# බයිබලීය ලෝක දැක්මක් වර්ධනය කර ගැනීම

## භාවස්ටයිම් ජාත්‍යන්තර ආයතනය

මෙම පාඨමාලාව **භාවස්ටයිම් ජාත්‍යන්තර ආයතනය** මගින් සකස් කරන ලද පාඨමාලාවක් වේ. මෙමගින් ඇදහිලිවතුන් සාර්ථක ආත්මික අස්වැන්නක් ලබා ගැනීම සඳහා පිළියෙල කිරීමට සකස් කරන ලද්දකි.

මෙම පුහුණුවේ තේමාව නම්, යේසුස්වහන්සේ ඉගැන්වූ දේ ඉගැන්වීමයි.
මෙම ඉගැන්වීම් මාළු අල්ලන්නන්, සුංගම් අයකරන්නන් යනාදී මනුෂ්‍යයන් ගෙන ශුභාරංචියේ බලය පෙන්නුම් කිරීම තුළින් ඔවුන් සිටියාවූ ලෝකය දිනාගැනීමට හැකි වූ කිතුබැතියන් ලෙසට වෙනස් කළේය.

මෙම අත්පොත මොඩියුල කීපයකින් සමන්විත විෂය මාලාවේ එක් පාඨමාලාවකි. ඇදහිලිවතුන් දර්ශනයක් තුළින් ක්‍රියාකාරී වීමෙන්, වර්ධනය වීමෙන්, සැලසුම් කිරීමෙන් හා සංවිධානය වීමෙන් එවැන්ජලිස්ත කිරීමේ ඉලක්කය කරා එළඹීම මෙහි අරමුණ වේ.

# පටුන


අත්පොත භාවිත කරන ආකාරය . . . . . 3

කණ්ඩායම් වැඩ සඳහා යෝජනා . . . . . 4

හැඳින්වීම . . . . . . . . 5

පාඨමාලාවේ අරමුණු . . . . . . . 6

1. පටන්ගැන්මෙහිදි . . . . . . . 7

2. බෙදුණු ලෝකයක් . . . . . . . 15

3. දෙවියන්වහන්සේ දකින ආකාරයට ලෝකය දැකීම . . 20

4. දේව වචනයේ ඇති ලෝකය : පැරණි ගිවිසුම . . . 26

5. දේව වචනයේ ඇති ලෝකය : නව ගිවිසුම . . . 41

6. ලෝකයේ ඇති සභාව . . . . . . 50

7. බලා සිටින ලෝකය . . . . . . 62

8. ලෝක කිතුනුවෙක් වීම . . . . . . 73

9. ජාත්‍යන්තර මැදිහත් යාච්ඤාව .. . . . . . 84

10. බයිබලීය ලෝක දැක්ම බෙදා ගැනීම . . . . . 94

11. එවිට අවසානය එනු ඇත. . . . . . . 108

ස්වයං පරීක්ෂණ සඳහා පිළිතුරු . . . . . 113

# අත්පොත භාවිත කරන ආකාරය

## අත්පොතේ සැකසුම

සෑම පාඩමකම පහත දැක්වෙන දේ අන්තර්ගත වේ:

**අරමුණු:** සෑම පාඩමක්ම අධ්‍යයනය කිරීමෙන් පසු ඔබ මුදුන් පමුණුවා ගත යුතු ඉලක්කයන් වේ. පාඩම ආරම්භ කිරීමට පෙර ඒවා කියවන්න.

**ප්‍රධාන පදය:** පරිච්ඡේදයක ප්‍රධාන සංකල්පය මෙම පදයෙන් අවධාරණය කෙරේ. එය කටපාඩම් කරන්න.

**පරිච්ඡේදයක අන්තර්ගතය:** සෑම කොටසක්ම අධ්‍යයනය කරන්න. අත්පොතේ මුද්‍රණය කර නොමැති යොමු කිරීම් සඳහා බයිබලය බලන්න.

**ස්වයං ඇගයීම:** පරිච්ඡේදයක් අධ්‍යයනය කර අවසන් කළ පසු මෙම ඇගයීමට පිළිතුරු සපයන්න. මෙම අත්පොත හෝ බයිබලය හෝ භාවිත නොකර ප්‍රශ්නවලට පිළිතුරු දීමට උත්සාහ කරන්න. ස්වයං-ඇගයීම අවසන් කළ පසු ඔබේ පිළිතුරු මෙම අත්පොතේ අවසානයේ දී ඇති පිළිතුරු හා සසඳා බලන්න.

**තවදුරටත් අධ්‍යයනය කිරීම සඳහා:** දේව වචනය තවදුරටත් අධ්‍යයනය කිරීමටත් ඔබගේ අධ්‍යයන හැකියාවන් දියුණුකර ගැනීමටත්, ඔබ උගත් දේ ඔබගේ ජීවිතයටත් මෙහෙයටත් අදාළ කර ගැනීමටත් මෙම කොටස උපකාරී වේ.

**අවසාන පරීක්ෂණය:** ඔබ සම්මාන සඳහා මෙම පාඨමාලාවෙහි ලියා පදිංචි වූයේ නම්, පාඨමාලාව හා සමඟ අවසාන පරීක්ෂණය ද ඔබට ලැබෙන්නට ඇත. මෙම පාඨමාලාව සම්පූර්ණ කිරීමෙන් පසු මෙම පරීක්ෂණයට පිළිතුර සපයා, ඔබට ලැබී ඇති උපදෙස් අනුව ශ්‍රේණි පැවරීම සඳහා ආපසු එවන්න.

# කණ්ඩායම් වැඩ සඳහා යෝජනා
# පළමු රැස්වීම

**ආරම්භය:** යාච්ඤාවකින් හා හැඳින්වීමකින් ආරම්භ කරන්න. එකිනෙකා හඳුනාගෙන ශිෂ්‍යයන්ව ලියාපදිංචි කරන්න.

**කණ්ඩායම් ක්‍රියා පිළිවෙළ තහවුරු කරන්න:** රැස්වීම මෙහෙය වන්නේ කවුරුන්ද, කාර්යය සැසි දින, කාලය, ස්ථානය තීරණය කරන්න.

**ප්‍රශංසා කිරීම හා යාච්ඤා කිරීම:** ඔබගේ පුහුණු සැසි සඳහා ශුද්ධාත්මයාණන්වහන්සේගේ වැඩ සිටීම අයැදින්න.

**අත්පොත ශිෂ්‍යයන්ට බෙදා දෙන්න:** අත්පොතේ මුල් පිටු කීපයෙන් සපයා ඇති පොතේ මාතෘකාවද, සැකැස්මද, පාඩමාලාවේ අරමුණු ද හඳුන්වා දෙන්න.

**පළමු පැවරුම සකස් කරන්න:** ඊළඟ රැස්වීමට පෙර ශිෂ්‍යයන් ඔවුන්ට නියමිත පරිච්ඡේද කියවා ස්වයං-ඇගයීම්වලට පිළිතුරු සපයනු ඇත. එක් රැස්වීමකදී අධ්‍යයන කරනු ලබන පරිච්ඡේද සංඛ්‍යාව, ඒ ඒ පරිච්ඡේදයේ දිග ප්‍රමාණය, අන්තර්ගතය හා කණ්ඩායමේ දක්ෂතා මත රැඳී පවතී.

# දෙවන හා ඊළඟ රැස්වීම්

**ආරම්භය:** යාච්ඤා කරන්න. අලුතින් පැමිණි ශිෂ්‍යයින් ඇතිනම් ඔවුන්ව පිළිගෙන ලියාපදිංචි කර අත්පොත බැගින් දෙන්න. පැමිණීම ලකුණු කරන්න. ප්‍රශංසා කිරීමේ හා යාච්ඤා කිරීමේ කාලයක් ගත කරන්න.

**පුනරීක්ෂණය:** පසුගිය රැස්වීමේ දී උගත් දේ කෙටි සාරාංශයකින් ඉදිරිපත් කරන්න.

**පාඩම: තද කළු අකුරින් ඇති මාතෘකා,** ඉගැන්වීමේ සැකිල්ලක් ලෙස භාවිත කරමින්, පරිච්ඡේදයක එක් එක් කොටස සාකච්ඡා කරන්න. තමන් අධ්‍යයනය කළ දේ ගැන ප්‍රශ්න හෝ අදහස් හෝ ඇත්නම් ඉදිරිපත් කරන ලෙස ශිෂ්‍යයන්ට පවසන්න. ඒ ඒ පාඩම්, ඔබගේ ශිෂ්‍යයන්ගේ ජීවිතවලටත් සේවයටත් අදාළ කර ගන්න.

**ස්වයං-ඇගයීම්**: ශිෂ්‍යයන් පිළිතුරු සපයා ඇති ස්වයං-ඇගයීම් පුනරීක්ෂණය කරන්න (ස්වයං-ඇගයීම්වල පිළිතුරු ශිෂ්‍යයන් අතට යෑමට ඔබ අකමැති නම්, ඒවා සෑම අත්පොතකින්ම ගළවා ඉවත් කරන්න).

**තවදුරටත් අධ්‍යයනය කිරීම සඳහා:** මෙහි ඇති ව්‍යාපෘති තනි තනිව හෝ කණ්ඩායම් වශයෙන් හෝ කළ හැකිය

**මොඩියුලය : ගුණනය කිරීම**
**පාඩමාලාව : බයිබලීය ලෝක දැක්මක් වර්ධනය කර ගැනීම**

# හැඳින්වීම

මෙම පාඨමාලාව, හාවස්ටයිම් ජාත්‍යන්තර ආයතනයේ පුහුණු කිරීම් පිළිබඳ තෙවැනි මොඩියුලයේ පළමු පාඩම වේ. "දෘෂ්‍යකරණය" ලෙස නම් කර ඇති පළමු මොඩියුලය ආත්මික අස්වැන්නේ දර්ශනය සන්නිවේදනය කරයි. "නියෝජනය" පිළිබඳ පාඨමාලා සහිත දෙවැනි මොඩියුලය මෙම දර්ශනය සාක්ෂාත් කර ගැනීම සඳහා ඔබ සන්නද්ධ කිරීමට මූලික පුහුණුවක් සපයයි. ඔබ උගත් දේ අන් අය සමඟ බෙදා ගැනීමෙන් ඔබ ලද දර්ශනය විස්තාරණය කරන ආකාරය තෙවැනි මොඩියුලයේ පාඨමාලාවලින් පැහැදිලි කරයි. ආත්මික අස්වැන්න සඳහා ගොවීන් පුහුණු කරන ආකාරය ඔබ ඉගෙන ගන්නා අතර ඔවුන්ට තවත් අය පුහුණු කිරීමට හැකි වෙනු ඇත.

> **"බොහෝ සාක්ෂිකාරයන් ඉදිරියෙහි නුඹ මාගෙන් ඇසූ දේම වෙන අයටත් උගන්වන්ට සමර්ථවූ විශ්වාසවූ මනුෂ්‍යයන්ට භාරදෙන්න" 2 තිමෝති 2:2.**

නොනවත්වා කෙරෙන මෙම පුහුණු චක්‍රය "ගුණ කිරීම" ලෙස හැඳින්වේ. ඊට හේතුව එය ආත්මික ශ්‍රමික බලකාය වැඩි කරන බැවිනි.

බයිබලීය ලෝක දැක්ම වැඩි වර්ධනය කිරීම, ආත්මික ගුණ කිරීමට මූලික වේ. බයිබලීය ලෝක දැක්මක් තිබීම යනු ඔබ ලෝකය දකින්නේ බයිබලයේ එය එළිදරව් කර ඇති පදනම මත වේ. ඔබ ලෝකය දෙස බලන්නේ දේශපාලකයන්, ආර්ථික විද්‍යාඥයන් හෝ අධ්‍යාපනඥයන් බලන ලෙස නොවේ. ඔබ ඔබගේම සංස්කෘතියට අනුව ලෝකය නොදකිනු ඇත. ඔබ ලෝකය දෙස බලන්නේ දෙවියන්වහන්සේ එය දකින ආකාරයෙනි. ඔබ උන්වහන්සේගේ දෘෂ්ටියෙන් ලෝකය අවබෝධ කර ගන්නවා ඇත. "වැඩි වර්ධනය කර ගැනීම" යනු යම් ක්ෂේත්‍රයක යම් දෙයක් අත්පත් කර ගැනීම හෝ වැඩි දියුණු කර ගැනීම හෝ වේ. ආත්මික සේවකයන් ගුණ කිරීමේ පරමාර්ථය ඇතිව ඔබ ජීවත් වන ලෝකය පිළිබඳ දැනුම මෙම පාඨමාලාව මගින් විස්තාරණය කෙරෙනු ඇත.

දෙවියන්වහන්සේගේ ලිඛිත වචනය වන බයිබලයෙන් එළිදරව් කර ඇති "ලෝක දැක්ම" මෙම පාඨමාලාව පැහැදිලි කරයි. එය එම විෂය උත්පත්ති පොතේ සිට එළිදරව් පොත දක්වා සොයා බලයි. අප "කාලය" ලෙස හඳුන්වන ආරම්භයේ සිට අවසානය දක්වා ලෝකයේ ජාතීන් වෙනුවෙන් ඇති දෙවියන්වහන්සේගේ සැලැස්ම පැහැදිලි කරයි. මෙම පාඨමාලාව "ලෝක කිතුනුවෙකු" වීමේ අභියෝගය හඳුන්වා දීම මඟින් ජාතීන් වෙනුවෙන් ඇති ඇදහිලිවන්තයෙකුගේ වගකීම ඉදිරිපත් කරයි.

ලෝකයේ ශුභාරංචිය නොලද සෙනඟ කණ්ඩායම් වෙත ශුභාරංචිය පැතිරීමේ හදිසි අවශ්‍යතාව අවධාරණය කරමින්, මෙම පාඨමාලාව අද පවත්නා ගෝලීය ආත්මික තත්ත්වයන් සාකච්ඡා කරයි. ලෝක සභාව වෙත ඇති වගකීම ගැනද මෙම පාඩම් අවධානය යොමු කරන අතර ඔබ, දෙවියන්වහන්සේ දකින ආකාරයට ලෝකය දැකීම ආරම්භ කරනු ඇත. එහෙත් ක්‍රියා නැති ඇදහිල්ල මළ ඇදහිල්ලක් වන්නා සේම (ජාකොබ් 2 : 26) පෞද්ගලික සහභාගීත්වයක් නොමැති ලෝක දැක්මක්ද ඵලදායි නොවනු ඇත. බයිබලීය ලෝක දැක්මක් ඇති නිරීක්ෂකයෙකු පමණක් වීමට වඩා කෙනෙකු වීමට මෙම පාඨමාලාව අභියෝග කරයි. අද දෙවියන්වහන්සේ ලෝකයේ කරන දෙයෙහි ක්‍රියාකාරී කොටස් කරුවෙකු වන සහභාගිකයෙකු වීමට ඔබ පොලඹවනු ලැබේ.

# පාඨමාලාවේ අරමුණු

මෙම පාඨමාලාව අධ්‍යයනය සම්පූර්ණ කළ පසු ඔබට

- දෙවියන්වහන්සේ දකින ආකාරයෙන් ලෝකය දැකීමට
- ලෝකය පිළිබඳව බයිබලය උගන්වන දෙය සාරාංශ කිරීමට
- ජාතීන් වෙනුවෙන් දෙවියන්වහන්සේගේ සැලැස්ම අවබෝධ කර ගැනීම ප්‍රදර්ශනය කිරීමට
- ලෝකය මුළුල්ලේ දේව රාජ්‍යය පිළිබඳ ශුභාරංචිය පැතිරීමේ ඔබේ භූමිකාව පිළිගැනීමට
- "ලෝක කිතුනුවෙකු" වීමට
- ජාත්‍යන්තර මැදිහත්වීම මඟින් සේවය කිරීමට
- බයිබලීය ලෝක දැක්ම අන් අය සමඟ බෙදා ගැනීමට හැකිවනු ඇත.

# පළමුවන පරිච්ඡේදය

## පටන්ගැන්මෙහිදී

### අරමුණු

මෙම පරිච්ඡේදය අධ්‍යයනයෙන් පසු ඔබට

- ❖ ප්‍රධාන පදය මතකයෙන් ලිවීමට
- ❖ ලෝකයේ හා සියලු මනුෂ්‍ය වර්ගයාගේ මැවුම්කරු හඳුනා ගැනීමට
- ❖ මැවීම පිළිබඳ ලොව පුරා පවතින විවිධ කතන්දර සඳහා හේතු දෙකක් දීමට
- ❖ මැවීම පිළිබඳ බයිබලීය වාර්තාව පිළිගැනීම ඇතැම් අය ප්‍රතික්ෂේප කරන්නේ මන්දැයි පැහැදිලි කිරීමට
- ❖ "බයිබලීය ලෝක දැක්ම" යනුවෙන් අදහස් වන්නේ කුමක්දැයි පැහැදිලි කිරීමට
- ❖ මැවීමේ දවස් හත තුළ දෙවියන්වහන්සේගේ මැවීමේ ක්‍රියාව සාරාංශ කිරීමට
- ❖ මැවීම තුළ මිනිසාගේ පරමාර්ථය හා තත්ත්වය පැහැදිලි කිරීමට
- ❖ "මිනිසාගේ වැටීම" පිළිබඳ කතාන්දරය සාරාංශ කිරීමට
- ❖ "මිනිසාගේ වැටීම" නිසා ඇතිවූ ප්‍රතිඵල පැහැදිලි කිරීම
- ❖ ලෝකය සඳහා වන දෙවියන්වහන්සේගේ සැලැස්ම පිළිබඳ පළමු බයිබලීය යොමුව හඳුනා ගැනීම
- ❖ සියලු මනුෂ්‍යයන් ජීවත්වන ලෝක දෙක හඳුනා ගැනීමට හැකිවනු ඇත.

### ප්‍රධාන පදය

**පටන්ගැන්මෙහිදී දෙවියන්වහන්සේ අහසත් පොළොවත් මැවූ සේක (උත්පත්ති 1:1).**

## හැඳින්වීම

ලෝකය පිළිබඳව බොහෝ දෙනෙකුට ඇත්තේ සීමිත දැක්මකි. ඔවුන් සැලකිලිමත් වන්නේ ඔවුන්ගේම ගම, නගරය හෝ ජාතිය ගැන පමණි. ඔවුන් ජීවත්වන පෙදෙස, "පෘථිවිය" නමින් හැඳින්වෙන විශාල ග්‍රහලෝකයක කුඩා කොටසක් බව ඔව්හු හඳුනන්නේ නැත. මුළුමහත් ලෝකය සියලු ජාතින්, සංස්කෘතීන් හා භාෂාවන්වලට අයත් සෙනඟ සඳහා දෙවියන්වහන්සේට ඇති විශේෂ සැලැස්ම ගැන ඔවුහු නොදනිති.

මෙම පරිච්ඡේදයෙන් අප ජීවත්වන ලෝකය හඳුන්වා දෙයි. ලෝකයේ මැවීමත් එහි වාසය කරන මනුෂ්‍යයාත් ගැන පැහැදිලි කිරීම සඳහා එය කාලයේ පටන් ගැන්මෙන් ආරම්භ කරයි. දෙවන පරිච්ඡේදය මෙම හැඳින්වීම තවදුරටත් ඉදිරියට ගෙන යන අතර ලෝකයා ජාතීන්ට හා භාෂාවන්ට වෙන්වූ ආකාරය පැහැදිලි කරයි.

### මැවීම පිළිබඳ මිථ්‍යාවන්

සෑම සංස්කෘතියකම මැවීම පිළිබඳ විවිධ විශ්වාසයන් තිබේ. නොයෙකුත් දේ ඇතිවුණේ කෙසේද හා මිනිසා පැමිණියේ කොතැනක සිටද යන්න පැහැදිලි කිරීමේ අවශ්‍යතාව මිනිසුන්ට තිබිණි. මැවීම පැහැදිලි කිරීම සඳහා විවිධ ජාතීන්ට හා සංස්කෘතීන්ට අයත් සෙනඟ ඔවුන්ගේම කතා නොහොත් 'මිථ්‍යාවන්' නිර්මාණය කර තිබේ. මැවීම පිළිබඳ විවිධ මිථ්‍යාවන් නිර්මාණය වී ඇත්තේ හේතු දෙකක් නිසා වේ.

1. මැවීම පිළිබඳ සත්‍ය කරුණු වෙත පිවිසීමට මිනිසුන්ට මාර්ගයක් නොතිබීම හෝ
2 මැවීම පිළිබඳ සත්‍ය කතාව ඇසූ පසුවද එය විශ්වාස නොකිරීමට ඔවුහු තෝරා ගත්හ.

## මැවුම්කාර දෙවියන්වහන්සේ

ලෝකය මැවීම පිළිබඳ සත්‍ය කතාව බයිබලයේ වාර්තා කර ඇත. උත්පත්ති 1:1 පළමු පරිච්ඡේදය සම්පූර්ණයෙන්ම සාරාංශ කරයි.

> **පටන්ගැන්මෙහිදී දෙවියන්වහන්සේ අහසත් පොළොවත් මැවූ සේක (උත්පත්ති 1:1).**

මෙම පදයේ සඳහන් දෙවියන්වහන්සේ සැබෑවූ එකම දෙවියන්වහන්සේ වේ. දෙවියන්වහන්සේගේ වචන හා ක්‍රියා ලිඛිතව වාර්තා කර ඇත්තේ බයිබලයෙහිය. බයිබලීය ලෝක මතයක් ගොඩනැඟීම ගැන අප කතාකරන විට එයින් අදහස් වන්නේ ලෝකය පිළිබඳ අපගේ අවබෝධය පදනම් වන්නේ දෙවියන්වහන්සේ තම ලිඛිත වචනය වන බයිබලය තුළින් එළිදරව් කරන දෙය මත වන බවය.

ඇතැම් අය මැවීම ගැන බයිබලයෙන් ඉදිරිපත් කර ඇති කරුණු විශ්වාස කිරීමට මැළිවන්නේ එවිට ඔවුන් දෙවිකෙනෙකු ඇති බවට පිළිගත යුතු බැවිනි. දෙවි කෙනෙකු ඇති බව ඔව්හු පිළිගනිත් නම්, එවිට ඔවුන් කෙරෙහි ඇති උන්වහන්සේගේ සර්වබලධාරී පාලනය ද පිළිගත යුතුය. එමෙන්ම උන්වහන්සේගේ වචනය ද පිළිගෙන තම දුෂ්ට ජීවිත පැවැත්මෙන් ඔවුන් ඉවත් විය යුතුය. තම ජීවිත ශෛලිය වෙනස් කිරීමට මිනිසුන් අකමැති බැවින් ඔවුහු මැවීම පිළිබඳ බයිබලීය විස්තරය හා දෙවියන්වහන්සේගේ පැවැත්ම ප්‍රතික්ෂේප කරති.

ඇතැම් අය පවසන්නේ මැවීම පිළිබඳ බයිබලීය විස්තරය, පෘථිවිය ගැන අධ්‍යයනය කරන විද්‍යාඥයන්ගේ සොයා ගැනීම් හා එකඟ නොවන බවය. ඇතැම් විද්‍යාඥයන්ගේ කල්පිත සමග බයිබලය එකඟ නොවන බව සත්‍යයකි. එහෙත් කල්පිතයක් යනු යම් කිසි දෙයක් සිදුවූ ආකාරය ගැන ඇති පෞද්ගලික විශ්වාසයක් හෝ අනුමානයක් පමණි. එය ඔප්පු කළ කරුණක් නොවේ. විද්‍යාඥයන් මතු කළ සෑම අභියෝගයකටම, ඔවුන්ගේ අධ්‍යයනයෙන් සොයා ගත් කරුණු මගින් මැවීම පිළිබඳව බයිබලය නිවැරදි බව සෑමවිටම ඔප්පු වී තිබේ.

## ලෝකයේ මැවීම

දෙවියන්වහන්සේ තම මැවීමේ ක්‍රියාවන් සිදුකරන විට ලෝකය පැවති තත්ත්වය අපට උත්පත්ති පොතෙන් පවසයි:

> **පොළොව වනාහි පාළුව හිස්ව තිබුණාය. ගැඹුර පිට අන්ධකාරය විය. දෙවියන්වහන්සේගේ ආත්මය ජලමතුයෙහි හැසිරෙමින් සිටි සේක (උත්පත්ති 1:2).**

දෙවියන්වහන්සේගේ ලෝකය මැවීමේ කතාව පහත දැක්වෙන පදවලින් පැවසේ :

| | | |
|---|---|---|
| පළමු දවස | : | ආලෝකය හා අන්ධකාරය (3 - 5 පද) |
| දෙවන දවස | : | අහස් කුස (ස්වර්ගය) ජලය වෙන් කිරීම (6 - 8 පද) |
| තුන්වන දවස | : | ගොඩබිම හා ගස් කොළන් (9 - 13 පද) |
| සතරවන දවස | : | ආකාශ වස්තු : ඉර හඳ තාරකා (14 - 19 පද) |
| පස්වන දවස | : | ජලයේ වසන සතුන් හා කුරුල්ලන් (20 - 23 පද) |
| හය වන දවස | : | ගොඩබිම සතුන් හා මිනිසා (24 - 25 පද) |

දෙවියන්වහන්සේගේ මැවීම බයිබලය සාරාංශ කරමින් මේවා එළිදරව් කරයි.

> **මක්නිසාද සිංහාසන වේවා, ස්වාමිකම් වේවා, අධිපතිකම් වේවා, බලපරාක්‍රම වේවා ස්වර්ගවල සහ පොළොවෙහිත් ඇති පෙනෙන්නාවූ දේවල්ද නොපෙනෙන්නාවූ දේවල්ද යන සියල්ල උන්වහන්සේ තුළ මවනලද්දේය. සියලු දේ උන්වහන්සේ කරණකොටගෙනද උන්වහන්සේ උදෙසාද මවා තිබේ. උන්වහන්සේ සියල්ලටම පළමුවෙන් සිටින සේක. සියල්ලද උන්වහන්සේ තුළ පවතින්නේය (කොලොස්සි 1:16 17).**

## මිනිසා මැවීම

සයවන දවසේ සියලු මැවීමේ ශ්‍රේෂ්ඨතම දෙය දෙවියන්වහන්සේ මැවූ සේක. උන්වහන්සේ පළමුව උන්වහන්සේගේම ස්වරූපයෙන් මිනිසා මැවූ සේක.

> **තවද දෙවියන්වහන්සේ: අපගේ ස්වරූපයෙන් අපගේ සමානත්වය ලෙස මනුෂ්‍යයා සාදම්හ. ඔවුහු මුහුදේ මත්ස්‍යයන් කෙරෙහිද ආකාශයෙහි පක්ෂීන් කෙරෙහිද තිරිසනුන් කෙරෙහිද මුළු පොළොව කෙරෙහිද පොළොව පිට බඩගා යන සියල්ලන් කෙරෙහිද ආණ්ඩු කෙරෙත්වයි කී සේක. දෙවියන්වහන්සේ තමන් ස්වරූපයෙන් මනුෂ්‍යයා මැවූ සේක. දෙවියන්වහන්සේගේ ස්වරූපයෙන් ඔහු මැවූ සේක පුරුෂයාද ස්ත්‍රියද කොට ඔවුන් මැවූ සේක (උත්පත්ති 1:26, 27).**

දෙවියන්වහන්සේ පළමුව පොළොවේ දූවිල්ලෙන් ආදම් මවා ඔහුගේ නාස් පුඩු තුළට ජීවමාන හුස්ම හෙළු සේක (උත්පත්ති 2:7). දෙවියන්වහන්සේ ආදම්ගෙන් පළමු ස්ත්‍රිය මැවූ සේක. ඒවගේ මැවීම උත්පත්ති 2:18-25 හි කියවන්න.

## මිනිසා සඳහා දෙවියන්වහන්සේගේ පරමාර්ථය

අතීතයේ රජවරු තමාගේ ප්‍රතිරූප සාදා, තමාට පෞද්ගලිකව යා නොහැකි පළාත්වල තමා නියෝජනය කිරීම පිණිස එම ප්‍රතිරූප පිහිටු වූහ. මිනිසා, දෙවියන්වහන්සේගේ ස්වරූපයෙන් සාදා උන්වහන්සේ නියෝජනය කිරීම පිණිස පොළොවේ තැබූ සේක. දෙවියන්වහන්සේගේ ආධිපත්‍යය මුළු ලොව පැතිරවීමට මිනිසාට උන්වහන්සේ බලය දුන් සේක. ලෝකයේ සියලුම සතුන් හා ගස් කොළන් කෙරෙහි ආධිපත්‍යය ඔහුට තිබිණි.

මිනිසාට විශේෂ වගකීමක්ද පැවරිණි. ඔහු වැඩී වර්ධනය වී, දෙවියන්වහන්සේගේ ස්වරූපය පෙන්වන තවත් මිනිසුන් හා ස්ත්‍රීන්ගෙන් මුළු පොළොව පිරවිය යුතු වේ.

> **දෙවියන්වහන්සේ ඔහුට ආශිර්වාද කළ සේක : දෙවියන්වහන්සේ ඔවුන්ට කියන සේක් : නුඹලා බෝවී වැඩිවෙමින් පොළොව පූර්ණකොට ඒක යටත් කර ගන්න: මුහුදේ මත්ස්‍යයන් කෙරෙහිද ආකාශයේ පක්ෂීන් කෙරෙහිද පොළොව පිට හැසිරෙන සියලු සතුන් කෙරෙහිද අධිපතිකම් කරන්නැයි කීසේක (උත්පත්ති 1:28).**

දෙවියන්වහන්සේගේ සියලු මැවීමෙන් ශ්‍රේෂ්ඨතම වන්නේ මිනිසා වේ. දෙවියන්වහන්සේ මනුෂ්‍යයා තමන්වහන්සේගේ ස්වරූපයෙන් මැවූ සේක. ඔහුට සත්වයන්ට නොමැති ජීවමාන සදාතනික ආත්මයක් තිබේ. ඔහුට දෙවියන්වහන්සේ සමග සන්නිවේදනය කළ හැකි හා උන්වහන්සේ ගැන ඉගෙන ගත හැකි ආත්මයක් හා මනසක් තිබේ. දෙවියන්වහන්සේගේ ආත්මය සැබවින්ම පැමිණ මිනිසා ජීවත් වූ මනහර උද්‍යානයේ ඔහු සමග කතා කරමින් ඇවිද්දේය (උත්පත්ති 3 : 8).

මැවීම තුළ ඇති ඔහුගේ විශේෂ තත්වය නිසා ඔහු දෙවියන්වහන්සේ පිළිබිඹු කළ යුතුය. ඔහු මවා ඇත්තේ දෙවියන්වහන්සේගේ ස්වරූපයෙනි. ඔහුව සැදූ දෙවියන්වහන්සේ සමග කතා කරමින් ඔහු උන්වහන්සේට ප්‍රශංසා කළ යුතුය.

> **එනම් මාගේ නාමය දරන්නාවූ මාගේ ගෞරවය පිණිස මා විසින් මවා තනා සැදුවාවූ සියල්ලන් ගෙනෙන්නැයි කියාත් කියන්නෙමි.**
>
> **මා විසින් මටම උපදවාගත් ඒ සෙනඟ මාගේ ප්‍රශංසාව දක්වනවා ඇත (යෙසායා 43:7, 21).**

ආදම් හා ඒවා ඔවුන් හා සමාන දරු සම්පත් ලබා මුළු ලොව ඔවුන්ගෙන් පිරවිය යුතුය. ඔවුන් ශුද්ධ වූ, දෙවියන්වහන්සේගේ ස්වරූපය පෙන්නුම් කරන අතර හා ඔවුන්ගේ මැවුම්කරු සමග සන්නිවේදනය කරන හා උන්වහන්සේට ප්‍රශංසා කරන අය විය යුතුය. එහෙත් මෙම අනර්ඝ සැලසුම විනාශ කරන යම් භයානක දෙයක් සිදුවිය.

## මිනිසාගේ වැටීම

උත්පත්ති 3 හි අන්තර්ගත වන්නේ බයිබලයෙහි ඇති ඉතාමත් දුක්බදායක කතාවකි. එය 'මිනිසාගේ වැටීම' ලෙස හැඳින්වෙන දේ වාර්තා කරයි. මිනිසා මවන ලද්දේ දෙවියන්වහන්සේගේ ස්වරූපයෙනි. දෙවියන්වහන්සේට තෝරා ගැනීමේ නිදහස තිබූ ආකාරයෙන්ම මිනිසාට ද තෝරා ගැනීමේ නිදහස තිබිණි. තමාගේම තීරණ ගැනීමට ඔහු නිදහස්ය.

ආදම් හා ඒව ජීවත්වූ උද්‍යානයේ බොහෝ ගස් තිබිණි. එහෙත් එහි විශේෂ ගස් දෙකක්ද විය. ඉන් එකක් ජීවන වෘක්ෂය ලෙස හැඳින්විණි (උත්පත්ති 3 : 22). ආදම් හා ඒව එම ගහේ ගෙඩි කෑවහු නම් කිසි දිනක නොමැරී සදහටම ජීවත් වීමට ඔවුන්ට හැකිව තිබිණි.

එහෙත් එම උද්‍යානයේ තවත් ගසක් විය. එය "හොඳ නරක අවබෝධ කිරීමේ ගස" ලෙස හැඳින්විණි (උත්පත්ති 2 : 17). එම ගසේ ගෙඩි කෑම දෙවියන්වහන්සේ ආදම්ට හා ඒවට තහනම් කළ සේක. මනුෂ්‍යයාට නපුර හා එහි භයානක ප්‍රතිඵල සමඟ, අත්දැකීම ගැන දෙවියන්වහන්සේ අකමැති වූ සේක. එබැවින් එම ගසේ ගෙඩි කෑවොත් ඔවුන් මිය යන බවට උන්වහන්සේ ඔවුන්ට අනතුරු ඇඟවූ සේක.

එහෙත් මිනිසා දෙවියන්වහන්සේගේ අනතුරු ඇගවීමට ඇහුම්කන් දුන්නේ නැත. දෙවියන්වහන්සේට සාතන් නමැති සතුරෙක් සිටියේය. සාතන් කලෙක දෙවියන්වහන්සේගේ ඉතා ලස්සන දේවදූතයෙක් විය. එහෙත් දෙවියන්වහන්සේ තරමටම ශ්‍රේෂ්ඨ වීමට ඔහු තීරණය කළේය. එබැවින් සාතන් ස්වර්ගයේදී දේවදූතයන්ගේ කැරැල්ලක් මෙහෙය විය. ඔබට මේ පිළිබඳව බයිබලයේ යෙසායා 14 : 12 - 17 හි කියවිය හැකිය.

මිනිසා දෙවියන්වහන්සේට සේවය කිරීම ගැන සාතන් සතුටු වූයේ නැත. සාතන් ඒදන් උයනේදී පළමුව ස්ත්‍රිය ළඟට ද පසුව මිනිසා ළඟට ද පැමිණියේය. ඔහු සර්පයෙකු මෙන් වෙස් වළාගෙන සිටියේය. බොරු පොරොන්දු දීමෙන් සාතන් ඔවුන්ව පෙලඹවීය. ඔවුහු මේ පෙලඹවීම්වලට රැවටී දෙවියන්වහන්සේට එරෙහිව පව් කරමින්, හොඳ නරක අවබෝධ කිරීමේ ගසින් කෑවෝය.

මිනිසා පාපයට වැටීමේ ප්‍රතිඵලය මුළු ලෝකයම වෙනස් කළේය. පැළෑටි හා සතුන් පාලනය තවදුරටත් පහසු නොවීය. ඔවුන් කෙරෙහි ආධිපත්‍යය තබා ගැනීමට මිනිසාට පොර බැදීමට සිදුවිය. සතුන් දරුණු වූ අතර පොළොවෙන් වල් පැළෑටි හා කටු පඳුරු මතු විය. කාලගුණය භයානක ලෙස වෙනස් වෙමින් ගංවතුර වැනි විනාශයන් ඇති විය.

අද ලෝකයේ ඇති සියලු නපුර - සියලු වසංගත, පීඩාවන් හා බේදවාචකයන් - මිනිසාගේ පළමු වැටීමේ ප්‍රතිඵල වේ. පාපය ලෝකයට ඇතුළු වූ අතර ඒ හා සමගම දුක් ද පැමිණියේය. දෙවියන්වහන්සේ අනතුරු ඇඟවූ ආකාරයටම මරණයේ දඬුවම ද මිනිසා වෙත පැමිණිණි. අප දන්නා පරිදි යුගයේ අවසානය දක්වා සියලු මිනිසුන් ශාරීරික මරණය අත් දකිනු ඇත.

මීටත් වඩා භයානක දෙය නම් පාපය නිසා මිනිසා දෙවියන්වහන්සේගෙන් වෙන් වීමය. මිනිසා විසින් පෙන්නුම් කළ යුතුව තිබූ දෙවියන්වහන්සේගේ ස්වරූපය විනාශ විය. පාපය නිසා, දෙවියන්වහන්සේ සමග තිබූ සම්බන්ධතාව හා සන්නිවේදනය මිනිසාට අහිමි විය.

## මහත් පොරොන්දුවක්

මනුෂ්‍ය ඉතිහාසයේ අඳුරුම අවස්ථාවේ දෙවියන්වහන්සේ මහත් පොරොන්දුවක් දුන් සේක.

උන්වහන්සේ සාතන්ට මෙසේ පැවසිය :

> **මම තා සහ ස්ත්‍රිය අතරෙහිද තාගේ වංශය සහ ඇගේ වංශය අතරෙහිද සතුරුකම තබන්නෙමි. ඒ වංශය තාගේ හිස පොඩි කරන්නෙහිය. තෝ ඔහුගේ විලුඹ පොඩි කරන්නෙහියයි කී සේක (උත්පත්ති 3:15).**

දෙවියන්වහන්සේගේ විශේෂ සැලැස්මේ පළමු එළිදරව්ව මෙය වේ. ඉන් එළිදරව් වූයේ මිනිසා හා සාතන් අතර ශතවර්ෂ ගණනාවක් මුළුල්ලේ සටනක් ඇති වන බව හා අවසානයේදී මිනිසාගේ

සතුරා විනාශ කර මිනිසා හා දෙවියන්වහන්සේ අතර නිවැරදි සබඳතාව නැවත ඇති කිරීමට දෙවියන්වහන්සේ යම් කෙනෙකු එවන බවය. ඒ යම්කෙනා ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ වේ. සියලු මනුෂ්‍යයන් උදෙසා වන දෙවියන්වහන්සේගේ මේ විශේෂ සැලැස්ම ගැන ඔබ මෙම අධ්‍යයනය ඉදිරියට කරගෙන යන විට තවදුරටත් ඉගෙන ගන්නවා ඇත.

## ලෝක දෙකක්

උත්පත්ති 3:15 න් තවත් වැදගත් කරුණක් එළිදරව් වේ. සියලු මනුෂ්‍යයන් ජීවත් වන්නේ ලෝක දෙකකය. මහද්වීප හා රටවල්වලින් සමන්විත ස්වභාවික ලෝකයක අපි ජීවත් වෙමු. ස්වභාවික ලෝකය යනු අපගේ ශාරීරික ඇස්වලට පෙනෙන ලෝකය වේ. අපි ආත්මික ලෝකයක ද ජීවත් වෙමු. ඔබගේ ශාරීරික ඇස්වලින් මෙම ලෝකය දැකබලා ගත නොහැකිය. එහෙත් එය ඔබ ජීවත් වන ස්වභාවික ලෝකය මෙන්ම තාත්විකය.

සියලුම මනුෂ්‍යයන්ට ස්වභාවික ලෝකයේ ජීවත් වන ස්වභාවික ශරීරයක් තිබේ. එහෙත් මනුෂ්‍යයා මවා ඇත්තේ සදාතනික ප්‍රාණයක් සහ ආත්මයක් ඇතිව බව මතක තබා ගන්න. ඔබගේ ස්වභාවික ශරීරය, ස්වභාවික ලෝකයේ කොටසක් වන්නා සේම ආත්මික පැවැත්ම ද (ප්‍රාණය හා ආත්මය) ආත්මික ලෝකයේ කොටසක් වේ.

උත්පත්ති 3 : 15 හි සඳහන් “පොඩි කිරීම” හා “දෂ්ට කිරීම” යනුවෙන් පෙන්නුම් කරන්නේ ආත්මික ලෝකයේ මහා සටන වේ. එය මනුෂ්‍යයාගේ හදවත, සිත, ප්‍රාණය හා ආත්මය සඳහා කෙරෙන සටනකි. මේ සටනේ මධ්‍යස්ථ තැනක් නොමැත. සියලුම මනුෂ්‍යයෝ ප්‍රතිවිරුද්ධ පැති දෙකකට බෙදී සිටිති. යේසුස්වහන්සේ මෙසේ පැවසූ සේක.

මාගේ පක්ෂයට නොවන්නා මට විපක්ෂය. (ලූක් 11:23)

බයිබලීය ලෝක මතයක් ගොඩනැඟීමට මෙම මූලික කරුණු අප අවබෝධ කරගත යුතුය.

1. සියලු මනුෂ්‍යයන් ජීවත් වන්නේ ස්වභාවික ලෝකයක පමණක් නොව ආත්මික ලෝකයකද බව අප දැනගත යුතුය.

2. ආත්මික ලෝකයේ ඇති ගැටුම්, අප ජීවත් වන ස්වභාවික ලෝකය කෙරෙහිද බලපාන්නේය. සාතන් ආත්මික ලෝකයේ ක්‍රියාකරන අතර එය අපට මිනිසුන් හා ජාතීන් ස්වභාවික ලෝකයේ කරනු ලබන නපුරු ක්‍රියාවලින් දැකගත හැකිය.

3. මේ මහා ආත්මික සටනේ මධ්‍යස්ථ තැනක් නොමැත. අපි යේසුස්වහන්සේ වෙනුවෙන් වන්නෙමු. නැතහොත් උන්වහන්සේට විරුද්ධ වෙමු. අප උන්වහන්සේ වෙනුවෙන් නම් දේව වචනයේ උගන්වන සියලු දේ අප විශ්වාස කරන අතර මේ දැනුම මත ක්‍රියා කරන්නෙමු. අපි දේව වචනය විශ්වාස නොකර අපගේම ආත්මාර්ථකාමී හා පාපී ජීවිතය අපි ගත කරන්නෙමු නම් අපි උන්වහන්සේට විරුද්ධ වෙමු.

## ස්වයං පරික්ෂණය

1. ප්‍රධාන පදය මතකයෙන් ලියන්න.

2. ලෝකයේ හා සියලු මනුෂ්‍ය වර්ගයාගේ මැවුම්කරු කවුරුන්ද?

3. ලෝකය පුරා පැතිරී ඇති මැවීම පිළිබඳ විවිධ කතා සඳහා හේතු දෙකක් දෙන්න.

4. මැවීම පිළිබඳ බයිබලීය කරුණු පිළිගැනීම ඇතැමුන් ප්‍රතික්ෂේප කරන්නේ මන්ද?

5. "බයිබලීය ලෝක මතය" යනුවෙන් අදහස් වන්නේ කුමක්ද?

6. මැවීමේ දින හය තුළ දෙවියන්වහන්සේගේ මැවීමේ ක්‍රියා සාරාංශ කරන්න.

   පළමු දිනය

   දෙවන දිනය

   තුන්වන දිනය

   සතරවන දිනය

   පස්වන දිනය

   හයවන දිනය

7. දෙවියන්වහන්සේ සැදූ අනෙකුත් සියලු සත්ත්වයන්ට වඩා මනුෂ්‍යයා වෙනස් වන්නේ කෙසේද?

8. මිනිසා පාපයට වැටීමේ කතාව සාරාංශ කරන්න.

9. මිනිසා පාපයට වැටීමේ ප්‍රතිඵල මොනවාද?

10. ලෝකයා වෙනුවෙන් ඇති දෙවියන්වහන්සේගේ සැලැස්ම පළමුවෙන්ම එළිදරව් කරන බයිබල් යොමුව කුමක්ද?

11. සියලු මනුෂ්‍යයන් ජීවත් වන ලෝක දෙක නම් කරන්න.

(පරීක්ෂණ සඳහා පිළිතුරු මෙම අත්පොතේ අවසාන පරිච්ඡේදය අවසානයේ ඇත.)

## තවදුරටත් අධ්‍යයනය සඳහා

පහත දැක්වෙන පද අධ්‍යයනය කිරීමෙන් ලෝකයේ ආරම්භය හා මැවුම්කාර දෙවියන්වහන්සේ ගැන තවදුරටත් ඉගෙන ගන්න.

### දෙවියන්වහන්සේ ලෝකය මැවූ සේක

උත්පත්ති 1:1-32, 2:3-4, 5:1-2,
නෙහෙමියා 9:6,
ජෝබ් 38:1-41,
ගීතාවලිය 74:17, 89:11, 104:1-35, 115:15, 121:2, 124:8, 134:3, 136:6, 148:5,
හිතෝපදේශ 8:23-31,
දේශනාකාරයා 3:11,
යෙසායා 40:28, 42:5, 43:1-7, 44:24, 45:8,12,18, 48:13, 54:16, 65:17,
යෙරමියා 10:12, 27:5, 31:22, 32:17, 51:15,
එසකියෙල් 28:13,15,
ආමොස් 4:13,
සෙකරියා 12:1,
මලාකි 2:10,
ජොහන් 1:3,
ක්‍රියා 4:24, 17:24,
රෝම 1:20,
එපීස 2:10, 3:9, 4:24,
එළිදරව් 10:6.

### දෙවියන්වහන්සේ ස්වකීය බලයෙන් ලෝකය පෝෂණය කරන සේක.

ගීතාවලිය 75:3, 95:4,
කොලොස්සි 1:16,17,
හෙබ්‍රෙව් 1:3, 6:7,
2 පේතෲස් 3:4,
එළිදරව් 4:11.

# දෙවන පරිච්ඡේදය

## බෙදුණු ලෝකයක්

### අරමුණු

මෙම පරිච්ඡේදය අධ්‍යයනයෙන් පසු ඔබට

- ❖ ප්‍රධාන පදය මතකයෙන් ලිවීමට
- ❖ ලෝකය විවිධ භාෂා කාණ්ඩවලට බෙදුණු ආකාරය පැහැදිලි කිරීමට
- ❖ මෙම බෙදීම නිසා විවිධ සෙනඟ කණ්ඩායම් බිහිවුණු ආකාරය පැහැදිලි කිරීමට
- ❖ සෙනඟ කණ්ඩායම් මගින් ජාතීන් ඇතිවූ ආකාරය විස්තර කිරීමට හැකිවනු ඇත.

### ප්‍රධාන පද:

> **ස්වාමීන්වහන්සේද: බලව ඔව්හු එක සෙනඟක්ය, ඔවුන් සියල්ලන්ට ඇත්තේ එක භාෂාවක්ය, ඔවුන් කරන්ට පටන් ගන්නා දේ මේය. ඉඳින් ඔවුන් කරන්ට අදහස් කරන කිසිවක් ඔවුන්ට දුෂ්කර නොවන්නේය. යමු, අපි බැස ඔවුන්ට එකිනෙකාගේ කතාව නොතේරෙන ලෙස එහි ඔවුන්ගේ භාෂාව අවුල් කරමුයයි කී සේක**
> **(උත්පත්ති 11:6, 7).**

## හැඳින්වීම

පෙර පරිච්ඡේදයෙන් ඔබ ලෝකයේ හා මනුෂ්‍ය වර්ගයාගේ මැවීම පිළිබඳ ඉගෙන ගත්තෙහිය. මනුෂ්‍ය වර්ගයා පාපයට වැටීමද ඉගෙන ගත්තෙහිය. ආදම් හා ඒවට දරු සම්පත් ලැබුණු විට, මනුෂ්‍ය වර්ගයාට එකතු වූ මේ අලුත් අය ඉපදුණේ මූලික පාප ස්වභාවයක් ඇතිව වේ. දෙවියන්වහන්සේ මැවූ ආකාරයට මනුෂ්‍යයා තවදුරටත් යහපත් නොවිය. ඔහුගේ ස්වභාවික සිතිවිලි හා ක්‍රියා රටාවන් නපුරු වී තිබිණි. ටික කලකට මනුෂ්‍යයන් හා ස්ත්‍රීන් විශාල පවුලක් ලෙස එකට ජීවත් වූහ. එහෙත් ක්‍රමයෙන් ලෝකයා විවිධ භාෂාවලට සෙනඟ කණ්ඩායම්වලට හා ජාතීන්ට බෙදෙන්නට වූහ.

ඔබ පසුගිය පරිච්ඡේදයෙන් ලෝකයාගේ එක් බෙදීමක් ගැන ඉගෙන ගත්තෙහිය. ඒ ස්වභාවික හා ආත්මික ලෝකයන් ගැන බෙදීම වේ. එහෙත් අද ලෝකයා අතර තවත් බෙදීම් තිබේ. ලෝකයා විවිධ ජාතීන්ට, සංස්කෘතීන්ට හා භාෂාවන්ට බෙදී ඇත. මෙම බෙදීම් සිදුවූ ආකාරය බයිබලය පැහැදිලි කරයි.

## පාපයේ රටාව

ලෝකය මුළුල්ලේ පාපයේ රටාව පැතිරීමේ ආරම්භය උත්පත්ති 4:1 -6:4න් විස්තර කරයි. මෙම පාඩම ඉදිරියට ගෙන යාමට පෙර මෙම පරිච්ඡේද ඔබගේ බයිබලයෙන් කියවන්න. මෙම පරිච්ඡේදවලින් අපි, පළමු මිනී මැරුම, පළමු බොරුව හා සෑම සිතිවිල්ලක් මෙන්ම සෑම ක්‍රියාවක් නපුරු වන තෙක් මනුෂ්‍යයාගේ දුෂ්ටකම වැඩි වර්ධනය වූ ආකාරය, ඉගෙන ගන්නෙමු. අවසානයේ මුළු ලෝකයම කෙතරම් පාපිවූයේද යත්,

> **"මනුෂ්‍යයාගේ දුෂ්ටකම පොළොවෙහි මහත් බවද ඔහුගේ සිතේ කල්පනාවල කවර අරමුණත් නිරන්තරයෙන් නපුරුවම තිබෙන බවද ස්වාමීන්වහන්සේ දුටු සේක. තවද ස්වාමීන්වහන්සේ පොළොවෙහි මනුෂ්‍යයා සෑදූ බැවින් තැවී තමන් සිතෙන්ම ශෝක වූ සේක" (උත්පත්ති 6:5-6).**

පාපය ඉතා වේගයෙන් වර්ධනය වූ නිසා ලෝකය ගංවතුරකින් විනාශ කිරීමට දෙවියන්වහන්සේ තීරණය කළ සේක. එහෙත් උන්වහන්සේ එක් ධර්මිෂ්ඨ මනුෂ්‍යයෙකු වූ නෝවා සහ ඔහුගේ පවුල විනාශ කළේ නැත. නෝවා හා ගංවතුර පිළිබඳ කතාව උත්පත්ති 6:8-9:17න් කියවන්න.

ගංවතුරෙන් පසු නෝවාගේ පවුල බොහෝ වෙන්නට පටන් ගත්තේය. ඒ මොහොතේම පාහේ පාපය නැවත ඇති විය.

## බාබෙල් කොත

මෙම අවස්ථාව වන තෙක් ලෝ වැසි සියල්ලෝම එක විශාල පවුලක් මෙන් වූහ.

**මුළු පොළොවෙහි එකම භාෂාවක්ද, එකම කථා ක්‍රමයක් ද විය (උත්පත්ති 11:1).**

භාෂාවන්ගේ හෝ සංස්කෘතින්ගේ හෝ බෙදීමක් නොවීය. තවමත් විවිධ ජාතීන් සිටියේ නැත. මිනිසා භාෂාවෙන්, සංස්කෘතියෙන් හා වත්පිළිවෙත්වලින් සම්පූර්ණයෙන්ම එකමුතුව සිටි නිසා ඔවුනට බොහෝ දේ කළ හැකි විය. මේ එක්සත් සෙනඟ කණ්ඩායම විශාල කොතක් සෑදීමට තීරණය කළහ. එය කෙතරම් උසද යත් ස්වර්ගය දක්වා දෙවියන්වහන්සේ වැඩ සිටින තැනටම විහිදෙනු ඇත. ඔවුන්ට අවශ්‍ය වූයේ ඔවුන් කීර්තියට පත්වීම වේ. බාබෙල් කොත ගැන උත්පත්ති 11:1-9 හි කියවන්න.

භාෂාවේ හා සංස්කෘතියේ මෙවැනි එකමුතුවක් ඇති විට මේ මිනිසුන්ට කළ නොහැකි දෙයක් නොවනු ඇති බව දෙවියන්වහන්සේ දැනගත් සේක. එබැවින් දෙවියන්වහන්සේ ඔවුන්ගේ භාෂාව "අවුල් වියවුල්" කළ සේක.

**"ස්වාමීන්වහන්සේද: බලව ඔව්හු එක සෙනඟක්ය. ඔවුන් සියල්ලන්ට ඇත්තේ එක භාෂාවක්ය, ඔවුන් කරන්ට පටන් ගන්නා දේ මේය, ඉඳින් ඔවුන් කරන්ට අදහස් කරන කිසිවක් ඔවුන්ට දුෂ්කර නොවන්නේය. යමු, අපි බැස ඔවුන්ට එකිනෙකාගේ කතාව නොතේරෙන ලෙස එහි ඔවුන්ගේ භාෂාව අවුල් කරමුයයි කී සේක"
(උත්පත්ති 11:6-7).**

ලෝකයේ විවිධ භාෂාවලට බෙදීමේ ආරම්භය මෙය වේ. මිනිසුන්ට එකිනෙකා අවබෝධ කර ගත නොහැකි වූ බැවින් බාබෙල් ව්‍යාපෘතිය නැවතිණි.

**"මෙසේ ස්වාමීන්වහන්සේ එතැනින් මුළු පොළෝතලයෙහි ඔවුන් විසිරෙවූ සේක."
(උත්පත්ති 11:8).**

තමාට කතා කළ හැකි අය සමඟ එක්වීමට මනුෂ්‍යයෝ පටන් ගත්හ. ඔව්හු එකම භාෂාව කතා කරන කණ්ඩායම් ලෙස හෝ ගෝත්‍ර ලෙස හෝ සංවිධානය වූහ. මෙම කණ්ඩායම් වර්ධනය වූ විට ඔව්හු ලෝකයේ විවිධ ස්ථානවලට ගියහ. ඉන්පසු මේ "සෙනඟ කණ්ඩායම්" භාෂාව නිසා පමණක් නොව භූගෝලීය තත්වයන් නිසා ද එකිනෙකාගෙන් වෙන් වූහ. අවසානයේ මහා කඳු හා සාගර ඔවුන් වෙන් කෙළේය.

ඉන්පසු මේ වෙන්වූ කණ්ඩායම් නොයෙකුත් දේ විවිධ ආකාරයෙන් කිරීමට පටන් ගත්හ. ඔව්හු සුවිශේෂී සංස්කෘතීන් හා චාරිත්‍ර ඇති කර ගත්හ. එමෙන්ම ඔව්හු විවිධ ආගම් ඇති කරගත් අතර විවිධ දෙවිවරුන්ට නමස්කාර කළහ.

කාලයාගේ ඇවෑමෙන් මේ කණ්ඩායම් වර්ධනය වූ අතර ජාතීන් ලෙස සංවිධානය වූහ. ඔව්හු ඔවුන්ගේ ප්‍රදේශ සඳහා භූගෝලීය දේශ සීමාවන් ඇති කර ගත්හ. එමෙන්ම ඔවුන්ගේ වැසියන් පාලනය කිරීමට දේශපාලනික හා නීතිමය පද්ධති සකස් කර ගත්හ. ලෝකයා විවිධ භාෂාවන් සංස්කෘතීන් හා චාරිත්‍රවලට බෙදෙන්නට වූයේ මේ ආකාරයෙනි.

## අද පවත්නා ලෝකය

අප ලෝකය ජලයෙන් වටවූ ප්‍රධාන භූමි කොටස් හතකින් සමන්විතය. මේ භූමි කොටස් මහාද්වීප ලෙස හැඳින්වේ. මෙම මහාද්වීප මෙසේ නම් කර ඇත : උතුරු ඇමෙරිකාව, දකුණු ඇමෙරිකාව, යුරෝපය, ආසියාව, අප්‍රිකාව, ඕස්ට්‍රේලියාව හා ඇන්ටාක්ටිකාව.

මේ සෑම මහාද්වීපයක්ම විවිධ සෙනඟ කණ්ඩායම්වලින් සමන්විත විවිධ ජාතීන්වලට බෙදී ඇත. සෑම ජාතියකටම ඔවුන්ගේම රජයක් හා තම සීමාවන් තුළ සිදුවන දේ පාලනය කිරීමට නීති පද්ධතියක් තිබේ.

ජාතියක් ඇතුලත වෙනත් බෙදීම් තිබේ. ජාතියක් ප්‍රාන්තවලට හෝ පළාත්වලට හෝ බෙදී පවතින්නට පුළුවන. එමෙන්ම ජාතීන් තුළ සිටින සෙනඟද බොහෝ ගෝත්‍රවලට හෝ කණ්ඩායම්වලට බෙදී සිටිති. අපගේ මේ බෙදුණු ලෝකයේ බොහෝ අය ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ ශුභාරංචිය කිසිදා අසා නැත. දෙවියන්වහන්සේගේ ලිඛිත වචනය ඔවුන්ගේ භාෂාවෙන් ලබා ගත නොහැකිය.

## ස්වයං පරීක්ෂණය

1. ප්‍රධාන පදය මතකයෙන් ලියන්න.

2. ලෝකයා විවිධ භාෂා කණ්ඩායම්වලට බෙදුණු ආකාරය පැහැදිලි කරන්න.


3. මෙම භාෂාවේ බෙදීම විවිධ සෙනඟ කණ්ඩායම් සෑදීමට මුල් වූ ආකාරය පැහැදිලි කරන්න.

4. ජාතීන් සෑදීම සඳහා සෙනඟ කණ්ඩායම් යොමුවූ ආකාරය විස්තර කරන්න.

(පරීක්ෂණ සඳහා පිළිතුරු මෙම අත්පොතේ අවසාන පරිච්ඡේදය අවසානයේ ඇත.)

## තවදුරටත් අධ්‍යයනය සඳහා

පහත දැක්වෙන රූප සටහන ඔබ මෙතෙක් උගත් බයිබලීය ලෝක මතය සාරාංශ කර ඇත .



# තෙවන පරිච්ඡේදය

## දෙවියන්වහන්සේ දකින ආකාරයට ලෝකය දැකිම.

### අරමුණු:

මෙම පරිච්ඡේදය අධ්‍යයනයෙන් පසු ඔබට

- ප්‍රධාන පදය මතකයෙන් ලිවීමට
- බයිබලයේ "ප්‍රධාන යතුර" හඳුනා ගැනිමට
- බයිබලයේ "ප්‍රධාන යතුරෙන්" ඉදිරිපත් කෙරෙන කරුණු දෙකක් පැහැදිලි කිරීමට
- ලෝකයා සඳහා වන දෙවියන්වහන්සේගේ පරමාර්ථය පැහැදිලි කෙරෙන ශුද්ධ ලියවිලි යොමුවීමක් හඳුනා ගැනිමට
- දෙවියන්වහන්සේ ලෝකය දෙස ආත්මිකව බලන ආකාරය පැහැදිලි කිරීමට ස්වාභාවික නිදර්ශනයක් භාවිත කිරීමට හැකිවනු ඇත.

### ප්‍රධාන පද

> **"එවිට උන්වහන්සේ ඔවුන්ට ලියවිලි වැටහෙන පිණිස ඔවුන්ගේ සිත් පහදවා, ඔවුන්ට කියන සේක්: මෙසේ ක්‍රිස්තුස්වහන්සේ වධ විඳින්ටත් තුන්වෙනිදා මළවුන්ගෙන් නැගිටින්ටත් යෙරුසලමේ පටන් සියලු ජාතීන්ට පසුතැවිල්ල සහ පව් කමාවද උන්වහන්සේගේ නාමයෙන් ප්‍රකාශ කරනු ලබන්ටත් යුතුයයි ලියා තිබේ" (ලූක් 24:45-47).**

### හැඳින්වීම

ඇදහිලිවතුන්ද, දෙවියන්වහන්සේ ලෝකය දකින ආකාරයට දැකිය යුතු බව ඔබ ඉගෙන ගෙන ඇත. ලෝකය පිළිබඳ මෙම දැක්ම වැඩි වර්ධනය වන්නේ ලෝකය පිළිබඳව දෙවියන්වහන්සේ පවසන දෙය ගැන ඔබ වඩ වඩා ඉගෙන ගන්නා විට දී වේ. බයිබලිය ලෝක දැක්ම අවබෝධ කර ගැනිමට "ප්‍රධාන යතුරක්" මෙම පරිච්ඡේදය ඉදිරිපත් කරන අතර, ලෝකයා සඳහා වන දෙවියන්වහන්සේගේ පරමාර්ථය ද සාකච්ඡා කරයි. එමෙන්ම උන්වහන්සේ ලෝකය දකින ආකාරය පැහැදිලි කරන ස්වාභාවික නිදර්ශනයක් ද සපයයි. සතරවන හා පස්වන පරිච්ඡේද, දේව වචනය පැරණි හා නව ගිවිසුමෙන් ඉදිරිපත් කර ඇති ආකාරයට, මෙම අධ්‍යයනය තව දුරටත් ඉදිරියට ගෙන යයි.

### ප්‍රධාන යතුරක්

බයිබලය, පොත් 66 කින් සමන්විත වේ. බයිබලයේ සෑම පොතකම "ප්‍රධාන" පදයක් ඇත. එය "යතුරක්" මෙනි. අප එයට යතුරු පදයක් යයි කියන්නේ එය ස්වභාවික ලෝකයේ යතුරක් ලෙස ක්‍රියා කරන බැවිනි. මන්ද යතුරක් දොරක් විවෘත කරන ආකාරයට මෙම පදය, බයිබලයේ යම් පොතක අන්තර්ගතය හා තේමාව අවබෝධ කර ගැනිම සඳහා දොරක් විවෘත කරයි.

බයිබලය සමස්තයක් වශයෙන් ගත් කල එයට ප්‍රධාන යතුරක් ඇත. එය සම්පූර්න දේව වචනයේ අදහස විවෘත කරන්නාවු විශේෂ පාඨයකි. මෙම ප්‍රධාන යතුර මුළු බයිබලයේම අන්තර්ගතය හා තේමාව අවබෝධ කර ගැනිමට ඉඩ සලසයි. දෙවියන්වහන්සේ ලෝකය දකින ආකාරයට අපට ද ලෝකය දැකිමට එය හැකියාව ලබා දෙයි. බයිබලය සඳහා වන ප්‍රධාන යතුර මෙසේය:

> **"එවිට උන්වහන්සේ ඔවුන්ට ලියවිලි වැටහෙන පිණිස ඔවුන්ගේ සිත් පහදවා, ඔවුන්ට කියන සේක්: මෙසේ ක්‍රිස්තුස්වහන්සේ වධ විඳින්ටත් තුන්වෙනිදා මළවුන්ගෙන් නැගිටින්ටත් යෙරුසලමේ පටන් සියලු ජාතීන්ට පසුතැවිල්ල සහ පව් කමාවද උන්වහන්සේගේ නාමයෙන් ප්‍රකාශ කරනු ලබන්ටත් යුතුයයි ලියා තිබේ" (ලූක් 24:45-47).**

මෙම වචන දෙස බලන්න: "එවිට උන්වහන්සේ ඔවුන්ට ලියවිලි වැටහෙන පිණිස ඔවුන්ගේ සිත් පහදවා කතා කොට ...". මින් අදහස් වන්නේ ජේසුස් ක්‍රිස්තුස්වහන්සේ තම ශ්‍රාවකයන්ට ප්‍රධාන යතුරක් දුන් බවය. දෙවියන්වහන්සේගේ සියලු වචන වටහා ගැනීමට ඔවුන්ට උපකාරී වන මූලික කරුණු දෙකකි. මෙම කරුණු දෙක ඔබට නොවැටහුණාහොත් ඔබට දේව වචනය සත්‍ය ලෙස නොවැටහෙනු ඇත.

ප්‍රධාන පද මෙසේ වේ :

**පළමුවැන්න "ක්‍රිස්තුස්වහන්සේ වධ විඳින්ටත් .... මළවුන්ගෙන් නැගිටින්ටත් ....යුතුමය."**

ජේසුස්වහන්සේ වධ විඳින්ට "යුතුමය." ධර්මිෂ්ඨ දෙවි කෙනෙකු සමඟ පාපී මිනිසා සමාදාන කිරීමට උන්වහන්සේ දුක් විඳීම අත්‍යවශ්‍ය බව මින් අදහස් කෙරේ. මෙය මුළු බයිබලයම පසුපස ඇති ප්‍රධාන සත්‍යයකි.

පාපයේ මිලය වන්නේ ශාරීරික, ආත්මික හා සදාතනික මරණය බව දෙවියන්වහන්සේ පැවසූ සේක.

> **"එහෙත් යහපත හා නපුර දැනගැනීමේ ගහෙන් කන්ට එපාය. මක්නිසාද එයින් කෑ දවසෙහි ඒකාන්තයෙන් නුඹ නසින්නෙහියයි කී සේක" (උත්පත්ති 2:17).**
>
> **"මක්නිසාද පාපයේ කුලී නම් මරණයය, නුමුත් දෙවියන්වහන්සේගේ දීමනාව නම්, අපගේ ස්වාමි වූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ තුළ සදාකාල ජීවනයය." (රෝම 6:23)**

ජේසුස් ක්‍රිස්තුස්වහන්සේ මාංශවත්ව, පාපී මිනිස් වර්ගයා වෙනුවෙන් මිය යෑම සඳහා ලෝකයට වැඩි සේක.

> **"මක්නිසාද එක මනුෂ්‍යයාගේ අකීකරුකම කරණකොටගෙන බොහෝදෙනා පව්කාරයන් කරනු ලැබුවා සේම එක්කෙනාගේ කීකරුකම කරණකොටගෙන බොහෝදෙනා ධර්මිෂ්ඨකරනු ලබන්නෝය" (රෝම 5:19).**
>
> **"මක්නිසාද දෙවියන්වහන්සේ ස්වකීය ඒකජාතක පුත්‍රයාණන් දෙන තරම් ලෝකයාට ප්‍රේම කළ සේක. එසේ කළේ උන්වහන්සේ කෙරෙහි අදහිගන්න සැමදෙනම විනාශ නොවී සදාකාල ජීවනය ලබන පිණිසය" (යොහන් 3:16).**

දෙවියන්වහන්සේ ලෝකයා දෙස බලනවිට උන්වහන්සේ දකින්නේ ගැළවුම්කරුවකු අවශ්‍ය පාපී මනුෂ්‍ය වර්ගයා වේ.

> **"මක්නිසාද සියල්ලෝම පව්කොට දෙවියන්වහන්සේගේ මහිමයෙන් හීනව සිටිති"**
> **(රෝම 3:23).**

ජේසුස්වහන්සේ තුළ ඇදහිල්ලෙන් හා පාපය ගැන පසුතැවිලිවීම තුළින් මිනිසා, දෙවියන්වහන්සේ සමඟ සමාදාන කළ හැකි අතර සදාතන ජීවිතයේ ත්‍යාගය ලබා ගත හැකිය.

**දෙවැන්න : පසුතැවී සිත් හරවා ගැනීමද පව් කමාවද ...ප්‍රකාශ කරනු ලබන්ටත් යුතුයයි ලියා තිබේ".**

ශුද්ධ ලියවිල්ල සඳහා වන ප්‍රධාන යතුරේ දෙවන කොටස වන්නේ පසුතැවීම හා පව් කමාව උන්වහන්සේගේ නාමයෙන් සියලු ජාතීන්ට දේශනා කළ යුතු බවය. මින් අදහස් වන්නේ ඇදහිලිවතුන්ට වැදගත් වගකීමක් ඇති බවය.

> **"නුඹ සැබවින් නසින්නෙහියයි මා විසින් දුෂ්ටයාට කියන කල, නුඹ ඔහුට අවවාද නොකරන්නෙහි නම්, දුෂ්ටයා ජීවත්වෙන පිණිස තමාගේ දුෂ්ට මාර්ගයෙන් හැරෙන ලෙස ඔහුට අවවාදකිරීමට ඔහුට කථා නොකරන්නෙහි නම්, දුෂ්ටවූ ඔහු තමාගේ අයුතුකමෙහි නසිනවා ඇත. එහෙත් ඔහුගේ ලේ නුඹ අතින් අයකරන්නෙමි. නුමුත් නුඹ දුෂ්ටයාට අවවාදකළාම ඔහු තමාගේ දුෂ්ටකමෙන්ද තමාගේ දුෂ්ට මාර්ගයෙන් ද නොහැරෙන්නේ නම්, ඔහු තමාගේ අයුතුකමෙහි නසිනවා ඇත. නුමුත් නුඹ නුඹේ ප්‍රාණය ගළවාගත්තෙහිය" (එසකියෙල් 3:18-19).**

ජේසුස්වහන්සේ සියලු මනුෂ්‍ය වර්ගයා වෙනුවෙන් මිය ගියද සියලු දෙනා නිරායාසයෙන්ම පාපයෙන් ගැළවීම ලබන්නේ නැත. සෑම කෙනෙකුටම නිදහස් කැමැත්තක් ඇති අතර තමා පශ්චාත්තාපවී (පාපයෙන් හැරී) ගැළවුම්කරු ලෙස ජේසුස්වහන්සේ පිළිගන්නේද නැද්දැයි තීරණය කළ යුතුය. ජේසුස්වහන්සේ අදහා ගෙන පාපයට කමාව ලැබීම සඳහා මිනිසුන් පළමුව උන්වහන්සේ ගැන දැනගත යුතු වේ.

> **"මක්නිසාද ස්වාමින්වහන්සේගේ නාමයට යාච්ඤා කරන කවුරු නුමුත් ගළවනු ලබන්නේය. එසේ නම් ඔවුන් තමුන් විසින් අදහා නොගත්තාවූ කෙනෙකුට යාච්ඤා කරන්නේ කොහොමද? තමන් නොඇසුවාවූ කෙනෙකු කෙරෙහි අදහන්නේ කොහොමද? දේශනා කරන්නෙක් නැතුව ඔවුන් අසන්නේ කොහොමද?" (රෝම 10:13,14)**

පසුතැවීම හා පාපයට කමාව ලැබීම ගැන දේශනා කිරීම ඉවැන්ජලිස්ත සේවය හෙවත් ශුභාරංචිය පැතිරීම ලෙස හැඳින් වේ. ලෝකයාට ශුභාරංචිය පැතිරීම මළවුන්ගෙන් උත්ථාන වූ පසු ජේසුස්වහන්සේ නිරන්තරයෙන්ම තම අනුගාමිකයන් සමඟ සාකච්ඡා කළ දෙයකි (ජොහන් 20:21, 21:15-17, මතෙව් 28:18-20, මාර්ක් 16:15, ලූක් 24:44-48 බලන්න.). ඔබ අවසාන වරට යම්කිසි කෙනෙකු සමඟ සාකච්ඡා කරන විට සාමාන්‍යයෙන් වඩාත් වැදගත් දේ සාකච්ඡා කිරීමට පෙලඹේ. ස්වර්ගයට නැගීමට පෙර ශුභාරංචිය පැතිරීම පිළිබඳව ජේසුස්වහන්සේගේ අවසාන වචන මෙසේය:

> **"නුමුත් ශුද්ධාත්මයාණන්වහන්සේ නුඹලා කෙරෙහි පැමිණි කල නුඹලා බලය ලබන්නහුය. එවිට නුඹලා යෙරුසලමෙහිද මුළු යුදයෙහිද සමාරියෙහිද පොළොවේ සීමාව දක්වාද මාගේ සාක්ෂිකාරයෝ වන්නහුයයි කී සේක" (ක්‍රියා 1:8)**

## දෙවියන්වහන්සේ ලෝකය දකින ආකාරය

දෙවියන්වහන්සේ ලෝකය දකින ආකාරය බයිබලයේ ප්‍රධාන යතුරෙන් අපි ඉගෙන ගත්තෙමු. උන්වහන්සේ ලෝකය දෙස බලන්නේ දේශපාලනික සීමාවන්, රජයන් හෝ සංස්කෘතීන් අනුව නොවේ. උන්වහන්සේ දකින්නේ ජේසුස් ක්‍රිස්තුස්වහන්සේ තුළින් තමන්වහන්සේ සමඟ සමාදාන විය යුතු පාපී සෙනඟ වේ. උන්වහන්සේ ඉවැන්ජලිස්ත කිරීමට අවශ්‍ය ලෝකයක් දකින සේක.

දෙවියන්වහන්සේ ලෝකය දකින්නේ දිව්‍යමය පරමාර්ථයක් සිතැතිව වේ. එය කාලයාගේ ආරම්භයට පෙර උන්වහන්සේ පිහිටවූ ලෝකයා වෙනුවෙන් ඇති පරමාර්ථයක් හා සැලැස්මක් වේ.

> **"එසේ කළේ කාලවල සම්පූර්ණකමේ නියමය ලෙස ස්වර්ගයෙහි දේවල්ද පොළොවෙහි දේවල්ද යන සියල්ල ක්‍රිස්තුස්වහන්සේ තුළ එක්රාශි කරන්ට තමන්වහන්සේ තුළ අදහස් කළ තමන්ගේ ප්‍රසන්නකමේ හැටියට තමන්ගේ කැමැත්තේ රහස අපට පෙන්වා දීමෙන්ය" (එපීස 1:9-10).**

> **"ස්වර්ගීය ස්ථානවල අධිපතීන්ටත් බලධාරීන්ටත් මේ කාලයෙහි සභාව කරණකොටගෙන උන්වහන්සේගේ අනේකවිධ ප්‍රඥාව දැනගන්ට ලැබෙන පිණිසය" (එපීස 3:11)**

දෙවියන්වහන්සේගේ සදාතනික පරමාර්ථය වන්නේ ජේසුස් ක්‍රිස්තුස්වහන්සේ තුළින් උන්වහන්සේ වෙතට සියලු පාපී සෙනඟ එක්රැස් කර ගැනීම වේ. උන්වහන්සේගේ ලිඛිත වචනය තුළින් වසර ගණනාවක් අබිරහසක්ව තිබූ මෙම පරමාර්ථය අපට එළිදරව් කර ඇත.

## දෙවියන්වහන්සේ ලෝකය දකින ආකාරය පිළිබඳ ස්වාභාවික පැහැදිලි කිරීමක්

බයිබලයේ ආත්මික සත්‍යයන් පැහැදිලි කිරීම සඳහා දෙවියන්වහන්සේ බොහෝ විට ස්වාභාවික නිදර්ශන භාවිත කරන සේක. ස්වාභාවික දේ අපට දැකීමට, ඇසීමට, රස බැලීමට, සුවඳ බැලීමට හෝ ස්පර්ශ කිරීමට හැකි දේ වේ. ආත්මික දේ නිරීක්ෂණය කළ හැක්කේ ආත්මික

ඉන්ද්‍රියයන්ගෙන් පමණි. එබැවින් අපට හුරු පුරුදු නැති ආත්මික සත්‍යයක් ඉගැන්වීම සඳහා දෙවියන්වහන්සේ අපට හුරු පුරුදු ස්වාභාවික සත්‍යයක් භාවිත කරන සේක.
දෙවියන්වහන්සේ ලෝකය දකින ආකාරය පැහැදිලි කිරීමට බයිබලයේ ස්වාභාවික නිදර්ශනයක් තිබේ. ජේසුස්වහන්සේ තම ශ්‍රාවකයන්ට මෙසේ කී සේක :

> **"තව සාරමසක් ගිය කල ගොයම් කපන කාලය පැමිණෙන්නේ යයි නුඹලා කියනවා නොවේද? මම නුඹලාට කියමි නුඹලාගේ ඇස් ඔසවා කුඹුරු දෙසට යොමා, ගොයම් දැනටම කැපීමට පැහී තිබෙන බව බලන්න" (යොහන් 4:35)**

ජේසුස්වහන්සේ කතා කළේ ඒ මොහොතේ ඔවුන් ඉදිරියේ පැතිරී තිබූ කෙත්වතුවල ස්වාභාවික අස්වැන්න පිළිබඳව නොවේ. උන්වහන්සේ කතා කළේ ආත්මික අස්වැන්නක් ගැනය. ජේසුස්වහන්සේ ස්වාභාවික අස්වැන්න පිළිබඳ නිදර්ශනය තම අනුගාමිකයන්ට ලෝකය පිළිබඳ ආත්මික දර්ශනයක් දීම සඳහා භාවිත කළ සේක.

තවත් අවස්ථාවක ජේසුස්වහන්සේ පැහැදිලිවම :

> **කෙත නම් ලෝකය..... (මතෙව් 13:38)** යයි පැවසූ සේක.

අප්‍රිකාව, ආසියාව, ඕස්ට්‍රේලියාව, උතුරු ඇමෙරිකාව, දකුණු ඇමෙරිකාව, මුහුදේ ඇති දූපත්, මේ සියල්ල දෙවියන්වහන්සේ අස්වැන්න සහිත කෙත්වතු ලෙස දකින සේක. දෙවියන්වහන්සේ ලෝකයේ අස්වැන්න සහිත කෙත්වතු දෙස බලන විට උන්වහන්සේ මහත් අවශ්‍යතාවයක්ද දකින සේක.

> **... අස්වැන්න බහුලය, ගොවිහු විරලය (මතෙව් 9:37)** යි පැවසූ සේක.

නෙළා ගැනීමට සූදානම් මහා ආත්මික අස්වැන්නක් දෙවියන්වහන්සේ දකින සේක. එහෙත් ගොවීන් ඇත්තේ ස්වල්ප දෙනෙකි. ගොවීන් විශාල සංඛ්‍යාවක් අවශ්‍ය බව ඔබ මෙම පාඩමාලාව අවසානයේ තවදුරටත් ඉගෙන ගන්නෙහිය.

## ස්වයං පරීක්ෂණය

1. ප්‍රධාන පදය මතකයෙන් ලියන්න.

2. බයිබලයේ කිනම් යොමුවක් බයිබලයේ ප්‍රධාන යතුර වන්නේද?

3. බයිබලයේ ප්‍රධාන යතුරේ ඉදිරිපත් කර ඇති මූලික කරුණු දෙක පැහැදිලි කරන්න.

4. ලෝකය වෙනුවෙන් දෙවියන්වහන්සේගේ පරමාර්ථය පැහැදිලි කෙරෙන ශුද්ධ ලියවිලි යොමුවක් දෙන්න

5. මෙම පදවලින් පැහැදිලි කෙරෙන පරිදි ලෝකය වෙනුවෙන් දෙවියන්වහන්සේගේ පරමාර්ථය කුමක්ද?

6. දෙවියන්වහන්සේ ලෝකය දකින ආකාරය පැහැදිලි කිරීමට ශුද්ධ ලියවිල්ලේ දී ඇති ස්වාභාවික නිදර්ශනය කුමක්ද?

(පරීක්ෂණ සඳහා පිළිතුරු මෙම අත්පොතේ අවසාන පරිච්ඡේදය අවසානයේ ඇත.)

## තවදුරටත් අධ්‍යයනය සඳහා

මහා ආත්මික සත්‍යයක් පැහැදිලි කිරීම සඳහා ජේසුස්වහන්සේ අස්වැන්න පිළිබඳ ස්වාභාවික නිදර්ශනයක් භාවිත කළ ආකාරය අපි මෙම පාඩමෙන් උගත්තෙමු. මේ විෂයය පිළිබඳව තව දුරටත් අධ්‍යයනය කිරීම සඳහා පහත දැක්වෙන යොමුවන් භාවිත කරන්න. අස්වැන්න පිළිබඳව සෑම පාඨයකින්ම උගන්වන දේ සාරාංශ කරන්න.

මතෙව් 9:37-38

---

මතෙව් 13:3-39,

---

මාර්ක් 4:3-32,

---

ලූක් 8:5-15, 10:2,

---

ජොහන් 4:35, 12:24,

---

1 කොරින්ති 3:6-8,

---

2 කොරින්ති 9:6,

---

ගලාති 6:7-8

---

# හතරවන පරිච්ඡේදය

## දේව වචනයේ ඇති ලෝකය : පැරණි ගිවිසුම

**අරමුණු :**

මෙම පරිච්ඡේදය අධ්‍යයනයෙන් පසු ඔබට

- ❖ ප්‍රධාන පදය මතකයෙන් ලිවීමට
- ❖ දේව වචනයේ ප්‍රධාන පණිවුඩය හඳුනා ගැනීමට
- ❖ පැරණි ගිවිසුමේ ව්‍යවස්ථාවේ දක්වා ඇති බයිබලීය ලෝක දැක්ම සාරාංශ කිරීමට
- ❖ පැරණි ගිවිසුමේ ඉතිහාසයේ දක්වා ඇති බයිබලීය ලෝක දැක්ම සාරාංශ කිරීමට
- ❖ පැරණි ගිවිසුමේ කාව්‍යවල දක්වා ඇති බයිබලීය ලෝක දැක්ම සාරාංශ කිරීමට
- ❖ පැරණි ගිවිසුමේ අනාවැකිවල දක්වා ඇති බයිබලීය ලෝක දැක්ම සාරාංශ කිරීමට

හැකිවනු ඇත.

ප්‍රධාන පදය

**මක්නිසාද ඉර උදාවන තැන් පටන් බස්නා තැන දක්වා මාගේ නාමය ජාතීන් අතරේ උතුම්ය. සියලුම ස්ථානවල සුවඳ දුම්ද, පිරිසිදු පූජාවක්ද, මාගේ නාමයට ඔප්පු කරනු ලබන්නේය. එසේය, මාගේ නාමය ජාතීන් අතරේ උතුම්යයි සේනාවල ස්වාමීන්වහන්සේ කියන සේක. (මලාකී 1:11)**

### හැඳින්වීම

මෙම පරිච්ඡේදය හා පස්වන පරිච්ඡේදය දේව වචනයේ තෝරාගත් කොටස් අධ්‍යයනය කිරීම මගින් තවදුරටත් බයිබලීය ලෝක දැක්ම ඉදිරිපත් කරනු ඇත. ඔබ දැනටමත් දෙවියන්වහන්සේ ලෝකය මැවූ ආකාරය, මනුෂ්‍ය වර්ගයා පාපයට වැටීම හා ලෝකය විවිධ ජාතීන්ට හා භාෂාවන්ට බෙදුනු ආකාරය ඉගෙන ගෙන ඇත. මෙම පරිච්ඡේදයෙන් ඔබ තව දුරටත් ඉගෙන ගන්නේ ලෝකය පිළිබඳ පැරණි ගිවිසුම එළිදරව් කරන දේ වේ. ඊළඟ පරිච්ඡේදයෙන් අවධාරණය කෙරෙන්නේ නව ගිවිසුමේ මේ විෂය පිළිබඳව ඇති දේ වේ.

බොහෝ ඇදහිලිවන්තයෝ ලෝකයා උදෙසා ඇති දෙවියන්වහන්සේගේ සදාතනික සැලැස්ම පිළිබඳව නොදනිති. දෙවියන්වහන්සේ මෙසේ පැවසූ සේක : "මා ගැන දැනුමක් නැති බැවින් මාගේ සෙනඟ විනාශ වී යති...." (හොෂෙයා 4 : 6). දෙවියන්වහන්සේ මේ කතා කරන්නේ යම් කෙනෙක් පාසලකට ගොස් ලබා ගන්නා දැනුම ගැන නොවේ. උන්වහන්සේ කතා කරන්නේ පොළොවේදී දෙවියන්වහන්සේගේ සැලැස්ම අවබෝධ කර ගැනීමට හා ඊට සහභාගි වීමට උපකාර කෙරෙන ආත්මික දැනුම පිළිබඳවය.

### එක් පණිවුඩයක් සහිත පොතක්

බයිබලය යනු දෙවියන්වහන්සේ පිළිබඳ මිනිසුන්ගේ අදහස් ඇතුලත් පොතක් නොවේ. එය මනුෂ්‍ය වර්ගයා සඳහා වන දෙවියන්වහන්සේගේ සැලැස්ම හා පරමාර්ථය සන්නිවේදනය කෙරෙන උන්වහන්සේගේ පණිවුඩයකි. බයිබලයේ දෙවියන්වහන්සේගේ සෙනඟ පිළිබඳ කතාන්දර ඇතුළත්ය. මොවුහු ලෝකයාට තම එළිදරව් වීම ගෙන යෑම සඳහා දෙවියන්වහන්සේ විසින් වෙන් කරන ලද අය වෙති.

බයිබලයේ බොහෝ පොරොන්දු, අනාවැකි හා සැනසීමේ හා පෙලඹවීමේ පද අන්තර්ගත වේ. එහෙත් ආරම්භයේ සිට අවසානය දක්වා මුළු බයිබලයේම ඇත්තේ එක් ප්‍රධාන පණිවුඩයකි. එය

පාපී මිනිසාගේ ගැළවීම උදෙසා දෙවියන්වහන්සේගේ සැලැස්ම හා සැලකිල්ල පිළිබඳ පණිවුඩය වේ.
ආරම්භයේ සිටම දෙවියන්වහන්සේගේ පරමාර්ථය වන්නේ :

> **එසේ කළේ කාලවල සම්පූර්ණකමේ නියමය ලෙස ස්වර්ගයෙහි දේවල්ද පොළොවෙහි දේවල්ද යන සියල්ල ක්‍රිස්තුස්වහන්සේ තුළ එක්රාශි කරන්ට, ... (එපීස 1:9).**

කාලයාගේ ආරම්භයේ සිටම ලෝකයේ ජාතීන් වෙනුවෙන් දෙවියන්වහන්සේගේ පරමාර්ථය වූයේ ජේසුස් ක්‍රිස්තුස්වහන්සේ තුළින් සාක්ෂාත් කරන ලද පාපී මිනිසා උදෙසා ගැළවීම වේ.

## පැරණි ගිවිසුම

ප්‍රධාන කොටස් හතරකට බෙදූ පොත් 39ක් පැරණි ගිවිසුමේ ඇතුලත් වේ.

| | |
|---|---|
| ව්‍යවස්ථාව | උත්පත්ති සිට ද්විතිය කථාව දක්වා |
| ඉතිහාසය | ජෝෂුවා සිට එස්තර් දක්වා |
| කාව්‍ය | ජෝබ් සිට සාලමොන්ගේ ගී දක්වා |
| අනාවැකි | යෙසායා සිට මලාකී දක්වා |

ලෝකයා සඳහා වූ දෙවියන්වහන්සේගේ සැලැස්ම පිළිබඳව පැරණි ගිවිසුමේ මෙම කොටස් හතර එළිදරව් කරන දෙයෙහි සාරාංශයක් පහත දැක්වේ.

## ව්‍යවස්ථා පිළිබඳ පොත්

### උත්පත්ති සිට ද්විතිය කතාව දක්වා

උත්පත්ති සිට ද්විතිය කතාව දක්වා වූ පොත් ව්‍යවස්ථා පොත් ලෙස හැඳින්වේ. ඊට හේතුව ඒවායේ දෙවියන්වහන්සේ මිනිසාට දෙන ලද පළමු ආඥා හා මේ නීතිවලට මිනිසා දැක්වූ ප්‍රතිචාර වාර්තා කර ඇති බැවිනි.

### ආරම්භය:

"උත්පත්ති" යන්නෙහි තේරුම ආරම්භය වේ. බයිබලයේ පළමුවැනි පොතේ සඳහන් වන්නේ ලෝකයේ, මිනිසාගේ, ජාතීන්ගේ, පාපයේ ආරම්භය හා ගැළවීම උදෙසා දෙවියන්වහන්සේගේ සැලැස්ම වේ.

ඔබ උගත් පරිදි මිනිසා දෙවියන්වහන්සේගේ ස්වරූපයෙන් දෙවියන්වහන්සේගේ ආත්මික හා සදාචාරාත්මක සමානතාවන් ඇතිව මවන ලදි. මිනිසා බෝවන විට සෑම අලුත් කෙනෙක්ම දෙවියන්වහන්සේගේ සැලැස්මේ කොටසක් සාක්ෂාත් කළ යුතු විය. එහෙත් ඔහු පව් කළ විට මිනිසා දෙවියන්වහන්සේගේ සදාචාරාත්මක හා ආත්මික සමානතාවෙන් වැටුණි. ලෝකයා සඳහා දෙවියන්වහන්සේගේ සැලැස්ම පළමුවෙන් එළිදරව් කෙරෙන්නේ උත්පත්ති 3:15 හිය.

> **මම තා සහ ස්ත්‍රිය අතරෙහිද, තාගේ වංශය සහ ඇගේ වංශය අතරෙහිද සතුරුකම තබන්නෙමි. ඒ වංශය තාගේ හිස පොඩි කරන්නේය. තෝ ඔහුගේ විලුඹ පොඩි කරන්නෙහිය යයි කී සේක. (උත්පත්ති 3:15)**

මෙම පොරොන්දුව සංකේතාත්මක භාෂාවෙන් දෙනු ලැබීය. "ස්ත්‍රියගේ (බීජය) වංශය" ජේසුස්වහන්සේ වේ. උන්වහන්සේ මනුෂ්‍යයාගේ පාපයට හේතු වූ සර්පයාගේ (සාතන්ගේ) හිස පොඩි කරනු ඇත. මනුෂ්‍ය වර්ගයාගේ පාපය වෙනුවෙන් මිය යෑමෙන් හා මිනිසා දෙවියන්වහන්සේට සමාදානය කිරීමෙන් යේසුස්වහන්සේ මේ දෙය කරන සේක.

මෙම පදයෙන් කරුණු හයක් එළිදරව් වේ.

1. ගැළවීමේ උල්පත දෙවියන්වහන්සේ වේ. ("මම ")
2. සාතන් සතුරෙකි. (මිනිසාගේ "වංශය" හා සාතන් අතර "වෛරය" තබන්නෙමි.)
3. ගැළවුම්කාරයාණන් පැමිණෙන්නේ මිනිසා සමඟ සුවිශේෂී සබඳතාවක් ඇතිවය. උන්වහන්සේ මනුෂ්‍ය ආකාරයෙන් ("ඇගේ වංශය") දේව පුත්‍රයා වන සේක.
4. ගැළවුම්කාරයාණෝ දුක් විඳින සේක. ("තෝ ද ඔහුගේ විලුඹ දෂ්ට කරන්නෙහිය.")
5. සතුරාගේ පරාජය දෙවියන්වහන්සේ විසින් ගෙන එන සේක. ("ඔහු තාගේ හිස පොඩි කරන්නේය.")
6. ගැළවීම සියලු මනුෂ්‍ය වර්ගයා වෙනුවෙනි. ("සියලු වංශයන්") සෑම පරම්පරාවකම පැවත එන්නන් වෙනුවෙනි.

මිනිසාගේ වැටීමෙන් පසුව පැමිණි පාපයේ පැතිරීම (උත්පත්ති 6) ගැන පෙර පාඩමෙන් අප ඉගෙන ගතිමු. පොළොවේ පිරී පැවති මහා දුෂ්ටකම නිසා දෙවියන්වහන්සේ ලොව පුරා ජල ගැල්මක් එවූ සේක. එහෙත් උන්වහන්සේ ගැළවීම උදෙසා ද විශේෂ සැලැස්මක් සැපයූ සේක (උත්පත්ති 8-9).

නෝවා හා ඔහුගේ පවුලේ අය ගලවා ගනු ලැබූ නැව ජේසුස්වහන්සේ තුළින් ලැබෙන ගැළවීමේ සංකේතයක් හෝ ක්‍රමයක් හෝ වේ. පාපය සඳහා වන දෙවියන්වහන්සේගේ විනිශ්චයෙන් මිනිසාට රැකවරණය ලබා ගත හැකි ආත්මික "නැව" ජේසුස්වහන්සේ වේ. නෝවා හා ජල ගැල්ම පිළිබඳ කතාවෙන් (උත්පත්ති 6-9) එළිදරව් වන්නේ දෙවියන්වහන්සේ ලෝකය පාපී දෙයක් ලෙස හා විනිශ්චය අවශ්‍ය දෙයක් ලෙස දුටුව ද උන්වහන්සේ ලෝකයා දෙස කරුණාවෙන් බලන සේක යන්නයි. පාපයේ දඬුවමෙන් බේරීම සඳහා උන්වහන්සේ සෑම විටම මාර්ගයක් සැපයූ සේක.

පැරණි ගිවිසුම මුළුල්ලේම මෙම රටාව නැවත නැවත තිබේ. මිනිසා පව් කරන අතර දෙවියන්වහන්සේ පාපය උදෙසා විනිශ්චයක් එවන සේක. එහෙත් කරුණාවෙන් යුක්තව ගැළවීමට මාර්ගයක් ද දෙන සේක.

## විශේෂ ජාතියක්

බාබෙල්හි ඇති වූ දෙවියන්වහන්සේට විරුද්ධ කැරැල්ල නිසා භාෂාවන්වලට බෙදීමත් ඉන්පසු ජාතීන් ඇතිවීමත් ගැන ඔබ උගත්තෙහිය. බෙදුනු මේ ලෝක ජාතීන් අතුරෙන් දෙවියන්වහන්සේ එක් ජාතියක් එනම් ඉශ්‍රායෙල් විශේෂ පරමාර්ථයක් සඳහා තෝරා ගත් සේක.

මුළු ජාතියම ආබ්‍රහම් නම් එක් මිනිසෙකුගෙන් පැවත එන්නකි. ආබ්‍රහම් ගැන ද දෙවියන්වහන්සේ ඔහුට දුන් පොරොන්දු ගැන ද ඒවා සාක්ෂාත් වීම පිළිබඳව ද ඔබට උත්පත්ති 11:27 - 25:34 දක්වා කියවිය හැකිය. ඉශ්‍රායෙල් ජාතියේ පියාණන් (නායකයා) වීමට ආබ්‍රහම් තෝරා ගනු ලැබීය. දෙවියන්වහන්සේ ඔහු තෝරා ගත්තේ විශේෂ පරමාර්ථයක් සඳහා වේ.

> **මම නුඹ මහත් ජාතියක් කරන්නෙමි. නුඹට ආශීර්වාද කොට නුඹේ නාමය කීර්තිමත් කරන්නෙමි. නුඹද ආශීර්වාදයක් වෙයන්න. තවද නුඹට ආශීර්වාද කරන්නන්ට මම ආශීර්වාද කරන්නෙමි. නුඹට ශාප කරන්නාට මම ශාප කරන්නෙමි. පොළොවේ සියලු පවුල් නුඹ කරණකොටගෙන ආශීර්වාද ලබන්නෝයයි කී සේක. (උත්පත්ති 12:2-3)**
>
> **මාගේ ශබ්දයට නුඹ කීකරු වූ නිසා නුඹේ වංශය කරණකොටගෙන පොළොවේ සියලු ජාතිහු ආශීර්වාද ලබන්නෝය කියා මා ගැනම දිවුළෙමියි ස්වාමීන්වහන්සේ කියන සේකැයි කීයේය. උත්පත්ති 22:18 (උත්පත්ති 26:4 හා 28:14 ද බලන්න.)**

ආබ්‍රහම්ගෙන් ඉශ්‍රායෙල් ජාතිය බිහි වන්නේය. සැබෑ දෙවියන්වහන්සේ දැන ගැනීමෙන් ඉශ්රායෙලය තුළින් ලෝකයේ සියලු ජාතීන් ආශීර්වාද ලබනු ඇත. පොළොවේ පවුල්වලට ද ආශීර්වාද ලැබෙන්නේය. "පවුල" යන්නෙන් අදහස් වන්නේ ජාතියක් සමන්විත වන විවිධ ගෝත්‍ර හා සෙනඟ කණ්ඩායම් වේ.

ඉශ්‍රායෙල් ජාතිය තෝරා ගනු ලැබුවේ විශේෂ වරප්‍රසාද නිසා හෝ ඔවුන් අනෙකුත් සියලු ජාතීන්ට වඩා යහපත් නිසා හෝ නොවේ. ඔවුන් තෝරා ගනු ලැබුවේ විශේෂ පරමාර්ථයක් ඇතිවය. මෙම

ජාතිය බහුතරයකට සේවය කිරීම සඳහා කැඳවනු ලැබූ සුළුතරයකි. දෙවියන්වහන්සේ ලෝකයාට තමන්ව එළිදරව් කෙරෙන ජාතිය ලෙස ඉශ්රායෙලය තෝරා ගත් සේක. ගැළවුම්කාරයාණන්වන ජේසුස් ක්‍රිස්තුස්වහන්සේ පැමිණෙන්නේ ද ඉශ්‍රායෙල් ජාතියෙනි (මතෙව් 2:2, ජොහන් 4:22). දෙවියන්වහන්සේ තම ලිඛිත වචනය ලෝකයාට කතා කළේ ද මෙම ජාතිය තුළිනි (ගීතාවලිය 147:19, රෝම 3:1,2, 9:4).

ජාතීන් වෙත දෙවියන්වහන්සේ ගැන සාක්ෂි දරන්නෝ ද ඉශ්‍රායෙල් ජාතිය විය යුතුවේ.

> **සියලු ජාතිහු එකට රැස්වෙත්වා. ජනයෝද එකතු වෙත්වා. ඔවුන්ගෙන් කවුරු මෙය දන්වා පළමු දේවල් අපට ප්‍රකාශ කරනවා ඇද්ද? ඔවුහු තමුන්ගේ සාක්ෂිකාරයන් ගෙනැවිත් තමුන් ධර්මිෂ්ඨ බව පෙන්වත්වා. නැත්නම් ඔවුහු අසා: ඒක සැබෑයයි කියත්වා. මම ඒ තැනැන්වහන්සේ බව නුඹලා දැනගෙන මා විශ්වාසකර තේරුම් ගන්න පිණිස නුඹලා මාගේ සාක්ෂිකාරයෝව මා විසින් තෝරාගත් මාගේ මෙහෙකරුවාව සිටින්නහුයයි ස්වාමින්වහන්සේ කියන සේක. මා සිටින්ට පළමුවෙන් කිසි දෙවි කෙනෙක් සාදනු ලැබුවේ නැත. මට පසුව සිටින්නෙත් නැත. මම මමම ස්වාමින්වහන්සේය. මා ඇර වෙන ගැළවුම්කාරයෙක් නැත. මමම දැන්වීමි. මමම ගැළවීමි. මමම ප්‍රකාශ කළෙමි. අන් දෙවි කෙනෙක් නුඹලා අතරේ සිටියේ නැත. එබැවින් නුඹලා මාගේ සාක්ෂිකාරයෝය. මම දෙවියන්වහන්සේයයි ස්වාමින්වහන්සේ කියන සේක. (යෙසායා 43:9-12)**

දෙවියන්වහන්සේ ගිවිසුම ලෙස හැඳින්වෙන ජීවමාන සබඳතාවක් ඉශ්රායෙලය සමඟ ඇති කරගත් සේක. මෙම ගිවිසුම උන්වහන්සේ ඔවුන්ගේ දෙවිඳුන් බවටත් ඔවුන් උන්වහන්සේගේ සෙනඟ බවටත් වන පොරොන්දුවකි. පැරණි ගිවිසුමේ දෙවියන්වහන්සේගේ ගිවිසුම තිබුණේ ඉශ්‍රායෙල්වරුන් සමඟය.

> **නුඹලා මාගේ සෙනඟ කොට පිළිගෙන නුඹලාට දෙවිකෙනෙක් වන්නෙමි. මෙසේ මම මිසරවරුන්ගේ බරවලින් නුඹලා පිටතට ගෙනෙන නුඹලාගේ දෙවිවූ යෙහෝවඃවහන්සේ බව නුඹලා දැන ගන්නහුය. (නික්මයාම 6:7)**

නව ගිවිසුමේ දෙවියන්වහන්සේ සියලු ඇදහිලිවතුන් සමඟ නව ගිවිසුමක් පිහිටෙවූ සේක.

> **එලෙසම රාත්‍රී කෑමෙන් පසු කුසලානත් දී: මේ කුසලාන මාගේ ලෙයින් පිහිටුවන අලුත් ගිවිසුමය යම් පමණ වර නුඹලා මෙයින් බොන්නහු ද එපමණ වර මා සිහිකිරීම පිණිස මේක කරන්නැයි කී සේක. (1 කොරින්ති 11:25)**

## ආබ්‍රහම්ගේ උරුමක්කාරයෝ

නව ගිවිසුමේ ඇදහිලිවන්තයන් ආබ්‍රහම්ගේ උරුමක්කාරයන් ලෙස හැඳින්වෙන්නේ කෙසේදැයි ඔබ පසුව ඉගෙන ගන්නවා ඇත. ආබ්‍රහම් මෙන් ලෝකයාට ආශිර්වාද කිරීම සඳහා අප ද කැඳවා තිබේ. එහෙත් පොළොවේ ජාතීන්ට හා පවුල්වලට ආශිර්වාද ලැබෙන්නේ අප ඔවුන් වෙත ශුභාරංචිය ඇතිව ගිය විට පමණි.

දෙවියන්වහන්සේ ආබ්‍රහම්ව කැඳවූ විට උන්වහන්සේ ඔහුට පැවසුවේ ඌර් නම් දේශයෙන් පිටත්ව “මා ඔබට පෙන්වන දේශයට” (ක්‍රියා 7:2,3) යන ලෙසය. ආබ්‍රහම් තම පවුල ද සමඟ ඌර්වලින් පිටත් විය. එහෙත් හාරාන් වෙත පැමිණි විට ඔවුන් එහි පදිංචි වූහ (උත්පත්ති 11:31).

දෙවියන්වහන්සේගේ පරමාර්ථයට බාධා කෙරෙන ආත්මික භූමි හා ස්ථාන අත්හරින ලෙස සෑම ඇදිහිලිවන්තයෙකුගෙන්ම ඉල්ලනු ලැබේ. ඇතැම් ඇදහිලිවතුන් තමා උපන් භූමියෙන් පිටත්ව වෙනත් ජාතීන් වෙත යාමට කැඳවනු ඇත. සෑම ඇදහිලිවන්තයෙක්ම ඇතැම් අවස්ථාවල “හාරාන්ට” මුහුණ දෙන්නේය. මෙය ඔබට සැප පහසු සහිතව පදිංචි වීමට හැකි ස්ථානයකි. එහි නැවතීම හෝ නැතහොත් දෙවියන්වහන්සේට කීකරු වී උන්වහන්සේගේ සැලැස්මට අනුව ඉදිරියට යාම හෝ ඔබට තෝරා ගත හැකිය. ආබ්‍රහම් හාරාන් පසුකර ගියේය. ඔහු එය පසුකර ගිය පසු නැවත හැරී නොබැලුවේය.

## ජාතිය වැඩි දියුණු වීම

උත්පත්ති පොතේ ආබ්‍රහම්ගේ කතාවට අනතුරුව ඉශ්‍රායෙල් ජාතියේ වර්ධනය හා වැඩි දියුණු වීම ඉතිරි ව්‍යවස්ථා පොත්වල වාර්තා කර ඇත.

දෙවියන්වහන්සේ ලෝකයා සඳහා වූ තම සැලැස්ම එළිදරව් කිරීමට ඉශ්‍රායෙලය යොදා ගත් සේක.

උත්පත්ති 50:20 : මිසරයේ දී දෙවියන්වහන්සේ ජාතින් සුරක්ෂිත කිරීම සඳහා ජෝසෙප් නැගිටවූ සේක.

නික්මයාම 8:22 : දෙවියන්වහන්සේ තමා පොළොවේ දෙවිඳුන් බව පෙන්වීමට ඉශ්‍රායෙල්වරුන් මිසරයෙන් පිටතට ගෙන ආ සේක.

නික්මයාම 9:29 : මිසරයේ ඇති වූ වසංගත සැළසුම් කළේ දෙවියන්වහන්සේගේ බලය පෙන්වීමටය.

නික්මයාම 33:16 : ඉශ්‍රායෙලය සමඟ දෙවියන්වහන්සේ වැඩ සිටීමෙන් පෙන්නුම් කළේ ජාතින් කෙරෙහි ඇති උන්වහන්සේගේ යථාර්තය වේ.

නික්මයාම 34:10 : දෙවියන්වහන්සේ ඉශ්‍රායෙලයෙහි අඛණ්ඩව වැඩ කළ සේක. ඊට හේතුව එමගින් ඔවුන් වාසය කළ සෙනඟ අතර ස්වාමීන්වහන්සේගේ ක්‍රියා දැක ගත හැකිවීම පිණිසය.

ලෙවී කථාව 20:23 : ඉශ්‍රායෙලය අනෙක් ජාතින්ට ආදර්ශයක් විය යුතු අතර ඔවුන්ගේ නපුරු මාර්ග අනුගමනය නොකළ යුතුය.

ලෙවී කථාව 19:24 : ඉශ්‍රායෙලය අනෙක් ජාතින් සමඟ දෙවියන්වහන්සේගේ ප්‍රේමය බෙදා ගත යුතුය.

ගණන් කථාව 14:21 : දෙවියන්වහන්සේගේ සැලැස්ම වූයේ උන්වහන්සේගේ මහිමයෙන් පොළොව පිරී පැවතිම වේ.

ද්විතිය කථාව 4:27, 7:6, 14:2, 26:19 : දෙවියන්වහන්සේ ඉශ්‍රායෙලය තම සාක්ෂිකරු වන පිණිස තෝරා ගත් සේක. එහෙත් පාපය නිසා පසුව ඔවුන් විසුරුවා හැරෙන අතර ඔවුන්ගේ සතුරන්ගෙන් පීඩා විඳිනවා ඇත.

ද්විතිය කථාව 18:9, 30:19 : අනෙකුත් ජාතින්ගේ මාර්ග අනුගමනය නොකරන ලෙස දෙවියන්වහන්සේ ඉශ්‍රායෙල්වරුන්ට අනතුරු ඇඟෙවූ සේක. ඔවුන්ට ජීවනයේ මාර්ගය තෝරා ගැනීමට පැවසූ සේක.

ද්විතිය කථාව 28:9,10 : දෙවියන්වහන්සේගේ ආශාව වූයේ ඉශ්‍රායෙල් ජාතිය තුළින් පොළොවේ සියලු සෙනඟ උන්වහන්සේගේ බලය හැඳින ගැනීම වේ.

## ඓතිහාසික පොත්

### ජෝෂුවා සිට එස්තර් දක්වා

ලෝකයාට ඉශ්‍රායෙල්වරුන් නොවැදගත් සෙනඟකි. එහෙත් ඉශ්‍රායෙලය පිළිබඳ බයිබලිය දැක්ම ඊට බොහෝ වෙනස් වේ. දෙවියන්වහන්සේගේ සැලැස්ම ලෝකයාට හෙළි කිරීම සඳහා උන්වහන්සේ ක්‍රියා කරන්නේ මෙම ජාතිය තුළිනි. පැරණි ගිවිසුමේ ඓතිහාසික පොත් ඉශ්‍රායෙලය මේ තත්ත්වය යටතේ සේවය කරන විට ලද අත්දැකීම් වාර්තා කරයි.

ඉශ්‍රායෙලය දෙවියන්වහන්සේට කීකරු වූ විට සතුරන්ගේ අත්වලින් ඇය මුදනු ලැබිණි. මෙය දෙවියන්වහන්සේගේ ගැළවීමේ බලය පෙන්වන්නක් විය (ගීතාවලිය 66:1-7, යෙසායා 52:10

බලන්න). ඉශ්‍රායෙලය දෙවියන්වහන්සේට අකීකරු වූ විට උන්වහන්සේ එවූ විනිශ්චයන්ද උන්වහන්සේ සත්‍යතාව සඳහා සාක්ෂියක් විය (ගීතාවලිය 145:17). දෙවියන්වහන්සේ ඉශ්‍රායෙලය සමඟ කටයුතු කළේ ප්‍රේමයෙන් වුවද විනිශ්චයෙන් වුවද ලෝකයේ ජාතීන් වෙත උන්වහන්සේ එළිදරව් වූයේ ඔවුන් තුළින් වේ.

ලෝකයා සඳහා වන දෙවියන්වහන්සේගේ සැලැස්ම පිළිබඳ අවබෝධය වැඩි වර්ධනය කෙරෙන ඓතිහාසික පොත්වලින් ගත් යොමුවීම් සමහරක් පහත දැක්වේ.

ජෝෂුවා 2:11, 3:11 : ස්වර්ගයේත් පොළොවේත් ස්වාමීන්වහන්සේ දෙවියන්වහන්සේ වේ.

ජෝෂුවා 4:23-24 : මිහිපිට සියල්ලන් ස්වාමීන්වහන්සේගේ හස්තය බලවත් බව දැනගනු පිණිස දෙවියන්වහන්සේ ජෝර්දාන් ගඟේ දිය හින්දවා දැමූ සේක.

ජෝෂුවා 23:3,9,12,13 : මිථ්‍යාදෘෂ්ටි ජාතීන්ගෙන් වෙන්ව සිටින ලෙස හා ඔවුන් අතර උන්වහන්සේගේ සාක්ෂිකරුවන් ලෙස කටයුතු කරන ලෙස දෙවියන්වහන්සේ ඉශ්‍රායෙල්වරුන්ට අනතුරු ඇඟවූ සේක.

විනිශ්චයකාරයන් 2:21-22 : දෙවියන්වහන්සේ අණ කරන පරිදි ඉශ්‍රායෙල්වරුන් ක්‍රියා කරනු ඇත්දැයි බැලීමට ඔවුන් පරීක්ෂා කළ සේක. ඔවුන් එසේ කිරීමට දිගටම අසමත් වූ අවස්ථාවන් විනිශ්චයකාරයන්ගේ සඳහන් වේ.

රූත් 1:16 : ජුදෙව්වන්ගේ දෙවියන්වහන්සේ විජාතීන්ගේ දෙවියන්වහන්සේ ද වනු ඇත.

1 සාමුවෙල් 17:46 : දාවිත්ට ගොලියත් හමුවූ විට ඔහු ජයග්‍රහණය ලබාගත්තේ ඉශ්‍රායෙල්හි දෙවි කෙනෙකු සිටින බව සියලු දෙනාම දැන ගන්නා පිණිසය.

2 සාමුවෙල් 22:50-51 : දාවිත් දෙවියන්වහන්සේට ප්‍රශංසා කළේ සියලු ජාතීන් උන්වහන්සේ මහිමයට පත්කරන පිණිසය.

1 රාජාවලිය 8:23,43 : ඉශ්‍රායෙල් රාජ්‍යය පිහිටෙවූ පසු සාලමොන් රජු මෙසේ අයැදිය: "ඔබේ සෙනඟ වන ඉශ්‍රායෙල්වරුන් මෙන් මිහිපිට සියලු සෙනඟ ඔබේ නාමය හැඳිනගෙන ඔබ කෙරෙහි ගරු බිය පානු ඇත".

1 රාජාවලිය 8:43,53,60 : තම සැලැස්ම පිළිබඳ දැනුම පොළොවේ අය ලබා ගැනීමට ඇති දෙවියන්වහන්සේගේ ආශාව මෙම පදවලින් පෙන්නුම් කෙරේ.

2 රාජාවලිය 19:15-19 : පොළෝ වැසි සියල්ලන් සැබෑවූ දෙවියන්වහන්සේ දැනගන්න පිණිස මුදා ගැනීම සෙවීය.

1 ලේකම් 16:23-24,31 : සියලු ජාතීන් අතරෙහි එතුමන්ගේ මහිමය ප්‍රකාශ කළ යුතුය.

1 ලේකම් 16:35 : දෙවියන්වහන්සේ මහිමයට පත් කරන පිණිස මිථ්‍යා දෘෂ්ටීන්ගෙන් මිදීම සොයනු ලැබේ.

2 ලේකම් 6:32-33 : පොළොවේ සියලු වැසියන්ට දෙවියන්වහන්සේ දැනගැනීමේ අවස්ථාව දිය යුතුය.

2 ලේකම් 6:14, 20:6, 32:13 : ලෝකයේ එකම සැබෑවූ දෙවිඳුන් ලෙස දෙවියන්වහන්සේ උසස් කෙරේ.

2 ලේකම් 16:9 : දෙවියන්වහන්සේ විශේෂ අභිප්‍රායක් සිත්හි තබාගෙන ලෝකයා දෙස බලන සේක.

එස්රා 1:2, 5:11 : මුළු පොළොව ඉදිරියේ දෙවියන්වහන්සේට ගරු කිරීමට දේව මාළිගාවක් සයිරස් විසින් ගොඩනඟනු ඇත.

නෙහෙමියා 6:16 : නෙහෙමියාගේ ව්‍යාපෘතියේ පරමාර්ථය පවුරක් ඉදි කිරීමට වඩා ශ්‍රේෂ්ඨ වේ. එමගින් දෙවියන්වහන්සේගේ බලයේ සත්‍යතාවත් උන්වහන්සේගේ සැලැස්මේ ස්ථිරත්වයත් ප්‍රදර්ශනය කෙරෙනු ඇත.

නෙහෙමියා 9:6-7 : දෙවියන්වහන්සේ මුළු ලෝකයේම ස්වාමීන්වහන්සේ ලෙස ප්‍රකාශ කෙරේ.

එස්තර් 4:14 : එස්තර් පත් කරනු ලැබුවේ විශේෂ පරමාර්ථයක් ඇතිවය. එනම් සාතන් විසින් විනාශ කිරීමට සැළසුම් කළ ඉශ්‍රායෙල් ජාතිය සුරැකීම සඳහාය.

## කාව්‍ය පොත්

### ජෝබ් සිට සාලමොන්ගේ ගී දක්වා

ජෝබ්, ගීතාවලිය, හිතෝපදේශ, ධර්මදේශකයා හා සාලමොන්ගේ ගී යන පොත් කාව්‍යමය පොත් ලෙස හැඳින්වේ. ඊට හේතුව ඒවා ලියා ඇත්තේ කාව්‍යමය ස්වරූපයෙන් වන බැවිනි. මේ කාව්‍යමය පොත්වල ලෝකය වැදගත් තේමාවක් වේ.

ගීතාවලිය පොතේ ජාතීන්ට හා සෙනඟට යොමුකිරීම් 200 වරකට වඩා ඇත. “මුළු පොළොව” “සියලු සෙනඟ” “සියලු මාංශ” “හුස්ම ඇති සියල්ල” “පොළොවේ සියලු අන්තයන්” “පොළොවේ සියලු සෙනඟ” “සියල්ලන්ගේ ඇස්” හා “මිථ්‍යාදෘෂ්ටි” වැනි ප්‍රකාශන නැවත නැවත මෙම පොතේ සඳහන් වේ.

පොළොව ස්වාමීන්වහන්සේට අයත් දෙයක් ලෙසත් එහි සියල්ල උන්වහන්සේගේ පාලනයෙහි පවතින බවත් ගීතාවලියෙන් ඉදිරිපත් කෙරේ (ගීතාවලිය 24:1). එය දෙවියන්වහන්සේ පොළොවේ ඇති සියල්ලට වඩා අති උසස් ලෙස මහිමයට පත් කරයි (ගීතාවලිය 38:10 97:9). උන්වහන්සේ පොළොවේ විනිශ්චයකාරයාණන් ලෙස ඉදිරිපත් කරයි (ගීතාවලිය 149:7). එසේ වුවද ගැළවීම තුළින් තවත් කරුණාව සපයයි (ගීතාවලිය 119:64). ජාතීන්ගේ පාපී ස්වභාවය ගීතාවලිය 2 හි විස්තර කර ඇත. ගීතාවලිය 67 න් ගැළවීමේ බලාපොරොත්තුව සියලු ජාතීන්ට දී තිබේ.

මෙම පරිච්ඡේදයේ “තවදුරටත් අධ්‍යයනය සඳහා” කොටසින් ගීතාවලියේ සාකච්ඡා කර ඇති පරිදි ලෝකයේ විෂයන් ගැන සම්පූර්ණ ලැයිස්තුවක් ඉදිරිපත් කර ඇත.

අනෙකුත් කාව්‍යමය පොත්වලින් ප්‍රධාන පද කිපයක් මෙසේය:

ජෝබ් 1හා2 : මිනිසාගේ හදවත, මනස හා ආත්මය අතර ඇති ගැටුම් විස්තර කරයි.

ජෝබ් 9:24, 12:23, 38:1-41 : පොළොවේ වර්තමාන තත්ත්වය දුෂ්ට වුවද දෙවියන්වහන්සේ අතින් උන්වහන්සේගේ විශ්වයේ පාලනය ගිලිහී නැත.

හිතෝපදේශ 2:22, 10:30, 11:31 : පොළොවේ වර්තමාන නපුරු තත්ත්වය විස්තර කරයි.

හිතෝපදේශ 14:34 : ධර්මිෂ්ඨ හා පාපී ජාතීන් අතර වෙනස පෙන්නුම් කෙරේ.

හිතෝපදේශ 3:19, 8:23-31 : දෙවියන්වහන්සේ අහසේත් පොළොවේත් මැවුම්කරු ලෙස උසස් කෙරේ.

ධර්මදේශකයා 1:4, 3:11 : ස්වාමීන්වහන්සේ ලෝකයේ මැවුම්කරු හා දෙවියන්වහන්සේ ලෙස ඉදිරිපත් කෙරේ.

ධර්මදේශකයා 7:20, 8:14, 10:7 : මිනිසාගේ හා ලෝකයේ වර්තමාන තත්ත්වය කෙරෙහි අවධානය යොමු කෙරේ.

ධර්මදේශකයා 12:7 : මනුෂ්‍යයාගේ ආත්මයේ සදාතනික ස්වභාවය එළිදරව් කෙරේ.

ධර්මදේශකයා 3:14 : දෙවියන්වහන්සේගේ සැළැස්මේ ස්ථිර භාවය අවධාරණය කෙරේ.

මෙම පද, පොත්වලින් එළිදරව් කර ඇති පරිදි ලෝකයා සඳහා වන දෙවියන්වහන්සේගේ සැලැස්ම පිළිබඳ නිදසුන් පමණි. (කාව්‍ය පොත්වල ලෝකය පිළිබඳ තවත් පද සඳහා මෙම පරිච්ඡේදයේ "තවදුරටත් අධ්‍යයනය සඳහා" යන කොටස බලන්න.)

## අනාවැකි පිළිබඳ පොත්

### යෙසායා සිට මලාකි දක්වා

යෙසායා සිට මලාකි දක්වා වූ පොත් අනාවැකි පොත් ලෙස හැඳින්වේ. ඒවායේ ආලේපලත් ඉශ්‍රායෙල් මනුෂ්‍යයන් විසින් දෙවියන්වහන්සේ විසින් දෙන ලද අනාවැකි සඳහන් වේ. ලෝකයා සඳහා වන දෙවියන්වහන්සේගේ සැළැස්මේ අනාගත සිද්ධීන් මෙම අනාවැකි මඟින් පැහැදිලි කෙරේ. මේ පොත් මුළුල්ලේම ගැළවුම්කාරයාණන්ගේ ක්‍රියාවන්හි ලෝකයා සඳහා වන දෘෂ්ටිය අවධාරණය කර ඇත. ජේසුස්වහන්සේ පැමිණෙන්නේ ඉශ්‍රායෙල් සෙනඟ සඳහා පමණක්ම නොව මුළු මනුෂ්‍ය වර්ගයා උදෙසා වේ.

## විවිධ සංස්කෘති හරහා සේවාවන්

දානියෙල් හා ජෝනා නැමැති දිවැසිවරු දෙදෙනා සේවය කළේ විවිධ සංස්කෘති පසුබිමක වේ.

දානියෙල් බබිලෝනියේ උපදේශකවරයෙකු හා නිලධාරියෙකු ලෙස සේවය කරන අතරතුර දෙවියන්වහන්සේට සාක්ෂිකරුවෙක් ද විය. පොළොවේ දෙවියන්වහන්සේ ලෙස තමන්වහන්සේ එළිදරව් කිරීම සඳහා දෙවියන්වහන්සේ දානියෙල් මරණයෙන් බේරා ගත් සේක (දානියෙල් 6:27). ලෝකයේ අනාගතය පිළිබඳ දෙවියන්වහන්සේගේ එළිදරව් කිරීම් බොහෝමයක් දානියෙල් පොතේ සඳහන්ව ඇත. මෙම පොත ජාතීන් උදෙසා දෙවියන්වහන්සේගේ සැලැස්ම පිළිබඳ අතිරේක තොරතුරු සපයන නව ගිවිසුමේ එළිදරව් පොත හා සම්බන්ධය.

දෙවියන්වහන්සේගේ සැළැස්මේ පරමාර්ථය දානියෙල් පොතේ මෙම පදයෙන් සාරාංශ කෙරේ.

> **සියලු ජනයන්ද ජාතීන්ද භාෂාවන්ද උන්වහන්සේට සේවය කරන පිණිස ආණ්ඩු බලයද ගෞරවයද රාජ්‍යයක්ද උන්වහන්සේට දෙන ලද්දේය. උන්වහන්සේගේ ආණ්ඩුව පහ නොවන සදාකාල ආණ්ඩුවක්ය. උන්වහන්සේගේ රාජ්‍යයද නැති නොවන්නේය. (දානියෙල් 7:14)**

ජෝනා දුෂ්ට විජාතික නගරයක් වූ නිනිවයෙහි මිදීම ගැන දේශනා කිරීමට කැඳවූ ජුදෙව් ධර්මදූතයෙකි. ඔහු අකමැත්තෙන් තම සේවය ඉටු කළේය. ජෝනා පොත වැදගත් වේ. මක්නිසාද ඉශ්‍රායෙල් ජාතියට පමණක් නොව සියලු ජාතීන්ට ගැළවීම ගෙන ඒමේ දෙවියන්වහන්සේගේ මාර්ගය ඉන් එළිදරව් වන බැවිනි.

ඉශ්‍රායෙල්වරු නිනිවයෙහි සෙනඟට ද්වේෂ කළහ. පළමුවෙන් ඔවුන්ට දේශනා කිරීම සඳහා නිනිවයට යෑම ජෝනා ප්‍රතික්ෂේප කළේය. එහෙත් දෙවියන්වහන්සේගේ ක්‍රියා මාර්ග නිසා ඔහු එහි ගොස් පශ්චාත්තාපවීම ගැන ඉගැන්නුවද පශ්චාත්තාප වන්නේ කෙසේදැයි පෙන්නුවේ නැත. රජතුමාගේ ආඥාවෙන් පෙනෙන පරිදි ඔවුන් කළ යුත්තේ කුමක්ද යන්න ඔවුන්ට අනුමාන කිරීමට සිදුවිය (ජෝනා 3:8-9).

ඔවුන්ගේ පශ්චාත්තාපවීම ගැන ප්‍රීති නොවී ජෝනා දෙවියන්වහන්සේට පැමිණිලි කරන්ටත් උන්වහන්සේ සමඟ වාද කරන්ටත් විය (ජෝනා 4:2). ශුද්ධ ලියවිල්ලේ සඳහන් ජෝනාගේ අවසාන වචන වන්නේ "මැරෙන තරම් කෝපවීම මට යුතුය" (ජෝනා 4:9) යන්න වේ. ජෝනාගේ පොතේ අවසානයක් නොමැත. අවසාන ප්‍රශ්නවලට (ජෝනා 4:9-11) පිළිතුරු සපයා නැත. අප නවතින්නේ ජෝනා සිතන ආකාරයට දෙවියන්වහන්සේ සිතන තෙක් ජෝනා බලා සිටින ස්ථානයෙහි. දෙවියන්වහන්සේ තවමත් බොහෝ සේ ජෝනා මෙන් වන විශාල සෙනඟක් වෙනුවෙන් බලා සිටින සේක. ජෝනා සෙවණේ අසුන් ගෙන සිටියාක් මෙන් ඔවුහු තම නිවසේ සැප පහසු අසුන්වල වාඩිවී සිටිති. ලෝකයා වෙනුවෙන් ඇති දෙවියන්වහන්සේගේ සැලැස්ම අවබෝධ කරගැනීමට ඔවුන් අසමත් වන අතර ඊට සහභාගි වීම ප්‍රතික්ෂේප කරති.

## යෙසායා පොත

යෙසායා පොත, දිවැසිවර පොත්වල එළිදරව් කෙරෙන ලෝකයා වෙනුවෙන් ඇති දෙවියන්වහන්සේගේ සැලැස්ම අවධාරණය කිරීම පිළිබඳ මනා නිදසුනකි.

යෙසායා 17:12-13, 24:5-6 : දෙවියන්වහන්සේ ඉදිරියේ ලෝකයේ තත්ත්වය විස්තර කරයි.

යෙසායා 40:12, 42:5, 44:24, 45:8,12,18, 48:13 - දෙවියන්වහන්සේ අහසේ හා පොළොවේ මැවුම්කාරයාණෝ ලෙස උසස් කෙරේ.

යෙසායා 14:12 සාතන් ජාතීන්ගේ සතුරා ලෙස එළිදරව් කෙරේ.

යෙසායා 37:20, 64:4 : ලෝකයා වෙනුවෙන් ඇති දෙවියන්වහන්සේගේ සැලැස්මේ පරමාර්ථය හා ශ්‍රේෂ්ඨත්වය අවධාරණය කරයි.

යෙසායා 65:17, 66:22 : ලෝකය වෙනුවෙන් ඇති දෙවියන්වහන්සේගේ අනාගත සැලැස්ම එළිදරව් කරයි.

යෙසායා 40:15 : ජාතීන් පිළිබඳ දෙවියන්වහන්සේගේ දැක්ම

යෙසායා 45:22, 51:6 : ගැළවීම උදෙසා දෙවියන්වහන්සේ සොයන්න යන ඉල්ලීම ජාතීන් වෙතට යැවේ.

යෙසායා 43:8-12 : ඉශ්රායෙලය ජාතීන් අතර දෙවියන්වහන්සේගේ සාක්ෂිකරු වේ.

යෙසායා 52:13-15 : මෙම කොටසේ සඳහන් කර ඇති සේවකයා ජේසුස්වහන්සේය. උන්වහන්සේ ලෝකයාගේ මිදීම වෙනුවෙන් දුක්විඳිනු ඇත. විජාතීන්ගේ හෝ මිථ්‍යාදෘෂ්ටි ජාතීන්ගේ රජවරුන් විස්මිතව ශුභාරංචිය අසනු ඇත. ක්‍රිස්තුස්වහන්සේගේ මරණය සියලු මනුෂ්‍ය වර්ගයන් හා ජාතීන් වෙනුවෙනි. උන්වහන්සේගේ ශුභාරංචිය ලෝකයේ සෑම පෙදෙසකම ප්‍රකාශ කළ යුතුය.

යෙසායා 54:1-5 : “දරුවන්” යනුවෙන් මෙහිදී අදහස් වන්නේ ජේසුස්වහන්සේගේ ගැළවීම ගැන දැනුමක් ඇති විජාතික ඇදහිලිවතුන් ඇතුළු ඉශ්‍රායෙල්හි ආත්මික දරුවන් වේ. “නුඹේ කූඩාරම පිහිටා ඇති ස්ථානය විශාල කරන්න” යන ඉල්ලීමේ තේරුම මිථ්‍යාදෘෂ්ටීන් අතුරින් දෙවියන්වහන්සේගේ දරුවන් පිළිගැනීමට සූදානම් වන්න යන්න වේ.

යෙසායා 42:1-10 : දෙවියන්වහන්සේ ජාතීන්ට කරුණාවන්ත ලෙස සලකනු ඇත. ඔවුන් ප්‍රතිචාර දැක්වීමට දිගුකලක් ගත වුවද කෙතරම් උත්සාහයක් ගන්න සිදුවුවද උන්වහන්සේ ප්‍රයත්නය අත්හරින්නේ නැත. යෙසායා සඳහන් කරන “දිවයින්” බොහොමයක් තවමත් උන්වහන්සේගේ ව්‍යවස්ථාව එනතුරු බලා සිටී. හයවන පදයේ සඳහන් වන්නේ සියලු ජාතීන්ගේ මිදීම ලැබූවන් එකට බැඳ තබන ගැළවුම්කරුවාණන් ගැනය.

යෙසායා 49:6-12 : ලෝකයා වෙනුවෙන් ඇති දෙවියන්වහන්සේගේ පරමාර්ථය හා සසඳා බලන විට ඉශ්රායෙලය මුදා ගැනීම සුළු දෙයකි. උන්වහන්සේගේ පරමාර්ථය නම් ආත්මයෙන් ද සැබෑකමෙන් ද උන්වහන්සේ දැන ගැනීමට හා උන්වහන්සේට නමස්කාර කිරීමට මුළු ලෝකයේම පැමිණීම වේ.

යෙසායා 56:7 : දෙවියන්වහන්සේගේ ගෘහය සියලු ජාතීන් හට යාච්ඤා ගෘහයක් වනු ඇත.

යෙසායා 59:16 - 60:5 : මෙම කොටසින් එළිදරව් කෙරෙන්නේ පාපය නිසා ආත්මික අඳුර ලොව වසා සිටිය ද ආලෝකය හා සුවය සමඟ ජේසුස්වහන්සේ නැගිටිනු ඇත යන්න වේ. මෙම ශුද්ධ ආලෝකය ලොව මුළුල්ලේම බැබළෙනු ඇත. ලෝකයේ බොහෝ දුර බැහැර පෙදෙස්වලින් විජාතීන් මෙම ආලෝකය වෙත පැමිණෙනු ඇත.

යෙසායා 2:4,19,21, 5:26, 11:4, 13:11,13, 24:1,19,21, 25:7, 26:21, 34:2, 64:2 මෙම සියලු පදවලින් පෙන්නුම් කරන්නේ ජාතීන් කෙරෙහි දෙවියන්වහන්සේගේ විනිශ්චය වේ.

යෙසායා 2:2, 6:3, 11:9, 52:10, 55:5, 60:2, 61:11, 66:1,18 මේ සියල්ල සඳහන් වන්නේ පොළොව දෙවියන්වහන්සේ පිළිබඳ දැනුමෙන් පිරී තිබෙන කාලයක් පැමිණෙන බවය.

## අනෙකුත් දිවැසිවරුන්

මෙහි දක්වෙන්නේ දිවැසිවරුන්ගේ අනෙකුත් පොත්වල සඳහන් ප්‍රධාන පාඨ සමහරකි.

ජෙරෙමියා 1:5 : ජෙරෙමියා ජාතීන්ගේ දිවැසිවරයෙකු ලෙස කැඳවනු ලැබිය.

ජෙරෙමියා 9:24 : දෙවියන්වහන්සේ ප්‍රේමණීය කරුණාව, යුක්තිය හා ධර්මිෂ්ටකම පොළොවේදී පෙන්වන සේක.

ජෙරෙමියා 23:5 : ජේසුස්වහන්සේ පොළොවේ යුක්තිය හා ධර්මිෂ්ටකම ඉටු කරන බවට අනාවැකිය.

ජෙරෙමියා 18:7-10 සියලු ජාතීන්ට පැහැදිලි තෝරා ගැනීමක් ලබා දෙයි.
ජෙරෙමියා 27:5, 32:17, 51:15 : දෙවියන්වහන්සේ ලෝකයේ මැවුම්කාරයාණන් ලෙස මහිමයට පත් කෙරේ.

ජෙරෙමියා 31:7 : දෙවියන්වහන්සේ ජාතීන් අතර ප්‍රසිද්ධ කර ප්‍රශංසා කළ යුතුය.

ජෙරෙමියා 4:2, 33:9 : ජාතීන් දෙවියන්වහන්සේ තුළ මහිමයට පත් කෙරේ.

ජෙරෙමියා 5:9, 6:19, 7:28, 9:9, 10:10,11,25, 12:17, 23:5, 25:14,31, 51:25 : මේ සියල්ලේ සඳහන් වන්නේ ලෝකයේ දුෂ්ට ජාතීන් කෙරෙහි ඇති දෙවියන්වහන්සේගේ විනිශ්චය වේ.

ජෙරෙමියා 16:19-21 : ජාතීන් සඳහා වන දෙවියන්වහන්සේගේ පරමාර්ථය ඉශ්‍රායෙලය තුළින් සාක්ෂාත් කර ගනු ලැබේ.

ජෙරෙමියා 33:9 : පොළොවේ සියලු ජාතීන් ස්වාමීන්වහන්සේ ගැන දැනගනු ඇත.

විලාප ගී 3:37-39 : දෙවියන්වහන්සේ මිනිසාගේ පාපයට දඬුවම් දෙන සේක.

විලාප ගී 4:20 : අප මිථ්‍යාදෘෂ්ටීන් අතරේ ජීවත් වුවද අපි දෙවියන්වහන්සේගේ සෙවණේ සිටින්නෙමු.

එසකියෙල් 20:41, 36:23, 38:23, 39:7,21 : මේ සෑම පදයකින්ම පෙන්නුම් කෙරෙන්නේ දෙවියන්වහන්සේ තමන්වහන්සේගේ නම ලෝකයේ ජාතීන් අතර දැනගැනීමට සැලැස්වීමට ඇති කැමැත්තය.

හොෂෙයා 1:10, 2:23 : දෙවියන්වහන්සේ ගැන නොදැන සිටින තැන්වල උන්වහන්සේ එළිදරව් වන සේක.

ජෝවෙල් 1:15 : ජෝවෙල් "ස්වාමීන්වහන්සේගේ දවස" ගැන අනතුරු ඇඟවීය. එය උන්වහන්සේ ජාතීන් විනිශ්චය කරන කාලය වේ. විශ්වීය පශ්චාත්තාපය ඔහු ඉල්ලා සිටියේය.

ජෝවෙල් 2:28-32, 3:9-12 : සියලු ජාතීන් දෙවියන්වහන්සේගේ විනිශ්චය අත්දුටුව ද ඔවුන් ශුද්ධාත්ම දීමනා හා ඉන්පසු පැමිණෙන සාමය ද අත් දකිනු ඇති.

ජෝවෙල් 3:14 : තවමත් දෙවියන්වහන්සේ ගැන නොදත් මහා ජනකාය විස්තර කරයි.

ආමොස් 4:13 : පොළොව කෙරෙහි ඇති දෙවියන්වහන්සේගේ ස්වාමිත්වය අනෙකුත් දිවැසිවරයන් සමඟ ප්‍රකාශ කිරීමට ආමොස් එකතු වේ.

ආමොස් 9:11-12 : දෙවියන්වහන්සේ උන්වහන්සේගේ නමින් හැඳින්වෙන සියලු ජාතීන් නැගුටුවන සේක.

ඔබදියා 1:1 : දෙවියන්වහන්සේ ජාතීන් අතර උන්වහන්සේගේ පණිවුඩකරුවන් යවා ඇත.

ඔබදියා 1:15 :අන්‍ය ජාතීන් කෙරෙහි දෙවියන්වහන්සේගේ විනිශ්චයේ දවස පැමිණෙනවා ඇත .

මීකා 4:1-3, 5:15, 7:16 : දෙවියන්වහන්සේ ජාතීන් විනිශ්චය කරන සේක.

නාහුම් 1:5 : මුළු පොළොවම දෙවියන්වහන්සේගේ පාලනයට යටත් වනු ඇත .

හබක්කුක් 1:5, 3:12 : මිථ්‍යාදෘෂ්ටීන්ට තමන්වහන්සේ එළිදරව් වීම පිණිස දෙවියන්වහන්සේ මහා පුදුම දේ කරනු ඇත .

හබක්කුක් 2:4 : ඇදහිල්ලෙන් ධර්මිෂ්ඨ කිරීමේ මූලධර්මය පිහිටුවයි.

හබක්කුක් 2:14, 3:3 : දෙවියන්වහන්සේගේ මහිමයෙන් පොළොව පිරී යන දවසක් ගැන අනාවැකි පළකරයි.

ශෙපනියා 3:6,8 : පොළොවේ දූෂිත ජාතීන් දෙවියන්වහන්සේ විනිශ්චය කරන සේක.

හග්ගයි 2:7,21,22 : දෙවියන්වහන්සේ ජාතීන් තමන් වෙතට ගෙන්වා ගැනීමට ඒවා සොලවන සේක.

සෙකරියා 12:1 : මිනිසාගේ ආත්මයේ මැවුම්කරු ලෙස දෙවියන්වහන්සේ ඉදිරිපත් කර ඇත.

සෙකරියා 4:10 : දෙවියන්වහන්සේගේ අවධානය ලෝකයා වෙත යොමු කෙරේ.

සෙකරියා 12:10, 13:1,6,7 ලෝකයේ පාපය වෙනුවෙන් ජේසුස්වහන්සේගේ මරණය පෙරැයුම් කරයි.

සෙකරියා 14:8-9 : දෙවියන්වහන්සේ මුළු පොළොවට රජවනු ඇත.

මලාකි 1:11 : සියලු ජාතීන් අතර දෙවියන්වහන්සේගේ නාමය ප්‍රශංසා කෙරෙනු ඇත.

මෙම සාම්පල පාඨවලින් ලෝකයා වෙනුවෙන් ඇති දෙවියන්වහන්සේගේ සැලැස්ම පිළිබඳ සියලු දිවැසිවරයන්ගේ ඉගැන්වීම් සීමිත ඉඩකඩ තුළ විශ්ලේෂණය කළ නොහැකි බව ඔබට පෙනෙනු ඇත. මෙම පරිච්ඡේදයේ "තවදුරටත් අධ්‍යයනය සඳහා" කොටසේ ලෝකය පිළිබඳ පැරණි ගිවිසුමේ දිවැසිවරුන්ගේ සියලු යොමු කිරීම් සඳහන් වේ. ඔබගේ ඉදිරි අධ්‍යයනය සඳහා ඒවා භාවිත කරන්න.

## නව ගිවිසුමට සංක්‍රමණය වීම

පැරණි ගිවිසුම මලාකි පොතෙන් අවසන් වේ. නව ගිවිසුම ආරම්භ වන්නේ මතෙව් පොතෙනි. ඊළඟ පරිච්ඡේදයෙන් බයිබලීය ලෝක දැක්ම නව ගිවිසුමෙන් පෙන්වා දී ඇති ආකාරයට ඉගෙනීම ඔබ ආරම්භ කරන්නෙහිය.

පැරණි ගිවිසුමේ දෙවියන්වහන්සේගේ සැලැස්ම වූයේ සියලු ජාතීන් තමන්වහන්සේ වෙතට ගෙන්වා ගැනීමට ඉශ්රායෙලය යොදා ගැනීම වේ. දෙවියන්වහන්සේ අභිමුවේ හා උන්වහන්සේට බිය ඇතිව ජීවත් වීමෙන් කාන්දමකින් මෙන් සියලූ ජාතීන් ජෙරුසලමට හා ස්වාමීන්වහන්සේ වෙතට ඇදගත යුතු විය.

නව ගිවිසුමේ ඉශ්‍රායෙලය ජේසුස්වහන්සේ ප්‍රතික්ෂේප කිරීමෙන් පසු අලුත් සෙනඟ කණ්ඩායමක් නැගුටුවනු ලැබීය. එම කණ්ඩායම සභාව ලෙස හැඳින්වෙන අතර නව උත්පාදනයෙන් යුත් ඇදහිලිවතුන්ගෙන් එය සමන්විත වේ. සභාව තුළින් තමන්වහන්සේ ලෝකයට එළිදරව් කිරීමට දෙවියන්වහන්සේ කටයුතු කරන සේක.

එහෙත් ක්‍රමය වෙනස් වේ. පැරණි ගිවිසුමේ ස්වාමීන්වහන්සේ ගැන ඉගෙන ගැනීමට ජාතීන් ජෙරුසලමට ආ යුතු විය. නව ගිවිසුමේ ජෙරුසලමේ සිට සියලු ජාතීන් වෙත සභාව යවනු ලැබේ.

## ස්වයං පරීක්ෂණය

1. ප්‍රධාන පදය මතකයෙන් ලියන්න.

2. දේව වචනයේ ප්‍රධාන පණිවුඩය කුමක්ද?

3. පැරණි ගිවිසුමේ ව්‍යවස්ථා පොත්වලින් පෙන්නුම් කෙරෙන බයිබලීය ලෝක දැක්ම සාරාංශ කරන්න.

4. පැරණි ගිවිසුමේ ඓතිහාසික පොත්වලින් පෙන්නුම් කෙරෙන බයිබලීය ලෝක දැක්ම සාරාංශ කරන්න.

5. පැරණි ගිවිසුමේ කාව්‍යමය පොත්වලින් පෙන්නුම් කෙරෙන බයිබලීය ලෝක දැක්ම සාරාංශ කරන්න.

6. පැරණි ගිවිසුමේ අනාවැකි පොත්වලින් පෙන්නුම් කෙරෙන බයිබලීය ලෝක දැක්ම සාරාංශ කරන්න.

(පරීක්ෂණ සඳහා පිළිතුරු මෙම අත්පොතේ අවසාන පරිච්ඡේදය අවසානයේ ඇත.)

## තවදුරටත් අධ්‍යයනය කිරීම සඳහා

**පැරණි ගිවිසුමේ බයිබලීය ලෝක දැක්ම අධ්‍යයනය තවදුරටත් කර ගෙන යෑම සඳහා පහත දැක්වෙන ශුද්ධ ලියවිලි පාඨ භාවිත කරන්න. මෙම ලැයිස්තුව ලෝකයා, මිථ්‍යාදෘෂ්ටීන්, ජාතීන් හා විජාතිකයන් (ඉන් අදහස් වන්නේ ඉශ්‍රායෙලය හැර අනෙකුත් සියලු ජාතීන් වේ.) වෙත කෙරෙන යොමුවීම් ඇතුළත්ය.**

**උත්පත්ති:** 6:5-7,11-13,17;8:17,22;9:1-2,11-17; 10:32; 11:1,8,9; 12:2,3; 13:16; 14:19,22; 17:4,6,16,20; 18:18; 21:13,18; 22:18; 26:4; 28:14; 46:3

**නික්මයාම:** 8:22; 9:14,16,29; 19:5,6; 32:10;33:16; 34:10

**ලෙවී කථාව:** 20:23

**ගණන් කථාව:** 14:21

**ද්විතීය කථාව:** 3:24; 4:27,39; 7:6; 9:4; 10:14; 14:2; 15:6; 18:9; 26:19; 2:1,10; 30:19

**යෝෂුවා:** 2:11; 3:11;4:24; 23:3,9,12,23

**විනිශ්චයකාරයන්ගේ පොත:** 2:21-23

1 **සාමුවෙල්:** 8:5

2 **සාමුවෙල්:** 7:23; 22:50

1 **රාජාවලිය:** 8:23,43,53,60; 11:2

1 **ලේකම්:** 16:14,23,24,30,31,35; 17:21; 29:11

2 **ලේකම්:** 6:14,33; 16:9; 20:6; 32:13

**නෙහෙමියා:** 1:8; 5:9; 6:16; 9:6

**ජෝබ්:** 9:24; 12:23; 19:25; 37:6,12 ; 38:4

**ගීතාවලිය:** 2:1,2,8; 8:19; 9:5,8,15,17,19,20; 10:16,18; 18:7,43,49; 19:4; 22:27-29; 24:1; 25:13; 33:5,8,10,12,14; 34:16; 37:9,11,22; 44:2,11,14; 46:2,6,8-10; 47:2,3,7-9; 48:2,10; 49:1; 50:1,4,12; 57:5,9,11; 58:11; 59:5,8,13; 65:5,9; 66:4,7; 67:2,4,6,7; 68:8,32; 69:34; 72:8,11,17,19; 73:12,25; 74:12,17,20; 75:3,8; 76:8,9,12; 77:18; 78:55,69; 79:6,10; 80:8; 82:8; 83:4,18; 86:9; 89:11; 90:2; 93:1; 94:10; 95:4; 96:1; 99:1; 102:1,5,19,25; 104:5,9,13,14,24,30,32,35; 105:7; 106:27,34,35,41,47; 108:35; 110:6; 111:6; 112:2; 113:4; 114:7; 115:2,15,16; 117:1; 119:64,90,119; 121:2; 124:8; 126:2; 134:3; 135:6,7,10,15; 136:6; 138:4; 146:6; 147:8,15; 148:11,13; 149:7

**හිතෝපදේශ:** 2:22; 3:19; 8:23,26,29,31; 10:30; 11:31; 14:34

**දේශනාකාරයා:** 1:4; 3:11; 5:29; 7:20; 8:14,16; 10:7; 11:2; 12:7

**යෙසායා:** 2:2,4,19,21; 5:26; 6:3; 11:4,9,12; 12:5; 13:11,13; 14:12, 26; 17:12,13; 23:9; 24:1,4-6,19-21; 25:7,8; 26:2,9,21; 34:2; 37:16,20; 40:12,15,17,21,28; 41:9; 42:4,5,10; 44:24; 45:8,12,18,22; 48:13; 49:6; 51:6,13,16; 52:10; 54:5; 55:5,9; 60:2; 61:11; 64:24; 65:1,17; 66:1,18,22

**ජෙරමියා:** 1:5; 4:2; 5:9; 6:19; 7:28; 9:9,24; 10:2,10-12,25; 12:17; 16:19; 18:7-9; 22:29; 23:5,24; 25:14,15,17,31,32; 27:5; 29:14; 31:7,10; 32:17; 33:9; 36:2 46:28; 49:14; 51:15,20,25

**විලාප ගී:** 4:20

**එසකියෙල්:** 5:5-8; 16:14; 20:41; 36:24; 38:23; 39:7,21; 43:2

**දානියෙල්:** 4:35; 6:27

**හොෂෙයා:** 2:23; 6:3; 9:17

**යෝවෙල්:** 2:17,19,30; 3:2,11,12

**ආමොස්:** 4:13; 9:8,9,12

**ඔබදියා:** 1:1,15

**මීකා:** 1:2,3; 4:2,3,7; 5:4,15; 6:2; 7:16

**නාහුම්:** 1:5

**හබක්කුක්:** 1:5; 2:14,20; 3:3,6,12

**ශෙපනියා:** 2:3,11; 3:6,8,20

**හග්ගයි:** 2:7,14,21,22

**සෙකරියා:** 1:10,11,15; 2:8,11; 4:10; 12:1,3,9; 14:2,3,9,16

**මලාකි:** 1:11

# පස්වන පරිච්ඡේදය

## දේව වචනයේ ඇති ලෝකය : නව ගිවිසුම

### අරමුණ

මෙම පරිච්ඡේදය අධ්‍යයනයෙන් පසු ඔබට

- ❖ ප්‍රධාන පදය මතකයෙන් ලිවීමට
- ❖ යේසුස්වහන්සේගේ උපත නිවේදනය කිරීමෙන් පසු ලෝකයා සඳහා වන දෙවියන්වහන්සේගේ සැලැස්ම එළිදරව් වූ ආකාරය පැහැදිලි කිරීමට
- ❖ යේසුස්වහන්සේගේ හැසිරීමෙන් උන්වහන්සේගේ ලෝක දැක්ම පෙන්වන ආකාරය පැහැදිලි කිරීමට
- ❖ ලෝකය ගැන හා ලෝකය තුළ උන්වහන්සේගේ මෙහෙය ගැන යේසුස්වහන්සේ ඉගැන්වූ දේ සාරාංශ කිරීමට
- ❖ ලෝකය සඳහා වන දෙවියන්වහන්සේගේ සැලැස්මේ යේසුස්වහන්සේගේ කුරුසියේ වැදගත්කම පැහැදිලි කිරීමට හැකිවනු ඇත.

### ප්‍රධාන පදය

**ඔබ මට කරන්ට දුන් වැඩ මම නිමකර පොළොවේදී ඔබ ගෞරවයට පැමිණෙව්මි. (යොහන් 17:4)**

### හැඳින්වීම

දේව වචනයේ ඉදිරිපත් කර ඇති ආකාරයට ලෝකය පිළිබඳ අධ්‍යයනය මෙම පරිච්ඡේදයෙන් තවදුරටත් සිදුවේ. නව ගිවිසුමේ එළිදරව් කර ඇති බයිබලීය ලෝක දැක්ම මෙහිදී විස්තර කෙරේ. යේසුස්වහන්සේගේ උපත පිළිබඳ නිවේදනයේ සිට උන්වහන්සේගේ ජීවිතය මරණය හා උත්ථානය තෙක් නව ගිවිසුම ලෝකය පිළිබඳව අවධාරණය කරයි.

මෙම අවධාරණය යේසුස්වහන්සේ ස්වර්ගයට ගිය පසුව වුවද සභාව විසින් ශුභාරංචිය සියලු ජාතීන් වෙත ගෙන යැමේදී ද සිදුවේ. මීළඟ පරිච්ඡේදයෙන් "ඔබ ලෝකයේ ඇති සභාව" ගැන ඉගෙන ගන්නෙහිය.

### යේසුස්වහන්සේගේ උපත දැනුම්දීම

නව ගිවිසුමේ වාර්තා වන යේසුස්වහන්සේගේ උපත පිළිබඳ පළමු දැන්වීම දෙන ලද්දේ දේව දූතයෙකු විසින් කන්‍යාවක වූ මරියා නමැති ස්ත්‍රියකට වේ. මේ පිළිබඳව ලූක් 1 හි කියවන්න.

ලෝකයට යේසුස්වහන්සේගේ පැමිණීම පරණ ගිවිසුමේ එළිදරව් කරන ලද දෙවියන්වහන්සේගේ සැලැස්මේ කොටසකි.

**"උන්වහන්සේ අපේ පියවරුන්ට කී ලෙස ආබ්‍රහම්ටද ඔහුගේ වංශයටද සදාකල්ම . . ." (ලූක් 1:54-55)**

යේසුස්වහන්සේගේ උපත පිළිබඳ දැනුම්දීම ලූක් 2:10-14න් කියවන්න. "භය නොවන්න බලව මුළු සෙනඟට මහත් ප්‍රීතියක් උපදවන යහපත් ආරංචි නුඹලාට ගෙනෙමි" (10) හා "ඉතා උසස් තැන්හි දෙවියන්වහන්සේට මහිමය ද පොළොවෙහි උන්වහන්සේට ප්‍රිය වූ මනුෂ්‍යයන් අතරෙහි සමාදානය ද වේවා" (14 පදය) වැනි වාක්‍ය දෙස බලන්න. "මුළු සෙනඟට" යන්නෙන් අදහස් වන්නේ ලෝකයේ සිටින සියලු දෙනාට වේ. යේසුස්වහන්සේගේ උපත පිළිබඳ මෙම දැනුම් දීමෙන් එළිදරව් වන්නේ උන්වහන්සේ වැඩියේ ලොව සියලු දෙනා වෙනුවෙන් බවය.

ශුභාරංචිය පොළොවේ සියලු මනුෂ්‍යයන් වෙතට බව ඔප්පු කෙරෙන වෙනත් ප්‍රකාශයක් නොතිබුණ ද මෙය ඒ සඳහා ප්‍රමාණවත් වේ.

## යේසුස්වහන්සේ කැප කිරීම

ජුදෙව් සම්ප්‍රදාය අනුව යේසුස්වහන්සේ කැප කිරීම පිණිස දේව මාළිගාවට ගෙන ගිය අවස්ථාවේ උන්වහන්සේ ලෝකයා වෙනුවෙන් පොරොන්දුවූ ගැළවුම්කාරයාණන් බව සිමියොන් හැඳින ගත්තේය. මේ සිද්ධිය ලූක් 2:25-32හි කියවන්න. යේසුස්වහන්සේ පැමිණියේ දෙවියන්වහන්සේ හා මිනිසා සමාදානය කිරීමට බව සිමියොන් පැවසීය.

> **සියලු මනුෂ්‍යයන් ඉදිරියෙහි ඔබ විසින් පිළියෙල කළාවූ ගැළවීම මාගේ ඇස්වලින් දුටුවෙමියි කීවේය. (ලූක් 2:31-32)**

ලෝකය සඳහා යේසුස්වහන්සේගේ සේවය පිළිබඳව නව ගිවිසුමෙහි සඳහන් තවත් අනාවැකියක් ජුදෙව් ආගමේ උත්තම පූජකයා වූ කායාපස් විසින් පසු කලෙක දෙන ලදි. ඔහු මෙසේ කීය:

> **මුළු ජාතිය විනාශ නොවන පිණිස සෙනඟ උදෙසා එක මනුෂ්‍යයෙකුගේ මරණය නුඹලාට ප්‍රයෝජන ඇති බව නුඹලා කල්පනා කරන්නේ නැතැයි කීවේය. ඔහු ඒ කීම තමා විසින්ම උපදවා කීවා නොවේය. ඔහු ඒ අවුරුද්දට උත්තම පූජකයාව සිටි බැවින් යේසුස්වහන්සේ ඒ ජාතිය උදෙසා මැරෙන බවත් ඒ ජාතිය උදෙසා පමණක් නොව දෙවියන්වහන්සේගේ විසිර ගියාවූ දරුවන් එකට රැස් කරන පිණිස මැරෙන බවත් අනාගතවාක්‍යයෙන් කීවේය. (යොහන් 11:50-52)**

## යොහන් බව්තිස්ත

යේසුස්වහන්සේගේ පැමිණීම උදෙසා සෙනඟ සූදානම් කිරීමට දෙවියන්වහන්සේ තෝරා ගත්තේ යොහන් බව්තිස්ත වේ. ඔහුගේ උපත හා ඔහුගේ ජීවිතය සඳහා දෙවියන්වහන්සේගේ සැලැස්ම ගැන ලූක් 1 වන පරිච්ඡේදය කියවන්න.

යොහන් යේසුස්වහන්සේ සෙනඟට හඳුන්වා දෙන විට පැවසුවේ, "සියලු මනුෂ්‍යයෝ දෙවියන්වහන්සේගේ ගැළවීම දකින්නෝය" (ලූක් 3:3-6) යනුවෙනි.

යොහන් යේසුස්වහන්සේ "ලෝකයේ පව් දුරුකරන බැටළු පැටියා" ලෙස ද හැඳින්විය.

> **පසුවදා ඔහු තමා ළඟට යේසුස්වහන්සේ එනවා දැක කථාකොට : අන්න ලෝකයේ පාපය දුරු කරන දෙවියන්වහන්සේගේ බැටළු පැටියාණෝ. (යොහන් 1:29)**

පැරණි ගිවිසුමේ පාපය වෙනුවෙන් පූජා කිරීමට බැටළු පැටියන් භාවිත කෙරිණි. පාපය සඳහා දෙවියන්වහන්සේගේ පූජාව වූයේ යේසුස්වහන්සේය. උන්වහන්සේ සම්පූර්ණ අවසාන පූජාව වේ. පාපය සඳහා කමාව ලබා ගැනීමට පැරණි ගිවිසුමේ පුරුද්ද වූ සතුන්ගේ ලේ පූජා කිරීම තව දුරටත් අවශ්‍ය වන්නේ නැත.

යේසුස්වහන්සේ "ලෝකයේ ආලෝකය" බව යොහන් පැවසිය

> **ලෝකයට එන්නාවූ සියලු මනුෂ්‍යයන් ආලෝක කරන්නාවූ ආලෝකය සත්‍ය වූ ආලෝකයය. උන්වහන්සේ ලෝකයෙහි සිටි සේක. ලෝකයද උන්වහන්සේ කරණකොටගෙන සාදන ලද්දේය. නුමුත් ලෝකයා උන්වහන්සේ ඇඳින ගත්තේ නැත. (යොහන් 1:9-10)**

## යේසුස්වහන්සේගේ හැසිරීම

යේසුස්වහන්සේ තම සේවයෙහිදී ලෝකයා වෙනුවෙන් ඇති උන්වහන්සේගේ මහා ප්‍රේමය උන්වහන්සේ කළ කී දෙයින් එළිදරව් කළ සේක. පන්දහසකට කන්ට දීම මතෙව් 14:13-21න් කියවන්න. ශ්‍රාවකයන් සෙනඟ දැක්කේ කරදරයක් ලෙසය. යේසුස්වහන්සේ ඔවුන් දැක්කේ දෙවියන්වහන්සේගේ ප්‍රේමය පෙන්වීමේ අවස්ථාවක් ලෙසය.

යේසුස්වහන්සේ හා සමාරියේ ස්ත්‍රිය ගැන යොහන් 4:1-42 හි කියවන්න. මෙම ආදර්ශයෙන් යේසුස්වහන්සේ පෙන්නුම් කළේ පාපය සඳහා දෙවියන්වහන්සේගේ මිදීමේ සැලැස්මේ ජාතීන් අතර වෙනසක් නැති බවය.

සමාරියේ මිනිසුන් පැවසුවේ: ස්ත්‍රියට කථාකොට: **අප දැන් අදහන්නේ නුඹේ කීම නිසා නොවේ. මක්නිසාද අපිම අසා සැබෑවටම මුන්වහන්සේ ලෝකයාගේ ගැළවුම්කාරයාණන් බව දනිමුයයි කීවෝය. (යොහන් 4:42)**

ලෝක ව්‍යාප්ත ආත්මික අස්වැන්න පිළිබඳ මහා දර්ශනය යේසුස්වහන්සේ තම ශ්‍රාවකයන් සමඟ බෙදා ගත්තේ මේ අවස්ථාවේය.

> **තව සාරමසක් ගිය කළ ගොයම් කපන කාලය පැමිණෙන්නේ යයි නුඹලා කියනවා නොවේද? මම නුඹලාට කියමි- නුඹලාගේ ඇස් ඔසවා කුඹුරු දෙසට යොමා ගොයම් දැනටම කැපීමට පැහී තිබෙන බව බලන්න. (යොහන් 4:35)**

උන්වහන්සේ තම ශ්‍රාවකයන්ට මෙසේ පැවසූ සේක :

> **එවිට උන්වහන්සේ තම ගෝලයන්ට කථාකොට: ගොයම නම් බොහෝය. නුමුත් ගොවියෝ ස්වල්ප දෙනෙක්ය. එබැවින් තමන් ගොයම් කැපීමට ගොවියන් එවන ලෙස ගොයමේ ස්වාමියාට යාච්ඤා කරන්නැයි කී සේක. (මතෙව් 9:37-38)**

මරියා යේසුස්වහන්සේ ආලේප කළ ආකාරය මාර්ක් 14:1-9 හි කියවන්න. ඇතැම් අය මේ වටිනා තෙල යේසුස්වහන්සේගේ හිසේ වත්කිරීම ගැන ඇ විවේචනය කළහ. එහෙත් යේසුස්වහන්සේ මෙසේ පැවසූ සේක:

> **සැබවක් නුමලාට කියමි - ලොව මුළුල්ලේ ශුභාරංචිය ප්‍රකාශ කරනු ලබන සෑම තැන්වලදීම මේ ස්ත්‍රිය කළ මේ ක්‍රියාවත් ඈ ගැන සිහිවීමක් කොට කියනු ලබන්නේයයි කී සේක. (මාර්ක් 14:9)**

මෙම ප්‍රකාශයෙන් යේසුස්වහන්සේ එළිදරව් කළේ ශුභාරංචිය මුළු ලෝකයේම පැතිරීම උන්වහන්සේගේ අභිප්‍රාය බවය.

දේව මාළිගාව පවිත්‍ර කිරීම පිළිබඳව මාර්ක් 11:15-17න් කියවන්න. උන්වහන්සේ නැවතත් ලෝකය අවධාරණය කර ඇත.

> **උන්වහන්සේ උගන්වමින් ඔවුන්ට කියන සේක්: මාගේ ගෘහය සියලු ජාතීන්ට යාච්ඤා ගෘහයකැයි කියනු ලබන්නේයයි ලියා තිබෙනවා නොවේද? නුමුත් නුඹලා ඒක සොරුන්ගේ ගුහාවක් කළහුයයි කී සේක. (මාර්ක් 11:17)**

අද අපේ නමස්කාර මධ්‍යස්ථාන බොහොමයක් දෙවියන්වහන්සේගේ පරමාර්ථයෙන් ඈත් වී තිබේ. උන්වහන්සේගේ සැලැස්ම සාක්ෂාත් කිරීම සඳහා අපව නැවත වරක් යේසුස්වහන්සේ විසින් පවිත්‍ර කිරීම අවශ්‍යය.

> **මාගේ ශුද්ධ කන්දට පමුණුවා මාගේ යාච්ඤා ගෘහයෙහි ප්‍රීතිවන්ට ඔවුන්ට සලස්වන්නෙමි. ඔවුන්ගේ දවන පූජා සහ යාග මාගේ පූජාසනය පිට පිළිගනු ලබන්නේය. මක්නිසාද මාගේ ගෘහය සියලු ජාතීන්ට යාච්ඤා ගෘහයක්යයි කියනු ලබන්නේය. (යෙසායා 56:7)**

## යේසුස්වහන්සේගේ ඉගැන්වීම්

යේසුස්වහන්සේ තම ඉගැන්වීම්වලින් ද හැසිරීමෙන් ද ලෝකයා වෙනුවෙන් ඇති දෙවියන්වහන්සේගේ සැලැස්ම අවධාරණය කළ සේක.

ඔබගේ බයිබලයේ පහත දැක්වෙන කොටස් අධ්‍යයනය කරන්න.

මතෙව් 5:13-16 : යේසුස්වහන්සේගේ අනුගාමිකයෝ පොළොවේ ලුණු ද ලෝකයේ ආලෝකය ද විය යුතුවේ.
මතෙව් 6:10 : දෙවියන්වහන්සේට පොළොවේ ඉටු කළ යුතු අධිෂ්ඨානයක් හා සැලැස්මක් ඇති බව සහතික කෙරේ.

මතෙව් 6:19, 16:26, මාර්ක් 8:36, ලූක් 12:22-32, යොහන් 12:25 : අප සැලකිලිමත් විය යුත්තේ ලෞකික දේ ගැන නොව සදාතනික දේ ගැන වේ.

මතෙව් 9:6, මාර්ක් 2:10, ලූක් 5:24 : පාපයට කමාව දීමේ බලය යේසුස්වහන්සේට ඇත.

මතෙව් 13:35 : ලෝකයේ පටන් ගැන්මේ සිටම අබිරහසක්ව පැවති ලෝකයා සඳහා වූ දෙවියන්වහන්සේගේ සැලැස්ම යේසුස්වහන්සේ එළිදරව් කළ සේක.

මතෙව් 21:43 : විජාතිකයන්ට ශුභාරංචිය පැතිරීම ගැන යේසුස්වහන්සේ අනාවැකි පල කරයි.

ලූක් 4:18-19 : පොළොවේ මනුෂ්‍යයන්ගේ අවශ්‍යතා ගැන යේසුස්වහන්සේට ඇති හැඟීම බලන්න.

ලූක් 12:49-51, යොහන් 9:39, 12:31 : යේසුස්වහන්සේ පැමිණියේ පොළොව මත ගින්න (විනිශ්චය කිරීමට) ගෙන ඒමට හා පාපය හා ධර්මිෂ්ඨකම අතර බෙදීමක් ඇති කිරීමට වේ.

ලූක් 13:28-29 : අවසාන කාලයේ ජාතීන් එක්රැස් කිරීමට ඉගැන්වූ සේක.

යොහන් 3:16-18, 12:47, 17:6, 18:37 : මෙම පදවලින් උන්වහන්සේ ලෝකයට පැමිණීමේ පරමාර්ථය හඳුන්වා දෙයි.

යොහන් 6:33-51 : ඕනෑම කෙනෙකුට තමා ජීවනයේ ආහාර බව හා ලෝකයාගේ ජීවිතය සඳහා තමා මාංශය පූජා කරන බවත් පැවසූ සේක.

යොහන් 7:7 : ලෝකයේ පාපී ස්වභාවය ගැන යේසුස්වහන්සේ කතා කළ සේක.

යොහන් 8:12 : යේසුස්වහන්සේ තමන්වහන්සේ ලෝකයේ ආලෝකය ලෙස ඉදිරිපත් කළ සේක. (9:5 හා 12:46 ද බලන්න.)

යොහන් 8:23,26 : තමන්වහන්සේ මේ ලෝකයෙන් නොවන බවත් එහෙත් මෙලොවට එවනු ලැබුවේ දෙවියන්වහන්සේගේ පණිවුඩය පැවසීමට බවත් යේසුස්වහන්සේ පැවසූ සේක.

යොහන් 12:47 : තමන්වහන්සේ පැමිණියේ ලෝකය ගළවන්නට බව යේසුස්වහන්සේ පැවසූ සේක.

යොහන් 10:1-16 : ශුභාරංචිය විජාතීන්ට (ඉශ්‍රායෙලයට අයත් නොවන බැටළුවන්ට) දේශනා කරන බවට අනාවැකි මෙම කොටසින් ප්‍රකාශ වේ. සියලු සෙනඟ එකරැළක් වන විට වෙන් කිරීමේ මායිම් ඉවත් කෙරෙනු ඇත.

යොහන් 12:20-36 : ලෝකයාගේ පාපය වෙනුවෙන් මිය යෑමෙන් සියලු මිනිසුන් තමා වෙතට ළංකර ගන්නා බව යේසුස්වහන්සේ වදාළ සේක. ලෝකයේ සෑම පෙදෙසකින් ස්ත්‍රීන් හා පුරුෂයන් උන්වහන්සේ ළංකර ගන්නා සේක.

යොහන් 15:18-19, 16:33, 17:14-16 : යේසුස්වහන්සේ ප්‍රතික්ෂේප කළ ආකාරයටම උන්වහන්සේගේ අනුගාමිකයන් ද ලෝකයා විසින් ප්‍රතික්ෂේප කරනු ඇත.

යොහන් 16:8 : ශුද්ධාත්මයාණන්වහන්සේ වැඩිය කල උන්වහන්සේ ලෝකයේ පාපයට තරවටු කරන සේක.

## යේසුස්වහන්සේගේ උපමා කතා :

යේසුස්වහන්සේ තම සේවා කාලය තුළ බොහෝ උපමා කතා පැවසූ සේක. උපමා කතා යනු ආත්මික සත්‍යයන් පැහැදිලි කිරීමට භාවිත කළ ස්වාභාවික නිදර්ශන වේ. ඒවා ස්වර්ගික තේරුමක්

ඇති පොළොවේ කතන්දර ලෙස හැඳින්වේ. උපමා කතා තුළින් යේසුස්වහන්සේ ලෝකය පිළිබඳ දෙවියන්වහන්සේගේ සැලැස්ම ගැන බොහෝ දේ එළිදරව් කළ සේක.

**යහපත් සමාරියයා: (ලූක් 10)**

ඉශ්රායෙලයේ සෙනඟ සමාරියේ සෙනඟ සමග හොඳ සබඳතාවක් පැවැත්වූයේ නැත. මාගේ අසල්වැසියා කවුද යන ප්‍රශ්නය දිගුකලක් ආගමික නායකයන් අතර සාකච්ජා කෙරිණි. මෙම කතාවෙන් ඉගැන්වූයේ වෙනත් සංස්කෘතියක් ඇති අය වෙත තිබිය යුතු නිවැරදි ආකල්පය වේ.

**නැතිවුණු පුත්‍රයා (ලූක් 15)**

මෙම කතාවේ වැඩිමහල් සහෝදරයාගේ ආකල්පය යේසුස්වහන්සේගේ කාලයේ සිටි ඉශ්‍රායෙල් ආගමික නායකයන්ගේ ආකල්පයට සමාන වේ. දෙවියන්වහන්සේගේ ප්‍රේමය අනෙකුත් ජාතීන් වෙතට දැක්වීම ගැන ඔවුහු කැමති නොවූහ. දෙවියන්වහන්සේගේ ගැළවීම අනෙකුත් ජාතීන් දැනගැනීම ගැන ඔවුහු විරුද්ධ වූහ.

අපි ඉශ්රායෙලය විවේචනය කරන්නෙමු නම් වර්තමාන සභාවේ බොහෝ අයට මෙම ආකල්පයම ඇති බව අප මතක තබා ගත යුතුය. යේසුස්වහන්සේ නොමැතිව මිථ්‍යාදෘෂ්ටි අඳුරේ තවමත් වෙසෙන අය ගැන එතරම්ම හැඟීමක් නොමැතිව අපි දෙවියන්වහන්සේගේ ආශීර්වාද තුළ සුරැකිව ජීවත් වෙමු.

**මහා මංගල භෝජනය (ලූක් 14:16-24)**

මෙම කතාවෙන් එළිදරව් වන්නේ දේව රාජ්‍යයට ඇතුළු වීමේ පළමු අවස්ථාව ඉශ්‍රායෙල්වරුන්ට දුන් නමුත් ඔවුහු එය ප්‍රතික්ෂේප කළහ. දැන් මේ කැඳවීම ලෝකයේ මහා මාවත්වල ද දෙවටවල ද සිටින අය වෙත දෙනු ලැබේ.

**වැව්ලිකරුවන් (මතෙව් 21:34-44)**

ඉශ්රායෙලය දෙවියන්වහන්සේගේ මිදිවත්ත රැකබලා ගැනීම කළ යුතුව තිබුන ද එම වගකීම පැහැර හැරිය බව යේසුස්වහන්සේ එළිදරව් කළ සේක.

**තිරිඟු හා කිරිඳි (මතෙව් 13:36-43)**

මෙම උපමා කතාවේ කෙත ලෝකය වේ. දේව වචනය ලෝකය මුළුල්ලේම පතුරනු ඇත. ලෝකය අවසානයේ දී ආත්මික අස්වැන්න දෙවියන්වහන්සේ විසින් කපා ගනු ඇත.

**වපුරන්නා (මාර්ක් 4)**

ලෝකයේ සෑම කෙත්වතුවලම බීජය වූ දේව වචනය පැතිරවිය යුතුය. එය විවිධාකාර ආත්මික පස් මතට වැටී විවිධ ප්‍රතිඵල ගෙන දෙනු ඇත.

**දේව රාජ්‍යයේ පැතිරීම (මතෙව් 13)**

ලෝකය මුළුල්ලේම දේව රාජ්‍යය පිළිබඳ ශුභාරංචිය පැතිරෙන ආකාරය පෙන්වීමට යේසුස්වහන්සේ උපමා කතා බොහොමයක් භාවිත කළ සේක. අබ ඇටය, මුහුන්, පහන, දැල, සැඟවූ නිධානය, වටිනා මුතු ඇටය හා ගෙදර අයිතිකරු පිළිබඳ කතන්දර මතෙව් 13 කියවන්න.

## යේසුස්වහන්සේ ප්‍රතික්ෂේප කරනු ලැබීම.

යේසුස්වහන්සේ විසින් ගෙනෙන ලද පණිවුඩය ඉශ්රායෙලය ප්‍රතික්ෂේප කළ නිසා මෙම ප්‍රතික්ෂේප කිරීමේ බැරෑරුම්කම පැහැදිලි කිරීමට ස්වාමීන්වහන්සේ බොහෝ නිදර්ශන භාවිත කළ සේක.

**ලාදුරු රෝගීන් දස දෙනා (ලූක් 17:12-19)**

මේ සිද්ධියේදී සමාරිය ලාදුරු රෝගියා ස්තුති කිරීමට ආපසු පැමිණි නමුත් ඉශ්රායෙලිය ලාදුරු රෝගීන් පැමිණියේ නැත. සමාරියයා දෙවියන්වහන්සේට ස්තුතිවන්ත වුවද ඉශ්‍රායෙල්වරුන් දෙවියන්වහන්සේගේ අනුග්‍රහය ගැන සැලකුවේ නැත. මෙය ශුභාරංචිය කෙරෙහි ඇති ඉශ්‍රායෙල්වරුන්ගේ හා විජාතීන්ගේ ආකල්පය අතර ඇති වෙනස පෙන්නුම් කරයි.

**කානානිය ස්ත්‍රිය (මතෙව් 15:21-28)**

යේසුස්වහන්සේගේ පළමු ප්‍රතිචාරය දරුණු බව පෙනේ. එහෙත් ඊට විශේෂ පරමාර්ථයක් තිබිණි. ඇගේ මහත් ඇදහිල්ල එළිදරව් වී එය ඉශ්‍රායෙල්වරුන්ට ආදර්ශයක් හා තරවටුවක් ලෙස සේවය කරනු ඇතැයි යේසුස්වහන්සේ බලාපොරොත්තු වූ සේක. ඇගේ ඉල්ලීම ඉටු කිරීමෙන් පෙන්වන්නේ දෙවියන්වහන්සේගේ කරුණාවට ජාතික සීමාවන් නොමැති බවය.

**ශතාධිපතියාගේ සේවකයා (මතෙව් 8:5-12)**

මොහු රෝම හමුදා භටයෙක් විය. එසේ වුවද ඔහුගේ සේවකයාට සුව කිරීමෙන් දෙවියන්වහන්සේගේ කරුණාව ඔහුටද දැක්වූ සේක. යේසුස්වහන්සේ ඔහුට කී සේක:

> **යේසුස්වහන්සේ ඒ අසා මවිතව තමන් අනුව එන්නන්ට කථාකොට : සැබවක් නුඹලාට කියමි ඉශ්‍රායෙල්හිවත් මෙබඳු මහත් ඇදහිල්ලක් නුදුටිමි. (මතෙව් 8:10)**

11 පදයේ දෙවියන්වහන්සේගේ ප්‍රකාශයෙන් එළිදරව් වන්නේ දේව රාජ්‍යය පිළිබඳ ශුභාරංචිය සියලු මනුෂ්‍යයන් සඳහා බවය.

> **තවද නුඹලාට කියමි : නැගෙනහිරින්ද බස්නාහිරින්ද බොහෝ දෙනෙක් ඇවිත් ආබ්‍රහම්ද ඊසාක්ද යාකොබ්ද සමඟ ස්වර්ග රාජ්‍යයෙහි හිඳ ගන්නෝය. (මතෙව් 8:11)**

## කුරුසිය හා ලෝකය

යේසුස්වහන්සේගේ කුරුසියේ මරණය ලෝකයා සඳහා වන දෙවියන්වහන්සේගේ සැලැස්මේ කොටසක් වේ. උන්වහන්සේගේ මරණය ලෝකයේ ගැළවීම උදෙසා පදනමය. මුළු බයිබලයේම ප්‍රධාන පණිවිඩය වේ. කුරුසිය මගින් මුළු ලෝකයට ඇති බලපෑම ගැන යේසුස්වහන්සේ බොහෝ විට අවධානය යොමු කළ සේක.

මතෙව් 20:28 : උන්වහන්සේ වැඩියේ බොහෝ දෙනෙකු උදෙසා දිවි පිදීමට වේ. බොහෝ දෙනෙකු යන්නෙන් අදහස් වන්නේ මුළු ලෝකයේම සිටින බොහෝ අය වේ.

මතෙව් 26:28 : තමන්වහන්සේගේ රුධිරය පව් කමාව පිණිස බොහෝ දෙනා උදෙසා වගුරුවනු ලැබූ බව යේසුස්වහන්සේ පැවසූ සේක.

යොහන් 3: 4-17 ලෝකයා වෙනුවෙන් වූ දෙවියන්වහන්සේගේ ප්‍රේමය යේසුස්වහන්සේ පෙන්වූයේ මනුෂ්‍ය වර්ගයාගේ පාපය වෙනුවෙන් මිය යෑමට තමන්වහන්සේගේ පුත්‍රයා දීමෙන් එළිදරව් වූ ලෙස වේ. සියලු දෙනාම යන්නෙන් අදහස් වන්නේ සියලු ජාතීන්ගේ මනුෂ්‍යයන් වේ.

යොහන් 6:51 උන්වහන්සේ පෙන්වන්නේ උන්වහන්සේ ලෝකයා වෙනුවෙන් තම ජීවිතය පූජා කිරීම වේ.

යොහන් 12:32 : ගැළවීම උදෙසා සියල්ලන් තමා වෙතට ඇදගන්නා බව යේසුස්වහන්සේ කී සේක.

පාවුලුතුමාගේ ලිපිවල ප්‍රධාන තේමාව වූයේ කුරුසිය වේ. ඔහු එහි විශ්වය සඳහා පරමාර්ථය වඩ වඩා එළිදරව් කළේය.

රෝම 5:12-21 : ආදම්ගේ පාපය තුළින් සියලු මනුෂ්‍යයන් වෙත විනිශ්චය පැමිණියේය. කුරුසිය මත යේසුස්වහන්සේගේ මරණය තුළින් සියල්ලන් වෙත ධර්මිෂ්ඨකම පැමිණියේය.

2 කොරින්ති 5:14-19 : යේසුස්වහන්සේ සියල්ලන් වෙනුවෙන් මැරුණු අතර දෙවියන්වහන්සේ යේසුස්වහන්සේ තුළින් ලෝකයා තමන්වහන්සේ වෙතට සමාදාන කළ සේක.

ගලාති 1:4 : දෙවියන්වහන්සේගේ කැමැත්ත පරිදි යේසුස්වහන්සේ අපේ පව් උදෙසා සිය දිවි පිදූ සේක.

එපිස 3:6-11 : මිථ්‍යාදෘෂ්ටි ජාතීන් යේසුස්වහන්සේගේ ශාන්තිකර පූජාවේ වරප්‍රසාද ලබා ගනු ඇත.

කොලොස්සි 1:20 : කුරුසිය මත යේසුස්වහන්සේගේ මරණය තුළින් දෙවියන්වහන්සේ සමඟ සාමය හා සමාදානය ලැබේ.

1 තිමෝති 1:15 : යේසුස්වහන්සේ පව්කාරයන් ගළවන්ට ලෝකයට වැඩිය සේක.

1 තිමෝති 2:5-6 : ඇත්තේ එකම මැදහත්කාරයෙකි. ඒ යේසුස්වහන්සේ පමණය. උන්වහන්සේ තුළින් සෑම ගෝත්‍රයකටම හා ජාතියකටම අයත් අය එකම සැබෑවූ දෙවියන්වහන්සේ වෙතට පිවිසෙති.

හෙබ්‍රෙව් 9:11-12 : මනුෂ්‍යයන්ගේ සියලු පව් උදෙසා යේසුස්වහන්සේ එක්වරක් දුක් විඳි සේක.

1 යොහන් 4:9,14 : කුරුසියේ ඇති ලෝක ව්‍යාප්ත බලපෑම ගැන යොහන් ද අවධානය යොමු කරයි. යේසුස්වහන්සේ ලෝකයට එවන ලද්දේ ලෝකයාගේ ගැළවුම්කරු වීම පිණිසය.

## අවසන් මෙහෙය

යේසුස්වහන්සේ කුරුසිය මත මරණයට මුහුණ දුන් විට මෙසේ පැවසූ සේක : යේසුස්වහන්සේ උත්තර දෙමින් ,

> **මම රජෙක්යයි නුඹ කියනවා හරිය. ඒ පිණිස මම ඉපිද සිටිමි. මා ලෝකයට ඇවිත් සිටින්නේ සත්‍යයට සාක්ෂි දෙන පිණිසය. සත්‍යයෙන් වූ සියල්ලෝ මාගේ හඬ අසතියි කී සේක. (යොහන් 18:37)**

ලෝකයේ සමාදානය සඳහා වන දෙවියන්වහන්සේගේ සැලැස්ම කුරුසිය මත තමන්වහන්සේගේ මරණය තුළින් සම්පූර්ණ වූ බව යේසුස්වහන්සේ ප්‍රකාශ කළ සේක.

> **ඔබ මට කරන්ට දුන් වැඩ මම නින්දුකර පොළොවේදී ඔබ ගෞරවයට පැමිණෙවීමි. (යොහන් 17:4)**

## යේසුස්වහන්සේගේ පැවරීම

තම මරණයෙන් තුන් දවසකට පසු යේසුස්වහන්සේ උත්ථාන වූ සේක (මතෙව් 28). උත්ථාන වීම හා ස්වර්ගාරෝහණය අතර යේසුස්වහන්සේ තම අනුගාමිකයන්ට කිහිප වරක්ම පෙනී සිටි සේක. උන්වහන්සේ ඔවුන් හමු වූ සෑම අවස්ථාවකම කතා කළේ ශුභාරංචි පණිවුඩය ලෝකය වෙත ගෙන යෑම පිළිබඳවය. උන්වහන්සේ ඔවුන්ට අභියෝගයක් කළ සේක. එය මහා පැවරීම ලෙස හැඳින්වේ. උන්වහන්සේගේ ශ්‍රාවකයන් මේ අභියෝගයට මුහුණ දුන් ආකාර ඊළඟ පරිච්ඡේදයෙන් ඔබ ඉගෙන ගනු ඇත.

## ස්වයං පරීක්ෂණය

1. ප්‍රධාන පදය මතකයෙන් ලියන්න.

2. යේසුස්වහන්සේගේ උපත පිළිබඳ දැනුම් දීමේදී ලෝකයා සඳහා වන දෙවියන්වහන්සේගේ සැලැස්ම එළිදරව් වූ ආකාරය පැහැදිලි කරන්න

3. ක්‍රිස්තුස්වහන්සේගේ හැසිරීම තුළින් බයිබලීය ලෝක දැක්ම ප්‍රදර්ශනය වූ ආකාරය පැහැදිලි කරන්න

4. ලෝකය හා එහි තමන්වහන්සේගේ මෙහෙය ගැන යේසුස්වහන්සේ ඉගැන් වූ දේ සාරාංශ කරන්න

5. ලෝකයා සඳහා වන දෙවියන්වහන්සේගේ සැලැස්මේ යේසුස්වහන්සේගේ කුරුසියේ වැදගත්කම පැහැදිලි කරන්න

6. දෙවියන්වහන්සේගේ වැඩ උන්වහන්සේ අවසන් කළ බව පැවසීමෙන් යේසුස්වහන්සේ අදහස් කළේ කුමක්ද?

(පරීක්ෂණ සඳහා පිළිතුරු මෙම අත්පොතේ අවසාන පරිච්ඡේදය අවසානයේ ඇත.)

## තවදුරටත් අධ්‍යයනය සඳහා

පහත දැක්වෙන යොමුවීම් අධ්‍යයනය මඟින් ලෝකය පිළිබඳව තවදුරටත් ඉගෙන ගන්න. ලෝකය ගැන හා ශුභාරංචිවල ඇති ඊට සම්බන්ධ වචනවල යොමුවීම් සියල්ල මේවා වේ.

**මතෙව්:** 5:5,13,14; 6:19; 9:6; 10:34 13:35,38-40,49; 16:19,26; 18:18,19; 21:4; 24:3,7,9,14,30,35; 25:32,34; 28:18-20;

**මාර්ක්:** 2:10; 4:5,19; 8:36; 10:30; 11:17; 13:8,10,27,31; 14:9; 16:15

**ලූක්:** 1:70; 5:24; 11:50; 12:30,49,51; 18:30; 21:10,25,26,33,35; 24:47

**යොහන්:** 1:9,10,29; 3:16,17,19,31; 4:42; 6:33,51; 7:7; 8:12,23,26; 9:5,39; 11:51,52; 12:19,25,31,32,4647; 14:17,19,31; 15:18,19; 16:11,21; 28:33; 17:4,6,11,14-16,18,21,23;

# හයවන පරිච්ඡේදය

## ලෝකයේ ඇති සභාව

### අරමුණු

මෙම පරිච්ඡේදය අධ්‍යයනයෙන් පසු ඔබට
- ❖ ප්‍රධාන පදය මතකයෙන් ලිවීමට
- ❖ "ශ්‍රේෂ්ඨ පැවරීම" පැහැදිලි කිරීමට
- ❖ "ශ්‍රේෂ්ඨ පැවරීම්" සඳහා ඇති ශුද්ධ ලියවිලි යොමුවීම් ඉදිරිපත් කිරීමට
- ❖ "සභාව" යන වචනය නිර්වචනය කිරීමට
- ❖ සභාව අරම්භ වූ ආකාරය පැහැදිලි කිරීමට
- ❖ සභාව පසුපස ඇති ආත්මික බලය හඳුනා ගැනීමට
- ❖ සභාව සඳහා දෙවියන්වහන්සේගේ සංවිධානාත්මක සැලැස්ම සාරාංශ කිරීමට
- ❖ සභාවේ පරමාර්ථය සඳහන් කිරීමට
- ❖ "දේව රාජ්‍යය පිළිබඳ ශුභාරංචියේ" මූලික කරුණු පැහැදිලි කිරීමට හැකිවනු ඇත.

### ප්‍රධාන පදය

**නුමුත් ශුද්ධාත්මයාණන්වහන්සේ නුඹලා කෙරෙහි පැමිණි කල නුඹලා බලය ලබන්නහුය. එවිට නුඹලා යෙරුසලමෙහිද මුළු යුදයෙහිද සමාරියෙහිද පොළොවේ සීමාව දක්වාද මාගේ සාක්ෂිකාරයෝ වන්නහුයයි කී සේක. (ක්‍රියා 1:8)**

## හැඳින්වීම

ලෝකයාට ගැළවීම ගෙන ඒමේ තම සැලැස්ම එළිදරව් කිරීම සඳහා යොදා ගැනීමට පැරණි ගිවිසුම් සමයේ දෙවියන්වහන්සේ ඉශ්‍රායෙල් ජාතිය එසවූ සේක. ඉශ්‍රායෙල් සෙනඟ යේසුස්වහන්සේ ප්‍රතික්ෂේප කළ පසු දෙවියන්වහන්සේ තම ක්‍රියාවන් ලෝකය තුළ දියත් කිරීමට අලුත් සෙනඟ කණ්ඩායමක් එසවූ සේක. එම කණ්ඩායම සභාව ලෙස හැඳින්වේ. ජාතීන් සඳහා ඇති දෙවියන්වහන්සේගේ සැලැස්මේ සභාවට විශේෂ තැනක් හා පරමාර්ථයක් තිබේ. මෙම පාඩමෙන් ලෝකයේ ඇති සභාවේ භූමිකාව පැහැදිලි කෙරේ.

## ශ්‍රේෂ්ඨ පැවරීම

යේසුස්වහන්සේ මරණයෙන් උත්ථානය වූ පසු උන්වහන්සේ තම අනුගාමිකයන්ට කිහිපවරක්ම දර්ශනය වූ සේක. ඒ සෑම අවස්ථාවකම වැදගත් අභියෝගයක් ඔවුන්ට ඉදිරිපත් කළ සේක. එම අභියෝගය වූයේ මුළු ලෝකයා වෙතම ශුභාරංචි පණිවුඩය ගෙන යෑම වේ. යේසුස්වහන්සේ විසින් ඇදහිලිවතුන්ට දෙන ලද මෙම පැවරුම "ශ්‍රේෂ්ඨ පැවරුම" ලෙස හැඳින්වේ. එය මනුෂ්‍යයන්ට දෙන ලද ශ්‍රේෂ්ඨතම පැවරුම වේ. එය සෑම කෙනෙකු වෙත ශුභාරංචිය ගෙන යෑමේ වගකීමය.

පහත දැක්වෙන ඡේදවල යේසුස්වහන්සේ තම අනුගාමිකයන්ට දෙන ලද ශ්‍රේෂ්ඨ පැවරුම සඳහන් වේ.

**යොහන් 20:21-23**

යේසුස්වහන්සේ තම අනුගාමිකයන්ට මෙසේ කී සේක : පියාණන්වහන්සේ මා එවා වදාළාක් මෙන් මම ද ඔබ යවමි. ශ්‍රේෂ්ඨ පැවරුම ආරම්භ වූයේ දෙවියන්වහන්සේගෙන් වේ. වසර ගණනාවක් තුළ දෙවියන්වහන්සේ තම පණිවුඩකරුවන් ද දිවැසිවරුන් ද පාපී මිනිසුන් තමන්වහන්සේ වෙතට

ඇඳගැනීම සඳහා එවූ සේක. මෙම පණිවුඩකරුවන් බොහෝ විට ප්‍රතික්ෂේප කෙරිණි. අන්තිමේදී දෙවියන්වහන්සේ තම එකම පුත්‍රයාණන් වන යේසුස්වහන්සේ එවූ සේක.

පණිවුඩකරුවෙකු ලෙස යේසුස්වහන්සේගෙන් දෙවියන්වහන්සේට අවශ්‍ය වූ සියලු දෙය උන්වහන්සේ අපගෙන් ද බලාපොරොත්තු වන සේක. මන්ද අප එවා ඇත්තේ ද පියාණන්වහන්සේ උන්වහන්සේ එවූ ලෙසම වේ. යේසුස්වහන්සේගෙන් අවශ්‍ය වූයේ මොනවාද?

- උන්වහන්සේ පැමිණීයේ දිව්‍යමය මෙහෙවරක් ඇතිව වේ.
- උන්වහන්සේ ලෝකයට පැමිණීම සඳහා සියල්ල අත්හැරිය සේක.
- වැටුණු මනුෂ්‍යයා සමඟ අනන්‍යතාව දැක්වීම සඳහා කැමති වූ සේක.
- උන්වහන්සේ එම මෙහෙවර සඳහා දුක් විඳීමට හා මිය යෑමට කැමති වූ සේක.
- උන්වහන්සේ තම මෙහෙවර ඉටු කළේ ප්‍රකාශ කිරීමෙන් මෙන්ම ප්‍රදර්ශනය කිරීමෙනි.
- දෙවියන්වහන්සේ උන්වහන්සේට පැවරූ කාර්යය අවසන් කළ සේක.

**ලූක් 24:45-49**

අපි පෙර පරිච්ඡේදයක මෙම කොටස ශුද්ධ ලියවිල්ලට යතුරක් (ඇතුළු වීමේ මඟක්) ලෙස අධ්‍යයනය කළෙමු. එය යේසුස්වහන්සේගේ මරණය හා උත්ථානය සඳහා දෙවියන්වහන්සේගේ සැලැස්ම එළිදරව් කරයි. එය සමගි කිරීමේ පණිවුඩය ලෝකයේ ජාතීන් සමග බෙදා ගැනීමට කැඳවයි.

මිනිසුන්ගේ පාපය සඳහා යේසුස්වහන්සේ මිය යෑම ප්‍රමාණවත් නොවේ. නැති වූ මිනිසුන් නිරායාසයෙන්ම ගැළවීම ලබන්නේ නැත. අප ඔවුන් සමඟ ශුභාරංචිය බෙදා ගෙන ඔවුන් දෙවියන්වහන්සේ වෙතට ගෙන ආ යුතුය. පාපයේ විපාකය මරණයයි (රෝම 6:23). පාපය නිසා සෑම පුරුෂයෙක් හා ස්ත්‍රියක්ම නිරයට යමින් සිටිති. ස්වාමී වූ යේසුස්වහන්සේ පිළිගෙන පාපය වෙනුවෙන් කමාව ලබා ගන්නා අය පමණක් ගැළවීම ලබති.

එක්කෙනෙකු හෝ විනාශවීම දෙවියන්වහන්සේට අවශ්‍ය නැත.

> **ප්‍රමාදයයි සමහරුන් සලකන හැටියට ස්වාමින්වහන්සේ තමන්ගේ පොරොන්දුව ගැන ප්‍රමාද නොවන සේක. නුමුත් සියල්ලන්ම පසුතැවිලි වෙනවාට මිස කිසිවෙක් විනාශ වෙනවාට උන්වහන්සේ නොකැමැතිව නුඹලා කෙරෙහි බොහෝ කල් ඉවසන සේක. (2 පේතෘස් 3:9)**

ලෝකයේ සිටින සෑම කෙනෙක්ම ගළවා ගැනීම දෙවියන්වහන්සේගේ කැමැත්ත බවට ප්‍රශ්නයක් නැත.

> **මක්නිසාද ස්වාමින්වහන්සේගේ නාමයට යාච්ඤා කරන කවුරු නුමුත් ගළවනු ලබන්නේය. (රෝම 10:13)**

එහෙත් **"එසේනම් ඔවුන් තමුන් විසින් අදහා නොගත්තාවූ කෙනෙකුට යාච්ඤා කරන්නේ කොහොමද? තමන් නොඇසුවාවූ කෙනෙකු කෙරෙහි අදහන්නේ කොහොමද? දේශනා කරන්නෙක් නැතුව ඔවුන් අසන්නේ කොහොමද?" (රෝම 10:14)**

සෑම කෙනෙක්ම ගැළවීම ලැබීම දෙවියන්වහන්සේට අවශ්‍යය. එහෙත් මෙම ශුභ ආරංචිය කවුරුන් හෝ ඔවුන්ට කිව යුතුය.

**මාර්ක් 16:14-16**

ආඥාව "ගොස්" වේ. යා යුතු තැන "ලෝ පුරා" වේ. ශුභාරංචිය සකල සත්ත්වයාට දේශනා කළ යුතුය. බලවත් හාස්කම් ප්‍රදර්ශනය කරමින් යන අය සමඟ වැඩ කිරීමට යේසුස්වහන්සේ පොරොන්දු වූ සේක. යෑමට දී ඇති ආඥාව පිළි නොපැද සමහරු තම සේවයේ හාස්කම් සොයති. ඉන්පසු තමන්ට බලය නැත්තේ මන්දැයි සිතති.

**යොහන් 15:16**

ගොස් ආත්මික ඵල ගෙන ඒම සඳහා යේසුස්වහන්සේ අප තෝරා ගෙන අපට නියම කර ඇත. ආත්මික ඵල දැරීම පිළිබඳව මෙම සම්පූර්ණ පරිච්ඡේදය කියවන්න. යේසුස්වහන්සේ මිදි වැල ද අප අතු ද වන්නේ කෙසේදැයි ඔබ ඉන් ඉගෙන ගන්නෙහිය. ආත්මික අස්වැන්න ගෙන එන්නේ අප තුළ ගලන යේසුස්වහන්සේගේ ජීවනය වේ.

**මතෙව් 18:16-20**

දෙවියන්වහන්සේ විසින් සියලු බලය තමන්ට දී ඇති බව යේසුස්වහන්සේ පැවසූ සේක. මේ නිසා ශුභාරංචිය සමඟ ලොව වටා යෑමට තම අනුගාමිකයන්ට අනුමැතිය දීමට යේසුස්වහන්සේට අධිකාරී බලය ඇත. මෙම කොටසේ පහත ඇති ඒවා බලන්න.

**පුද්ගලයන්** : පුද්ගලයන් යනු මේ කාර්යය කිරීම සඳහා යේසුස්වහන්සේ කැඳවන අය වේ. ඔබ (සියලු ඇදහිලිවන්තයෝ) පණිවුඩකරුවෝ වෙති.

**බලය** : "සියලු බලය". පණිවුඩකරුවන්ට ඉදිරියට යෑමට හැකිවන පරිදි පෙලඹවීම ලැබෙන්නේ දෙවියන්වහන්සේගේ බලය තුළින් වේ. එය දෙවියන්වහන්සේගේ ශුද්ධාත්මයාණන්ගේ බලය මිස මිනිසාගේ බලය හෝ ක්‍රමය හෝ නොවේ.

**ප්‍රමුඛත්වය** :"ගොස්" යන්න මෙම ශ්‍රේෂ්ඨ පැවරුමේ සඳහන් නියෝගය වේ. එය අපගේ ජීවිතයට විකල්පයක් නොව ප්‍රමුඛත්වයක් වේ.

**සැලැස්ම** : භාවිත කළ යුතු ක්‍රම වන්නේ ඉගැන්වීම හා දේශනා කිරීමය.

**පරමාර්ථය** : පරමාර්ථය වන්නේ සකල ජාතීන් ශ්‍රාවකයන් කිරීමය. මෙය ශුභාරංචියේ ගුණ කිරීම වේ.

**සෙනඟ** : ශුභාරංචිය ගෙන යා යුතු සෙනඟ වන්නේ "සකල ජාතීන්ය". මෙය ආඥාවේ විශාලත්වය වේ. මුළු ලෝකයම ඊට අයත්ය.

**අභිමුඛත්වය** : අප සමඟ යන්නේ යේසුස්වහන්සේ වේ. උන්වහන්සේ මෙම වැඩසටහනේ කළමණාකරු වේ. මේ ශ්‍රේෂ්ඨ පැවරුම අප ඉටු කරන විට ශුද්ධාත්මයාණන්වහන්සේ තුළින් උන්වහන්සේ අපට මඟ පෙන්වන සේක.

**උපදේශය**: ඉගැන්විය යුතු උපදේශය වන්නේ පණිවුඩය වේ. ලෝකයා වෙත ගෙන ආ යුතු පණිවුඩය වන්නේ දේව රාජ්‍යය පිළිබඳ ශුභාරංචියය.

> **රාජ්‍යයේ මේ ශුභාරංචිය සියලු ජාතීන්ට සාක්ෂියක් පිණිස ලොව මුළුල්ලේ ප්‍රකාශ කරනු ලබන්නේය. එවිට අන්තිමය පැමිණෙන්නේය. (මතෙව් 24:14)**

ශුභාරංචිය දෙවියන්වහන්සේගේ ශුභාරංචිය (සුබ අස්න) ලෙස ද (1 තෙසලෝනික 2:9) ක්‍රිස්තුස්වහන්සේගේ ශුභාරංචිය ලෙස ද (1 තෙසලෝනික 3:2) පාවුලුතුමාගේ ශුභාරංචිය ලෙස ද (රෝම 2:16) හැඳින්වේ. මෙහි විරුද්ධ මතභේදයක් නැත. ශුභාරංචියේ ආරම්භක තැනැන්වහන්සේ දෙවියන්වහන්සේ වේ. යේසුස්වහන්සේ දෙවියන්වහන්සේගේ සැලැස්ම සාක්ෂාත් කළ සේක. පාවුලුතුමා වැනි අය ශුභාරංචිය ලද අය මෙන්ම එහි පණිවුඩකරුවෝ ද වෙති.

ශුභාරංචිය දෙවියන්වහන්සේගේ එළිදරව් වීමක් මගින් ලැබුණු අතර එය මිනිසා සැදූ දේවධර්මයක් නොවේ.

> **ඉතින් සහෝදරයෙනි මා දේශනා කළාවූ ශුභාරංචිය වනාහි මනුෂ්‍ය ප්‍රකාර වූ එකක් නොවන බව නුඹලාට දන්වමි. මක්නිසාද එය යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ එළිදරව් කිරීමෙන් මිස මා එය මනුෂ්‍යයන්ගෙන් ලැබුවේවත් උගන්වනු ලැබුවේවත් නැත. (ගලාති 1:11-12)**

1 කොරින්ති 15:1-11හි ශුභාරංචියේ සරල සත්‍යය සාරාංශ කර ඇත. මූලික පණිවුඩය වන්නේ යේසුස්වහන්සේ, උන්වහන්සේගේ මෙහෙය, පාපය සඳහා මරණය, උත්ථාන වීම, හා දර්ශනය වීම් වේ. ශුභාරංචිය පදනම් වන්නේ කරුණාව හා ඇදහිල්ල මත වේ.

ඉතා පටු අන්දමින් පැවසූ විට ශුභාරංචිය යනු යොහන් 3:16, යොහන් 14:1, මතෙව් 11:28 හා රෝම 10:9න් ඉදිරිපත් කර ඇති ගැළවීම සඳහා සරල සැලැස්ම වේ. පුළුල් ලෙස බැලූ විට එහි යේසුස්වහන්සේ දේව රාජ්‍යය ගැන ඉගැන්වූ සියල්ල අන්තර්ගතය.

ශුභාරංචිය යනු දෙවියන්වහන්සේ පිළිබඳ සත්‍යයය.

> **ඒ බලාපොරොත්තුව ගැන ශුභාරංචියේ සැබෑවේ වචනයෙන් නුඹලා පළමු ඇසුවහුය. (කොලොස්සි 1:5)**

එමෙන්ම ශුභාරංචිය යනු ගැළවීම ලබා දෙන දෙවියන්වහන්සේගේ බලය වේ.

> **මක්නිසාද, මම ශුභාරංචිය ගැන ලැජ්ජා නොවෙමි. අදහන්නාවූ සියල්ලන්ටම එනම්: පළමුකොට යුදෙව්වාදටද එසේම ග්‍රීකයාටද ගැළවීම පිණිස එය දෙවියන්වහන්සේගේ බලයව තිබෙන නිසාය. (රෝම 1:16)**

## සභාව

ශ්‍රේෂ්ඨ පැවරීමේ අභියෝගය යේසුස්වහන්සේ විසින් සභාවට දෙන ලදි. පැරණි ගිවිසුම් සමයේ සේවය කිරීම සඳහා ඉශ්‍රායෙලය කැඳවූ ආකාරයට සභාව අද සේවය කිරීම සඳහා කැඳවා ඇත. දැන් දෙවියන්වහන්සේ තමන්වහන්සේ ලෝකයේ ජාතින්ට එළිදරව් කරන සාමූහික කණ්ඩායමකි.

අප "සභාව" ගැන කතා කරන විට අප අදහස් කරන දේ නිර්වචනය කිරීම වැදගත් වේ. දේව වචනයේ සඳහන් සභාව යනු ගොඩනැඟිල්ලක් නොවේ. එය නිකායක් හෝ ආගමක් නොවේ. සභාව මට්ටම් දෙකක නිර්වචනය කෙරේ.

### ලෝක ව්‍යාප්ත සභාව

සභාව යේසුස් ක්‍රිස්තුස්වහන්සේ අදහන සියලු සෙනඟගෙන් සමන්විතය. එය නැවත උත්පාදනය ලැබූ හා දෙවියන්වහන්සේට කීකරුව ජීවත් වන ඇදහිලිවතුන්ගේ සහභාගිකත්වයකි.

"සභාව" යන වචනයෙහි තේරුම "කැඳවනු ලැබූ" හෝ "කැඳවා ඇති අය" වේ. සභාව සමන්විත වන්නේ සාතන්ගේ රාජ්‍යයේ සිට දෙවියන්වහන්සේගේ රාජ්‍යයට කැඳවූ අයගෙන් වේ. මෙයට සෑම වර්ගයකම, ගෝත්‍රයකම, සංස්කෘතියකම හා භාෂාවකම යේසුස් ක්‍රිස්තුස්වහන්සේ ගැළවුම්කරු ලෙස පිළිගත් සියලු දෙනා ඇතුළත්ය.

සභාව "ක්‍රිස්තුස්වහන්සේගේ ශරීරය", "කිතුනුවන්" හෝ "ඇදහිලිවතුන්" ලෙස ද හැඳින්වේ. එවැනි වචන ඇතැම් විට ඉතා පුළුල්ව භාවිත කෙරේ. එහෙත් සැබෑ නිර්වචනය අනුව ඇතුළත් වන්නේ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ තුළින් නැවත උපන් හා දෙවියන්වහන්සේට කීකරුව ජීවත් වන අය පමණි.

### දේශීය සභාව

ධර්මදූත සේවය සඳහා, සංවිධාන, සහභාගිකත්ව කන්ඩායම්, ඇදහිලිවතුන්ගෙන් සමන්විත කණ්ඩායම්, සංවිධානාත්මක දේශීය සහභාගිකත්වයක් ලෙස එක් වී ඇත. මේ ආකාරයේ දේශීය මට්ටමේ සභාවන් ආරම්භ වූයේ නව ගිවිසුම් සමයේ වේ.

## සභාවේ ස්වභාවය

වැඩි වශයෙන් සභාවේ ස්වභාවය, කාර්යය, සබඳතා හා තත්ත්වය පැහැදිලි කරන සංකේත බයිබලයේ භාවිත කර ඇත.

පහත දැක්වෙන පදවල සභාව විවිධාකාරයෙන් හැඳින්වේ.

**නව මනුෂ්‍යත්වයක්** : එපිස 2:14-15
**ක්‍රිස්තුස්වහන්සේගේ ශරීරය** : එපිස 1:22-23, 5:30, 1 කොරින්ති 12:27
**දෙවියන්වහන්සේගේ මන්දිරය** : එපිස 2:21-22, 1 කොරින්ති 3:9,16, 1 තිමෝති 3:15, 1 පේතෘස් 2:5
**රාජකීය පූජක පෙළ** : 1 පේතෘස් 2:5,9, එළිදරව් 1:6, 5:10
**ක්‍රිස්තුස්වහන්සේගේ මනාලිය** :2 කොරින්ති 11:2
**දෙවියන්වහන්සේගේ පවුල** : එපිස 2:19
**දෙවියන්වහන්සේගේ රැළ** : යොහන් 10:1-29, 1 පේතෘස් 5:3-4, හෙබ්‍රෙව් 13:20, ක්‍රියා 20:28
**දෙවියන්වහන්සේගේ සභාව** : ක්‍රියා 20:28, 1 කොරින්ති 1:2, 10:32, 11:22, 15:9, 1 තිමෝති 3:5, 1 තෙසලෝනික 2:14
**ජීවමාන දෙවියන්වහන්සේගේ සභාව** : 1 තිමෝති 3:15
**ක්‍රිස්තුස්වහන්සේගේ සභාව** :රෝම 16:16
**කුළුඳුලන්ගේ සභාව :** හෙබ්‍රෙව් 12:23
**ශුද්ධවන්තයන්ගේ සභාව** : 1 කොරින්ති 14:33 (පැරණි)

## සභාවේ පරමාර්ථය

සභාවට වැදගත් කාර්යයන් ඇත. ඒවා අතර නමස්කාරය, සහභාගිකත්වය හා මනුෂ්‍ය අවශ්‍යතා අනුව සේවය කිරීම තිබේ. එහෙත් එහි පැවැත්මේ මූලික පරමාර්ථය වන්නේ ශුභාරංචිය පැතිරීම වේ. සරලව සඳහන් කළහොත් සභාවේ ප්‍රධාන පරමාර්ථය වන්නේ ශ්‍රේෂ්ඨ පැවරුම සාක්ෂාත් කිරීම වේ.

මුල් සභාවේ මෙහෙවරට සාතන් විවිධාකාරයෙන් ප්‍රහාර එල්ල කළේය. ඔහු භීෂණය, සාවද්‍ය දේවධර්මය හා පාපය මඟින් ශුභාරංචිය පැතිරවීම වැළැක්වීමට උත්සාහ කළේය. අදද මේවා ඔහුගේ උපක්‍රම වේ. එහෙත් සභාවේ පරමාර්ථයට තවත් තර්ජනයක් විය. නායකයන් යහපත් හා වැදගත් වැඩ ගැන වඩාත් සැලකිලිමත් වීම තුළින් ක්‍රිස්තුස්වහන්සේ බලාපොරොත්තු වූ ප්‍රධාන අවධානය වෙනස්වීම හා සමානය. ක්‍රියා 4 අධ්‍යයනය කරන්න. අවශ්‍යයෙන්ම කළ යුතු වූ යහපත් වැඩ රාශියක් තිබිණි. එහෙත් නායකයෝ ඒවා කරමින් දෙවියන්වහන්සේගේ වචනය හා යාච්ඤාව අමතක කළහ.

මනුෂ්‍ය අවශ්‍යතාවන් මහත්ය. අවශ්‍යතා ඇති අය අප සමඟ සෑම විටම සිටින බව යේසුස්වහන්සේ පැවසූ සේක. නව ගිවිසුම් යුගයේ මෙන් සභාව මනුෂ්‍ය අවශ්‍යතාවයන් ඉටු කරමින් අන් අය ගැන සැලකිලිමත් වන ප්‍රජාවක් විය හැකිය. එය වැදගත්ය. එහෙත් සභාවේ පරමාර්ථය භෞතික, සමාජීය හා ද්‍රව්‍යමය අවශ්‍යතාවන් සපුරාලීමම නොවේ. එහි ප්‍රමුඛත්වය වන්නේ ශුභාරංචිය පැතිරීමය. අනෙක් අවශ්‍යතාවන් වෙනුවෙන් සේවය කිරීමට සභාවට හැකිය. එහෙත් එවැනි දේ ශුභාරංචිය ප්‍රබලව ඉදිරිපත් කිරීම හා සම්බන්ධ කළ යුතුය.

මේ පිළිබඳ හොඳ නිදර්ශනයක් රෝම 9 හා 10 හි ඇත. ජුදෙව් ජාතියේ ආර්ථික අවශ්‍යතාවන් ගැන පාවුලු ප්‍රේරිතතුමා දැන සිටියේය. එමෙන්ම සෙනඟ කෙරෙහි වූ රෝම පීඩනය ගැනද දැන සිටියේය. එසේ වුවද මනුෂ්‍යයන් උදෙසා ඔහුගේ ප්‍රධාන හැඟීම වූයේ ආත්මික අතිනි. ඉශ්‍රායෙලය සඳහා පාවුලු ප්‍රේරිතතුමාගේ බලවත් ආශාව වූයේ ඔවුන්ගේ ගැළවීමය (රෝම 10:1). සභාවේ මෙහෙවර වන්නේ ශුභාරංචිය දැන ගැනීමට සැලැස්වීම වේ. එවිට සියලු මනුෂ්‍යයන්ට ඇදහිල්ලෙන් යුතුව දෙවියන්වහන්සේට සේවය කළ හැකිය.

## යැවීමේ නියෝජිත ධූරයක්

දෙවියන්වහන්සේගේ ක්‍රමය වන්නේ යැවීමය. අපට ඇති ප්‍රේමය නිසා පියාණන්වහන්සේ තම පුත්‍රයාණන් එවූ සේක.

> **මක්නිසාද දෙවියන්වහන්සේ ස්වකීය ඒකජාතක පුත්‍රයාණන් දෙන තරම් ලෝකයාට ප්‍රේම කළ සේක. එසේ කළේ උන්වහන්සේ කෙරෙහි අදහාගන්න සෑමදෙනම විනාශ නොවී සදාකාල ජීවනය ලබන පිණිසය. මක්නිසාද දෙවියන්වහන්සේ පුත්‍රයාණන් ලෝකයට එවූවේ ලෝකයා විනිශ්චය කරන පිණිස නොව ලෝකයා උන්වහන්සේ කරණ කොටගෙන ගළවනු ලබන පිණිසය. (යොහන් 3:16-17)**

යේසුස්වහන්සේ අපට පවරා ඇත්තේ ශුභාරංචිය රැගෙන යාමටය. සෑම දේශීය සභාවක්ම යැවීමේ සභාවක් විය යුතුය. මියයන ලෝකයක් වෙනුවෙන් ප්‍රේමයෙන් යුතුව ඉදිරියට යා යුතුය.

දෙවියන්වහන්සේ සභාව ගොඩනැඟුවේ උන්වහන්සේගේ විශේෂ වරප්‍රසාද ලත් දෙයක් ලෙස නොවේ. සභාව කැඳවා ඇත්තේ *පරමාර්ථයක්* පිණිස මිස *වරප්‍රසාද* ලැබීමට නොවේ. අපි සමාදානයේ සේවකයෝ වෙමු. අපි දෙවියන්වහන්සේ හා යේසුස්වහන්සේ තැනූ රටාව අනුගමනය කළ යුතු වෙමු. අපි ශුභාරංචිය සමඟ ඉදිරියට යා යුතු වෙමු.

සෑම සභාවක් වටාම දෙවිඳුන් නැති බලාපොරොත්තුවක් නැති සෙනඟ සිටිති. පාවුලුතුමා පිලිප්පියේ සභාවට පවසන්නාක් මෙන් මෙය අපේ පළමු හා වැදගත්ම අභියෝගය වේ (පිලිප්පි 2:12-16). මේ හා සමාන වචනම කොරින්තියේ, එපීසයේ, තෙසලෝනිකයේ හා කොලොස්සියේ සභාවලට පවසා ඇත. අද ද මෙම පණිවුඩයම රැව් පිළිරැව් දෙයි.

පාවුලුතුමා, සභාවේ පරමාර්ථය එපීස පොතේ සාරාංශ කර ඇත.

> **සියල්ල මැවුවාවූ දෙවියන්වහන්සේ තුළ සියලු කාලවල පටන් සැඟවී තිබුණාවූ රහසේ නියමය කිමෙක්ද කියා සියල්ලන්ට පෙන්වන පිණිසත්ය. එසේ කළේ අපගේ ස්වාමි වූ ක්‍රිස්තුන් යේසුස්වහන්සේ තුළ දෙවියන්වහන්සේ විසින් අභිප්‍රාය කරන ලද සදාකාල අභිප්‍රායේ ප්‍රකාරයට ස්වර්ගීය ස්ථානවල අධිපතීන්ටත් බලධාරීන්ටත් මේ කාලයෙහි සභාව කරණකොටගෙන උන්වහන්සේගේ අනේකවිධ ප්‍රඥාව දැනගන්ට ලැබෙන පිණිසය. (එපීස 3:9-11)**

## බලය මඟින් ඉපදුණු සභාවක්

යේසුස්වහන්සේ තම අනුගාමිකයන්ට මහා කාර්යභාරයක් බාර දී ඇත. ඔවුන් ශුභාරංචි පණිවුඩය මුළු ලොව පුරා ගෙන යා යුතුව තිබුනි. එහෙත් උන්වහන්සේ ඔවුන්ට අධිකාරී බලය නොදී වගකීම පමණක් නුදුන් සේක. මේ කාර්යය ඉටු කිරීමට උන්වහන්සේ විශේෂ බලයක් ඔවුන්ට පොරොන්දු වූ සේක.

ශුද්ධාත්මයාණන්ගේ පැමිණීම තුළින් ඔවුන් මේ බලය ලබන බව යේසුස්වහන්සේ තම අනුගාමිකයන්ට පැවසූ සේක.

> **නුමුත් ශුද්ධාත්මයාණන්වහන්සේ නුඹලා වෙත පැමිණි කල නුඹලා බලය ලබන්නහුය. එවිට නුඹලා යෙරුසලමෙහිද මුළු යුදයෙහිද සමාරියෙහිද පොළොවේ සීමාව දක්වාද මාගේ සාක්ෂිකාරයෝ වන්නහුයයි කී සේක. (ක්‍රියා 1:8)**

සාමාන්‍යයෙන් කළ නොහැකි කාර්යයක් මනුෂ්‍යයන් එකොළොස් දෙනෙකුට පැවරිය. කවුරුන් කොතැනකට යන්නේදැයි තීරණය කිරීමට ඔවුන් කමිටුවක් පිහිටුවූයේ නැත. කෙතරම් දුරකට යා හැකිදැයි බැලීමට ඔවුන් සම්මාදමක් ගත්තේ නැත. ඔවුන් ඡන්දයක් ගෙන බහුතරයේ තීරණය අනුගමනය කළේ නැත. ඔවුහු උඩුමහල් කාමරයකට ගියහ. ඉන්පසු එක්සිත්ව යාච්ඤා කළහ. මෙහිදී මහත් බලයක් ප්‍රදර්ශනය කරමින් සභාව බිහි විය.

ශුද්ධාත්මයාණන්වහන්සේගේ පැමිණීම ක්‍රියා 2හි සඳහන් වේ. ශුද්ධාත්මයාණන්ගේ මේ බලය විශේෂ පරමාර්ථයක් සඳහා දෙන ලද්දකි. එම පරමාර්ථය නම් ශුභාරංචිය සියලු ජාතීන් වෙත ගෙන යාම වේ (ක්‍රියා 1:8). පළමු සභාවේ පටන් ගැන්ම (උපත) ක්‍රියා 2හිද සඳහන් වේ. මෙම නව බලය එළිදරව් කිරීමෙහිදී ශුද්ධාත්ම දානය ලැබූ විට පේත්‍රුස් දේශනාවක් කළ අතර එහි ප්‍රතිඵලයක් වශයෙන් 3000ක් ශුභාරංචියට ප්‍රතිචාර දැක්වූහ. මේ අය පළමු සභාව පිහිටුවූහ. මොවුන්ගේ වැඩි වර්ධනය වීම හා මෙහෙවර ක්‍රියා පොතේ ඉතිරි කොටසේ සඳහන් වේ.

## සභාවේ සංවිධානය

සභාවේ මෙහෙවර සාක්ෂාත් කර ගැනීම සඳහා දෙවියන්වහන්සේ සංවිධානය කිරීමේ මූලික ප්‍රතිපත්ති සංස්ථාපනය කළ සේක. සභාවේ සාමාජිකයෝ ආත්මික සහෝදර සහෝදරීන් ලෙස

එකිනෙකාට බැඳී සිටිති. ඔවුන් ක්‍රිස්තුස්වහන්සේගේ ශරීරය ලෙස හැඳින්වෙන අතර එහි ප්‍රධානියා යේසුස්වහන්සේ වේ. මනුෂ්‍ය ශරීරය මෙන් සභාව ද ඒකත්වයෙන් යුතුව කටයුතු කළ යුතුය. ඔවුන් ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ ප්‍රධානත්වයෙන් උන්වහන්සේගේ මඟ පෙන්වීම යටතේ කටයුතු කළ යුතුය.

ප්‍රේරිතවරුන්, දිවැසිවරුන්, ධර්මදූතයන්, පූජකවරුන් හා ගුරුවරුන් ද ඇතුළත් විශේෂ නායකයන් දෙවියන්වහන්සේ සභාවට පත් කරන සේක. එමෙන්ම සේවය කිරීම සඳහා භාවිත කිරීමට දෙවියන්වහන්සේ සෑම ආත්මයෙන්ම පිරී ඇදහිලිවන්තයෙකුටම විශේෂ දීමනාවක් (හෝ දීමනා) දෙන සේක.

සභාවේ මෙහෙවර සාක්ෂාත් කර ගැනීම සඳහා මෙම නායකත්වයන් හා දීමනා උපකාරී වන අන්දම සාකච්ඡා කිරීම මෙම පාඨමාලාව තුල කළ නොහැකිය. හාවස්ටයිම් ජාත්‍යන්තර ආයතනය "ශුද්ධාත්මයාණන්වහන්සේගේ සේවය" නමැති පාඨමාලාවක් සම්පූර්ණයෙන්ම මෙම විෂය සඳහා වෙන් කර තිබේ.

## මුල් සභාවේ සාක්ෂි දැරීම

නව ගිවිසුමේ ක්‍රියා පොතේ කතාව වන්නේ ලෝකයේ ශුභාරංචිය පැතිරීමේ ශ්‍රේෂ්ඨ පැවරුම ඉටු කිරීම සභාව ආරම්භ කළ ආකාරය වේ. ක්‍රියා 2 සඳහන් සිද්ධීන්වලින් සති කිපයක් ඇතුළත දහස් සංඛ්‍යාවක් ගැළවීම ලැබූහ. කාලය ගතවත්ම ජෙරුසලමේ සිටි ඇදහිලිවතුන්ගේ සංඛ්‍යාව බොහෝ සේ වැඩිවිය.

ඇදහිලිවතුන් ජෙරුසලමෙන් පිටකිරීම සඳහා දෙවියන්වහන්සේ හිෂණයට ඉඩ දුන් සේක. ඔවුහු ජුදයේ හා සමාරියේ විසිරුවනු ලැබූහ.

> **ඔහු මරා දැමීම ගැන සාවුල්ද එකඟව සිටියේය. ඒ දවසේදී යෙරුසලමෙහි වූ සභාවට විරුද්ධව මහත් පීඩාවක් අටගත්තේය. එවිට ප්‍රේරිතයන් හැර ඔවුන් සියල්ලෝ යුදයේද සමාරියේද පළාත්වල විසරුවනු ලැබුවෝය. (ක්‍රියා 8:1)**
>
> **එබැවින් විසුරුවනු ලැබූ ඔවුහ ගිය ගිය තැන වචනය ප්‍රකාශ කළෝය. (ක්‍රියා 8:4)**

දේශනා කිරීම සඳහා සමාරියට ගිය එක් ඇදහිලිවන්තයෙක් වූයේ පිලිප්ය. ක්‍රියා පොතේ සඳහන් පළමු වෙනස් සංස්කෘතියක මෙහෙය මෙය වේ (ක්‍රියා 8). ක්‍රියා 9හි ප්‍රේරිත වූ පාවුලුතුමා විජාතීන්ට ප්‍රේරිතයෙකු වීමට ලෝකයේ ජාතීන්ට ධර්මදූතයෙකු වීමට ඔසවනු ලැබිය.

කොර්නේලියස් නමැති මිනිසෙකුගේ හැරීම ක්‍රියා 10 කතාව වේ. දෙවියන්වහන්සේ පේත්‍රුස්ට දර්ශනයක් දුන් අතර ඔහු ශුභාරංචිය සමග විජාතිකයන් වෙතට යෑමට කැමැත්ත පල කළේය. ක්‍රියා 11න් පෙන්වන්නේ ලෝකය කෙරෙහි සභාවේ මෙහෙවරට මඟ පෙන්වීමට ශුද්ධාත්මයාණන්වහන්සේගේ වැදගත්කම වේ.

ක්‍රියා 13න් ශුභාරංචිය ලෝකයේ සෑම පෙදෙසකටම පැතිරවීමේ සැබෑ වැඩසටහන ඇරඹේ. පාවුලුතුමා හා බාර්ණබස් වෙනස් සංස්කෘතයක ඉවැන්ජලිස්ත සේවය සඳහා ඇරයුම් ලබති. ඔවුන් ඉශ්‍රායෙලය හැර අනෙකුත් සංස්කෘතීන්වලට ශුභරංචිය පැතිරවිය යුතුය.

> **අන්‍ය ජාතිහු ඒ අසා සන්තෝෂව දෙවියන්වහන්සේගේ වචනයට ගෞරව කළෝය. සදාකාල ජීවනය ලැබීමට නියම කරන ලද සියල්ලෝම අදහා ගත්තෝය. ස්වාමීන්වහන්සේගේ වචනය ඒ පළාත මුළුල්ලෙහි පතළව ගියේය. (ක්‍රියා 13:48-49)**

ඔබට අන්තියෝකියේ සභාවේ පැවැත්වූ පළමු ධර්මදූත සම්මේලනය ගැන ක්‍රියා 14: 26-27හි ද එමෙන්ම යෙරුසලමෙහි මූලස්ථානයට යැවූ ඔවුන්ගේ පළමු වාර්තාව ගැන ක්‍රියා 15:2-4න් ද කියවිය හැකිය.

පාවුලුතුමා ලෝකයේ ජාතීන් වෙනුවෙන් දෙවියන්වහන්සේගේ පරමාර්ථය ස්ථිර ලෙස දැනගෙන බිය නැතිව ශුභාරංචිය නගර හා ගම් නියම් ගම්වලට ද පළාත්වලට ද උගත් නූගත් අය වෙත ද දාසීන්ට හා නිර්දාසීන්ට ද ගෙන ගියේය.

**මක්නිසාද ස්වාමීන්වහන්සේ අපට මෙසේ අණ කළ සේක : කෙසේදයත් නුඹ පොළොවේ සීමා දක්වා ගැළවීම වන පිණිස අන්‍ය ජාතීන්ට නුඹ එළියක් කොට තැබුවෙමියි කියා තිබේයයි කීවෝය. (ක්‍රියා 13:47)**

මුල් සභාව ඔවුන්ගේ මෙහෙවර කෙතරම් උද්‍යෝගයකින් ඉටු කළේද යත් ඔවුහු ලෝකය පෙරළු අය ලෙස හැඳින්වූහ (ක්‍රියා 17:6). යේසුස්වහන්සේගේ රුධිරය තුළින් සියලු ජාතීන්ගේ මනුෂ්‍යයන් ඒකත්වයක් කළ නිසා දෙවියන්වහන්සේගේ පරමාර්ථය සාක්ෂාත් කෙරිණි.

**උන්වහන්සේ පිළියෙල කළ කාලයන්ද සියලු මනුෂ්‍ය ජාතීන්ගේ වාසස්ථානවල සීමාද නියම කොට මුළු පොළෝතලයෙහි වාසය කරන පිණිස එක්කෙනෙකුගෙන් ඔවුන් මැවූ සේක. (ක්‍රියා 17:26)**

**සියලු ජාතීන් අතරේ උන්වහන්සේ කෙරෙහි භය ඇතිව ධර්මිෂ්ටකම් කරන තැනැත්තේ උන්වහන්සේට ප්‍රසන්න බව සැබවින්ම මට පෙනේ. (ක්‍රියා 10:35)**

## නව ගිවිසුමේ ඉතිරි වාර්තාවන්

මේ දක්වා මෙම පාඩමෙන් අවධාරණය කෙරුණේ ක්‍රියා පොතේ ඇති ලෝකයේ සභාව පිළිබඳ විෂය ගැන වේ. නව ගිවිසුමේ ඉතිරි පොත් ලියා ඇත්තේ ශුද්ධාත්මයාණන්වහන්සේගේ දිව්‍යමය ආභාසය යටතේ පළමු සභාවේ සාමාජිකයන් විසිනි. ඒවායේ ලෝකය සඳහා වූ දෙවියන්වහන්සේගේ සැලැස්ම ගැන පද බොහොමයක් අන්තර්ගත වේ.

මෙම පරිච්ඡේදයේ "නව දුරටත් අධ්‍යයනය සඳහා" කොටස ලෝකය පිළිබඳ විෂය ගැන නව ගිවිසුමේ ඇති සියලු යොමුවීම් අධ්‍යයනය කිරීමට ඔබට අවස්ථාව සලසයි. මෙය ස්ථිර වශයෙන්ම කරන්න. එමඟින් දේව වචනයේ සඳහන් ලෝකය ගැන අධ්‍යයනය සම්පූර්ණ කෙරෙනු ඇත. එමෙන්ම ඔබගේ බයිබලීය ලෝක දැක්ම තව දුරටත් වැඩි වර්ධනය වනු ඇත.

ඔබ "තවදුරටත් අධ්‍යයනය සඳහා" යන කොටස අධ්‍යයනය කරන විට සැලකිල්ලට ගත යුතු වැදගත් දෙයක් වන්නේ පැරණි ගිවිසුමට ඇති සබඳතාව වේ. රෝම 4හි පාවුලුතුමා ආබ්‍රහම්ට දුන් පොරොන්දුවලට යොමු කරයි. ලෝකයේ ජාතීන්ට ආශීර්වාදයක් වීම පිළිබඳව පොරොන්දුව මීට ඇතුළත්ය. නව ගිවිසුමේ ඇදහිලිවතුන් ආබ්‍රහම්ගේ උරුමක්කාරයන් ලෙස හැඳින්වේ (ගලාති 3). ඉන් අදහස් වන්නේ අප දෙවියන්වහන්සේ ආබ්‍රහම්ට දුන් පොරොන්දුවලට උරුමක්කාරයන් වන බවය. ලෝකයේ ජාතීන්ට ආශීර්වාද කිරීමට කැඳවීම මීට අයත් වේ.

### ලෝකයේ ඇති සභාව

නව ගිවිසුම අධ්‍යයනයෙන්, ලෝකයට අදාළව සභාවේ ඇති කාර්යයභාරය පහත දැක්වෙන ආකාරයට සාරාංශ කළ හැකිය.

1. සභාව යේසුස්වහන්සේ ගැළවුම්කරුවාණන් ලෙසත්, විශ්වයේ සර්වබලධාරී ස්වාමීන්වහන්සේ ලෙසත්, මනුෂ්‍ය වර්ගයාගේ විනිශ්චයකරුවාණන් ලෙසත් පුද්ගලයන්ට හා ලෝකයාට ඉදිරිපත් කළ යුතුය.

2. පාපය සඳහා කමාවත් යේසුස් ක්‍රිස්තුස්වහන්සේ තුළ නව ජීවනයත් අත් දැකීමට හැකිවන පරිදි උන්වහන්සේ හා සමඟ නිවැරදි සබඳතාවක් ඇති කර ගැනීමට සභාව සෙනඟට මඟ පෙන්විය යුතුය.

3. වතුර බව්තිස්මයෙන්, ඉගැන්වීමෙන් හා දේශනා කිරීමෙන් සභාව කිතුනු ජීවිතයේ ධර්මය, මූලධර්ම හා ව්‍යවහාරය ඇදහිලිවතුන් තුළ ස්ථාපිත කළ යුතුය. දේව වචනයේ අණ කර ඇති "සියලු දේ පිළිපැදීමට" සභාව ඔවුන්ට ඉගැන්විය යුතුය.

4. ඇදහිලිවතුන්, ලෝකයා වෙනුවෙන් ඇති ඔවුන්ගේ කාර්යය භාරය ඉටු කිරීම පිණිස ක්‍රියාකාරී ප්‍රාදේශීය සහභාගිකත්ව ලෙස එක් රැස් විය යුතුය.

5. මෙම චක්‍රය (1 සිට 5 දක්වා වූ කරුණු) නැවත ක්‍රියාත්මක කිරීමට සෑම නව ප්‍රාදේශීය සහභාගිකත්වයක්ම ශුද්ධාත්මයාණන්ගෙන් බලය ලබා ගත යුතුය. මෙම ක්‍රියාවලිය තුළින් නව ඇදහිලිවතුන් දිනා ගැනීමට හා නව සහභාගිකත්ව පිහිටුවීම තවදුරටත් සිදු කෙරෙනු ඇත.

සභාව “මුළු ලෝකයා” වෙතම ශුභාරංචිය ගෙන යා යුතුය. ඊළඟ පරිච්ඡේදයෙන් විස්තර කෙරෙන්නේ සභාවට පවරා ඇති “බලා සිටින ලෝකය” වේ.

## ස්වයං පරික්ෂණය

1. ප්‍රධාන පදය මතකයෙන් ලියන්න.

2. "ශ්‍රේෂ්ඨ පැවරීම" යනුවෙන් අදහස් වන දේ පැහැදිලි කරන්න.

3. "ශ්‍රේෂ්ඨ පැවරීම" සඳහා ශුද්ධ ලියවිල්ලෙන් යොමු කිරීම් 3ක් දෙන්න.

4. "සභාව" යන්නෙහි බයිබලීය නිර්වචනය දෙන්න.

5. "සභාව" ආරම්භ වුයේ කෙසේද?

6. ලෝකයා වෙනුවෙන් ඇති මෙහෙවර ඉටු කිරීම සඳහා සභාවට හැකියාව දෙන ආත්මික බලය කුමක්ද?

7. සභාව වෙනුවෙන් ඇති දෙවියන්වහන්සේගේ සංවිධාන සැලැස්ම සාරාංශ කරන්න.

8. දෙවියන්වහන්සේගේ සැලැස්මේ සභාවේ පරමාර්ථය සාරාංශ කරන්න.

9. ශුභාරංචියේ මූලික කරුණු මොනවාද?

(පරීක්ෂණ සඳහා පිළිතුරු මෙම අත්පොතේ අවසාන පරිච්ඡේදය අවසානයේ ඇත.)

## තවදුරටත් අධ්‍යයනය සඳහා

1. දෙවියන්වහන්සේගේ ලිඛිත වාර්තා සඳහන් කළ පසු ලෝකය මුළුල්ලේම ශුභාරංචිය පැතිරුණු ආකාරය ගැන ඉගෙනීමට ඔබ කැමති නම් රූත් ටකර්ගෙ "From Jerusalam to Iryian Jaya" **නමැති පොත කියවන්න. එය** Zondervan Publishing House, Grand Rapids, Michigan, USA **හි ප්‍රකාශනයකි.**

නව ගිවිසුම් යුගයෙන් අනතුරුව ලෝකයාට සාක්ෂි දැරීම ප්‍රධාන යුග තුනකට බෙදා තිබේ.

**පළමු යුගය :**

ලෝකයේ වෙරළාසන්න ප්‍රදේශවලට ශුභාරංචිය පැතිරීම. මෙය ආරම්භ කළේ විලියම් කේරි නමැත්තෙකි.

**දෙවෙනි යුගය**

ජේ හඩ්සන් ටේලර් විසින් ආරම්භ කළ ලෝකයේ අභ්‍යන්තරයට ශුභාරංචිය පැතිරීම.

**තෙවෙනි යුගය**

ඩබ්ලිව් කැමරන් ටවුන්සෙන්ඩ් දියත් කළ හා මේ කාලයේත් පවතින යුගය. ශුභාරංචිය නොගිය ඉතිරි පෙදෙස්වලට ශුභාරංචිය ගෙන යෑමේ ප්‍රයත්නය මෙය වේ.

2. නව ගිවිසුමේ මතෙව්, මාර්ක්, ලූක් හා යොහන්හි සඳහන් ලෝකයට ඇති යොමුවීම් සියල්ල ඔබ පසුගිය පරිච්ඡේදයෙන් අධ්‍යයනය කළෙහිය. පහත දැක්වෙන්නේ ක්‍රියා පොතේ සිට ජුඩ් දක්වා ඇති ලෝකය වෙත යොමු කිරීම් වේ.

ක්‍රියා: 1:8; 2:5; 3:25; 4:24,26; 10:28,35; 13:47; 14:15,16; 15:18; 17:6,24,26,31;
රෝම: 1:5,8,20; 3:19; 4:13,17,18; 5:12,13; 9:17,28; 1:18; 11:12,15; 12:2; 16:25,26;
1 කොරින්ති: 1:20,2127,28; 2:6-8,12; 3:18,19; 8:45; 10:11,26,28; 11:32; 15:47-49;
2 කොරින්ති: 4:4; 5:19; 7:10;
ගලාති: 1:4,16; 2:9; 3:8; 4:3
එපිස: 1:4,10,21; 2:2,12; 3:9,21; 6:12
පිලිප්පි: 2:10,15; 3:19
කොලොස්සි: 1:16,20; 2:8,20; 3:2,5
1 තිමෝති: 1:15; 3:16; 6:7,17
2 තිමෝති: 1:9; 4:10
තිතස්: 1:2; 2:12
හෙබ්‍රෙව් : 6:7; 9:26; 11:7; 12:25,26
යාකොබ්: 2:5
1 පේතෘස්: 1:20
2 පේතෘස්: 2:5; 3:6,7
1 යොහන්: 2:2,15-17; 3:1; 4:3,4,9,14,17; 5:4,5,19;
2 යොහන්: 1:7

# හත්වන පරිච්ඡේදය

## බලා සිටින ලෝකය

### අරමුණ

මෙම පරිච්ඡේදය අධ්‍යයනයෙන් ඔබට

- ❖ ප්‍රධාන පදය මතකයෙන් ලිවීමට
- ❖ ශුභාරංචිය ලෝකයේ පැතිරීමේ වර්තමාන තත්ත්වය සාරාංශ කිරීමට
- ❖ "සෙනඟ කණ්ඩායම්" යන පදය නිර්වචනය කිරීමට
- ❖ "ශුභාරංචිය ගියාවූ සෙනඟ කණ්ඩායම්" යන පදය නිර්වචනය කිරීමට
- ❖ "ශුභාරංචිය නොගිය සෙනඟ කණ්ඩායම්" යන පදය නිර්වචනය කිරීමට
- ❖ ශුභාරංචිය නොගිය ප්‍රධාන සෙනඟ කණ්ඩායම් 5 හැඳින ගැනීමට
- ❖ "සංවෘත රටක්" යන්නෙන් අදහස් වන දේ පැහැදිලි කිරීමට හැකිවනු ඇත.

### ප්‍රධාන පදය

**ගොයම නම් බොහෝය. නුමුත් ගොවියෝ ස්වල්ප දෙනෙක්ය (මතෙව් 9:37)**

### හැඳින්වීම

මෙම පරිච්ඡේදයෙන් ඔබ, දේව රාජ්‍යයේ ශුභාරංචිය සඳහා බලා සිටින ලෝකයේ වර්තමාන ආත්මික තත්ත්වය ඉගෙන ගන්නෙහිය. ලෝකයේ ආත්මික අවශ්‍යතා පැහැදිලි කිරීම සඳහා ජේසුස්වහන්සේ භාවිත කළ අස්වැන්න සහිත කෙත පිළිබඳ ස්වභාවික නිදර්ශනය මතකද? මෙම පරිච්ඡේදයෙන් පසු ජේසුස්වහන්සේ
**... ගොයම නම් බොහෝය. නුමුත් ගොවියෝ ස්වල්ප දෙනෙක්ය (මතෙව් 9 : 37)** යයි පැවසුවේ මන්දැයි ඔබට අවබෝධ වනු ඇත.

### මුළු ලෝකය

ජේසුස්වහන්සේ තම අනුගාමිකයන්ට මෙසේ පැවසූ සේක:

**නුඹලා ගොස් සියලු ජාතීන් ගෝලයන් කරන්න. (මතෙව් 28 : 19)**

**ලොව මුළුල්ලේ ගොස් සකල ජනතාවට ශුභාරංචිය ප්‍රකාශ කරන්න. (මාර්ක් 16:15)**

**ජෙරුසලමේ පටන් සියලු ජාතීන්ට පසුතැවිල්ල සහ පව්කමාවද උන්වහන්සේගේ නාමයෙන් ප්‍රකාශකරනු ලබන්ටත් යුතුයයි ලියා තිබේ. (ලූක් 24: 47)**

**ඔබ යෙරුසලමෙහිද මුළු යුදයෙහිද සමාරියෙහිදපොළොවේ සීමාව දක්වාද මාගේ සාක්ෂිකාරයෝ වන්නහුය. (ක්‍රියා 1:8)**

සකල ලෝකයා වෙත යන්න යන්නෙහි තේරුම කුමක්ද? සෑම ජාතියක් වෙතම ධර්මදූතයන් ගොස් තිබේ. එමෙන්ම පොළොවේ සෑම රටකම පාහේ කිතුනු සාක්ෂිය මිණිය හැකි ප්‍රමාණයකට පවතී. එහෙත් අපි **සකල** ලෝකයා වෙතම **සෑම** සත්ත්වයෙක් වෙතම ගොස් තිබේද?

## භූගෝලියව

ධර්මදූතයෙකු තවමත් අඩිය නොතැබූ ගම්මාන මිලියන ගණනක් අද ලෝකයේ තිබේ. මේවායේ ජීවත් වන සෙනඟට ගැළවීමේ පණිවුඩයට සවන් දීමට අවස්ථාවක් ලැබී නැත. ඒවා ලෝකයේ කොටස්ය. අප භූගෝලියව සෑම තැනකටම ගොස් නැත.

## භාෂාමය ලෙස

භාෂාමය අතින් ශුභාරංචිය පැතිරීම යනුවෙන් අදහස් වන්නේ එහි පණිවුඩය විවිධ භාෂාවලට ලිඛිතව පරිවර්තනය කිරීමය. බයිබලය සකල මනුෂ්‍ය වර්ගයා වෙනුවෙන් ඇති දෙවියන්වහන්සේගේ පණිවුඩය වේ. ඕනෑම සංස්කෘතියක සන්නිවේදනය කිරීමේ ඉතාමත්ම කාර්යක්ෂම ක්‍රමය වන්නේ බොහෝ දෙනෙක් කතා කරන දේශීය භාෂාව භාවිතය වේ.

අද ලෝකයේ කතා කරන භාෂා 5445ක් පමණ ඇත. මෙම සංඛ්‍යාවෙන් 3000ක පමණ අයට ඔවුන්ගේම භාෂාවෙන් බයිබලය පරිවර්තනය වී නොමැත. මේ අයට දෙවියන්වහන්සේගේ පණිවුඩය ඔවුන්ගේම භාෂාවෙන් කියවීමට අවස්ථාවක් ලැබී නැත. අප තවමත් භාෂාමය ලෙස ලොවට ශුභාරංචිය ගෙන ගොස් නැත.

## ජනගහනය

අප තවමත් මුළු ලොව වෙතම දේශපාලනික හා භාෂාමය ලෙස ශුභාරංචිය ගෙන ගොස් නැති අතර ලෝකයේ සෑම ජනගහනයක් වෙතද එසේමය.

අප ස්වාමීන්වහන්සේ මෙලොව වැඩ විසූ කාලයේ ලෝකයේ ජනගහනය මිලියන 250ක් පමණ වූ බවට තක්සේරු කර ඇත. මෙම සංඛ්‍යාව 1600 දී දෙගුණයක් පමණ විය. ආදම්ගේ කාලයේ සිට ජේසුස්වහන්සේගේ උත්පත්තියෙන් පසු වසර 1500ක් පමණ වන විට ලෝකයේ ජනගහනය මිලියන 500ක් පමණ වන තෙක් වැඩිවී තිබේ. 1500 සිට 1850 දක්වා ජනගහනය බිලියනය දක්වා වැඩිවී තිබේ. 1850 වන විට ජනගහනය නැවත වරක් දෙගුණ විය. අද මනුෂ්‍යයෝ බිලියන ගණනක් මෙලොව සිටිති.

සභා විශාල සංඛ්‍යාවක් ඇති මහා නගරවලද බොහෝ දෙනෙක් ජේසුස්වහන්සේ ගැන තවමත් නොදනිති. ජනගහනය අතින් බැලූ විට මුළු ලොව වෙත අප ශුභාරංචිය ගෙන ගොස් නැත. මන්ද මනුෂ්‍යයන් මිලියන සංඛ්‍යාවක් ශුභාරංචිය ගැන කිසිදා අසා නැති බැවිනි.

## සෙනඟ කණ්ඩායම්

ජාතීන් ලෙස අප ලෝකය දෙස බැලුවහොත් ශුභාරංචිය මුළු ලොවම වෙත ගෙන ගොස් ඇතැයි අපට කිව හැකිය. මක්නිසාද සෑම ජාතියකම පාහේ යම් ආකාරයක ශුභාරංචි සාක්ෂියක් ඇති බැවිනි. අද පොළොවේ සෑම රටකම ඇදහිලිවන්තයන් හා සංවිධානාත්මක සභාවන් තිබේ. එහෙත් මෙය කෙසේවත් එළිදරව්ව පොතේ සඳහන් “සියලු ගෝත්‍රවලින්ද භාෂාවලින්ද ජනයාගෙන්ද ජාතීන්ගෙන්ද” යන්න හා සමාන නොවේ (5:9).

ජේසුස්වහන්සේ ලෝකයා ගැන කතා කරන විට උන්වහන්සේ අදහස් කළේ ජාතීන් ගැන පමණක් නොවේ. ලෝකයා ගැන ජේසුස්වහන්සේ කතා කරන විට උන්වහන්සේ භාවිත කළේ “ethne” යන ග්‍රීක් පදය වේ. මින් අදහස් වන්නේ ජාතීන් හෝ සෙනඟ කණ්ඩායම්ය. ජේසුස්වහන්සේ ලෝකය දෙස බැලුවේ “සියලු සෙනඟ” හෝ “සෙනඟ කණ්ඩායම්” හෝ ලෙස වේ.

අප ලෝකය දෙස සෙනඟ කණ්ඩායම් ආකාරයෙන් බැලුවහොත් අද ශුභාරංචිය පැතිරී ඇති තත්ත්වය අවබෝධ කර ගැනීම පහසු වේ. සෙනඟ කණ්ඩායමක් නිර්වචනය කර ඇත්තේ මෙසේය:

> “ ................ එකිනෙකාට පොදු බැඳීමක් ඇති පුද්ගලයන්ගෙන් සමන්විත සැලකිය යුතු විශාල කණ්ඩායමකි. එබඳු බැඳීමකට භාෂාව, සංස්කෘතිය, සිරිත් විරිත් හා භූගෝලීය පිහිටීම ආදිය ඇතුලත් විය හැකිය.”

අවබෝධය හා පිළිගැනීම පිළිබඳ ගැටලු ඇති නොවී ශුභාරංචිය පැතිරිය හැකි විශාලතම කණ්ඩායම "සෙනඟ කණ්ඩායම" වේ. "සෙනඟ කණ්ඩායමක්" එකම භාෂාවක් කතා කරන නිසා හා පොදු සංස්කෘතියක් ඇති නිසා බොහෝ විට ශුභාරංචිය ඉදිරිපත් කිරීම අසීරු කෙරෙන භාෂාමය හා සංස්කෘතිකමය බාධක මඟ හැරේ.

අද හඳුනාගෙන ඇති අන්දමට ලෝකයේ විවිධ සෙනඟ කණ්ඩායම් 19,000 කට වඩා සිටී. ඇතැම් ඒවායේ ඇත්තේ 3000ක් පමණ වන සුළු සංඛ්‍යාවක් වන අතර මිලියන 30ක් පමණ සිටින අති විශාල කණ්ඩායම් ද ඇත. ලෝකයේ සෑම මහද්වීපයක්ම, විවිධ ජාතීන්ගෙන් පමණක් නොව විවිධ සෙනඟ කණ්ඩායම්වලින් ද සමන්විත වේ. නිදසුනක් ලෙස අප්‍රිකානු මහාද්වීපයේ භාෂාවන් 1000ක් පමණ ද සෙනඟ කණ්ඩායම් සිය ගණනක් ද ඇත.

සෑම ජාතියක්ම විවිධ සෙනඟ කණ්ඩායම්වලින් සමන්විතය. නයිජීරියාව වැනි එකම රටක් විවිධ ගෝත්‍ර කණ්ඩායම් 500කින් පමණ සමන්විත බව අපට පෙනෙන විට ජාතීන් ලෙස ඇති බෙදීමට වඩා මනුෂ්‍යයන් අතර වෙනස්කම් ඇති බව අපට අවබෝධ වේ.

අප්‍රිකාවේ, කෙන්යාවේ සෝමාලි සෙනඟ එක් සෙනඟ කණ්ඩායමකට නිදසුනකි. ඔවුන්ට පොදු භාෂාවක් ද ඉතිහාසයක් ද සම්ප්‍රදායක් හා සංස්කෘතියක් ද තිබේ. ඔවුහු ස්ථිර පදිංචියක් නොමැති දැඩි මුස්ලිම් භක්තිකයන් වන අතර උතුරු පළාතේ ඈත පෙදෙස්වල වාසය කරති. ඔවුහු කෙන්යාවේ සිටින සෙනඟ කණ්ඩායම් සිය ගණනක් අතුරින් එකක් පමණි.

ඔබ දැනගත යුතු තවත් පද දෙකක් ඇත.

**ශුභාරංචිය නොගිය සෙනඟ කණ්ඩායමක්** යනු බාහිර උපකාරයක් නොමැතිව තම සෙනඟ ඉවැන්ජලිස්ත කිරීම සඳහා ප්‍රමාණවත් සෙනඟ සංඛ්‍යාවක් හෝ සම්පත් හෝ සහිත ස්වදේශීය ඇදහිලිවතුන් ප්‍රජාවක් නොමැති සෙනඟ කණ්ඩායමකි.

**ශුභාරංචිය ගිය සෙනඟ කණ්ඩායමක්** යනු බාහිර උපකාර නොමැතිව තමාගේම සෙනඟ ඉවැන්ජලිස්ත කිරීම සඳහා ඇදහිලිවතුන් හා සම්පත් ප්‍රමාණවත් සංඛ්‍යාවක් සහිත සෙනඟ කණ්ඩායමකි.

## ශුභාරංචිය නොගිය සෙනඟ ප්‍රභේද

අද ප්‍රමාණවත් සාක්ෂි දරන ශුභාරංචි සභාවක් නොමැති ජනවාර්ගික කණ්ඩායම් හෝ සෙනඟ කණ්ඩායම් හෝ 17,000ක් පමණ තිබේ. මේ සෙනඟ කණ්ඩායම් තුළ මිලියන ගණනාවක් සිටිති. මෙම ශුභාරංචිය නොගිය සෙනඟ කණ්ඩායම් ප්‍රධාන වර්ග පහකට කණ්ඩායම් කළ හැකිය.

### ගෝත්‍රික සෙනඟ

ගෝත්‍රික සෙනඟක් යනු විවිධ සංස්කෘතික හා භාෂාමය වෙනස්කම් සහිත පුද්ගලයන් දහස් ගණනකි. මේ බොහෝ දෙනෙක් "ප්‍රාණවාදීන්" ලෙස හැඳින්වේ. ඉන් අදහස් වන්නේ ඔවුන් සැබෑ දෙවිඳුන් නොව වෙනත් විවිධාකාර ආත්මයන් නමස්කාර කරන බවය. මෙම ආත්මයන් අතර ලී, ලෝහ හෝ වෙනත් ද්‍රව්‍යමය දේවලින් නියෝජනය කෙරෙන යක්ෂයන් හා ව්‍යාජ දෙවිවරු වෙති.

### මුස්ලිම් භක්තිකයන්

මුස්ලිම්වරුන් අනුගමනය කරන්නේ ඉස්ලාම් ආගම හා කුර්ආනයේ ඉගැන්වීම් වේ. මුස්ලිම්වරුන් විශාල වශයෙන් මධ්‍යම ආසියාව, අප්‍රිකාව හා මැදපෙරදිග රටවල දක්නට ලැබේ. මුස්ලිම් ලෝකයේ විවිධ ජනවාර්ගික කණ්ඩායම්වල සෙනඟ මිලියන ගණනක් සිටිති.

### හින්දු භක්තිකයන්

හින්දුවරුන් වැඩි වශයෙන් වාසය කරන්නේ ඉන්දියාවේ වේ. එහෙත් ලෝකයේ විවිධ ජාතීන් අතර ඔවුහු විසිරී සිටිති. ඔවුන්ගේ දේවාල, උත්සව, පිළිම හා විවිධ ව්‍යාජ දෙවිවරුන් ඇතිව හින්දු ආගම, සෙනඟ මිලියන සංඛ්‍යාවක් ආත්මික බන්ධනයේ රඳවා ගෙන ඇත.

## චීන ජාතිකයන්

චීන සෙනඟ ද ශුභාරංචිය නොගිය විශාල කණ්ඩායමක් නියෝජනය කෙරේ. චීනයේ වෙසෙන, ශුභාරංචිය නොගිය සෙනඟ මිලියන සංඛ්‍යාවට අමතරව ලෝකය මුළුල්ලේම චීන සෙනඟ පැතිර සිටිති.

## බෞද්ධයෝ

ශුභාරංචිය නොදත් පස්වන කණ්ඩායම වන්නේ බෞද්ධයන් වේ. නැගෙනහිර ආසියාවේ පැතිර සිටින විවිධ බෞද්ධ කණ්ඩායම් අතර වෙනස්කම් බොහෝය. එහෙත් ඔවුහු පිළිම පූජාවෙන්, ආත්මික නමස්කාරයෙන් හා භූතවේදයෙන් බොහෝ දුරට එකට බැඳී සිටිති.

## ගොවීහු සිටින්නේ කොහේද?

මේ සියලු දෙනා වෙත ශුභාරංචිය ගෙන ගොස් නැත්තේ මන්ද? ගොවියෝ කොහේද? බොහෝ කිතුනු සේවකයන්ට අවශ්‍ය ද්‍රව්‍යමය වරප්‍රසාද බොහෝ ඇති හා ප්‍රමාණවත් තරම් මූල්‍යය සහාය ඇති විශාල සභාවල වැඩකිරීමට වේ. අසිරු තැන්වල හා වෙනත් සංස්කෘතීන්වල වැඩ කිරීම සඳහා තම නිවසින් හා පවුලෙන් ඈත්ව සිටීමට ඔවුන් අකමැතිය. අනෙක් අය සැබෑ ලෙස බයිබලීය ලෝක දැක්ම අල්ලා ගෙන නැත.

දෙවියන්වහන්සේ ලෝකය දෙස බැලූ විට, උන්වහන්සේ විශාල හිස් තැනක් දකින සේක. එය පාපී මිනිසා හා ධර්මිෂ්ඨ දෙවියන්වහන්සේ අතර ඇති හිදැසය. එහෙත් දෙවියන්වහන්සේ තවත් හිස් තැනක් දකින සේක. එය අස්වැන්න කෙත් වතුවල ඇති හිදැසය. අස්වැන්න බහුලය. ගොවීහු විරලය.

මනුෂ්‍යයෝ මිලියන සංඛ්‍යාවක් මෙම හිදැසේ සිටිති. මොවුහු දෙවියන්වහන්සේ සඳහා ශුභාරංචිය මඟින් කපා ගැනීමට සූදානම්ව සිටිති. දෙවියන්වහන්සේ මෙසේ පවසන සේක :

> **"මා විසින් දේශය නාස්ති නොකරන පිණිස පවුරක් ගොඩනඟා දේශය උදෙසා මා ඉදිරිපිට කඩුල්ලෙහි සිටීමට ඔවුන් අතරේ මනුෂ්‍යයෙකු සෙව්මි. නුමුත් කිසිවෙක් මට සම්බනූණේය." (එසකියෙල් 22:30)**

ඔබ බයිබලීය ලෝක දැක්ම සම්පූර්ණයෙන්ම අවබෝධ කරගත් විට මෙම කපොල්ලේ සිට ගැනීමට ඔබ කැඳවා ඇති බව ඔබ දැනගන්නවා ඇත. එය සියලු සැබෑ ඇදහිලිවතුන්ගේ කැඳවීම වේ.

## සංවෘත රටවල්

ශුභාරංචිය පැතිරවීමට බාධා කෙරෙන එක් කරුණක් වන්නේ මෑත කාලයේ ජාතීන්ගෙන් 60%ක් පමණ ශුභාරංචිය පැතිරවීමේ සාම්ප්‍රදායික ක්‍රමයට මඟ අහුරා තිබීමය. රටක් මේ ආකාරයෙන් සංවෘත වූ විට ඉන් අදහස් වන්නේ එම රටවල් විදේශීය ධර්මදූතයන් තව දුරටත් පිළිනොගන්නා බවය. බොහෝ අවස්ථාවල ඔවුන් තම සෙනඟගේ ආගම පාලනය කරන නීති පනවා ඇත. ඇතැම් රටවල මිනිසුන් කිතුනු ආගමට හැරවීම නීතියෙන් තහනම් කර ඇත.

ඇතැම් ජාතීන් ශුභාරංචියට දොර වසා ඇත්තේ මන්ද? ඊට හේතුව ඒ ජාතීන්ගේ නායකයන් වෙත සාතන් මෙසේ බලපෑම් කර තිබීමය.

- දෙවි කෙනෙක් සිටින බව පිළි නොගන්නා අදේවවාදී දර්ශනයක් පිළිගැනීම. එවැනි ජාතීන්ගේ නායකයන්ට ඔවුන්ගේ සෙනඟට සැබෑ හා ජීවමාන දෙවිඳුන් ගැන ඉගැන්වීම අවශ්‍ය නැත.
- ප්‍රබල ජාතික ආගමක් පිහිටුවීම. එවැනි ජාතීන්ගේ නායකයන්ට තම සෙනඟ කිතුනු ආගමට හැරීම අවශ්‍ය නොවේ. ඔවුන්ට අවශ්‍ය තම සෙනඟ ජාතික ආගම පිළිගැනීම වේ. එබැවින් ශුභාරංචිය පැතිරීම තහනම් කෙරෙන හා ධර්මදූතයන් තම රටට පැමිණීම නවත්වන නීති ඔවුහු සම්පාදනය කරති.

* තම රට අනෙකුත් ජාතීන්ගෙන් තනි කෙරෙන දේශපාලන දර්ශනයක් පිළිගැනීම. එවිට ධර්මදූතයන් පිට කරන අතර ශුභාරංචියට තම දේශ සීමාවන් වසා දමනු ලැබේ. සාතන් ශුභාරංචිය පැතිරවීමට බාධා කිරීම සඳහා එවැනි දේශපාලනික තනි කිරීමට හා ජාතීන් අතර සමගිය නැති කිරීමට බලපෑම් කරනු ඇත.

## විවෘත රටවල්

සම්ප්‍රදායානුකූල ක්‍රමවලින් ධර්මදානය කිරීම සඳහා ජාතීන්ගෙන් 60% පමණ දොරවල් වසා තිබෙන බව පිළිගැනුණද, සැබවින් වැසූ දොරවල් නොමැත. ශුභාරංචියට විරෝධතාවන් ඇති වන බව ජේසුස්වහන්සේ තේරුම් ගෙන සිටි සේක. උන්වහන්සේ මෙසේ කී සේක, "ඔවුන් එක් නුවරකදී ඔබට පීඩා කළහොත්, ඊළඟ නුවරට දිව යන්න" (මතෙව් 10:23).

බොහෝ ඇදහිලිවතුන්ට ශුභාරංචිය සඳහා රටවල්වල දොරවල් වැසී ඇති සංකල්පය පෙන්වන්නේ අසාර්ථක භාවය වේ. එහෙත් ජේසුස්වහන්සේ පෙන්වා දුන්නේ ශුභරංචියට එක් දොරක් වැසුණු විට තවත් දොරක් විවෘත වන බවය. ඇතැම්විට දෙවියන්වහන්සේ වැසූ දොරවල් මගින් වඩාත් සශ්‍රීක ආත්මික අස්වැන්න ඇති කෙත්වතුවලට අප යැවීමට භාවිත කරන සේක. මෙය පාවුළුතුමාට හා ඔහුගේ ධර්මදූත කණ්ඩායමට සිදුවිය.

> **"ඔවුහු ආසියාවේදී වචනය කියාදෙන්ට ශුද්ධාත්මයාණන් විසින් තහනම් කරනු ලැබ, පිරිගිය සහ ගලාතිය පළාත මැදින් ගියෝය: ඔවුහු මීසිය ඉදිරියට ඇවිත්, බිතිනියට යන්ට උත්සාහ කළෝය: නුමුත් යේසුස්වහන්සේගේ ආත්මයාණෝ ඔවුන්ට ඉඩ නුදුන් සේක. එවිට ඔවුහු මීසිය පසුකොට ත්‍රෝවසට බැස ආවෝය." (ක්‍රියා 16:6-8)**

අස්වැන්න කැපීමට සූදානම්ව තිබූ කෙතක් වූ මකිදෝනියට යන ලෙස පාවුලුතුමාට කැඳවීම පැමිණියේ ඔහු ත්‍රෝවසයේ සිටියදීය. පසු කාලයකදී ආසියාවට යාමට, පාවුලුතුමාට අවසර ලැබිණි. ඇතැම්විට දොරවල් වසා ඇත්තේ අස්වැන්න තවමත් පැසී නැති බැවිණි. මෙවැනි අවස්ථාවන්වලදී ශුද්ධාත්මයාණන්වහන්සේගේ මඟ පෙන්වීම අනුගමනය කිරීමට අප සංවේදී විය යුතුය.

එහෙත් අදේවවාදී, ආගමික හා දේශපාලනික දර්ශන නිසා දොරවල් වසා ඇති ජාතීන් ගැන කිව හැක්කේ කුමක්ද? එවැනි වැසූ දොරවල්වලින් පරාජය වීමට සහාව ඉක්මන් වී ඇත. ඉවැන්ජලිස්තවරයෙකු හෝ මිෂනාරි කෙනෙකු හෝ ලෙස සම්ප්‍රදායික ක්‍රම භාවිතයෙන් රටකට ඇතුළු වීමට නොහැකි අවස්ථාවල ශුභාරංචිය එහි ගෙන යෑමට දෙවියන්වහන්සේ වෙනත් ආකාරයක් එළිදරව් කරනු ඇත.

මිෂනාරි කෙනෙකු හෝ දේව සේවකයෙකු හෝ ලෙස රටකට ඇතුළු වීමට නොහැකි අවස්ථාවල අධ්‍යාපනඥයෙකු, කළමණාකරුවෙකු හෝ කම්කරුවෙකු ලෙස ඇදහිලිවන්තයෙකුට එම රටට ඇතුළු විය හැකිය. රැකියාවක් කරමින් උපයා ගනිමින් මිනිසුන් අතර ජීවත් විය හැකිය. එහෙත් ඔවුන්ගේ ප්‍රධාන පරමාර්ථය තවමත් ශුභාරංචිය පැතිරීම වේ.

මෙම මූලධර්මය පිළිබඳව බයිබලයේ නිදර්ශන කීපයක් ඇත. බොහෝ රටවල ශුභාරංචි වැඩවලට සහාය ලබා ගැනීමට පාවුලුතුමා කූඩාරම් තැනීය. ජෝසෙප් හා දානියෙල් උසස් රැකියාවන් කළ ගිහි අය වූ අතර දෙවියන්වහන්සේ පිළිබඳව මුළු රටටම ඉගැන්වීමට ඔවුහු එම තත්ත්වයන් ප්‍රයෝජනයට ගත්හ.

යම් රටකට ඇතුළු වීමට කිසිදු ක්‍රමයක් නොමැති බව පෙනුනත් එය ශුභාරංචිය සඳහා තවමත් වැසී නැත. යාච්ඤාව තුළින් ශුද්ධාත්මයාණන්වහන්සේගේ බලයට කිසිදු රටක් වැසී නැත. දේශ සීමාවන් වසා දැමුවද ශුභාරංචිය පැතිරවීම නීතියෙන් තහනම් කළ ද යාච්ඤාවේ හා ශුද්ධාත්මයාණන්වහන්සේගේ බලයට ඕනෑම රටකට ඇතුළු වීමට හැකිය.

## කාර්යය සම්පූර්ණ කරන්නේ කෙසේද?

ශුභාරංචි පණිවුඩය ලබා ගැනීම සඳහා බලා සිටින ලෝකය දෙස අප බැලූවිට අප පුදුමයට පත්වනු ඇත.

- ක්‍රිස්තුස්වහන්සේ නොමැතිව සෙනඟ මිලියන ගණනක් ඇත.
- දේව වචනය නොමැති භාෂාවන් සිය ගණනකි.
- තමන් අතර ශුභාරංචිය ගැන සාක්ෂි දැරීමක් නැති සෙනඟ කණ්ඩායම් සිය ගණනකි.

මුහුදේ වැලි මෙන් ටෝකියෝ, සවෝ පවුලෝ, කල්කටාව හා හොංකොං වැනි නගරවල සිටින සමූහය දකින විට අපි විස්මිත වෙමු. ගණන් නොගත් දහස් සංඛ්‍යාවකි. එහෙත් මේ සෑම කෙනෙක්ම ශුභාරංචි පණිවුඩය ඇසිය යුතුය. අවබෝධ කර ගත යුතුය. එමෙන්ම ප්‍රතිචාර දැක්වීමට අවස්ථාවක් ලැබිය යුතුය.

ශුභාරංචිය තවමත් ලැබී නොමැති විශාල සෙනඟක් සහිත ලෝකය දෙස බැලූ විට අපගේ අභිලාෂය පාවුලුතුමාගේ මෙන් විය යුතුය.

> **"එසේය, වෙන කෙනෙකුගේ අත්තිවාරම පිට ගොඩ නොනඟන පිණිස ක්‍රිස්තුස්වහන්සේගේ නාමය සඳහන් කරනු ලැබූ තැන්වල නොව: උන්වහන්සේ ගැන ආරංචි නොලැබූ අය දකින්නෝය, උන්වහන්සේ ගැන නෑසූ අය තේරුම් ගන්නෝයයි ලියා තිබෙන ලෙස, ශුභාරංචිය දේශනා කරන්ට අභිප්‍රාය කළෙමි." (රෝම 15:20-21)**

මෙම අභියෝගය ඉටු කළ හැක්කේ සෑම ඇදහිලිවන්තයෙක්ම ලෝක කිතුනුවෙක් වූ විටය. ඔබ මේ පිළිබඳව තවදුරටත් ඊළඟ පරිච්ඡේදයෙන් ඉගෙන ගන්නෙහිය.

## ස්වයං පරීක්ෂණය

1. ප්‍රධාන පදය මතකයෙන් ලියන්න.

___

___

2. ලෝකයා වෙත ශුභාරංචිය පැතිරීමේ අද තත්ත්වය භූගෝලීයව, භාෂාමය ලෙස හා ජනගහනය වෙත යෑම පදනම් කරගෙන සාරාංශ කරන්න.

___

___

3. "සෙනඟ කණ්ඩායම" යන්න නිර්වචනය කරන්න.

___

4. "ශුභාරංචිය නොගිය සෙනඟ කණ්ඩායම" නිර්වචනය කරන්න.

___

5. "ශුභාරංචිය ගිය සෙනඟ කණ්ඩායම" නිර්වචනය කරන්න.

___

6. තවමත් ශුභාරංචිය ගොස් නැති ප්‍රධාන සෙනඟ කණ්ඩායම් පහ නම් කරන්න.

___ ___ ___

___ ___

7. "සංවෘත රටක්" යන්නෙන් අදහස් වන දේ පැහැදිලි කරන්න.

___

8. සත්‍ය වශයෙන්ම වැසූ රටවල් නොමැත. මෙය සත්‍යයක්ද? අසත්‍යයක්ද?

___

(පරීක්ෂණ සඳහා පිළිතුරු මෙම අත්පොතේ අවසාන පරිච්ඡේදය අවසානයේ ඇත.)

# තවදුරටත් අධ්‍යයනය සඳහා

1. ලෝකයේ ශුභාරංචිය නොගිය සෙනඟ සඳහන් කර ඇති සටහනක් සඳහා U.S. Centre for World Mission, 1605, Elizabeth Street, Pasdena, California, 91104, U. S. A. ia:dkhg ,shkak'
2. ලෝකය මුළුල්ලේ ශුභාරංචිය පැතිරීමේ වර්තමාන තත්ත්වය පිළිබඳ සම්පූර්ණ තොරතුරු ලබා ගැනීමට *The World Christian Encyclopedia* by David B Barrett බලන්න.
3. "ශුභාරංචිය නොගිය අය පිළිබඳ තොරතුරු සඳහා මේසයක් Missions Advanced Research & Communication Centre, 919 Huntington, Drive, Monrovia, California, 91016 U.S.A හි පිහිටුවා ඇත.
   ශුභාරංචිය නොගිය අය ගැන උනන්දුවක් දක්වන අයට සේවය කිරීම සඳහා මෙම මේසය ඇත. මෙම මේසයේ කාර්යය මෙසේ වේ: ශුභාරංචිය නොගිය අය පිළිබඳ තොරතුරු රැස් කිරීම හා ඔවුන් වෙත ශුභාරංචිය ගෙන යාමට කැමති අය සමඟ මෙම තොරතුරු බෙදා ගැනීම.
4. ශුභාරංචිය නොගිය ප්‍රධාන කණ්ඩායම් (ගෝත්‍රික, මුස්ලිම්, හින්දු, බෞද්ධ, චීන) ගැන තවදුරටත් තොරතුරු ලබා ගැනීමට ඔබට උනන්දුවක් ඇත්නම් U.S. Centre for World Mission, 1605, Elizabeth Street, Pasdena, California, 91104, U. S. A. වෙත ලියන්න. මේ සේවය පිළිබඳ විශේෂඥතාවක් ඇති ආයතනවල මූලස්ථානය ඇත්තේ මෙම ලිපිනයේ වේ. මේ සෑම කණ්ඩායමක් ගැනම වැදගත් තොරතුරු හා සිතියම් ඔවුහු සපයති.
5. බොහෝ ජාතීන්ගේ විවිධ සෙනඟ කණ්ඩායම් පෙන්වන සිතියම් National Geography Magazine පොත පළ කරයි. ඔවුන් ළඟ ඇති සිතියම් ලැයිස්තුවක් ලබා ගැනීමට National Geography Society, Washington, D. C. 20036, U. S. A fj; ,shkak'
6. පහත දැක්වෙන සමීක්ෂණයෙන් පෙන්නුම් කෙරෙන්නේ මෙම පාඩමාලාව ප්‍රසිද්ධ කරන අවධියේ ලෝක ව්‍යාප්ත ප්‍රවණතා වේ.

## අප්‍රිකාව

### රටවල් 52කි

විශාල විවිධත්වයක් හා වෙනසක් මධ්‍යයේ වුවද මෙම මහද්වීපයේ සභාව ප්‍රාණවත් භාවයක් හා වර්ධනයක් පෙන්නුම් කරයි. මෙම වර්ධනය වැඩි වශයෙන් දැක ගත හැක්කේ සහරා කාන්තාරයට දකුණින් පිහිටි රටවලය. මහද්වීපයෙන් තුනෙන් එකක් පමණ වන උතුරේ මනුෂ්‍යයන් අතර ඉස්ලාම් දහම ප්‍රබලව අනුගමනය කෙරේ. කිතු දහමට හැරුණු අය ඇත්තේ ස්වල්පයක් වන අතර සභාවන් ද කුඩාය. කෙසේවුවද සහරාවට දකුණින් කිතුනු සංඛ්‍යාව ශීඝ්‍රයෙන් වර්ධනය වේ. 2000 වර්ෂයට පසු ලෝකයේ අනෙක් පෙදෙස්වලට වඩා අප්‍රිකාවේ කිතුනුවන් වැඩි වනු ඇතැයි ගණන් බලා තිබේ. අප්‍රිකානු සභාවේ නව ආත්මික ජීවිතය, මෑතදී දියත් කර ඇති අති මහත් ඉවැන්ජලිස්ත වැඩසටහන්වලින් ද පෙනේ. පරිණත වන අප්‍රිකානු සභාව දැන් ඉවැන්ජලිස්තවරුන් පිටරටවලට යවයි. අප්‍රිකානු සභාවේ මිෂනාරි සේවා ගැටලුවලට මෙන්ම අවස්ථාවන්ට ද මුහුණ දෙන බව පෙනේ. සභා කණ්ඩායම්වලට හා විදේශ මිෂනාරිවරුන්ට ඇතැම් රටවල සීමාවන් පනවා ඇති අතර බොහෝ රටවලින් මිෂනාරිවරුන් සහ සභා සේවකයන් පිටුවහල් කර ඇත. එහෙත් වැඩි වශයෙන් හේතුවන්නේ මීට අදාළ රාජ්‍යයන් දේශපාලන අල්ලා ගැනීමට කෙරෙන අරගලයන් වේ.

## ආසියාව

### රටවල් 28

මෙම විශාලතම හා ජනගහනය වැඩිම මහද්වීපයේ කිතුනුවන් කුඩා සුළුතරයකි. මේ පෙදෙසේ මුළු ජනගහනයෙන් ඔවුන්ගේ නියෝජනය සියයට දෙකක් හෝ තුනක් වේ. කෙසේවුවද ඇතැම් ආසියානු

රටවල සංඛ්‍යාවලින් දැක්වෙන ප්‍රමාණයට වඩා කිතුනුවන්ගේ බලපෑම වැඩිය. ඊට හේතුව ඔවුන්ගේ අධ්‍යාපනය හා සමාජ තත්ත්වය වේ.

රටවල් ඇතුළත ඇතැම් ප්‍රදේශවල කිතුනු ප්‍රතිශතය සමස්තයක් ලෙස රටේ ප්‍රතිශතය හා සසඳන විට වැඩිය. නිදසුනක් ලෙස ඉන්දියාවේ කේරළය, බෙංගාලය, මනිපූර්, මිසෝරාම් සහ මැලේසියාවේ සභා නම් පළාත දැක්විය හැකිය. ආසියාවේ ඇතැම් පෙදෙස්වල සමස්තයක් වශයෙන් ගත් කල මුළු සංඛ්‍යාව අඩු වුවද කිතු දහමට දක්වන ප්‍රතිචාරය විස්මයජනකය. විශේෂයෙන්ම ඉන්දියාව, තායිවානය, ඉන්දුනීසියාව, බුරුමය වැනි රටවල ගෝත්‍රික කණ්ඩායම් හා සරණාගතයෝ ශුභාරංචිය පිළිගැනීමට කැමති වෙති.

කොරියාවේ කිතුනුවන්ගේ සංඛ්‍යාව සමස්ත කොරියානු ජනගනය මෙන් සතර ගුණයකින් වර්ධනය වේ. " Asiaweek" නමැති සඟරාවේ වාර්තා කර ඇත්තේ ලෝකය කිතුනු ජනගහණය ශීඝ්‍රයෙන්ම වර්ධනය වන්නේ දකුණු කොරියාවේ බවය. ඉන්දුනීසියාවේ 1960 ගණන්වල දහස් ගණනින් කිතු දහම වැළඳගෙන ඇත. මුළුමනින්ම බෞද්ධ රටක්ව පැවති කාම්බෝජය 1971 සිට 1975 කොමියුනිස්ට්වරුන් බලයට පැමිණෙන තෙක් කිතු දහම ගැන දහස් ගණනින් උනන්දුවක් දැක්විය. අද එහි ජීවත් වන්නේ කිතුනුවන් ස්වල්ප දෙනෙකි. සමාජීය, සංස්කෘතික හා දේශපාලනමය බාධක පැවතියද තායිලන්තය, සිංගප්පූරුව හා බුරුමය යන රටවල ධර්මදානී සභාවන් වර්ධනය වන බවට වාර්තා වී ඇත.

මැලේ හා සූඩාන් ජාතිකයන් ඉවැන්ජලිස්ත කිරීම වැළැක්වීමට සටන්කාමී මුස්ලිම්වරු බොහෝ සේ වෙහෙස වී වැඩ කරති. බෞද්ධයෝ හා හින්දූන් කිතුනුවන්ගේ ක්‍රියා සීමා කිරීමට කටයුතු කරති. එමෙන්ම දරුණු පීඩා කිරීම්ද වාර්තා වී ඇත. ඇතැම් රටවල රාජ්‍ය ප්‍රතිපත්ති ඉවැන්ජලිස්ත සේවය වළක්වන අතර සභාවේ කටයුතු සීමා කරයි. නැතහොත් නවත්වයි.

බ්‍රසීලයේ හැර ලෝකයේ වෙනත් කිසිදු රටකට වඩා ජපානයේ ප්‍රෙතෙස්තන්ත මිෂනාරිවරු සේවය කරති. ඉදිරි දශකයේ කිතු දහම ගැන විශාල ව්‍යාපාරයක් ජපානයේ අත් දැකිමට හැකි වනු ඇතැයි සභා නායකයෝ විශ්වාස කරති.

## යුරෝපය හා පැරණි සෝවියට් දේශය

රටවල් 27ක් හා සමූහාණ්ඩු 15ක් සහිත එක් රටක්

ලෝකායත්තවාදය, මානවවාදය, කොමියුනිස්ට්වාදය හා ආගමික විශ්වාස පිළිබඳ උදාසීනත්වය අද බොහෝ යුරෝපීය රටවල දක්නට ලැබේ. යුරෝපයේ ඉවැන්ජලිස්ත වැඩසටහන් සාමාන්‍යයෙන් ඇත්තේ ප්‍රාදේශියව වුවද ඇතැම් අවස්ථාවල විශාල පෙදෙසක කටයුතු කිරීමට ප්‍රයත්නයක් ගෙන ඇත. ඉවැන්ජලිස්ත කිරීම පිළිබඳ යුරෝපයේ සංගම් ඉවැන්ජලිස්ත කටයුතු ගැන වඩ වඩාත් උනන්දුවක් දක්වන අතර බොහෝ සේ ජාතික ප්‍රයත්නයක් ගෙන ඇත. යුරෝපය මුළුල්ලේම සවන් දිය හැකි ප්‍රබල කිතුනු ගුවන්විදුලි මධ්‍යස්ථාන කීපයක්ම නිසා ඉවැන්ජලිස්ත සේවය හා වෙනත් සේවාවන් ශක්තිමත් වී ඇත. කොමියුනිස්ට් වාදය ප්‍රබලව පැවති නැගෙනහිර යුරෝපීය රටවල බොහෝ අය කිතු දහම ගැන නැවත උනන්දුවක් දැක්වීමට පටන් ගෙන ඇත. බොහෝ රටවල පිළිගත් සභාවලට ක්‍රියා කිරීමට අවසර දී ඇති අතර පෝලන්තය, රුමේනියාව, බල්ගේරියාව හා පැරණි සෝවියට් දේශයේ දේවස්ථානවලට පැමිණෙන සංඛ්‍යාව වැඩි වෙමින් පවතී. කොමියුනිස්ට්වාදය හා වෙනත් අදේවවාදී දර්ශනයන් ප්‍රතික්ෂේප කරන තරුණයන් සිටින ගම් හා නගරවල කුඩා බයිබල් අධ්‍යයන කණ්ඩායම් හා ගෘහ සභා බිහිවෙන්නට පටන් ගෙන ඇත.

## ලතින් අමෙරිකාව

### රටවල් 36කි

ලතින් ඇමෙරිකාවේ බොහෝ පෙදෙස්වල ධර්මදානී සභා ශීඝ්‍රයෙන් වර්ධනය වෙමින් පවතින අතර පිබිදීම බොහෝ ජාතීන් අතර දැකගත හැකිය. නිදසුනක් ලෙස ඒ පෙදෙසේ විශාලතම ජාතිය වන බ්‍රසීලයේ ප්‍රොතෙස්තානුවෝ, සමස්තයක් වශයෙන් ගත් කළ මුළු ජනගහන වර්ධන වේගයට වඩා තුන් ගුණයකින් වර්ධනය වෙති. ලතින් ඇමෙරිකාවේ සියලු ප්‍රොතෙස්තන්තවරුන්ගෙන් තුනෙන්

දෙකක් පමණ සිටින්නේ බ්‍රසීලයේ වේ. අනෙකුත් ජාතීන් බොහෝ සේ අදේවවාදී හා මාක්ස්වාදී දර්ශනවල බලපෑම්වලට යට වී ඇත. එබැවින් ශුභාරංචිය පැතිරවීම මහත් අභියෝගයකි.

## මැද පෙරදිග

### රටවල් 17කි.

මැදපෙරදිග සභාවේ වර්ධනය සීමිත වූ ප්‍රදේශයකි. ඉස්ලාමීය පිබිදීම හා සියොන්වාදය මධ්‍යයේ කිතු දහම විදේශීය දෙයක් ලෙස සැලකේ. ක්‍රිස්තියානි ආගමට හැරීම සලකන්නේ ආගමට හා ජාතියට කෙරෙන ද්‍රෝහිකමක් ලෙසය. සභාව සාමාන්‍යයෙන් කුඩාය. සාම්ප්‍රදායිකය. සිරිත් විරිත්වලට බැඳී ඇත. සියලුම කිතුනුවන් ගත් කළ මුළු ජනගහනයේ සියයට හතරකට වඩා අඩුය.

මේ ප්‍රදේශයේ බොහෝ සේ ඵලදායි ලෙස ශුභාරංචිය පැතිරීම සිදුවන්නේ පාසල්වල හා ආරෝග්‍යශාලාවල වන අතර එය එක්කෙනාට එක්කෙනා බැගින් වේ. ගුවන් විදුලිය හා පොත්පත් ආදියෙන්ද ශුභාරංචිය පැතිරීම සිදුවේ. ලෙබනනය වැනි කලබල ඇති පෙදෙස්වල සහනදායී හා සංවර්ධන ව්‍යාපෘති මගින් ත්‍රස්තවාදයෙන් හා ආරවුල් නිසා විපතට පත් අය අතර ශුභාරංචිය පැතිරීමට අවස්ථාවක් ලැබී ඇත.

මැද පෙරදිග ජනගහනය අධිකම රට වන තුර්කියේ කිතුනු දේව සේවය සීමා කර ඇත. දෙවැනි ජනගහනය අධික ඊජිප්තුවේ කිතුනු ප්‍රතිශතය අඩුවෙමින් ද පීඩාවන් වැඩිවෙමින් ද පවතී. මැද පෙරදිග රටවල මුස්ලිම්වරුන්ට සේවය කිරීම අද සභාවට ඇති ප්‍රබලතම අභියෝගය වේ. නිදසුනක් ලෙස සවුදි අරාබියේ මුස්ලිම් බැතිමතෙක්ට ක්‍රිස්තියානි වීම නීති විරෝධීය.

අසීරු වාතාවරණයක් තිබියදීත් ලෙබනනය, පකිස්ථානය හා ජෝර්දානය වැනි රටවල ශුභාරංචිය පැතිරීම සඳහා අවස්ථාවන් හා ගෘහ බයිබල් අධ්‍යයනයන් ශීඝ්‍ර ලෙස වර්ධනය වන බව කැපවුණු කිතුනුවන්ගේ අත්දැකීම වේ.

## උතුරු ඇමෙරිකාව

### රටවල් 2කි.

ආගමික පර්යේෂණ සංවිධාන පවසන්නේ, තම ජීවිතවලට ආගමේ ඇති වැදගත්කම, සදාතන ජීවිතය ගැන ඇති විශ්වාසය හා දෙවියන්වහන්සේ ඇදහීම ආදිය පදනම් කර ගත් විට ලෝකයේ ඉතාමත් ආගමට ලැදි අය සිටින්නේ උතුරු ඇමෙරිකාවේ බවය. එහෙත් උතුරු ඇමෙරිකාවේ සිටින බොහෝ අය "නාමික කිතුනුවෝ" වෙති. වර්තමාන සංස්කෘතික හා දේශපාලනික ප්‍රවණතාවලින් මේවා "කිතුනු" ජාතීන් බව නොපෙනේ.

මෑත කාලයේ උතුරු ඇමෙරිකාවේ කිතු දහමේ විවිධ ප්‍රවණතා හා ව්‍යාපාරයන් ඇති වී තිබේ. සාම්ප්‍රදායික සභා ව්‍යුහයන් තුළත් බාහිරවත් අලුත් කිරීමේ උත්සාහයන් ගෙන ඇත. ඇතැම් නිකායයන් ප්‍රතිසංවිධානය වී ඇති අතර ඇතැම් ඒවා අලුත් සංවිධාන බිහි කිරීම සඳහා බෙදී සිටිති.

## සමුද්‍රීය රටවල්

### රටවල් 8කි.

ඕස්ට්‍රේලියාව හා නවසීලන්තය ඇතුළු සමුද්‍රීය රටවල් යනු පැසිෆික් සාගරයේ විසිරී ඇති විවිධ සංස්කෘතීන්ට අයත් සෙනඟ මිලියන සංඛ්‍යාවක් වෙසෙන රටවල් වේ. දූපත් කණ්ඩායම්වල සෙනඟ බොහොමයක් කිතුනුවන් වන අතර ඔවුන් ශුභාරංචිය දී ඇත්තේ දහනවවන ශත වර්ෂයේ හා විසිවන ශතවර්ෂයේ මුල් භාගයේදී වේ.

මෑත කාලයේදී මේ දූපත්වල කිතුදහම වර්ධනය වීම ශීඝ්‍රයෙන් සිදු වී ඇත. සමුද්‍රීය රටවල සභාවට ඇති අභියෝගයන් වන්නේ ප්‍රමාණවත් තරම් නායකයන් පුහුණු කිරීම, ගෝත්‍රික ආගම්වලින් ඇති විරෝධතාවන් හා ශුභාරංචිය නොගිය ඈත වනාන්තරවල වෙසෙන අය වෙත යෑම ආදිය වේ.

ශුභාරංචිය ගෙන ගොස් නැති ගෝත්‍රික කණ්ඩායම් බොහෝ සේ සිටින පපුවා නිව් ගිනියාව මේ සඳහා නිදසුනකි. මෙහි කිතු දහම අදහන සංඛ්‍යාව වර්ධනය වෙමින් පවතී. උත්සාහයන් ප්‍රබලව පවතින්නේ නම් පපුවා නිව්ගිනියාවේ තනිවී සිටින ශුභාරංචිය නොලද ගෝත්‍රික කණ්ඩායම් අපගේ පරම්පරාව තුළම ශුභාරංචිය තුළට ගෙන ආ හැකිය.

අනෙකුත් කිතුනු නොවන කණ්ඩායම් අතර බොහෝ දූපත්වල වෙසෙන චීන හා ඉන්දියානු සෙනඟ වෙති. බ්‍රිතාන්‍ය උරුමය පෙන්වන ඕස්ට්‍රේලියානු හා නවසීලන්ත සභාවන් සමුද්‍රීය රටවල ශුභාරංචිය පැතිරීමේ කටයුතුවල නිරතව ඇත. කෙසේ වුවද ඉතාමත් ඵලදායී ශුභාරංචිය සේවය වී ඇත්තේ දූපතෙන් දූපතට ගමන් කරන ජාතික ඉවැන්ජලිස්තවරුන්ගේ වැඩකටයුතු වේ.

යාබද නවසීලන්තයේ කිතු දහමද බ්‍රිතාන්‍ය උරුමයට හිමිකම් කියන අතර එහි එංගලන්ත සභාවට හා ප්‍රෙස්බටීරියන් සභාවට ප්‍රොතෙස්තන්ත්‍ර කිතුනුවන්ගෙන් තුනෙන් දෙකක් පමණ අයත් වෙති. එහි විශාලතම ඒකීය සභාව වන්නේ රෝමානු කතෝලික සභාවය.

# අටවන පරිච්ඡේදය

## ලෝක කිතුනුවෙක් වීම

### අරමුණ

මෙම පරිච්ඡේදය අධ්‍යයනයෙන් පසු ඔබට

- ප්‍රධාන පදය මතකයෙන් ලිවීමට
- "ලෝක කිතුනුවෙකු" යන පදය නිර්වචනය කිරීමට
- "ලෝක කිතුනුවෙකු" වීම
- ලෝකයා වෙත ශුභාරංචිය ගෙන යෑමට මුල් සභාව භාවිත කළ උපක්‍රම පැහැදිලි කිරීමට හැකිවනු ඇත.

### ප්‍රධාන පදය

> **"නුඹලා මා තෝරා ගත්තා නොව මම නුඹලා තෝරාගෙන පත් කළෙමි. එසේ කළේ නුඹලා ගොස් ඵල දරන පිණිසත් නුඹලාගේ ඵල පවතින පිණිසත් මාගේ නාමයෙන් පියාණන්වහන්සේගෙන් නුඹලා ඉල්ලන කොයි දෙයක් නුමුත් උන්වහන්සේ නුඹලාට දෙන පිණිසත්ය." (යොහන් 15:16)**

## හැඳින්වීම

ජේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ ශුභාරංචිය ලෝකයා වෙත ගෙන යෑමේ සභාවේ වගකීම ගැන ඔබ පෙර පරිච්ඡේදයෙන් ඉගෙන ගත්තෙහිය. සභාව ලෙස හැඳින්වෙන ජේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ සාමූහික ශරීරයේ **<u>ඔබ</u>** ද කොටසක් වේ. ලෝකයා වෙනුවෙන් සභාවට ඇති දූත මෙහෙවර සාක්ෂාත් කර ගැනීමට නම් දෙවියන්වහන්සේගේ සැලැස්මේ එක් එක්කෙනා වෙනුවෙන් ඇති කොටස සෑම සාමාජිකයෙක්ම හඳුනාගත යුතුය. **<u>ඔබට</u>** ලෝකයා වෙනුවෙන් පෞද්ගලික වගකීමක් ඇත. එම වගකීම සෑම මසකම මිෂනාරි සේවය සඳහා සභාවට පරිත්‍යාග කරන මුදලට වඩා වැඩිමනත් දෙයකි.

මෙම පරිච්ඡේදයෙන් සොයා බැලෙන්නේ ලෝකයා වෙනුවෙන් ඇති ඔබගේ පෞද්ගලික වගකීම වේ. ඔබ ලෝක කිතුනුවෙක් වන ආකාරය ඉගෙන ගන්නවා ඇත. ඔබ ජාතීන් වෙනුවෙන් ඇති දෙවියන්වහන්සේගේ සැලැස්මේ ප්‍රේක්ෂකයෙකුගේ තත්ත්වයේ සිට සහභාගිකයෙකුගේ තත්ත්වයට පත්වනු ඇත.

## සෑම කෙනෙක්ම ඉවැන්ජලිස්තවරයෙකි.

"ඔබ ලෝකය වෙත ගොස් ශුභාරංචිය දේශනා කරන්න" හා "ඔබ මාගේ සාක්ෂිකාරයෝ වන්නහුය" යි ජේසුස්වහන්සේ පැවසූ විට උන්වහන්සේ තමන්වහන්සේගේ අනුගාමිකයන් කණ්ඩායමකට කතා කරමින් සිටි සේක. එහෙත් සෑම කණ්ඩායමක් මෙන්ම මෙම කණ්ඩායම ද එක් එක් පුද්ගලයන්ගෙන් සමන්විත විය. ජේසුස්වහන්සේ "ඔබ ගොස්" යයි පැවසූ විට එය කණ්ඩායමට පැවසූ දෙයක් නොව තනි පුද්ගලයන්ට ද පැවසූ දෙයක් විය. කණ්ඩායමේ සෑම කෙනෙක්ම පෞද්ගලිකව මේ අභියෝගය භාර ගත යුතු වේ. කණ්ඩායම තුළ සිටින පුද්ගලයන් මේ දේ කිරීමට අසමත් වුවහොත් මුළු කණ්ඩායමම අසමත් වනු ඇත.

ජාතීන් වෙතට යෑමේ අභියෝගය දැන් සභාව විසින් භාර ගෙන ඇත. එහෙත් සභාව තනි පුද්ගලයන්ගෙන් සමන්විත වන බැවින් සෑම පුද්ගලයෙක්ම පෞද්ගලිකව ශ්‍රේෂ්ඨ පැවරීමට ප්‍රතිචාර දැක්වීමෙන් පමණක් මෙම අභියෝගයට මුහුණ දීමට හැකි වනු ඇත.

## එක්කෙනෙක් තවකෙනෙකුට උගන්වන්න

මුල් සභාවේ ගෘහාරංචිය පැතිරවීමේ වගකීම සෑම කෙනෙක්ම පුද්ගලිකව භාර ගත්තේය. විවිධ සංස්කෘතික ඉවැන්ජලිස්ත සේවය කරන ලද්දේ ගිහි අය වන අතර ඔවුහු පූර්ණ කාලීන පූජකවරු නොවූහ. ඇතැම් ශ්‍රේෂ්ඨ ඉවැන්ජලිස්ත ව්‍යාපාර මෙහෙය වන ලද්දේ මෙම ගිහි අය විසිනි. ක්‍රියා පොතේ 6 හා 7 පරිච්ඡේදවල සඳහන් පිලිප්ගේ හා ස්තේපන්ගේ කතාන්දරවලින් මෙය පැහැදිලි කෙරේ. ඔවුන් දෙදෙනාම ගිහියන් වූ අතර ගෘහාරංචිය පැතිරීම සඳහා දෙවියන්වහන්සේ ඔවුන්ව ප්‍රබලව යොදා ගත් සේක.

ජෙරුසලමේදී සභාවට විරුද්ධව පීඩාවන් පැමිණි සිට ඇදහිලිවත්හු ජුදාවෙහි හා සමාරියයෙහි විසිරී සිටියහ. එය බයිබලය මෙසේ වාර්තා කරයි.

> **"එබැවින් විසුරුවනු ලැබූ ඔවුහු ගිය ගිය ස්ථානවල වචනය ප්‍රකාශ කළෝය." (ක්‍රියා 8:4)**

භක්තිමත් අයට ඉගැන්වීමේ අභියෝගය ඇදහිලිවතුන් භාර ගත් අතර ඔවුන්ට අනෙක් අයට ඉගැන්වීමට ද හැකිවිය.

> **"බොහෝ සාක්ෂිකාරයන් ඉදිරියෙහි නුඹ මාගෙන් ඇසූ දේම වෙන අයටත් උගන්වන්ට සමර්ථ වූ විශ්වාස වූ මනුෂ්‍යයන්ට භාර දෙන්න." (2 තිමෝති 2:2)**

මෙම ආත්මික අය බිහිකිරීමේ අඛණ්ඩ චක්‍රයේ ප්‍රතිඵලයක් වශයෙන් ඇදහිලිවතුන් වැඩිවීම නිරන්තරයෙන්ම පැවතිණි.

## සෑම නිවසක්ම බෝ කිරීමේ මධ්‍යස්ථානයක් වේ.

නිවෙස, ආත්මික වර්ධනයේ මධ්‍යස්ථානයක් වීමේ අදහස අලුත් දෙයක් නොවේ. දෙවියන්වහන්සේගේ ව්‍යවස්ථාව මිනිසාට දුන් අවස්ථාවේ සිටම, බලාපොරොත්තුව වූයේ නිවස පුහුණු කිරීමේ මධ්‍යස්ථානයක් කිරීමය.

> **"මා විසින් අද නුඹට අණ කරන මේ වචන නුඹේ සිතේ තිබේවා. ඒවා නුඹේ දරුවන්ට හොඳාකාරයෙන් උගන්වා, නුඹ ගෙයි හිඳින කලද මග යන කලද නුඹ සයනය කරන කලද නැගිටින කලද ඒවා ගැන කතා කරන්න. . . . ඒවා නුඹේ ගෙයි උළුවහු පිටද නුඹේ දොරවල් පිටද ලියන්න." (ද්විතීය කථාව 6:6, 7, 9)**

මුල් සභාවේ සෑම නිවසක්ම ඉවැන්ජලිස්ත සේවයේ මධ්‍යස්ථානයක් විය. ඇදහිලිවතුන් ගෘහාරංචිය ඉගැන්වූයේ දේව මාළිගාවේ පමණක් නොවේ. දිනපතාම නිවෙස්හි එය සිදු කෙරිණි.

> **"දවස්පතාම දේව මාළිගාවේදීත් ගෙදරදීත් ඉගැන්වීමෙන්ද යේසුස්වහන්සේ ක්‍රිස්තුස්වහන්සේයයි දේශනාකිරීමෙන්ද නොනැවතුණෝය." (ක්‍රියා 5:42)**

නිවෙස් කණ්ඩායම්වල ඉවැන්ජලිස්ත සේවයේ බලපෑම කෙතරම් සාර්ථක වූයේද යත් සාවුල් සභාව මැඩලීමට උත්සාහ කරන විට දේව මාළිගාව කෙරෙහි පමණක් අවධානය යොමු කිරීමෙන් එය කළ නොහැකි බව ඔහුට හැඟිණි. ගෘහාරංචිය පැතිරීම නැවැත්වීමට ඔහු සෑම නිවසකටම ගියේය.

> **"නුමුත් සාවුල් සියලු ගෙවලට වැද, පුරුෂයන්ද ස්ත්‍රීන්ද ඇදගෙන ගොස් හිරගෙට භාරදෙමින් සභාව නාස්තිකෙළේය." (ක්‍රියා 8:3)**

ගෘහාරංචිය විවිධ සංස්කෘතිවල පැතිරවීමේ දෙවියන්වහන්සේගේ සැලැස්ම පිළිබඳ දැක්ම දෙනු ලැබුවේ පේතෘස්තුමා නිවසක මහල්තලයේ යාච්ඤා කරමින් සිටියදීය (ක්‍රියා 10). විජාතීන්ට දෙන ලද පළමු පණිවිඩය දේශනා කරන ලද්දේ කොර්නේලියස්ගේ නිවසෙහි දී වේ (ක්‍රියා 10).

ශ්‍රේෂ්ඨ විවිධ සංස්කෘති සඳහා ඉවැන්ජලිස්තවරයෙකු වූ පාවුල්තුමා අනනියස් විසින් ගෝලත්වයට ගෙන ආවේ නිවෙසකදී වේ (ක්‍රියා 9). පාවුලුතුමා තම දූත මෙහෙවරෙහිදී ප්‍රසිද්ධියේ මෙන්ම නිවෙසින් නිවෙසට ගොස් ඉගැන්වීම ද කළේය.

**"ප්‍රයෝජනවත් වූ කිසි දෙයක් ප්‍රකාශ කිරීමෙන් නොවැලකී, ප්‍රසිද්ධියෙන්ද ගෙයින් ගෙටද නුඹලාට උගන්වමින් ................" (ක්‍රියා 20:20)**

පාවුල්තුමා තම දූත මෙහෙවරෙහි අවසාන දවස් ගත කළේ කුලියට ගත් නිවසක, තමා වෙතට පැමිණි සියල්ලන්ට උගන්වමින් හා දේශනා කරමින්ය.

**"ඔහු තමා විසින් කුලියට ගත් ගෙයි දෑවුරුද්දක්ම වාසය කොට, තමා වෙත පැමිණි සියල්ලන් පිළිගෙන, කිසිම භයක්වත් තහනමක්වත් නැතිව, දෙවියන්වහන්සේගේ රාජ්‍යය දේශනා කරමින්, ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ කාරණා ගැන ඉගැන්නුවේය." (ක්‍රියා 28:30-31)**

තම නිවස සියලු ජාතීන්ගේ යාච්ඤා ගෘහය ලෙස හඳුන්වන බව ජේසුස්වහන්සේ ප්‍රකාශ කළ සේක.

**"උන්වහන්සේ උගන්වමින් ඔවුන්ට කියන සේක්: මාගේ ගෘහය සියලු ජාතීන්ට යාච්ඤා ගෘහයකැයි කියනු ලබන්නේයයි ලියා තිබෙනවා නොවේද? නුමුත් නුඹලා ඒක සොරුන්ගේ ගෘහාවක් කළහුයයි කී සේක." (මාර්ක් 11:17)**

මෙම පදයේ "ගෘහය" සඳහා යොදා ඇති ග්‍රීක වචනයේ තේරුම වාසය කරන තැන වේ. මෙය පෞද්ගලික තැනක් හෝ ප්‍රසිද්ධ දේවස්ථානයක් විය හැකිය.

මුල් සභාවේ ලෝකයා වෙත යෑමේ උපක්‍රමය වූයේ සෑම ඇදහිලිවන්තයෙක්ම ඉවැන්ජලිස්ත මධ්‍යස්ථානයක් ලෙස සිය නිවස යොදා ගැනීම තුලින් වේ.

## ප්‍රතිඵල

මුල් සභාවේ මෙම "සෑම පුද්ගලයෙක්ම" හා "සෑම නිවෙසක්ම" යන උපක්‍රමයේ ප්‍රතිඵල මොනවාද? ඔවුන්, ඔවුන්ගේ ලෝකයට ශුභාරංචිය ගෙන යෑම වේ. සභාවේ සතුරෝ මෙසේ පැවසූහ:

**"නුමුත් ඔවුහු ඔවුන් සොයා නොදැක යාසොන් සහ සමහර සහෝදරයන්ද නුවර මුලාදෑනීන් ළඟට ඇදගෙන ගොස්: ලෝකය පෙරළුවාවූ මොව්හු මෙහිත් ඇවිත් සිටිති. (ක්‍රියා 17:6)**

සෑම ඇදහිලිවන්තයෙක්ම මෙම ක්‍රමය අනුගමනය කළහොත් ප්‍රතිඵල කුමක් වේද?

පහත දැක්වෙන සටහන අධ්‍යයනය කරන්න. අලුතෙන් කෙනෙක් දිනා ගැනීමට හා ඔහු පුහුණු කිරීමටද ඔහු තවත් ඇදහිලිවන්තයන් ඇතිකිරීමට අවශ්‍ය සාමාන්‍ය කාලය අවුරුද්දක් ලෙස සලකා මෙම චාට් සටහන යොදා ගෙන ඇත. එහෙත් මෙම ක්‍රියාවලිය සඳහා ගතවන කාලය, ඊට සහභාගි වන අය අනුව අඩු වැඩි විය හැකිය. එහෙත් වසරක් සාමාන්‍යය ලෙස ගෙන, සෑම ඇදහිලිවන්තයෙක්ම, සෑම අවුරුද්දකම එක් පුද්ගලයෙකු ශුභාරංචිය වෙත ගෙනවිත් ගෝලත්වයට ගෙනආවොත්, සෑම අවුරුද්දකම එක් පුද්ගලයෙකු ගෝලත්වයට ගෙනෙන බවට ඔහු පොරොන්දු වුවහොත් ශුභාරංචිය ලොව පුරා ගෙන යාම ඉතා පහසු වනු ඇත.

පළමුවන අවුරුද්දේ ඇදහිලිවන්තයා තවත් පුද්ගලයෙකු දිනාගෙන ඔහු ගෝලයෙකු කරනු ඇති බව සටහනෙන් බලාගන්න. එම අවුරුද්ද අවසානයේ දැන් ඇදහිලිවන්තයන් දෙදෙනෙක් ඇත. (ඇදහිලිවන්තයා හා ඔහු ගෝලයෙකු කළ තැනැත්තා) ඊළඟ අවුරුද්දේ මේ සෑම කෙනෙක්ම තවත් කෙනෙකු බැගින් ගෝලයන් කරනු ඇත. එවිට දෙවෙනි අවුරුද්ද අවසානයේ මුළු ගණන සතර දෙනෙකු වන අතර ඔවුන් සෑම කෙනෙක්ම ඊළඟ අවුරුද්දේ එක්කෙනා බැගින් ගෝලයෙකු කරනු ඇත. ලෝකයේ ජනගහනයෙන් බොහෝ දෙනෙක් වෙත තවම ශුභාරංචිය ගොස් නැත. එහෙත් දෙවියන්වහන්සේ උපක්‍රමයක් දී ඇත. එය සෑම ක්‍රියාකාරී ඇදහිලිවන්තයෙක්ම භාවිත කළහොත් දේවරාජ්‍යය පිළිබඳ ශුභාරංචිය පැතිරවීම පහසුවෙන්ම ඉටු කර ගත හැකිය.

| | ගෝලත්වයට ගෙනෙන්නන් | ගෝලයන් | මුළු ගණන |
|---|---|---|---|
| 17 වන අවුරුද්ද | 65356 | 65356 | = 131072 |
| 16 වන අවුරුද්ද | 32768 | 32768 | = 65356 |
| 15 වන අවුරුද්ද | 16384 | 16384 | = 32768 |
| 14 වන අවුරුද්ද | 8192 | 8192 | = 8192 |
| 13 වන අවුරුද්ද | 4096 | 4096 | = 32768 |
| 12 වන අවුරුද්ද | 2048 | 2048 | = 4096 |
| 11 වන අවුරුද්ද | 1024 | 1024 | = 2048 |
| 10 වන අවුරුද්ද | 512 | 512 | = 1024 |
| 9 වන අවුරුද්ද | 256 | 256 | = 512 |
| 8 වන අවුරුද්ද | 128 | 128 | = 256 |
| 7 වන අවුරුද්ද | 64 | 64 | = 128 |
| 6 වන අවුරුද්ද | 32 | 32 | = 64 |
| 5 වන අවුරුද්ද | 16 | 16 | = 32 |
| 4 වන අවුරුද්ද | 8 | 8 | = 16 |
| 3 වන අවුරුද්ද | 4 | 4 | = 8 |
| 2 වන අවුරුද්ද | 2 | 2 | = 4 |
| 1 වන අවුරුද්ද | 1 | 1 | = 2 |

## දෙවියන්වහන්සේගේ ගුණ කිරීමේ හා සේවයෙහි යෙදවීමේ දිව්‍යමය උපක්‍රමය

## ලෝක කිතුනුවන්

අද ලොව මුළුල්ලේම වර්ධනය වන නව ව්‍යාපාරයක් තිබේ. එය නිකායයන් හෝ සංවිධානාත්මක හෝ ව්‍යාපාරයක් නොවේ. එය ලෝකයේ සියලු ජාතීන් වෙත ශුභාරංචිය පැතිරීමේ පෞද්ගලික වගකීම හඳුනාගත් ඇදහිලිවතුන්ගේ කණ්ඩායමකි.

මෙම කණ්ඩායම බොහෝ ජාතීන්, සංස්කෘතීන්, භාෂාවන් හා ආගමික නිකායන්ට අයත් අයගෙන් සමන්විත වූවකි. ඔවුන්ට පොදුවූ එක් දෙයක් වන්නේ ලෝක කිතුනුවෙකු වීමට ඇති ඔවුන්ගේ කැපවීම වේ. ලෝක කිතුනුවෙකු යනු,

- ශුද්ධ බයිබලයෙන් එළිදරව් වූ දෙවියන්වහන්සේ එකම සැබෑ දෙවියන්වහන්සේ බව පිළිගන්නෙකි.
- ශුද්ධ බයිබලය දෙවියන්වහන්සේගේ වචනය බව පිළිගන්නෙකි.
- ජේසුස් ක්‍රිස්තුස්වහන්සේ තුළින් ලැබෙන දෙවියන්වහන්සේගේ ගැළවීමේ සැලැස්ම පෞද්ගලිකව පිළිගන්නෙකි.
- බයිබලීය ලෝක දැක්මක් පිළිගන්නෙකි.
- ලෝකයේ ජාතීන් වෙත ශුභාරංචිය ගෙන යෑමේ අභියෝගය පෞද්ගලිකවම පිළිගත්තෙකි.

ලෝක කිතුනුවෙකු තමාගේ රට අත්හැර වෙනත් සංස්කෘතියකට යා යුතුම යයි මින් අදහස් නොවේ. එහෙත් එය දෙවියන්වහන්සේගේ මඟ පෙන්වීම නම් එසේ කිරීමට ඔවුහු කැමති වෙති. ඉන් අදහස් වන්නේ ඔවුන් දැන් සිටින තැන, ඔවුන්ගේ නගරයේ හෝ ගමේ හෝ ශුභාරංචිය පැතිරීමට කැපවී සිටින බවය. එමෙන්ම ලෝකයේ ශුභාරංචිය නොගිය අය වෙත අන් අය යැවීමට ඔවුහු කැපවී සිටිති. පූර්ණ කාලීනව දේව සේවයේ යෙදී සිටිය ද ලෞකික රැකියාවක් කළ ද ලෝක කිතුනුවෙකුගේ ප්‍රමුඛතාව වන්නේ ශුභාරංචිය පැතිරීම වේ.

## ලෝක කිතුනුවෙකු වීමේ කැපවීම

මෙම පෞද්ගලික අභියෝගය පිළිගත් අය දෙවියන්වහන්සේට විශේෂ පෞද්ගලික කැපවීමක් කර ඇත. ඔවුන් මෙසේ පොරොන්දුවක් දී ඇත.

> "දෙවියන්වහන්සේගේ කරුණාවෙන් හා උන්වහන්සේගේ මහිමය සඳහා මම මාගේ මුළු ජීවිතයම මතෙව් 28:18-20හි සඳහන් පැවරීමට, දෙවියන්වහන්සේ මට මඟ පෙන්වන ආකාරයට හා ඕනෑම වෙලාවක, දැනට ශුභාරංචිය නොදත් අයට ප්‍රමුඛත්වය දෙමින් කීකරු වීමට කැප කරමි (රෝම 15:20-21). එමෙන්ම මෙම දැක්ම අන් අය සමඟ බෙදා ගැනීමට උත්සාහ කරමි."

මෙම පරිච්ඡේදයේ "ස්වයං පරීක්ෂණයේ" කොටසක් ලෙස මෙම පොරොන්දුව අත්සන් කිරීමේ අවස්ථාව ඔබට ලැබෙනු ඇත.

## ලෝක කිතුනුවෙකු ලෙස වර්ධනය වීම

මෙම පරිච්ඡේදයේ තව දුරටත් අධ්‍යයනය සඳහා කොටසේ ලෝක කිතුනුවෙකු ලෙස තවදුරටත් වර්ධනය වීම සඳහා අවශ්‍ය ද්‍රව්‍ය ලබා ගැනීමට යෝජනා දී තිබේ. මෙහි සඳහන්ව ඇත්තේ ලෝක කිතුනුවෙකු ලෙස දෙවියන්වහන්සේගේ සැලැස්මේ කටයුතු කිරීමට ඔබට කළ හැකි දේවල් කිහිපයකි.

## දෙවියන්වහන්සේගේ කැඳවීම සඳහා සූදානම් වන්න.

1. ස්වාමීන්වහන්සේට ඔබ ප්‍රසන්න වූ ජීවමාන යාගයක් වන්න (රෝම 12:1-2).

2. ඔබගේ ආත්මික ඇසීමට හා පෙනීමට පාපය බාධාවක් නොවන බවට වගබලා ගන්න (එපීස 1:18 කොලොස්සි 1:9).

3. මුල් බැසගෙන ඇති පෞද්ගලික සැලසුම් හා අභිලාසයන් ඉවත් කරන්න (ගීතාවලිය 25:9).

4. දෛනික යච්ඤාවේ හා බයිබල් අධ්‍යයනයේ පුරුද්ද ඇති කර ගන්න (ජෝෂුවා 1:8 ගීතාවලිය 77:12 119:15 25 45).

5. ස්වාමීන්වහන්සේ දෙස ඉවසීමෙන් බලා සිටින්න. ඔබගේ දෛනික ජීවිතයේ හා ක්‍රියාකාරකම්වල සෑම පියවරක් සඳහාම උන්වහන්සේගේ මඟ පෙන්වීම බලාපොරොත්තු වන්න. උන්වහන්සේ උන්වහන්සේගේ කැමැත්ත හා කැඳවීම ස්ථිර කරන සේක (හිතෝපදේශ 3:6, ගීතාවලිය 23:3, 32:8, 37:5, 7).

6. *"දෙවියන්වහන්සේගේ හඬ දැන ගැනීම"* නමැති හාවස්ටයිම් ජාත්‍යන්තර ආයතනයෙහි පාඨමාලාව ලබා ගන්න. ඔබ දෙවියන්වහන්සේගේ කැඳවීමට පිළිතුරු දීමට සූදානම් වීම සඳහා මෙය අධ්‍යයනය කරන්න.

## ඔබ සිටින තැන සිට ආරම්භ කරන්න.

1. දෛනික ජීවිතයේ කුඩා දේවලදී දෙවියන්වහන්සේට දිනපතාම කීකරු වන්න (ලූක් 19:17 1 සාමුවෙල් 15:22). ඔබ දැන් සිටින තැනදී දෙවියන්වහන්සේ ඔබට කරන්නට දෙන කුඩා දේ ගැන ඔබ සැලකිල්ලක් නොදක්වන්නෙහි නම් උන්වහන්සේ ඔබට මහත් කැඳවීමක් හෝ සේවයක් හෝ නොදෙනු ඇත (මතෙව් 25:14-30).

ඔබගේ නගරය හෝ ගම දෙස ආත්මික ඇස්වලින් බලන්න. ශුභාරංචිය අවශ්‍ය අය පෙන්වන මෙන් දෙවියන්වහන්සේගෙන් ඉල්ලා සිටින්න. හාවස්ටයිම් ජාත්‍යන්තර ආයතනයේ *"වටාපිටාවේ විශ්ලේෂණය"* නමැති පාඨමාලාව ඔබට මේ සඳහා උපකාරී වනු ඇත.

ඔබගේ පෙදෙසේ සිටින අයට ශුභාරංචිය ප්‍රකාශ කරන්න. ඔබ සිටින තැන දෙවියන්වහන්සේගේ සැලැස්මේ කොටස්කරුවෙකු වීමට හාවස්ටයිම් ජාත්‍යන්තර ආයතනයේ *"ගුණ කිරීමේ ක්‍රමවේද"* හා *"මුහුන්වලට සමානවූ ධර්ම ප්‍රචාරණය"* යන පාඨමාලා උපකාරී වනු ඇත.

2. දෙවියන්වහන්සේ විසින් යවන තැනකට යාමට හා උන්වහන්සේට අවශ්‍ය පරිදි පාවිච්චි කිරීමට කැමති වන්න (යොහන් 7:17). ඔබගේ ප්‍රදේශය අත්හැර ශුභාරංචිය පැතිරවීම සඳහා වෙනත් සංස්කෘතියකට යාම මින් අදහස් විය හැකිය. නැතහොත් අවශ්‍යතාව ඇති කෙනෙකු සමඟ ශුභාරංචිය බෙදා ගැනීම සඳහා මහපාර දිගේ යෑම විය හැකිය.

3. ඔබගේ ආත්මික දැක්ම තවදුරටත් වර්ධනය කර ගැනීමට ලෝකයාගේ ආත්මික අවශ්‍යතා අඛණ්ඩව අධ්‍යයනය කරන්න (යොහන් 4:35). මෙම විෂය පිළිබඳ පොත් කියවන්න. වෙනත් සංස්කෘතීන් වෙතට ඔබ විවෘත කෙරෙන කෙටි ගමන් යන්න. ඔබගේ ප්‍රදේශයේ පවත්වන ධර්මදූත සම්මේලනවලට සහභාගි වන්න.

4. ලෝකයේ ජාතීන් පිළිබඳව හා කෙත්වතුවල අස්වැන්න කැපීමට සහභාගි වන ගොවීන් උදෙසා යාච්ඤා කරන්න (මතෙව් 9:37-38). මෙය කිරීම සඳහා සංවිධානාත්මක සැලැස්මක් මෙම පාඨමාලාවේ 9 පරිච්ඡේදයෙන් සැපයේ.

5. ඔබගේ ආත්මික දීමනා භාවිත කිරීම ආරම්භ කරන්න. *"ශුද්ධාත්මයාණන්වහන්සේගේ සේවය"* නමැති හාවස්ටයිම් ජාත්‍යන්තර ආයතනයේ පාඨමාලාවක් ඔබට මේ ගවේෂණය සඳහා මඟ පෙන්වනු ඇත.

6. ඔබගේ සභාවේ ඉවැන්ජලිස්ත සේවය සඳහා ඇති කමිටුවට බැඳෙන්න. එවැනි දෙයක් නොමැති නම් එවැන්නක් ආරම්භ කරන්න. දසවන පරිච්ඡේදයේ තවදුරටත් අධ්‍යයනය සඳහා කොටස ඔබට මේ සඳහා සහාය වනු ඇත.

7. අනෙකුත් රටවල ශුභාරංචිය පතුරුවන අය සමඟ සම්බන්ධතා පවත්වන්න. ධර්මදූත සේවයේ යෙදෙන අයට ලියන්න. ඔබගේ පෙදෙසට ඔවුන් පැමිණි විට ඔබගේ නිවසේ නැවතීමට ඔවුන්ට ආරාධනා කරන්න. ඔවුන්ගේ අත්දැකීම්වලින් ඉගෙන ගන්න. ඔවුන්ගේ අපහසුතා, අවශ්‍යතා හා ජයග්‍රහණ ගැන ඔවුන් ඔබ සමඟ කතා කරන විට ඒවා ඔබට ප්‍රයෝජනවත් වනු ඇත.

8. ලෝකයා වෙත යෑමට තව දුරටත් පුහුණු වන්න. මෙවැනි දේට සූදානම් වීම සඳහා ඔබට උපකාරී වීමට හාවස්ටයිම් ජාත්‍යන්තර ආයතනයේ පාඨමාලාවන් ගෙන්වා ගන්න.

9. ඔබ උගත් දේ අන් අය සමඟ බෙදා ගන්න. ලෝකය ගැන ඉගෙනීමට හා මේ දැනුම මත ක්‍රියා කිරීමට ලෝක කිතුනුවන්ගේ කුඩා කණ්ඩායමකට බැඳෙන්න හෝ එවැන්නක් සංවිධානය කරන්න. දසවන පරිච්ඡේදය ඔබට මේ සඳහා සහාය වනු ඇත.

10. ශුභාරංචිය පැතිරවීම සඳහා උපකාර කිරීමට ඔබගේ පෞද්ගලික මුදල් දීමට සංවිධානාත්මක වැඩසටහනක් අරඹන්න. ඔබගේ ජීවන ශෛලිය විමසා බලන්න. ස්වාමීන්වහන්සේගේ වැඩ සඳහා ඔබගේ මුදල් තව වැඩිපුර දීමට කවර ආකාරයේ වෙනසක් කළ යුතුද?

11. ඔබගේ ගමන් බලපත්‍රය ලබා ගන්න. ශුභාරංචිය බෙදාගැනීමට ඔබ වෙනත් රටකට යැවීමට දෙවියන්වහන්සේට අවශ්‍ය විය හැකිය.

## දෙවියන්වහන්සේගේ කැඳවීම හඳුනා ගන්න.

සෑම ඇදහිලිවන්තයෙක්ම ඔවුන් දැන් සිටින ස්ථානයේදීම ශුභාරංචිය අන් අය සමඟ බෙදා ගැනීමට කැඳවනු ලැබේ. එහෙත් ඇතැම් අයට වෙනත් සංස්කෘතියකට යෑමට හෝ පාලකවරුන් ඉවැන්ජලිස්ත සේවකයන් හෝ මිෂනාරිවරුන් ලෙස පූර්ණ කාලීනව සේවයට බැඳෙන්නට හෝ දෙවියන්වහන්සේ විශේෂ කැඳවීමක් කිරීමට ඉඩ තිබේ. දෙවියන්වහන්සේ දෙන කැඳවීම හා ඔබ යවන කෙත්වතු ගැන සහතික වීම පිළිබඳව ඇතැම් මූලධර්ම ඇත.

ඔබ ඔබගෙන්ම මේ ප්‍රශ්න අසන්න.

1. ඔබ කරන්නට කැමති දෙය දෙවියන්වහන්සේ උන්වහන්සේගේ වචනයෙන් ඉදිරිපත් කර ඇති උන්වහන්සේගේ පොදු සැලැස්ම හා එකඟ වන්නේද? එය ශුද්ධ ලියවිල්ලට අනුකූලද? එය ශුභාරංචිය ලෝකයා වෙත ගෙන යෑමේ අරමුණට දායක වේද?

2. ඔබගේ ජීවිත ශෛලියේ අවස්ථාවන් දෙවියන්වහන්සේගේ මඟ පෙන්වීම ලෙස පෙනෙන දේ හා ගැළපේද? බාහිර අවස්ථාවන්ගෙන් පමණක් මඟ පෙන්වීම නොසොයන්න. එහෙත් ඒවා දෙවියන්වහන්සේගේ කැඳවීම ලෙස ඔබ විශ්වාස කරන දේ සමඟ විමසා බලන්න.

3. ශුද්ධාත්මයාණන්වහන්සේ ඔබගේ ආත්මය සමඟ මෙය දෙවියන්වහන්සේගේ කැමැත්ත බවට අඛණ්ඩව සාක්ෂි දරන්නේද? ඔබගේ ආත්මයේ සාමයේ අඩුවකින් බොහෝ විට පෙන්නුම් කෙරෙන්නේ ඔබ වැරදි තීරණයක් ගෙන ඇති බවට අනතුරු ඇඟවීමකි.

4. ඔබට අභියෝගයක්, සිත් ඇද ගන්නා දෙයක් හෝ නොමැති විට පවා ඔබ තවමත් කැඳවීම ලබන්නෙක් ලෙස සිටිද? එතරම්ම වැදගත් නැතැයි සිතෙන කාර්යයකට හෝ සේවයකට හෝ ඔබ කැඳවනු ලැබුවහොත් ඔබ යන්නෙහිද?

5. දෙවියන්වහන්සේ ඔබට දී ඇති කැඳවීම සාක්ෂාත් කිරීම පිණිස ඕනෑම මිලයක් ගෙවීමට ඔබ කැමැත්තෙහිද? මේ මිලය තවදුරටත් අධ්‍යාපනයක් ලැබීමේ සිට ජීවිතය පූජා කිරීම දක්වා පරාසයක තිබිය හැකිය. එය නිවසින් පවුලෙන් හා මිතුරන්ගෙන් ඈත්වීමක් විය හැකිය. ඔබ කැමතිද?

## උන්වහන්සේ ඔබ තෝරාගෙන පත් කර ඇත.

ලෝකයේ ජාතීන් වෙත ශුභාරංචිය ගෙන යෑමේ උන්වහන්සේගේ සැලැස්මේ කොටස්කරුවෙකු ලෙස ජේසුස්වහන්සේ ඔබ තෝරා ගෙන ඇත. කෙත්වතුවලින් ආත්මික පල ගෙනෙන පිණිස ඔබ තෝරාගෙන පත්කර ඇත. මෙම කාර්යය සම්පූර්ණ කිරීම සඳහා ඔබට අවශ්‍ය ඕනෑම දෙයක් දීමට උන්වහන්සේ පොරොන්දු වී ඇත.

> **"නුඹලා මා තෝරාගත්තා නොව මම නුඹලා තෝරා ගෙන පත් කෙළෙමි. එසේ කළේ නුඹලා ගොස් ඵල දරන පිණිසත් නුඹලාගේ ඵල පවතින පිණිසත් මාගේ නාමයෙන් පියාණන්වහන්සේගෙන් නුඹලා ඉල්ලන කොයි දෙයක් නුමුත් උන්වහන්සේ නුඹලාට දෙන පිණිසත්ය. (යොහන් 15:16)**

## ස්වයං පරීක්ෂණය

1. ප්‍රධාන පදය මතකයෙන් ලියන්න.

2. ලෝක කිතුනුවෙක් යනු කවරෙක්ද?

3. ශුභාරංචිය ලෝකයා වෙත ගෙන යෑමට මුල් සභාවට හැකි වූ උපක්‍රම සාරාංශ කරන්න.

4. මේ පරිච්ඡේදයේ වැදගත්ම පරීක්ෂාව වන්නේ ලෝක කිතුනුවෙකු වීමය. මේ ඔබගේ කැපවීම වේ. පහත දැක්වෙන ලෝක කිතුනුවෙකු වීමේ කැපවීම නැවත බලන්න. ඔබට මෙම පොරොන්දුව අවබෝධ වන්නේ නම් හා එය ඔබට හැකි උපරිම ප්‍රමාණයෙන් ඉටු කිරීමට ඔබ කැපවන්නේ නම් සපයා ඇති ඉඩෙහි අත්සන් කරන්න.

   "දෙවියන්වහන්සේගේ කරුණාවෙන් හා උන්වහන්සේගේ මහිමය සඳහා මම මාගේ මුළු ජීවිතයම මතෙව් 28:18-20හි සඳහන් පැවරීමට, දෙවියන්වහන්සේ මට මඟ පෙන්වන ආකාරයට හා ඕනෑම වෙලාවක, දැනට ශුභාරංචිය නොදත් අයට ප්‍රමුඛත්වය දෙමින් කීකරු වීමට කැප කරමි. (රෝම 15:20-21) එමෙන්ම මෙම දර්ශනය අන් අය සමඟ බෙදා ගැනීමට උත්සාහ කරමි."

   අත්සන ______________________ දිනය ____________________

(පරීක්ෂණ සඳහා පිළිතුරු මෙම අත්පොතේ අවසාන පරිච්ඡේදය අවසානයේ ඇත.)

# තවදුරටත් අධ්‍යයනය සඳහා

1. ඔබගේ ලෝක කිතුනු දැක්ම ගොඩනගා ගැනීම පිණිස සම්පත් ලැයිස්තුවක් ඉල්ලා World Christian, Inc., P. O. Box 40345,Pasdena, California, 91104, U.S.A. යන ලිපිනයට ලියන්න.
2. MARC at World Vision International , 919 W. Huntington Drive, Monrovia, California, 91016 U.S.A g ,shd MARC ප්‍රවෘත්ති හසුනක සාම්පලයක් ඉල්ලන්න. ලෝක කිතුනුවකු ලෙස තවදුරටත් වර්ධනය වීමට ඔවුන් සතුව ඇති ලියවිලි ලැයිස්තුව නැවත බලන්න.
3. ලෝකයේ දුරකථන නාමාවලියන්හි නම් සඳහන් සියලු දෙනාට තමාගේම භාෂාවෙන් බයිබලයක් සැපයීමේ කර්තව්‍යයට සම්බන්ධ වන්න. Bibles for the World, P.O Box 805, Wheton. Illinois, U.S.A අමතන්න.
4. මුදල් දීම සඳහා ධර්ම දූත ව්‍යපෘතියක් සොයාගන්න.
5. පළමු ලෝක කිතුනුවා ආබ්‍රහම් වේ. එය උත්පත්ති පොතේ 11-25 දක්වා වාර්තා කර ඇත . ජාතීන් වෙත යෑමේ පොරොන්දුව දෙවියන්වහන්සේ පළමුවෙන්ම දෙන ලද්දේ ආබ්‍රහම්ට වේ. ඔහු දෙවියන්වහන්සේගේ පරමාර්ථය සාක්ෂාත් කිරීම සඳහා තැනින් තැනට තම ගව ව්‍යාපාරය රැගෙන ගිය ගිහියෙකි. ලෝකයේ ජාතීන් වෙත ඇති ඔහුගේ කැඳවීම සාක්ෂාත් කිරීමට හැකිවූ වැදගත් ආත්මික ගති ලක්ෂණ කිහිපයක් ආබ්‍රහම්ට තිබිණි. ලෝක කිතුනුවන් ලෙස මේවා අපගේ ජිවිතවලට සම්බන්ධ කිරීමට උත්සාහ ගත යුතුය.

ආබ්‍රහම් තම කැඳවීම හැඳින ගත්තේය. ලෝකයේ ජාතීන් වෙත ඇති තමාගේ පුද්ගලික වගකීම ඔහු දැන සිටියේය (උත්පත්ති 22:18). ආත්මික උරුමක්කාරයන් ලෙස අපට ද එම වගකීමම තිබේ (උත්පත්ති 3:10).

- තම පරමාර්ථය වෙනුවෙන් ඔහු සම්පූර්ණයෙන්ම පෙලඹී සිටියේය. රෝම:4:21
- ඔහුට දෙවියන්වහන්සේ වෙනුවෙන් යා හැකි විය. ආබ්‍රහම් ඉතා සරල ජිවිතයක් ගත කළේය. එබැවින් ඔහුට දෙවියන්වහන්සේ වෙනුවෙන් ඕනෑම තැනකට යාමේ නිදහස තිබිණි. දෙවියන්වහන්සේ අණ කළ විගස ඉක්මණින් යෑමට ඔහුට හැකි විය. (උත්පත්ති 12)
- ඔහු ආපසු හැරී බැලුවේ නැත. ඔහුට තමා අත්හැර ආ පැරණි ජිවිතය ගැන කැමැත්තක් තිබුණේ නැත. එහෙත් දෙවියන්වහන්සේ කරන අලුත් දේ ඔහු බලා සිටියේය. (හෙබ්‍රෙව් 11:6)
- ඔහුට ලැබුණාවූ එළිදරව් තුළ ගමන් කළේය. (උත්පත්ති 18:17)
- ඔහු තම ස්වභාවික හැකියාවන් දෙස බැලුවේ නැත. ජාතීන් පිළිබඳ දෙවියන්වහන්සේගේ පොරොන්දුව "මළ කෙනෙකු වැනි එක තැනැත්තෙකුගෙන් පවා" ඉටු විය. (හෙබ්‍රෙව් 11:12)
- ඔහු දෙවියන්වහන්සේ සෙවීය. ආබ්‍රහම් පූජාසනයක් ගොඩනඟා ස්වාමීන්වහන්සේගේ නාමයෙන් හඬ ගැසූ ආකාරය උත්පත්ති 12 හි සඳහන් වේ.
- ආබ්‍රහම් අන් අය වෙනුවෙන් වගකීම භාර ගත්තේය. ආබ්‍රහම් හා ලොත් පිළිබඳ කථාව උත්පත්ති 14න් කියවන්න.
- ඔහු දීමනාවන් දෙන්නෙක් විය. ඔහු සතු සියල්ලෙන් දසයෙන් කොටසක් දුන්නේය. (උත්පත්ති 14:20)
- ඔහු කීකරු කෙනෙක් විය. අවසාන ප්‍රතිඵලය නොදැන සිටියත් ආබ්‍රහම් දෙවියන්වහන්සේගේ අණට කීකරු විය. (හෙබ්‍රෙව් 11:8 උත්පත්ති 22:18)
- ආගන්තුක දේශයක වාසය කිරීමට ඔහු කැමති විය. (හෙබ්‍රෙව් 11:9)
- අන් අයගේ සංස්කෘතීන්ට ගරු කිරීමට ඔහු කැමති විය. ඔහු ඒ රටේ සිරිත ලෙස ජනයා ඉදිරිපිට නැමී ආචාර කළේය. (උත්පත්ති 23:12)
- ඔහුගේ අගයයන් තාවකාලික නොව සදාතනික විය. (ක්‍රියා 7:5)
- ඔහු තනිව නැගී සිටිමට කැමති විය. (යෙසායා 51:2)
- ඔහු ආත්මික දර්ශනයක් තිබූ කෙනෙක් විය. (හෙබ්‍රෙව් 11: 10)
- ඔහු දෙවියන්වහන්සේ සමීපව දැන සිටියේය. ඔහු දෙවියන්වහන්සේගේ මිත්‍රයා යයි කියනු ලැබීය. (ජාකොබ් 2: 23)
- ඔහු බලාපොරොත්තුවේ මිනිසෙක් විය. (රෝම 4:18)

- ඔහු ඇදහිල්ලෙහි බලවත්ව සිටියේය. (රෝම 4:20)
- ඔහු ධර්මිෂ්ඨ කෙනෙකි. (රෝම 4:22)
- ඔහු නිහතමානී කෙනෙකි. (රෝම 4:20)
- ඔහු සාමයේ මනුෂ්‍යයෙකි. (උත්පත්ති 13)
- ආබ්‍රහම් දෙවියන්වහන්සේගේ කැමැත්ත කිරීමට කඩිනම් විය. දෙවියන්වහන්සේගේ කැමැත්ත අසීරු වූ අවස්ථාවලදී ද ආබ්‍රහම් ඊට කඩිනමින් ප්‍රතිචාර දැක්විය. (උත්පත්ති 22)
- ඔහු දෙවියන්වහන්සේ මහිමයට පත් කළේය. (උත්පත්ති 14:21-24)
- ඔහු වැනි කැපවීමේ අය ඔහු ඇති කළේය. ඔහුගේ සේවකයාගේ ජීවිතයෙන් මෙය පෙනේ. (උත්පත්ති 24)
- සෑම අතින්ම ඔහු ආශිර්වාද ලද්දෙක් විය. (උත්පත්ති 24:1)

# නවවන පරිච්ඡේදය

## ජාත්‍යන්තර මැදිහත් යාච්ඤාව

### අරමුණ

මෙම පරිච්ඡේදය අධ්‍යයනයෙන් ඔබට

- ප්‍රධාන පදය මතකයෙන් ලිවීමට
- “ජාත්‍යන්තර මැදිහත්කරුවෙකුවීම” යන්නෙන් අදහස් වන දේ පැහැදිලි කිරීමට
- ජාත්‍යන්තර මැදිහත් යාච්ඤාවේ ප්‍රතිලාභ හඳුනා ගැනීමට
- ලෝකයේ ජාතීන් වෙනුවෙන් සංවිධානාත්මක යාච්ඤා සඳහා සැලැස්මක් අනුගමනය කිරීමට
- ජාත්‍යන්තර මැදිහත්කරුවෙක් වීම
- ජාත්‍යන්තර මැදිහත්වීම් සඳහා පෞද්ගලික යාච්ඤා අත්පොතක් සංවිධානය කිරීමට
- අන් අය ජාත්‍යන්තර මැදිහත්කරුවන් ලෙස පුහුණු කිරීමට හැකිවනු ඇත.

### ප්‍රධාන පදය

**“මාගේ ශුද්ධ කන්දට පමුණුවා මාගේ යාච්ඤා ගෘහයෙහි ඔවුන් ප්‍රීතිවන්ට සලස්වන්නෙමි. ඔවුන්ගේ දවන පූජා සහ යාග මාගේ පූජාසනය පිට පිළිගනු ලබන්නේය. මක්නිසාද මාගේ ගෘහය සියලු ජනයන්ට යාච්ඤා ගෘහයක්යයි කියනු ලබන්නේය.” (යෙසායා 56:7)**

### හැඳින්වීම

ලෝකයා සඳහා දෙවියන්වහන්සේගේ සැලැස්මේ ඔබ ක්‍රියාකාරී සාමාජිකයෙකු වන්නේ කෙසේදැයි යන්න පිළිබඳව පසුගිය පරිච්ඡේදයෙන් යෝජනා කිහිපයක් ඉදිරිපත් කෙරිණි. දෙවියන්වහන්සේගේ සැලැස්මේ කොටස්කරුවෙකු වීමේ එක් ශ්‍රේෂ්ඨ මාර්ගයක් වන්නේ යාච්ඤාව තුළින් ජාතීන් වෙත යෑම වේ. එය කරන ආකාරය මෙම පරිච්ඡේදයෙන් උගන්වනු ලැබේ. ජාත්‍යන්තර මැදිහත්කරුවෙකු වන්නේ කෙසේදැයි ඔබ ඉගෙන ගන්නෙහිය.

### දිව්‍යමය මැදිහත්කරු

මැදිහත්කරුවෙකු අන් අය වෙනුවෙන් ඉල්ලීම් ඉදිරිපත් කරයි. නිදසුනක් ලෙස උසාවියක නීතිඥවරයෙක් මැදිහත්කරුවෙකි. ඔහු වරදක් වෙනුවෙන් චෝදනා ලැබූවෙක් හා විනිශ්චයකරු අතර පෙනී සිටී. ඔහු චෝදනා ලද විත්තිකරු වෙනුවෙන් මැදිහත් වේ.

වරක් දෙවියන්වහන්සේ උන්වහන්සේ හා පව්කාර මනුෂ්‍යයා අතර සිටිමින් මැදිහත්කම් කිරීම සඳහා කෙනෙකු ඇත්දැයි පොළොවෙන් සොයා බැලූ සේක. උන්වහන්සේට මැදිහත්කරුවෙකු හමු නොවීය. එබැවින් ඒ සඳහා උන්වහන්සේ ජේසුස්වහන්සේ එවූ සේක.

> **“උන්වහන්සේද කිසිවෙක් නැති බව දැක, මැදහත්කාරයෙක් නැති බැවින් පුදුම වූ සේක. ඒ නිසා උන්වහන්සේගේ බාහුව තමන්වහන්සේට ගැළවීම ගෙනායේය. උන්වහන්සේගේම ධර්මිෂ්ඨකම උන්වහන්සේව ඉසුලුවේය.” (යෙසායා 59:16)**

ජේසුස්වහන්සේ ජාත්‍යන්තර මැදිහත්කරුවෙකුගේ දිව්‍යමය රටාව වේ. උන්වහන්සේ මිනිසා හා දෙවියන්වහන්සේ අතර සිටින මැදිහත්කරු වේ. කුරුසිය මත තම මරණය තුළින් උන්වහන්සේ පාපය මගින් ඇති කළ හිදැස පිරවූ සේක.

ජේසුස්වහන්සේ තව දුරටත් අප උදෙසා මැදිහත්කාරකම් කරන සේක:

> **"එබැවින් උන්වහන්සේ කරණකොටගෙන දෙවියන්වහන්සේ වෙතට ළඟාවෙන්නන් උදෙසා මැදහත්කම්කරන පිණිස උන්වහන්සේ නිරතුරුම ජීවත් වන හෙයින් ඔවුන් කෙළවර දක්වාම ගළවන්ට උන්වහන්සේට පුළුවන." (හෙබ්‍රෙව් 7:25)**

> **"මැරුණෙත්, ඒ ඇර මළවුන්ගෙන් නැගිටුවනු ලැබුවෙත් දෙවියන්වහන්සේගේ දකුණු පැත්තෙහි සිට අප උදෙසා මැදහත්කම් කරන්නෙත් ක්‍රිස්තුස්වහන්සේය." (රෝම 8:34)**

ජේසුස්වහන්සේ මිනිසා හා දෙවියන්වහන්සේ අතර මැදිහත්කම් කරන සේක. ශුද්ධාත්මයාණන්වහන්සේද මැදිහත්කම් කරන සේක.

> **"එලෙසම ආත්මාණන්වහන්සෙත් අපගේ දුර්වලකම්වලදී උපකාර කරන සේක. මක්නිසාද යුතු ලෙස යාච්ඤා කරන්ට අපි නොදනිමුව. නුමුත් ආත්මයාණන්වහන්සේම කිය නොහැකි කෙඳරිගෑම්වලින් අප උදෙසා මැදහත්කම් කරන සේක. ඒ ආත්මයාණන්වහන්සේ දෙවියන්වහන්සේගේ කැමැත්ත ලෙස ශුද්ධවන්තයන් උදෙසා මැදිහත්කම් කරන බැවින් සිත් විමසන තැනැන්වහන්සේ උන්වහන්සේගේ අදහස කුමක්දැයි දන්නා සේක."**
> **(රෝම 8:26-27)**

## ජාත්‍යන්තර මැදහත්වීම්

ජාතීන් වෙනුවෙන් මැදහත්කම් කිරීමේ කාර්යය දෙවියන්වහන්සේ ඇදහිලිවතුන්ට භාර දී ඇත. අපි යාච්ඤා කිරීමෙන් ජාතීන් වෙනුවෙන් මැදහත්කම් කරන්නෙමු. අප මැදිහත්වන විට අපි අන් අය වෙනුවෙන් දෙවියන්වහන්සේ සොයන්නෙමු. ලෝකයේ ජාතීන් වෙනුවෙන් අපි උන්වහන්සේට ඉල්ලීම් ඉදිරිපත් කරන්නෙමු.

ජාත්‍යන්තර යන වචනයෙහි තේරුම ජාතීන් අතර යන්න වේ. ඔබ ජාත්‍යන්තර මැදහත්කරුවෙකු ලෙස ඔබගේ පෞද්ගලික අවශ්‍යතාවන්ටත් ඔබගේ පවුලේ අය හා මිතුරන් වෙනුවෙනුත් කරන යාච්ඤාවන්ටත් වඩා වැඩියෙන් යාච්ඤා කරන්නෙහිය. යාච්ඤාවෙන් ඔබ ලෝකයේ ජාතීන් අතර හා ජාතීන් සමඟ ආත්මිකව හැසිරෙන්නෙහිය.

## ජාත්‍යන්තර මැදිහත්වීමේ ප්‍රතිලාභ

ලෝකයේ ජාතීන් වෙතට යෑමේ ඉතාමත් වැදගත් උපක්‍රමය වන්නේ ජාත්‍යන්තර මැදහත් වීම් වේ. එවැනි දේව සේවයක ප්‍රධාන ප්‍රතිලාභ තුනක් ඇත. :

### මැදහත් වීම ශුද්ධ ලියවිල්ලට අදාළ වේ.

සම්පූර්ණ ජාතියක ගමන් මග මැදහත්වීමේ ප්‍රතිඵලයක් වශයෙන් වෙනස් වූ ආකාරය පිළිබඳ බොහෝ නිදසුන් පැරණි ගිවිසුමේ අන්තර්ගත වේ. මේ සඳහා කදිම නිදසුනක් වන්නේ නෙහෙමියා පොතේ සඳහන් නෙහෙමියාගේ මැදහත් වීමය. මේ ක්‍රියාකාරකම බොහෝ ශුද්ධ ලියවිලි නිර්දේශවලින් දැකගත හැකිය.

> **"ඉතින් අප විසින් සියලු ආකාර භක්තියෙන් සහ සන්සුන්කමින් සමාදාන වූ නිශ්චල ජීවිතයක් ගත කරන පිණිස රජවරුන් හා උසස් තනතුරු දරන සියල්ලන් ඇතුළුව සියලු මනුෂ්‍යයන් උදෙසා ඉල්ලීම්ද යාච්ඤාද මැදහත්කම්ද ස්තුතිදීම්ද පවත්වන්ට සියල්ලට පළමුවෙන් අවවාද කරමි."**
> **(1 තිමෝති 2: 1-2)**

> **"එවිට උන්වහන්සේ තමන් ගෝලයන්ට කතාකොට: ගොයම නම් බොහෝය, නුමුත් ගොවියෝ ස්වල්ප දෙනෙක්ය. එබැවින් තමන් ගොයම් කැපීමට ගොවියන් එවන ලෙස ගොයමේ ස්වාමියාට යාච්ඤා කරන්නැයි කී සේක." (මතෙව් 9:37-38)**

**"මාගේ ශුද්ධ කන්දට පමුණුවා මාගේ යාච්ඤා ගෘහයෙහි ඔවුන් ප්‍රීතිවන්ට සලස්වන්නෙමි. ඔවුන්ගේ දවන පූජා සහ යාග මාගේ පූජාසනය පිට පිළිගනු ලබන්නේය. මක්නිසාද මාගේ ගෘහය සියලු ජනයන්ට යාච්ඤා ගෘහයක්යයි කියනු ලබන්නේය." (යෙසායා 56:7)**

## යාච්ඤාව යනු අනෙක් සියලු දෙනා යැපෙන ක්‍රියාකාරකමකි.

මනුෂ්‍ය වර්ගයා දන්නා ආත්මික බලයේ ප්‍රබලතම ප්‍රභවය වන්නේ යාච්ඤාව වේ. යාච්ඤාව නිසා පිබිදීමක් ඇතිවේ. පිබිදීමෙන් ඉවැන්ජලිස්ත සේවයට උදෙහ්ගයක් ඇතිවේ. ඉවැන්ජලිස්ත සේවය නිසා දේව රාජ්‍යයේ ශුභාරංචිය පැතිරේ. ඉවැන්ජලිස්ත සේවය සඳහා සැලසුම් හා වැඩසටහන් ඉතා වැදගත්ය. එය දේව සේවයේ ස්ථිර අත්තිවාරම වන අතර ක්‍රියාත්මක කිරීමේ පදනමද වේ.

## ජාත්‍යන්තර මැදිහත්වීම සඳහා සීමාවන් නැත.

යාච්ඤාවට යා නොහැකි සංවෘත රටවල් හෝ සුරක්ෂිත දේශ සීමා හෝ නොමැත. යාච්ඤාවට ලෝකයේ අන්තයන්ටම යා හැකිය. ඔබ ඔබේ නිවසින් පිටව යා නොයනු ඇත. එහෙත් යාච්ඤාව තුළින් ඔබට ආත්මිකව ලෝකය පුරාම අවශ්‍යතාවන් ඇති ඕනෑම කෙනෙකු වෙත යෑමට හැකිවේ. යාච්ඤාව ඔබට සීමාවන් රහිත සේවයන්ට ඉඩ සලසයි. දුර, සමාජ තත්ත්වය හා භාෂාව ආදිය යාච්ඤාවට කිසිදු බාධකයක් නොවේ.

සෑම ඇදහිලිවන්තයෙකුටම තිබෙන එකම "ලෝකය සඳහා සේවය" යාච්ඤාව වේ. එය මොහොතකින් හෝ ප්‍රමාද නොවී ලෝක ධර්මදූත සේවයට සහභාගි වීමට අපට මඟ සලසයි. මෙම දේව සේවය සඳහා ඔබ කිසිදා මහලු වැඩි හෝ තරුණ වැඩි හෝ නැත. ඔබ ආබාධිතයෙක් හෝ රෝගියෙක් හෝ නොවේ. එය සීමාවන් කිසිවක් නැතිව දෙවියන්වහන්සේගේ ගෝලීය කටයුතුවල ක්‍රියාකාරීව සහභාගිවන්නකි.

## යාච්ඤා සැලසුමක්

පහත දැක්වෙන යාච්ඤා සැලැස්ම පෞද්ගලික හෝ කණ්ඩායම් හෝ ජාත්‍යන්තර මැදිහත්වීම සඳහා භාවිත කළ හැකිය. එය ඔබගේ යාච්ඤාවන් සඳහා සුවිශේෂී අවධානයක් යොමු කරයි. මේ සැලැස්ම පැයක යාච්ඤා සැසියක් සඳහාය.. මෙය ඔබගේ යාච්ඤාවන් කෙරෙහි අවධානය යොමු කරවීමට මඟ පෙන්වීමක් පමණක් වේ. දෙවියන්වහන්සේ තව ඔබට දීර්ඝ ලෙස යාච්ඤා කිරීමට මග පෙන්වන්නේ නම් මෙහි යෝජනා කර ඇති කාලයට යාච්ඤාව සීමා නොකරන්න. ජේසුස්වහන්සේ උගන්වා ඇති පරිදි උන්වහන්සේගේ නාමයෙන් යාච්ඤා කිරීමට මතක තබා ගන්න. මෙය උන්වහන්සේගේ අවශ්‍යතා හා හැඟීම්වලට සම්බන්ධය.

## ආරම්භ කිරීමට පෙර සුවිශේෂී යාච්ඤා අවශ්‍යතා හඳුනාගන්න.

ඔබ යාච්ඤා කළ යුතු සුවිශේෂී අවශ්‍යතා හඳුනාගන්න. ඒවා දෙවියන්වහන්සේගේ ලෝක ව්‍යාප්ත පරමාර්ථවලට සම්බන්ධ බවට සහතික වන්න. ජාත්‍යන්තර මැදිහත් යාච්ඤාව යනු විවිධ ඉල්ලීම් සඳහා වන පොදු යාච්ඤා කාලයක් නොවේ. එය ලෝකයේ ජාතීන් වෙත අවධානය යොමු කෙරෙන මැදිහත් යාච්ඤාවකි.

### දෙවියන්වහන්සේට ප්‍රශංසා කිරීම (මිනිත්තු 10)

අප දෙවියන්වහන්සේගේ අභිමුවට පැමිණෙන්නේ ස්තුති දීමෙන් හා ප්‍රශංසා කිරීමෙනි.

**"ස්තුති කරමින් උන්වහන්සේගේ දොරටුවලින් ඇතුල්ව ප්‍රශංසා කරමින් උන්වහන්සේගේ මණ්ඩපවලට පැමිණෙව්. උන්වහන්සේට ස්තුති කරමින් උන්වහන්සේගේ නාමයට ප්‍රශංසා කරව්." (ගීතාවලිය 100:4)**

ප්‍රශංසාවන් ඔබ දෙවියන්වහන්සේ අභිමුවට ගෙන එන්න. එවිට ඔබේ ඉල්ලීම්වලට උන්වහන්සේට සවන් දීමට හැකි වන සේක. උන්වහන්සේ දෙවියන්වහන්සේ නිසා හා උන්වහන්සේ කර ඇති දේ සඳහා ප්‍රශංසා කරන්න. ඔබගේ ප්‍රශංසාවන්හිදී ලෝකයා සඳහා වන උන්වහන්සේගේ ශ්‍රේෂ්ඨ සැලැස්ම සඳහා ද ඔබ එහි කොටස්කරුවෙකු නිසා ද තුති පුදන්න. ගීතිකාකාර දාවිත් පවසන්නේ උන්වහන්සේ අභිමුවට ගී ගයමින් පැමිණෙන්න යනුවෙනි. දෙවියන්වහන්සේට ඔබගේ ප්‍රශංසාවන් ගැයීමට ඔබට අවශ්‍ය විය හැකිය. ඇතැම්විට ජාතීන් සඳහා ඇති උන්වහන්සේගේ පරමාර්ථයට අදාළ ගීතිකා ඔබට ගැයීමට පුළුවන.

## ලෝකය සඳහා පොදු මැදිහත් යාච්ඤාව (මිනිත්තු 10)

යාච්ඤා කිරීම සඳහා සුවිශේෂී කරුණු කිහිපයක් පහත දැක්වේ. :

- ලොව මුළුල්ලේම අලුත් ආත්මික පිපාසාවක් සඳහා
- ජාත්‍යන්තර මැදිහත්කාර යාච්ඤාවේ ලෝක ව්‍යාප්ත බලයක් ඇති කිරීම සඳහා
- ලොව සෑම තැනකම ඇති සභාවේ වැඩි වර්ධනය සඳහා
- ශ්‍රේෂ්ඨ පැවරුම (මතෙව් 9:38 ලූක් 10:2) සාක්ෂාත් කිරීම පිණිස අස්වැන්න කැපීම සඳහා ගොවියන් - පාලකවරුන්, දිවැසිවරුන්, ධර්මදූතයන්, ප්‍රේරිතයන්, ගුරුවරුන් හා ගිහි නායකයන් නැගිටුවන ලෙස
- දැන් පවතින සභාවන් හා මිෂන් සේවාවන් අතර එකමුතුකම හා සහයෝගය සඳහා
- නැතිවූවන් දිනාගැනීමට පිබිදීමක් හා උද්‍යෝගයක් වෙනුවෙන්
- ශුභාරංචිය පැතිරීම සඳහා ඇදහිලිවතුන් ද්‍රව්‍යමය සම්පත් ප්‍රඥාවන්තව භාවිත කිරීම සඳහා අවශ්‍ය මුදල් සපයන ලෙස හා ඉවැන්ජලිස්ත වැඩ සඳහා මූල්‍යමය ආධාර සැපයීමට කැමති හා සැපයිය හැකි අය ලබා දෙන ලෙස
- ශුභාරංචිය බෙදා ගැනීම පිණිස “කතා කරන දොරවල්” විවෘත කරන ලෙස (එපීස 6:19)
- ශුභාරංචිය සඳහා “සංවෘත රටවල්” විවෘත කරන ලෙස (2 තෙසලෝනික 3:1)
- ශුභාරංචියට සවන් දෙන අයගේ ඉක්මන් වැටහීම උදෙසා (රෝම 15:30-31)
- ශුභාරංචිය පැතිරීමට බලපාන ප්‍රධාන ලෝක කරුණු සඳහා
- රාජ්‍ය හා දේශපාලන නායකයන් වෙනුවෙන් දූතනයට හා ඉවැන්ජලිස්ත වැඩ සඳහා ඔවුන්ගේ සිත් ඉඩ දීම පිණිස
- අලුත් සභාවන් හා මිෂන් සභාවන් පිහිටුවන අය සඳහා
- ක්‍රිස්තුස්වහන්සේට ඇති කැපවීම නිසා හෝ දේව සේවාවන් නිසා හෝ සිරගත වී සිටින හා දුක් පීඩා විඳින ඇදහිලිවතුන් උදෙසා
- ලෝකය මුළුල්ලේම සිටින බයිබල් පරිවර්තකයන් උදෙසා
- ලෝකය මුළුල්ලේම ඇති බයිබල් පාඨමාලා, පුහුණු මධ්‍යස්ථාන, හා බයිබල් විද්‍යාල උදෙසා
- ජාතික කිතුනු සේවකයන් උදෙසා
- විවිධ සංස්කෘතියන් හරහා ඇති මිෂනාරි බලවේගවලට
- තරුණයන් අතර දෙවියන්වහන්සේගේ ක්‍රියාකාරීත්වය උදෙසා, ඔවුහු සභාවේ අනාගත නායකයෝ වෙති.
- ලෝකයේ සෑම රටකටම හා ගමකටම යාම සඳහා නිවැරදි උපක්‍රම එළිදරව් කිරීම පිණිස. ඒ පෙදෙස්වල සේවය කරන අයට මෙය එළිදරව් කරන ලෙස දෙවියන්වහන්සේගෙන් ඉල්ලන්න. දේව සේවා පර්යේෂණ හා උපක්‍රමවල යෙදී සිටින සංවිධාන උදෙසා.
- සාතන්ගේ ප්‍රහාරවලින් සේවකයන් ආරක්ෂා කරන ලෙෂ ද ඇදහිලිවතුන්ට හා ජාතීන්ට එරෙහිව පැමිණෙන සාතන්ගේ ක්‍රියාකාරකම් බැඳ තැබීම පිණිස ද ශුභාරංචියට විරුද්ධ වන අයගෙන් මුදාගන්නා ලෙස (රෝම 15:30-31, 2 තෙසලෝනික 3:2)
- ඇදහිලිවතුන් අතර බයිබලීය ලෝක දැක්ම පැතිරීම උදෙසා ද ඔවුන් දෙවියන්වහන්සේගේ සැලැස්මේ ප්‍රේක්ෂකයන් නොව සහභාගිකයන් වනු පිණිස.
- ශුභාරංචිය පැතිරීම පිණිස විවිධ රටවල ලෞකික රැකියාවල යෙදෙන අයට
- ලෝකයේ විවිධ ප්‍රදේශවල රඳවා සිටින ත්‍රිවිධ හමුදාවන්හි ඇදහිලිවතුන් උදෙසා, ශුභාරංචිය පැතිරීමේ ඵලදායී අය වීමට ඔවුන්ට පුළුවන.

- ශුභාරංචිය පටිගත කිරීම්, චිත්‍රපටි, කැසට්පට, කිතුනු ගුවන් විදුලි හා රූපවාහිනී වැඩසටහන් වැනි ආගමික මාධ්‍යවල කටයුතු සඳහා
- වෛද්‍ය හා සමාජ සේවාවන් උදෙසා, සහනදායි හා උපකාරක සේවාවන් මීට ඇතුළත් වේ. මේවා ශුභාරංචිය පැතිරීම හා සම්බන්ධ වන වෛද්‍ය හා භෞතික සහාය ආයතන වේ.
- මිෂනාරිවරුන් හා සැපයුම්, ලෝකයේ විවිධ ප්‍රදේශවලට ගෙන යන්න කැපවූ ගුවන් නියමුවන්ට, මිෂනාරි ගුවන් සංවිධානවලට
- සංක්‍රමිකයන් හා සරණාගතයන් අතර කෙරෙන වැඩ කටයුතු සඳහා
- ජාතීන් හා ප්‍රදේශයන් කෙරෙහි බලපෑම් කරන සාතන්ගේ ආත්මික බලය බැඳ තැබීම පිණිස. එවැනි බලයන් පවතින බව දානියෙල්ගේ කාලයේ පර්සියාව කෙරෙහි බලය පැතුරූ රාජ කුමාරයාගෙන් පැහැදිලි වේ. ඇතැම් ජාතීන් ශුභාරංචිය වඩාත් පහසුවෙන් ග්‍රහණය කිරීමට හේතුව මෙම බලවලින් පැහැදිලි කෙරේ. විවිධ පෙදෙස්වල ඇතැම් ආත්ම ක්‍රියාකාරීය. මෙම පෙදෙස්වලට ඇදහිලිවතුන් මැදිහත් වන තෙක් ඒවා ශුභාරංචිය ග්‍රහණය නොකරයි.

## ලෝකයේ එක් පෙදෙසක් උදෙසා මැදිහත් යාච්ඤාව. (මිනිත්තු 10)

ඔබගේ යාච්ඤාව සුවිශේෂි මහාද්වීපයක් හෝ රටක් වෙනුවෙන් යොමු කරන්න. ඔබට වඩාත් සුවිශේෂිව යාච්ඤා කිරීමට උපකාරී වන විවිධ ප්‍රදේශ, ආයතන හා සෙනඟ කණ්ඩායම් පිළිබඳව සුවිශේෂි තොරතුරු සැපයීමට බොහෝ ආයතන ඇත. මෙම පරිච්ඡේදයේ "තව දුරටත් අධ්‍යයනය සඳහා" කොටස බලන්න.

සෑම ජාතියක් වෙනුවෙන්ම යාච්ඤා කළ යුතු සුවිශේෂි කරුණු සමහරක් මෙසේය:

- වර්තමාන සිද්ධීන් - ජාතියේ වර්තමාන සිද්ධීන් පිළිබඳ ප්‍රවෘත්ති මඟින් හෝ කිතුනු සේවකයන් සමඟ සබඳතා පැවැත්වීමෙන් හෝ සුවිශේෂි යාච්ඤා අවශ්‍යතාවන් දැන ගත හැකිය.
- ජාතියේ සභා වෙනුවෙන්
- මෙම රටේ ආත්මික අස්වැන්න සහිත කෙත්වතුවල වැඩ කරන අය වෙනුවෙන්. මේ අය අතර සභාරෝපකයන්, ජාතික සේවකයන්, පුහුණු ආයතන, ධර්ම දූතයන්, බයිබල් පරිවර්තකයන් ආදිය සිටිය හැකිය.
- මේ රටේ සිටින සියලුම ඇදහිලිවතුන්
- මේ රටේ සිටින ශුභාරංචිය නොලද අය
- මේ රටේ ක්‍රියා කරන සාතන්ගේ බලය බැඳීම. ශුභාරංචිය පැතිරීමට එරෙහි වන අය හෝ ඉවැන්ජලිස්ත ප්‍රයත්නයන්ට දොර වසන අය හෝ වෙත ඇති බලය
- මූලික වශයෙන් සෑම සමාජයකම පුද්ගයන්ගේ චින්තනය මෙන්ම ජාතියේ ඉරණම ද හැඩගස්වන ක්ෂේත්‍ර හතක් ඇත. මේවා නම් : නිවස හා පවුල, සභාව, අධ්‍යාපනය, කලාවන් හා විනෝදය, මාධ්‍යය, රජය හා ව්‍යාපාර වේ. මේ දේවල නායකයන් හා ආත්මික තත්ත්වය ගැන මැදිහත් වන්න.

## සුවිශේෂි මිෂනාරිවරයෙකුට හෝ ආයතනයක් හෝ වෙනුවෙන් මැදහත්කාර යාච්ඤාව. (මිනිත්තු 10)

මිෂනාරිවරයා හෝ මිෂනාරි ආයතනය සමඟ සමීප සබඳතා පැවැත්වීමෙන් යාච්ඤා කළ යුත්තේ කවර සුවිශේෂි අවශ්‍යතාවන්ටදැයි ඔබට දැනගත හැකිය. ඔවුන්ගේ ප්‍රවෘත්ති හසුන හෝ යාච්ඤා නිවේදන හෝ ලබාගැනීම සඳහා ඔබගේ ලිපිනය ඔවුන්ට දෙන්න.

## ශුභාරංචිය නොගිය එක් සෙනඟ කණ්ඩායමක් සඳහා යාච්ඤා කරන්න. (මිනිත්තු 10)

ශුභාරංචිය නොලද ප්‍රධාන සෙනඟ කණ්ඩායම් පහ වන්නේ බෞද්ධයන්, හින්දූන්, ගෝත්‍රිකයන්, මුස්ලිම්වරුන් හා චීන අයය.

- මෙම කණ්ඩායම් අතර ආත්මික පිපාසාව සඳහා යාච්ඤා කරන්න.

- මෙම සෙනඟ සමඟ ශුභාරංචිය බෙදා ගැනීමට සඳහා අවශ්‍ය වන්නාවූ සේවකයන් වෙනුවෙන් යාච්ඤා කරන්න.
- සෑම පෞද්ගලික කණ්ඩායමක් වෙතම ළඟා වීම සඳහා නිවැරදි උපක්‍රමයක් එළිදරව් කරන මෙන් යාච්ඤා කරන්න.
- දැනටමත් මෙම කණ්ඩායම වෙත ළඟාවීමට උත්සාහ කරන අය සඳහා යාච්ඤා කරන්න.

## පෞද්ගලික අවශ්‍යතාවන් සඳහා යාච්ඤාවන් (මිනිත්තු 10)

ලෝකය හා සම්බන්ධ ඔබගේ පෞද්ගලික අවශ්‍යතාවන් ගැන සලකා බලන්න. ඔබගේ පෞද්ගලික අවශ්‍යතාවන්, දෙවියන්වහන්සේගේ ගෝලීය පරමාර්ථයට හා එහි ඔබගේ කොටසට සම්බන්ධ වන්නේ කෙසේද? ඔබගේ අති පෞද්ගලික චින්තාවන් වුවද කෙසේ හෝ ජාතීන් සඳහා වන දෙවියන්වහන්සේගේ සැලැස්මට සම්බන්ධ විය යුතුය.

දේවරාජ්‍යයේ ශුභාරංචිය සමඟ ලෝකයේ ජාතීන් වෙත යෑමේ ශ්‍රේෂ්ඨ පැවරීම සාක්ෂාත් කිරීම සඳහා ඔබගේ කොටස ඉටු කිරීමට හැකි ක්‍රම පිළිබඳව දෙවියන්වහන්සේගේ සහාය පතන්න. මෙය කිරීමට ඔබ සූදානම් වන්නේ කෙසේද? දැන්මම මෙය ඔබ ආරම්භ කරන්නේ කෙසේද? ලෝක ධර්මදූත සේවය වෙනුවෙන් ඔබගේ පෞද්ගලික කාලය හා මුදල් වඩාත් නිදහස් කර ගන්නේ කෙසේද?

## යාච්ඤා පැය

ජාත්‍යන්තර මැදහත් වීමේ යාච්ඤා පැය බෙදා ඇති ක්‍රමයේ සාරාංශය පහත දැක්වේ.

1. දෙවියන්වහන්සේට ප්‍රශංසා කිරීම (මිනිත්තු 10)
2. පොදුවේ ලෝකයා සඳහා මැදහත් යාච්ඤාව (මිනිත්තු 10)
3. ලෝකයේ එක් පෙදෙසක් වෙනුවෙන් මැදහත් යාච්ඤාව (මිනිත්තු 10)
4. සුවිශේෂී මිෂනාරිවරයෙකු හෝ මිෂනාරි ආයතනයක් සඳහා මැදහත් යාච්ඤාව (මිනිත්තු 10)
5. ශුභාරංචිය නොගිය එක් සෙනඟ කණ්ඩායමක් වෙනුවෙන් යාච්ඤා කිරීම (මිනිත්තු 10)
6. සුවිශේෂී පෞද්ගලික යාච්ඤා අවශ්‍යතා (මිනිත්තු 10)

## යාච්ඤා අත්පොතක් සම්පාදනය කරන්න.

ජාත්‍යන්තර මැදිහත් යාච්ඤාවල දී පෞද්ගලික යාච්ඤා අත්පොතක් ඔබට උපකාරී වනු ඇත. එවැනි අත්පොතක් සම්පාදනය සඳහා උපදෙස් සමහරක් මෙසේ වේ :

### පළමු කොටස - යාච්ඤා සැලැස්ම

ජාත්‍යන්තර මැදිහත්වීමේ පැය සඳහා මෙම පරිච්ඡේදයේ දී ඇති "යාච්ඤා සැලැස්ම" ඉවත් කරන්න. එය ඔබගේ යාච්ඤා කාලයට මඟ පෙන්වීමක් ලබා දීමට ඔබගේ යාච්ඤා අත්පොතට ඇතුළු කරන්න.

### දෙවන කොටස - පොදු ලෝකය

මෙම පරිච්ඡේදයේ දී ඇති පොදු ලෝකය සඳහා යාච්ඤා අවශ්‍යතා සඳහා යෝජනාවන් ගෙන එය ඔබේ යාච්ඤා අත්පොතේ මෙම කොටසට ඇතුළු කරන්න. මෙම ලැයිස්තුවට ලෝකය සඳහා දෙවියන්වහන්සේ ඔබගේ සිතට ගෙන එන යාච්ඤා අවශ්‍යතා ද එක් කළ හැකිය.

ලෝක සිතියමක් සොයා ගෙන ඔබගේ යාච්ඤා අත්පොතේ දෙවැනි කොටසට ඇතුළු කරන්න. ඔබ ලෝකය වෙනුවෙන් යාච්ඤා කරන විට මෙම සිතියම මත අත් තබන්න.

## තෙවන කොටස - සුවිශේෂී අංශ

ලෝකයේ විවිධ ජාතීන් හා පෙදෙස් පිළිබඳව තොරතුරු හා සිතියම් එක්කර ඔබේ යාච්ඤා අත්පොතේ මෙම කොටසට ඇතුළු කරන්න. යම් ජාතියක ශුභාරංචි කටයුතු සඳහා බලපාන වර්තමාන සිද්ධීන් ඇතුළත් පුවත්පත් වාර්තා මෙම කොටසට ඇතුළු කරන්න. මෙම කරුණු පිළිබඳව යාච්ඤා කරන්න.

ඔබගේම රට හා ඔබගේම නගරය හෝ ගම හෝ වෙනුවෙන් යාච්ඤා කිරීමට අමතක නොකරන්න. ඔබගේ රටේ සිතියමක් සොයාගෙන එය මෙම කොටසට ඇතුළු කරන්න. ඔබගේ නගරය පිළිබඳ සිතියමක් ලබා ගන්න. නැතහොත් ඔබගේ ගමේ සිතියමක් අඳින්න. එය ද මෙම කොටසට ඇතුළු කරන්න.

ඔබගේ නගරයේ දුරකථන සේවාවක් තිබේනම් දුරකථන නාමාවලියේ පිටපතක් ලබාගෙන සෑම කෙනෙක් වෙනුවෙන්ම යාච්ඤා කිරීම අරඹන්න. ඔබ රටේ හා නගරයේ රජයේ සේවකයන්ගේ නම් ලැයිස්තුවක් ද ලබාගෙන ඔවුන් වෙනුවෙන් ද යාච්ඤා කරන්න.

## සිවුවන කොටස - සුවිශේෂී මිෂනාරිවරුන් හා ආයතන

මෙම කොටසේ සුවිශේෂී මිෂනාරිවරුන්ගේ නම් ලැයිස්තුවක් සකසන්න. ඔබ ඔවුන් වෙනුවෙන් යාච්ඤා කරන්න. ඔවුන්ගේ ප්‍රවෘත්ති හසුන් ලබාගෙන ඒවා මෙම කොටසට ඇතුළු කරන්න. ඔවුන්ගේ සුවිශේෂී යාච්ඤා අවශ්‍යතා සඳහා යාච්ඤා කරන්න.

ඔබගේ සභාවේ මිෂනාරිවරු සිටිත්නම් ඔවුන්ගේ නම් හා ලිපිනයන් ලබා ගෙන ඔවුන් වෙනුවෙන් යාච්ඤා කිරීමටත් ඔවුන් බොහෝ දෙනෙකු සමඟ ලිපි ගනුදෙනු කිරීමටත් පටන් ගන්න. සුවිශේෂී මිෂනාරි ආයතන පිළිබඳ තොරතුරු ලබාගෙන ඒවා මෙම කොටසට ඇතුළු කරන්න. ඔබ පෙදෙසේ සභාවලත් කිතුනු පුහුණු සංවිධානවලත් මිෂනාරි ආයතනවලත් ලැයිස්තුවක් ලබා ගන්න. ඔවුන් වෙනුවෙන් විශේෂයෙන් යාච්ඤා කරන්න.

## පස්වන කොටස - ශුභාරංචිය නොලද සෙනඟ කණ්ඩායම්

මෙම කොටසේ ශුභාරංචිය නොලද ප්‍රධාන කණ්ඩායම් පහේ නම් ලියන්න. ඒවා නම් : බෞද්ධයන්, මුස්ලිම්වරුන්, හින්දුවරුන්, චීන ජාතිකයන් හා ගෝත්‍රික සෙනඟ වේ. මේ කණ්ඩායම් පිළිබඳ තොරතුරු රැස් කරන්න. ඒවා ඔබගේ යාච්ඤා අත්පොතේ මෙම කොටසට ඇතුළු කරන්න.

## හයවන කොටස - පෞද්ගලික යාච්ඤා අවශ්‍යතා

කඩදාසියක පහත දැක්වෙන තීරු මාතෘකා ලියන්න. ඔබගේ පෞද්ගලික යාච්ඤා අවශ්‍යතා එහි වාර්තා කරන්න.

| දිනය | පෞද්ගලික අවශ්‍යතාව | පිළිතුරු ලද දිනය |
|---|---|---|

ලිඛිත වාර්තාවක් තබා ගැනීමෙන් ඔබගේ යාච්ඤා සුවිශේෂීව ඉලක්ක කිරීමට ඔබට උපකාරී වන අතර ඒවාට දෙවියන්වහන්සේ පිළිතුරු දුන් අවස්ථා ද දැනගත හැකිය.

## ජාත්‍යන්තර මැදිහත්කරුවන් වීම සඳහා අන් අය පුහුණු කරන්න.

ජාත්‍යන්තර මැදිහත්කරුවන් වීම සඳහා ඔබට අන් අය පුහුණු කළ හැකිය. ඒ සඳහා සැලැස්මක් පහත දැක්වේ.

### 1. බයිබලීය ලෝක දැක්ම ප්‍රකාශ කරන්න.

පළමුව බයිබලීය ලෝක දැක්ම සන්නිවේදනය කරන්න. යම් පුද්ගලයෙකු ලෝකයා සඳහා වූ දෙවියන්වහන්සේගේ සැලැස්මේ දැක්ම හා තමාට එහි ඇති කොටස දැනගන්න තුරු ඵලදායී

ජාත්‍යන්තර මැදිහත්කරුවකු නොවනු ඇත. බයිබලිය ලෝක දැක්ම අන් අයට සන්නිවේදනය කරන ආකාරය පිළිබඳ මාර්ග නිර්දේශ 10 වන පරිච්ඡේදය සපයයි.

**2. ජාත්‍යන්තර මැදිහත් කිරීම ගැන අන් අය පුහුණු කිරීමට මෙම පරිච්ඡේදය යොදා ගන්න.**

පළමුව ඔවුන් සමඟ මෙම පරිච්ඡේදය අධ්‍යයනය කරන්න. දෙවනුව ඔබ පරිච්ඡේදයේ දී ඇති යාච්ඤා සැලැස්ම අනුව යාච්ඤා කිරීම ආරම්භ කරන්න. තෙවනුව මෙම පරිච්ඡේදයේ දී ඇති ආකාරයට යාච්ඤා අත්පොතක් සංවිධානය කිරීමට ඔවුන්ට උපකාර කරන්න.

**3. ජාත්‍යන්තර මැදිහත් කිරීම සඳහා යාච්ඤා කණ්ඩායමක් සාදා ගන්න.**

ජාත්‍යන්තර මැදිහත්වීම් සඳහා අඛණ්ඩ කැපවීම කණ්ඩායම් මගින් සහතික කෙරේ. ඔබගේ රැස්වීම සඳහා සුවිශේෂී වේලාවක් දවසක් හා තැනක් පිළියෙල කර ගන්න. ඔබගේ නිවසේ හෝ දේවස්ථානයේ මෙම කණ්ඩායමට රැස්වීමට පුළුවන. ඔබගේ යාච්ඤා කාලය ගැන අවධානය යොමු කිරීමට මෙම පරිච්ඡේදයේ දී ඇති යාච්ඤා සැලැස්ම හා ඔබ සකස් කළ යාච්ඤා අත්පොත භාවිත කරන්න. මෙම පරිච්ඡේදයේ 'තවදුරටත් අධ්‍යයනය' සඳහා කොටසේ දී ඇති අතිරේක යාච්ඤා උපකාරක සමහරක් ලබාගන්න. මේවා ඔබටත් ජාත්‍යන්තර මැදිහත් වීම් ගැන ඔබ පුහුණු කරන අයටත් උපකාරී වනු ඇත.

## ස්වයං පරීක්ෂණය

1. ප්‍රධාන පදය මතකයෙන් ලියන්න.

2. "ජාත්‍යන්තර මැදිහත්කරුවෙකු වීම" යන්නෙන් අදහස් වන්නේ කුමක්ද?

3. "ජාත්‍යන්තර මැදිහත්කරුවෙකු" වීමට ඔබ අන් අය පුහුණු කරන්නේ කෙසේද?

4. "ජාත්‍යන්තර මැදිහත්කරුවෙකු වීම" සඳහා ඔබ කැපවී සිටින්නෙහිද?

5. ඔබ ඔබගේ පෞද්ගලික මැදිහත් වීමේ යාච්ඤා අත්පොත පිළියෙල කළෙහිද?

6. මෙම පරිච්ඡේදයේ සාකච්ඡා කෙරුණු ජාත්‍යන්තර මැදිහත් වීමේ ධනාත්මක ප්‍රතිලාභ තුන මොනවාද?

7. ජාත්‍යන්තර මැදිහත් වීම කෙරෙහි අවධානය යොමු කරමින් සංවිධානාත්මක යාච්ඤා සැසියක් සඳහා මෙම පරිච්ඡේදයේ දී ඇති සැලැස්ම සාකච්ඡා කරන්න.

(පරීක්ෂණ සඳහා පිළිතුරු මෙම අත්පොතේ අවසාන පරිච්ඡේදය අවසානයේ ඇත.)

## තවදුරටත් අධ්‍යයනය සඳහා

ඔබගේ ජාත්‍යන්තර මැදිහත් වීමේ යාච්ඤා වලට සහාය වීම සඳහා පහත දැක්වෙන පත පොත විවිධ ලෝක කිතුනු ප්‍රවණතාවක් ඇති ආයතනවලින් ලබා ගත හැකිය.

1. Operation World: මෙම පොත ලෝකයේ සෑම ජාතියක් පිළිබඳවම තොරතුරු සපයන අතර සුවිශේෂී යාච්ඤා අවශ්‍යතා ලැයිස්තු ගත කර ඇත. එය STL Books, Box 28, Waynesboro, Georgia, 30830, U. S. A. වෙතින් ලබාගන්න.

2' International Intercessors: මාසයේ සෑම දිනක් සඳහාම සුවිශේෂී යාච්ඤා අවශ්‍යතා හා විවිධ ජාතීන් පිළිබඳ තොරතුරු ඇතුලත් මාසික ප්‍රවෘත්ති හසුනක් සපයන කණ්ඩායමකි. මෙම ලිපිනයට ලියා ඔවුන්ගේ සාමාජිකයෙකු වන්න. Box O, Pasadena, California, 91108, U. S. A.

3. ශුභාරංචිය නොලද අය ඉලක්ක කරගෙන යාච්ඤා කරන "ප්‍රත්‍යන්ත සහභාගිකත්ව යාච්ඤා කණ්ඩායමක්" පටන් ගන්න. මේ සඳහා තොරතුරු ලබා ගැනීමට U.S. Centre for World Mission, 1605, Elizebeth Street, Pasadena, California 91104, USA වලට ලියන්න.

4. ලෝකයේ ජාතීන් සඳහා යාච්ඤා කාඩ්පත් ලබා ගන්න. ආත්මික අවශ්‍යතා ඇති ජාතීන් 70ක් සඳහා යාච්ඤා කිරීමට උනන්දු කරවීම සඳහා, සෑම කාඩ්පතක්ම ඒ ඒ රට පිළිබඳ වැදගත් තොරතුරු සපයයි. එවිට ඔබට වඩාත් ඵලදායීව යාච්ඤා කළ හැකිය. Inter- Varsity Christian Fellowship, 233 Langdon Street, Modison, WI 53703 USA.

5. විශේෂ යාච්ඤා සහභාගීත්වයකට බැඳෙන්න. එවැනි කණ්ඩායම් සඳහා උදාහරණ දෙකක් පහත දැක්වේ. Fellowship of Faith for Muslims, 205 Yonge Street Toronto, Canada M5BIN2. Pray for China Fellowship 1423, Grant Street, Berkeley, Ca. USA.

# දසවන පරිච්ඡේදය

## බයිබලීය ලෝක දැක්ම බෙදා ගැනීම

### අරමුණ

මෙම පරිච්ඡේදය අධ්‍යයනයෙන් ඔබට

- ❖ ප්‍රධාන පදය මතකයෙන් ලිවීමට
- ❖ බයිබලීය ලෝක දැක්ම බෙදා ගැනීම සඳහා පියවර හතරක් හඳුනා ගැනීමට
- ❖ විශ්වාසවන්ත අය සමඟ බයිබලීය ලෝක දැක්ම බෙදා ගැනීමට
- ❖ ඉවැන්ජලිස්ත සේවය සඳහා කමිටුවක් පිහිටුවීමට
- ❖ ලෝක කිතුනු බයිබල් පාඩම් නිර්මාණය කිරීමට

### ප්‍රධාන පදය

> **බොහෝ සාක්ෂිකාරයන් ඉදිරියෙහි නුඹ මාගෙන් ඇසූ දේම වෙන අයටත් උගන්වන්ට සමර්ථවූ විශ්වාසවූ මනුෂ්‍යයන්ට භාරදෙන්න. (2 තිමෝති 2:2)**

### හැඳින්වීම

ඔබ උගත් පරිදි ලෝකය මුළුල්ලේ සිටින ඇදහිලිවතුන් මිලියන ගණනකට බයිබලීය ලෝක දැක්මක් නොමැත. ඔවුන්ගේ අවධානය යොමුවන්නේ තමාගේම පවුල, ගම හා සභාව ගැන වේ. ලෝකයා සඳහා වූ දෙවියන්වහන්සේගේ සැලැස්ම ඔවුන් අවබෝධ කරගෙන නොමැති බැවින් ඔව්හු මේ සැලැස්ම තුළ ඔවුන්ට අයත් කොටස ඉටු නොකරති. මෙම පරිච්ඡේදයෙන් පැහැදිලි කෙරෙන්නේ එවැනි අය සමඟ බයිබලීය ලෝක දැක්ම බෙදා ගන්නා ආකාරයත්, ඔවුන් ලෝක කිතුනුවන් වීමට පොලඹවන ආකාරයත් වේ.

### විශ්වාසවන්ත පුද්ගලයන්

බයිබලීය ලෝක දැක්ම ඵලදායී ලෙස සන්නිවේදනය කිරීමට ප්‍රධාන වන්නේ පුහුණු වීම සඳහා විශ්වාසවන්ත පුද්ගලයන් තෝරා ගැනීම වේ.

> **බොහෝ සාක්ෂිකාරයන් ඉදිරියෙහි නුඹ මාගෙන් ඇසූ දේම වෙන අයටත් උගන්වන්ට සමර්ථවූ විශ්වාසවූ මනුෂ්‍යයන්ට භාරදෙන්න. (2 තිමෝති 2:2)**

'විශ්වාසවන්ත' යන වචනයෙහි තේරුම ක්‍රියාකාරී, විශ්වාස කළ හැකි හා විශ්වසනීය අය වේ.

සෑම කෙනෙකුටම බයිබලීය ලෝක දැක්ම අල්ලා ගැනීමේ හැකියාවක් නැත. සෑම කෙනෙක්ම ඊට විශ්වාසවන්තව සිටින්නේ ද නැත. මේ දැක්ම බෙදා ගැනීමේදී ඔබ තෝරා ගත යුත්තේ ක්‍රියාකාරී, විශ්වාසය තැබිය හැකි දෙවියන්වහන්සේට ප්‍රතිචාර දක්වන අය වේ. ඔබ බයිබලීය ලෝක දැක්ම බෙදා ගන්නා අය, අන් අයට ඉගැන්වීමට ද විශ්වාසවන්ත විය යුතුය. මෙවැන්නන්ගේ බෝවීම හා වැඩි වීම අඛණ්ඩව සිදුවන්නේ මේ ආකාරයෙන් පමණයි.

## බයිබලීය මිස සංස්කෘතිමය ලෙස නොවේ.

ඔබ උගත් දේ අන් අය සමඟ බෙදාගන්නා විට, ඔබගේම සංස්කෘතියට අයත් වන්නාවූ මත බෙදා නොගත යුතුය. ඔබ බෙදා ගත යුත්තේ බයිබලීය ලෝක දැක්ම වේ.

සංස්කෘතිය යනු එක්තරා පරිසරයක යම් යම් දේ කරන ආකාරය අත්පත් කරගත් රටාව වේ. ඊට සිරිත් විරිත්, සම්ප්‍රදායන්, භාෂාව ආදි සියලුම ජීවන ශෛලියන් හා චර්යාවන් අයත් වේ. ඉන්දියාව හා අප්‍රිකාව අතර මිනිසුන්ගේ මෙතරම් විශාල වෙනස්කම් දැක ගත හැක්කේ එබැවිනි.

ඔබ ජීවත් වන සංස්කෘතියෙන් ඔබට මහත් බලපෑම් ඇතිවේ. යම් යම් දේ ඔබ කරන ආකාරය ඉතාම හොඳ ආකාරය ලෙස ඔබ සිතනු ඇත. එහෙත් කිසිම සංස්කෘතියක් තවත් සංස්කෘතියකට වඩා උසස් නොවන බව ඔබ මතක තබා ගත යුතුය. ඔබගේ කැඳවීම වන්නේ සංස්කෘතිය වෙනස් කිරීම හෝ ඔබ ඉතාම උසස් යයි සිතන ආකාරයට දේවල් කරන ආකාරය බෙදා ගැනීම හෝ නොවේ.

සංස්කෘතිය ගැන ඔබ සැලකිලිමත් විය යුත්තේ යම් පුරුදු දෙවියන්වහන්සේගේ ලිඛිත වචනයට පටහැනි වනවිට පමණි.
...එවිට ඔබ එයට මුහුණ දී ඒවා පාප ලෙස කටයුතු කළ යුතුය. මිථ්‍යාදෘෂ්ටීන්ට ශිෂ්ඨාචාරය ගෙන යාමට ඔබ කැඳවා නැත. ඔබගේ පරමාර්ථය වන්නේ සමාජය මුදා ගැනීම නොව ආත්ම මුදා ගැනීම වේ. මාළු අල්ලන්නන්ගේ පරමාර්ථය මුහුද වෙනස් කිරීම නොවේ. එහි සිටිනා මත්ස්‍යයන් අල්ලා ගැනීමය.

ප්‍රධාන කාර්යය දෙසට අවධානය යොමු කරන්න. එය විශ්වාසවන්ත අයට ඉගැන්වීම වේ.

## සැලැස්ම

බයිබලීය ලෝක දැක්ම බෙදා ගැනීම සඳහා ඔබ අනුගමනය කළ යුතු පියවර හතර මෙසේ වේ:

1. මෙම දර්ශනයේ ආකෘතියක් වන්න.
2. දර්ශනය අන් අයට සන්නිවේදනය කරන්න.
3. මෙම දර්ශනය ජීවිතයේ අවධානය යොමු වන කේන්ද්‍රස්ථානය කර ගන්න.
4. දර්ශනයට කීකරු වන්න.

අපි මේ එක් එක් පියවර දෙස විස්තරාත්මකව බලමු.

## මෙම දර්ශනයේ ආකෘතියක් වන්න.

පළමුව බයිබලීය ලෝක දැක්ම ඔබ පිළිගත යුතුය. මෙම අධ්‍යයනයේ පරමාර්ථය එය වේ. ශ්‍රේෂ්ඨ පැවරුමට ඇති ඔබගේ වගකීම ඔබ හඳුනා ගත් විට හා ලෝකයේ ජාතීන් වෙනුවෙන් ඇති ඔබගේ හැඟීම ඔබගේ හදවත ස්පර්ශ කළ විට, ඔබ මෙම දර්ශනයේ ආකෘතියක් බවට පත්වේ.

ආකෘතියක් ලෙස ඔබ ඔබගේ මිතුරන් හා සභා සහභාගිත්වය ඉදිරියේ ජීවමාන ආදර්ශයක් වේ. ක්‍රිස්තුස්වහන්සේගේ වැඩය වෙනුවෙන් ඇති ඔබගේ උනන්දුව හා ලෝකයේ ජාතීන් වෙනුවෙන් ඇති ඔබගේ හද ගැස්ම අන් අයට දැකීමට ඉඩ දෙන්න. ශුභාරංචිය අන් අය වෙතට ගෙන යෑමට ඔබ ක්‍රියාකාරීව සම්බන්ධ වන ආකාරය ඔවුහු දකිත්වා ! ශ්‍රේෂ්ඨතම ඉගැන්වීම සිදුවන්නේ වචනයෙන් නොවේ, ආදර්ශයෙනි. අපි මෙය ජේසුස්වහන්සේගේ ජීවිතයෙන් හා සේවයෙන් දකිමු.

## දර්ශනය අන් අයට සන්නිවේදනය කරන්න.

දර්ශනය , අන් අයට සන්නිවේදනය කරන ආකාරය සඳහා යෝජනා කිහිපයක් මෙසේ වේ:

1. ඔබට සමීපව සිටින ඇදහිලිවතුන් සමඟ පුද්ගලිකවම දර්ශනය බෙදා ගන්න. *"බයිබලීය ලෝක දැක්මක් වර්ධනය කර ගැනීම"* යන මෙම පාඨමාලාව ඔවුන් සමඟ බෙදා ගන්න. ලෝකයාට ඇති ආත්මික අවශ්‍යතාව බෙදා ගෙන ඒ සඳහා වන ඔවුන්ගේ පෞද්ගලික භූමිකාව පැහැදිලි කරන්න. නවවන පරිච්ඡේදයේ ඔබ උගත් උපක්‍රම භාවිත කරමින් ලෝකයේ ජාතීන් වෙනුවෙන් එක්ව යාච්ඤා කරන්න.

2. දේව මෙහෙයේ ස්ථිර පදනමක් ලෙස "ලෝක කිතුනු අවධානය" ගැන ඉගැන්වීමට කාලයක් ඔබගේ පාලකතුමාගෙන් ඉල්ලන්න. මෙය ලෝකයේ ආත්මික තත්ත්වය, ශුභාරංචිය නොලද පෙදෙස්, හා ක්‍රියාත්මක වන ලෙස කෙරෙන අභියෝග සඳහන් මිනිත්තු කීපයක බෙදා ගැනීමකි.

3. ඔබගේ සභාව සතිපතා පුවත්පතක් හෝ වෙනත් සඟරාවක් හෝ පල කරන්නේ නම් බයිබලීය ලෝක දැක්ම පිළිබඳ ලියවිලි ඊට ඇතුළත් කරන්න.

4. ඔබගේ දේවස්ථානයේ හෝ නිවසේ හෝ සම්පත් මධ්‍යස්ථානයක් පිහිටුවන්න. ශුභාරංචිය නොලද අය, මිෂනාරිවරුන්ගේ ලිපි, යාච්ඤා සිතියම් ආදිය ඇතුළත් පොත් හා වෙනත් ද්‍රව්‍ය මෙහි තබන්න. (මෙම පාඨමාලාව ද සම්පත් මධ්‍යස්ථානයේ කොටසක් ලෙස ඇතුළත් කරන්න.)

5. ඔබගේ කණ්ඩායම සමඟ බෙදා ගැනීමට මිනිත්තු පහක පමණ ශ්‍රව්‍ය පට එවන ලෙස මිෂනාරිවරුන්ගෙන් හා කිතුනු නායකයන්ගෙන් ඉල්ලා සිටින්න. ඔවුන්ගේ රටේ කෙරෙන වැඩ පිළිබඳ ඡායාරූප, කථා, දෘශ්‍ය පට ආදිය එවන ලෙස පවසන්න.

6. ඔබ සිටින පෙදෙසේ විශ්ව විද්‍යාලයක් තිබේ නම්, තම රටේ අවශ්‍යතා හා සංස්කෘතිය ගැන අදහස් හුවමාරු කර ගැනීමට එහි සිටින ජාත්‍යන්තර සිසුන්ට ආරාධනා කරන්න. ඔබ පෙදෙසේ පිටරටින් පැමිණි අය වැනි උප-සංස්කෘතියක් සහිත අය ඇත්නම් ඔවුන්ට ද ආරාධනා කරන්න.

7. ඔබගේ සභාවේ යාච්ඤා ජීවිතයට බලපෑම් කරන්න. කණ්ඩායම් යාච්ඤා සඳහා වාචික හෝ ලිඛිත හෝ ඉල්ලීම් ඇතිවිට සමූහය ඉදිරියේ ක්‍රිස්තුස්වහන්සේගේ ලෝකය සඳහා ඇති අභිප්‍රාය ගැන සඳහන් කරන්න.

8. ඔබ සභාවේ ලෝක කිතුනු හෝ ඉවැන්ජලිස්ත සේවය සඳහා කමිටුවක් නොමැති නම් එය පිහිටුවන්න. මෙය කරන ආකාරය මෙම පරිච්ඡේදයේ තවදුරටත් අධ්‍යයනය සඳහා කොටසින් පැහැදිලි කර ඇත.

9. ඔබගේ නිවසේ හෝ සභාවේ දැනුවත් කිරීමේ රැස්වීම් පවත්වන්න. මේවා කුඩා ගෘහ රැස්වීමක සිට පූර්ණ ඉවැන්ජලිස්ත සම්මේලනයක් දක්වා අතර පරාසයක තිබිය හැකිය. විවිධ මිෂන් සේවාවලින් කථිකයන් කැඳවන්න. මිලදී ගැනීමට හැකි ද්‍රව්‍ය ඇතුළත් වන සේ "ලෝක කිතුනු" මේසයක් පිළියෙල කරන්න. (මෙම පාඨමාලාව ද එම මේසයට ඇතුළත් කිරීමට වගබලා ගන්න.)

10. *"බයිබලීය ලෝක දැක්මක් වර්ධනය කර ගැනීම"* නමැති මෙම පාඨමාලාව මුළු සභාවට හා ඔබ ප්‍රජාවේ ඇති අනෙකුත් සභාවන්ට හඳුන්වා දෙන ලෙස ඔබගේ පාලකතුමාගෙන් ඉල්ලා සිටින්න. ඒ සඳහා පංති නිවසක, දේවස්ථානයේ හෝ ප්‍රසිද්ධ රැස්වීම් ශාලාවක පැවැත්විය හැකිය.

## මෙම දර්ශනය ඔබගේ ජීවිතයේ අවධානය යොමු වන කේන්ද්‍රස්ථානය ලෙස තබා ගන්න.

මෙම දර්ශනය ඔබගේ ජීවිතයේත් ඔබ පුහුණු කරන විශ්වාසවන්ත ස්ත්‍රී පුරුෂයන්ගේ ජීවිතවලත් අවධානය යොමු වන කේන්ද්‍රස්ථානය ලෙස තබා ගන්න. මෙය සිදු කරන ආකාරය පිළිබඳ යෝජනා කිහිපයක් පහත දැක්වේ:

1. බයිබලීය ලෝක දැක්ම හා මිෂනාරි සේවය කෙරෙහි අවධානය යොමු කෙරෙන පොත් කියවන්න.
2. ඔබ පෙදෙසේ පැවැත්වෙන ධර්මදූත රැස්වීම්වලට සහභාගි වන්න.
3. ශුභාරංචිය පැතිරීමට විරුද්ධව බලපාන ලෝක සිද්ධීන් ගැන අවදිව සිටින්න. ලෝකයේ ජාතීන් ගැන නොකඩවා යාච්ඤා කරන්න.
4. ලෝකයේ විවිධ ක්ෂේත්‍රවල වෙහෙසෙමින් වැඩ කරන අය සමඟ සෘජු සබඳතා පවත්වන්න. ඔවුන්ගේ වාර්තා ඔබගේ ලෝක දැක්ම කෙරෙහි අඛණ්ඩ පෙලඹවීම් කරනු ඇත.
5. ඔබගේ භාවිතය සඳහා ලෝක කිතුනු බයිබල් අධ්‍යයනයන් නිර්මාණය කර ඒවා අන් අය සමඟ බෙදා ගන්න. ලෝක කිතුනු බයිබල් අධ්‍යයනයක් යනු ශුද්ධ ලියවිල්ලේ ලෝකය පිළිබඳ තේමාව කෙරෙහි අවධානය යොමු කරන අධ්‍යයනයකි. මෙම පරිච්ඡේදයේ "තව දුරටත් අධ්‍යයනය සඳහා" යන කොටස මෙය කිරීමට ඔබට උපකාර කෙරෙනු ඇත.

## දර්ශනයට කීකරු වන්න.

බයිබලීය ලෝක දැක්මක් නිර්මාණය කර එය අන් අයට සන්නිවේදනය කිරීම පමණක් ප්‍රමාණවත් නැත. ඔබ උගත් දේ මත ක්‍රියා කළ යුතු වේ.

> **දෙවියන්වහන්සේගේ මනුෂ්‍යයා සම්පූර්ණව, සියලු යහපත් ක්‍රියාවලට සූදානම්ව සිටින පිණිස දේවානුභාවයෙන් දුන් මුළු ලියවිල්ල ඉගැන්වීමටත් තරවටුවටත් හික්මවීමටත් ධර්මිෂ්ඨකම ගැන ගුරුකම් දීමටත් ප්‍රයෝජනවත්ව තිබේ. (2 තිමෝති 3:16)**

අප උගන්වන ශුද්ධ ලියවිල්ලේ සෑම මූලධර්මයක්ම යහපත් සේවයක් කිරීමට අප සූදානම් කළ යුතුය. ඔබ මෙම පාඨමාලාවෙන් බොහෝ මූලධර්ම උගත්තෙහිය. එහෙත් ක්‍රියාවක් නොමැති දැනුම ක්‍රියාවක් නොමැති ඇදහිල්ල මෙනි. ඔබ මූලධර්ම ඉගෙන ගන්නවා පමණක් නම් හා ලබාගත් දැනුමෙන් ක්‍රියාකාරීව ප්‍රතිචාර නොදක්වන්නේ නම් එය ආත්මික වැසූ පාරක් මෙනි. දර්ශනය ලබා ගැනීම පමණක් ප්‍රමාණවත් නැත. අන් අයට එය සන්නිවේදනය කිරීම ද ප්‍රමාණවත් නැත. ඔබ හා ඔබ පුහුණු කරන අය ඒ දර්ශනයට කීකරු විය යුතුය.

මෙය කිරීමට සහාය වීම සඳහා ජාත්‍යන්තර හාවස්ටයිම් ආයතනය පාඨමාලා සපයයි. මෙම ශ්‍රේණියේ ඊළඟ පාඨමාලාව වන "*ඉගැන්වීමේ උපක්‍රම*" ඔබ උගත් දේ ඵලදායිව අන් අය සමඟ බෙදා ගැනීමට ඔබට හැකියාව ලබා දෙනු ඇත. "*ගුණ කිරීමේ ක්‍රම වේදය*" ඔබ පුහුණු කළ ආත්මික බලසේනාව ගුණ කරන ආකාරය පෙන්වනු ඇත. අනෙකුත් හාවස්ටයිම් පාඨමාලා, ඇදහිලිවතුන් සංවිධානය කිරීමට, කළමණාකරණය කිරීමට හා ක්‍රියාවේ යෙදවීමට ඔබට සහාය වනු ඇත. "*මුහුන් වැනි ධර්මදානය*" නමැති හවස්ටයිම් ජාත්‍යන්තර පාඨමාලාව බලය ප්‍රදර්ශනය කිරීමේ ශුභාරංචි පණිවුඩය බෙදා ගැනීමට සුවිශේෂී මාර්ගෝපදේශ සපයයි. එහෙත් මෙම පාඨමාලා අවසන් වන තුරු නොසිටින්න. දැක්මට මේ දැන්, ඔබ සිටින තැන සිටම කීකරු වීම අරඹන්න. මෙම කිරීම සඳහා යෝජනා කීපයක් මෙසේ වේ.

1. ඔබගේම අසල් වැසියන්, ගමේ හා නගරයේ අය සමඟ ශුභාරංචිය බෙදා ගන්න.
2. ප්‍රාදේශීයව, ජාතිකව හා අන්තර්ජාතිකව ඉවැන්ජලිස්ත සේවාව සඳහා ඔබගේ දේශීය සභාව සමඟ එක්ව වැඩ කරන්න.
3. ලෝකයේ ජාතීන් වෙනුවෙන් යාච්ඤා කරන්න.
4. මිෂන් සේවා හා සම්බන්ධ ආයතනවලට ඔබගේම සභාව තුළින් හෝ වෙනත් ඉවැන්ජලිස්ත සංවිධාන තුළින් මුදල් දෙන්න. තවමත් ශුභාරංචිය ගොස් නොමැති අය අතර වෙහෙසව වැඩ කරන අයට දෙන මුදල් දීමට අවධාරණය කළ යුතුය.

5. ඔබගේ ප්‍රදේශයෙන් පිටත අයටද ශුභාරංචිය ගෙන යන්න. ධර්මදූත සේවා කණ්ඩායමක කොටසක් වන්න. ශුභාරංචිය බෙදා ගැනීම සඳහා වෙනත් අසල්වැසි තැනකට, සංස්කෘතියකට හෝ ජාතියක් වෙත යෑමට ඉවැන්ජලිස්ත කණ්ඩායමක් සංවිධානය කරන්න.

## අඛණ්ඩ චක්‍රය

බයිබලීය ලෝක දැක්ම බෝ කිරීමේ අඛණ්ඩ චක්‍රය මෙසේ වේ.

දර්ශනයේ ආකෘතියක් වන්න.
↓
දර්ශනය අන් අයට සන්නිවේදනය කරන්න.
↓
දර්ශනය ඔබගේ ජීවිතයේ කේන්ද්‍රීය ස්ථානය ලෙස තබා ගන්න.
↓
දර්ශනයට කීකරු වන්න. → → →

පළමුව ඔබ ලද දර්ශනයේ ආකෘතියක් බවට පත්වේ. ඉන්පසු එය ආදර්ශයෙන් හා ඉගැන්වීමෙන් අන් අයට සන්නිවේදනය කරයි. ඔබගේ ජීවිතයේත් ඔබ පුහුණු කරන අයගේ ජීවිතයේත් කේන්ද්‍රීය අවධානය ලෙස බයිබලීය ලෝක දැක්ම තබා ගනී. දර්ශනයට කීකරු වීම සඳහා ඔබ පුහුණු කළ අය සමඟ ඔබ සම්බන්ධ වන විට ඔබ සියලු දෙනාම දර්ශනයේ ආකෘතියන් බවට පත්වේ. ඔබ එය අන් අයට සන්නිවේදනය කරන විට මෙම චක්‍රය අඛණ්ඩව පවතී.

## ස්වයං පරීක්ෂණය

1. ප්‍රධාන පදය මතකයෙන් ලියන්න.

2. බයිබලීය ලෝක දැක්ම බෙදා ගන්නා විට අප අවධානය යොමු කළ යුත්තේ කවර ආකාරයේ පුද්ගලයන් වෙතද?

3. බයිබලීය ලෝක දැක්ම බෙදා ගැනීමේ පියවර හතර මොනවාද?

4. ශුභාරංචිය ලෝකයේ ජාතීන් වෙත ගෙන යෑමේ දර්ශනය සාක්ෂාත් කර ගැනීමට ඔබ ගන්නා සුවිශේෂී පියවර මොනවාද? මෙම දර්ශනය බෙදා ගන්නේ කවර ආකාරයේ පුද්ගලයන් සමගද? ඔබගේ සභාව තුළ ඔබ කුමක් කරන්නේද? ඔබගේ ප්‍රජාව තුළ ඔබ කුමක් කරන්නේද?

(පරීක්ෂණ සඳහා පිළිතුරු මෙම අත්පොතේ අවසාන පරිච්ඡේදය අවසානයේ ඇත.)

# තවදුරටත් අධ්‍යයනය සඳහා

## ඉවැන්ජලිස්ත සේවය සදහා කමිටුවක් පත් කිරිම.

ඔබ සභාවේ ඉවැන්ජලිස්ත සේවාව සඳහා කමිටුවක් හෝ “ලෝක කිතුනු” කණ්ඩායමක් පිහිටුවන ලෙස මෙම පාඩමෙන් යෝජනා කෙරිණි. ඉවැන්ජලිස්ත සේවාව ඉවැන්ජලිස්ත සේවාව, සභාවේ තවත් දෙපාර්තමේන්තුවක් හෝ කමිටුවක් හෝ විය නොයුතුවේ. එය සභාවේ ප්‍රධානතම අවධානය විය යුතුය. එවැනි කමිටුවක් පිහිටුවීමේ හේතුව වන්නේ “ලෝකය තුළ සභාව” එහි පරමාර්ථය ලෙස සාක්ෂාත් කර ගැනීම සඳහා සහභාගිත්වයට මඟ පෙන්වීම වේ. (හයවන පරිච්ඡේදය බලන්න).

එවැනි කමිටුවක් පිහිටුවන්නේ මෙසේ වේ:

### සභාපාලකතුමාගෙන් ආරම්භ කරන්න.

පළමුව ඔබේ සභාපාලකතුමා හමුවී මෙවැනි කමිටවක් පිහිටුවීමට ඇති ඔබගේ ආශාව පවසන්න. ඔබගේ දර්ශනය හා ඔබ මේ පාඩමෙන් උගත් දේ ඔහු සමඟ බෙදාගන්න. ඇතැම් විට එවැනි කමිටුවක නායකයා වීමට ඔබ පත් කරනු ඇත. නැතහොත් එය සංවිධානය කිරීමට ඔබට සහාය වීම සඳහා තවත් කෙනෙකු ලබා දෙනු ඇත. මේ කමිටුව සාර්ථක වීමට නම් සභාපාලකවරයාගේ අවසරය හා සහභාගිකත්වය අවශ්‍ය වේ.

### වර්තමාන වැඩ සටහන විශ්ලේෂණය කරන්න.

ඔබගේ සභාවේ දැනට පවතින ඉවැන්ජලිස්ත සේවාව හෝ දේව සේවයේ හෝ තත්ත්වය කුමක්ද? පහත දැක්වෙන දේ සලකා බලන්න.

**- ප්‍රතිපත්තිය**
ඉවැන්ජලිස්ත සේවාව හෝ මිෂන් සේවය හෝ පිළිබඳව ඔබ සභාවට ලිඛිත ප්‍රතිපත්තියක් තිබේද? එසේ ඇත්නම් සභාව කරන දේ පෙන්නුම් කිරීමට එය ප්‍රමාණවත්ද? එසේ පෙන්නුම් කරන්නේද?

**- යාච්ඤාව**
ඉවැන්ජලිස්ත සේවාව හා මිෂන් සේවය සම්බන්ධ ඉල්ලීම් ගැන ඔබ සභාව එකමුතුව කොපමණ යාච්ඤා කරන්නේද? මතෙව් 9:38හි උපදෙස් දී ඇති පරිදි ඔබ සභාව සේවකයන් යාච්ඤාවෙන් බඳවා ගෙන තිබේද?

**- සම්මේලන**
පසුගිය අවුරුද්දේ ඔබ සභාව ඉවැන්ජලිස්ත සේවා හෝ මිෂන් සේවා සම්මේලනයක් පැවැත්වූයේද?

**- පුහුණුව**
ඉවැන්ජලිස්ත සේවාව සදහා ඇති අවශ්‍යතාව හා ශුභාරංචිය පැතිරීමේ වර්තමාන තත්ත්වය ගැන අවධානය යොමු කෙරෙන බයිබලීය ලෝක දැක්ම පිළිබඳ ඔබ සභාව උපදෙස් සපයන්නේද? ඔබ සභාවේ සෑම වයස් කණ්ඩායමකට හා සෑම දෙපාර්තමේන්තුවකටම මිෂන් සේවා අධ්‍යාපනය ගැන වැඩසටහනක් තිබේද?

**- සහභාගිවීම**
අතීතයේදී ඔබ සභාව සහභාගි වු ඉවැන්ජලිස්ත සේවාව හෝ මිෂන් සේවා වැඩසටහන් මොනවාද? දේශීයව, ජාතිකව හා ජාත්‍යන්තරව ඔබ කරන්නේ කුමක්ද? සාර්ථක වූයේ කිනම් වැඩසටහනක්ද? ඒ මන්ද? අසාර්ථක වූයේ කුමන ඒවාද? ඒ මන්ද?

සභාවේ විවිධ දෙපාර්තමේන්තු මිෂන් සේවාවලට සහභාගි වන්නේ කෙසේද? නිදසුනක් ලෙස තරුණයන්, පුරුෂ සංගමය, කාන්තා සංගමය ආදිය පෞද්ගලික ධර්මදූත සේවාවලට සහභාගි වන්නේ කෙසේද?

**- සහාය දීම**
ඔබගේ සභාව දැනට සහාය දෙන මිෂන් සේවාවන් මොනවාද? ඒවා පිහිටා ඇත්තේ කොහේද? ඒවාට සහාය දෙන්නේ කුමන මට්ටමකටද?

**- මුදල් වෙන් කිරීම**
ඔබ සභාවේ වර්තමාන මුදල් වෙන් කිරීම අනුව (ලද පූජාවන්ගෙන්) ඉවැන්ජලිස්ත හෝ මිෂන් සේවාවලට කුමන ප්‍රතිශතයක් වෙන් කර ඇත්ද? මේ සඳහා පහත හිස්තැන් පුරවන්න.

පසුගිය වසරේ අප සභාව ලද පූජාවන් මුළුමනින්ම රුපියල් .................වන අතර මේ මුදලින් අපි රුපියල් ................. ඉවැන්ජලිස්ත හා මිෂන් සේවාවන්ට දුනිමු. මින් අදහස් වන්නේ අපගේ සභාවේ අයවැය ලේඛණයෙන්......... %ක් පසු ගිය වසරේ ඉවැන්ජලිස්ත හෝ මිෂන් සේවාවන්ට වෙන් කළ බවය.

**- සම්පත්**
සම්පත්වලට සෙනඟ, මුදල්, බඩු බාහිරාදිය හා පහසුකම් අයත් වේ. ඔබගේ සභාවේ සම්පත් ඉවැන්ජලිස්ත හෝ මිෂන් සේවාවලට අද භාවිත වන්නේ කෙසේද?

## සමූහය දැනුවත් කරන්න.

මෙම අත්පොත ඉගෙනුම් ආධාරකයක් ලෙස භාවිත කරමින් "බයිබලීය ලෝක දැක්මක් වර්ධනය කර ගැනීම" පිළිබඳ පංතියක් සංවිධානය කරන්න. මෙම පංතියේදී ඔබගේ සභාවේ ඉවැන්ජලිස්ත හා මිෂන් සේවාවන්වල වර්තමාන තත්ත්වය ගැන ඔබ උගත් දේ බෙදා ගන්න. පංතිය ගන්නා අයගෙන් බයිබලීය ලෝක දැක්ම ග්‍රහණය කරන ප්‍රධාන අය තෝරා ගන්න. මොවුන් ඉවැන්ජලිස්ත සේවාවන් ගැන උනන්දුවක් දක්වන අතර මේවාට ක්‍රියාකාරීව සහභාගි වීමට කැමති අය විය හැකිය.

## සංවිධානය කිරීමේ රැස්වීමක් පවත්වන්න.

ඉවැන්ජලිස්ත සේවය සඳහා කමිටුවක් සංවිධානය කිරීම සඳහා විශේෂ රැස්වීමක් පවත්වන්න.

**වගකීම්**

ඉවැන්ජලිස්ත සේවා කමිටුව සඳහා යෝජිත වගකීම් සමහරක් මෙසේ වේ. මෙම කමිටුව

- සභාවට, පෞද්ගලික ඉවැන්ජලිස්ත සේවයේ යෙදීමෙන්ද, දීමනා තුළින් හා යාච්ඤාවෙන් ආදර්ශයක් සැපයිය යුතුය.
- ඉවැන්ජලිස්ත හා මිෂන් සේවාවන් වෙනුවෙන් සමූහයාගේ යාච්ඤා සමායෝජනය කළ යුතුය.
- ඉවැන්ජලිස්ත හා මිෂන් සේවාවන් සඳහා දේශීය, ජාතික හා අන්තර් ජාතික ඉලක්ක පිහිටුවිය යුතුය.
- ඉවැන්ජලිස්ත හා මිෂන් සේවාවන් සඳහා වඩාත් ඵලදායී ලෙස සභා සම්පත් යොදා ගන්නා අයුරු තීරණය කළ යුතුය.
- ඉවැන්ජලිස්ත හා මිෂන් සේවාවන් පිළිබඳව සභාවට සන්නිවේදනය කළ යුතුය.
- ඉවැන්ජලිස්ත හා මිෂන් සේවාවන් සඳහා, උපයන මුදල හා එය භාවිත කරන අන්දම පෙන්වන අය-වැය ලේඛණයක් සකස් කළ යුතුය.
- ඉවැන්ජලිස්ත හා මිෂන් සේවාවන්ට අදාළ සභා සිද්ධීන් ඇතුළත් වාර්ෂික දින දර්ශකයක් සකස් කළ යුතුය.
- ඉවැන්ජලිස්ත හා මිෂන් සේවාවන් සඳහා පුහුණුවීම් සැලසුම් කර ක්‍රියාත්මක කළ යුතුය.
- වාර්ෂික ධර්මදූත සම්මේලනයක් සැලසුම් කර ක්‍රියාත්මක කළ යුතුය.
- සභාවේ සියලුම දෙපාර්තමේන්තු සඳහා වන ඉවැන්ජලිස්ත හා මිෂන් සේවාවන් සම්බන්ධීකරණය කළ යුතුය.
- යාච්ඤාවෙන්, දීමනා තුළින්, පෞද්ගලික සබඳතා තුළින් හා ව්‍යාපෘති මගින් මිෂනාරිවරුන්ට සහාය වීම දිරි ගන්වන්න. මේ ක්ෂේත්‍ර පිළිබඳ නව අදහස් කමිටුව මඟින් ඉදිරිපත් කළ යුතුය.

- ලෝකය මුළුල්ලේම ඉවැන්ජලිස්ත හා මිෂන් සේවාවන්වල ඇති වන වැඩි දියුණු වීම් පිළිබඳව අවදියෙන් සිටිය යුතුය.
- සභා සහාය ලැබීමට උචිත ඉවැන්ජලිස්ත හා මිෂන් සේවා ව්‍යාපෘති පිළිබඳව සොයා බලා ඒවා අනුමත කළ යුතුය.
- සහාය ලැබීමට සුදුසුකම් ඇති සභා මිෂනාරිවරුන් හා සංවිධාන ගැන සොයා බලා අනුමත කළ යුතුය.
- සභාව විසින් සහාය දෙනු ලැබන සියලුම මිෂනාරිවරුන්, මිෂනාරි ආයතන හා මිෂන් ව්‍යාපෘති සමඟ නිරන්තර සබඳතාවක් පැවැත්විය යුතුය.

**සංවිධාන**

කමිටු සංවිධානය පිළිබඳ යෝජනා සමහරක් මෙසේ වේ:

- සභාපාලකතුමා
  ඔහු සභාවේ ප්‍රධානියා බැවින් කමිටුවට මඟ පෙන්වීමේ බලය ඔහුට ඇත.

- අධ්‍යක්ෂ
  සභාපාලකතුමාගේ අධීක්ෂණය යටතේ රැස්වීම් මෙහෙයවයි. ක්‍රියාකාරකම් සංවිධානය කර ක්‍රියාත්මක කරයි. එමෙන්ම ඔහු අනෙකුත් කමිටු සාමාජිකයන් තම වගකීම් ඉටු කරන්නේදැයි සොයා බලයි.

- ලේකම්
  කමිටු රැස්වීම්වල වාර්තාද, මිෂන් සේවයේ දින දර්ශනයද පවත්වා ගෙන යයි. එමෙන්ම ලිපි ගනුදෙනු භාරව සිටී.

- අරමුදල් උපයන සභාපති :
  ඉවැන්ජලිස්ත හා මිෂන් සේවයට අරමුදල් ඉපයීමට මග පෙන්වයි.

- භාණ්ඩාගාරික -
  ඉවැන්ජලිස්ත හා මිෂන් සේවයන්ගේ අයවැය ලේඛණය සකසයි. කමිටුව විසින් අනුමත කරන ලද ව්‍යාපෘතිවලට හා මිෂන් සේවාවන්ට අරමුදල් ලබා දෙයි.

- යාච්ඤා කමිටු සභාපති -
  ඉවැන්ජලිස්ත හා මිෂන් සේවාව සම්බන්ධව යාච්ඤා ඉල්ලීම් සකස් කොට එම ඉල්ලීම් ද ඒවාට ලැබෙන පිළිතුරු ද සමග සභා සාමාජිකයන් හා කමිටු සාමාජිකයන් දැනුවත් කිරිම.

- ප්‍රසිද්ධ කිරීමේ සභාපති -
  ප්‍රවෘත්ති පත්‍ර, ගුවන් විදුලිය, රූපවාහිනිය, පෝස්ටර්, දේවස්ථාන දැන්වීම් පුවරුව හා මිෂන් සේවා දැන්වීම් පුවරුව ආදියට ඉවැන්ජලිස්ත හා මිෂන් සේවාව පිළිබඳ ප්‍රසිද්ධ කළ යුතු ප්‍රවෘත්ති සූදානම් කරයි.

- පුහුණු කිරීමේ සභාපති -
  ඉවැන්ජලිස්ත හා මිෂන් සේවාව පිළිබඳව සභා සාමාජිකයන්ට අධ්‍යාපනයක් දීමේ පුහුණුවීම් වැඩසටහන් සම්පාදනය කරයි. සභාවේ සෑම වයස් කණ්ඩායමකට හා දෙපාර්තමේන්තුවකටම වැඩ සටහන බැගින් සම්පාදනය කළ යුතුය. සභා පුස්තකාලයට හා / හෝ ශ්‍රව්‍ය දෘෂ්‍ය දෙපාර්තමේන්තුවට, ප්‍රතිපාදනවලට සරිලන සේ ඉවැන්ජලිස්ත හා මිෂන් සේවාව පිළිබඳ පොත්, සඟරා, අත්පොත්, පත්‍රිකා ආදි අධ්‍යාපනික දේ ලබා ගන්න.

- සම්මේලන සභාපති -
  වාර්ෂික මිෂන් සම්මේලනය සැලසුම් කරයි. මෙහෙයවයි.

- දේශීය මිෂන් සේවා සභාපති -
  සිරගෙවල්, ආරෝග්‍ය ශාලා, නිවෙස්, වීදි හා පාසල් සේවා, බැහැ දැකීම්, අලුතෙන් හැරුණු අය ගැන සොයා බැලීම් හා දේවස්ථාන වෙත යෑම ද එමෙන්ම මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වූවන්, අවිවාහක මව්වරුන්, මත්පැන්වලට ඇබ්බැහි වූවන්

වැනි අයට කෙරෙන විශේෂ සේවාවන් ද සම්බන්ධීකරණය කරයි. සභාය දීමට උචිත ව්‍යාපෘති සොයා බලා අනුමත කරයි.

- මිෂන් සේවා සභාපති -
  ඉවැන්ජලිස්ත හා මිෂන් සේවා කටයුතු සම්බන්ධීකරණය කරයි. සභාය දීමට සුදුසු පුද්ගලයන් හා ව්‍යාපෘති සොයා බලා අනුමත කරයි.

- විදේශීය ධර්මදූත සේවා සභාපති -
  විදේශීය ඉවැන්ජලිස්ත හා මිෂන් සේවා කටයුතු සම්බන්ධීකරණය කරයි. සභාය දීමට සුදුසු පුද්ගලයන් හා ව්‍යාපෘති සොයා බලා අනුමත කරයි.

- බඳවා ගැනීමේ සභාපති -
  ඉවැන්ජලිස්ත හා මිෂන් සේවයට ස්වේච්ඡා සේවකයන් බඳවා ගෙන මඟ පෙන්වයි.

- සභා දෙපාර්තමේන්තුවල නියෝජිතයෝ -
  කමිටුවේ සේවය කිරීමට ඉඩ ඇති සභාවේ විවිධ දෙපාර්තමේන්තුවල නියෝජිතයන් අතර පුරුෂ හා කාන්තා සේවය, තරුණ දෙපාර්තමේන්තුව හා ඉරිදා පාසලේ අධ්‍යක්ෂ අයත් වේ.

## සැලසුම් කිරීමේ රැස්වීම් පවත්වන්න.

ඉවැන්ජලිස්ත හා මිෂන් සේවාවන් සඳහා අලුත් සැකසුම් සකස් කිරීමට ඉවැන්ජලිස්ත කමිටුව නිරන්තරයෙන්ම රැස්විය යුතුය. ඔබ එක්ව කරන යාච්ඥා හා සාකච්ඡා තුළින් දේව රාජ්‍යයේ ශුභාරංචිය පැතිර වීම සඳහා අලුත් අරමුණු පිහිටුවන්න. අරමුණක් යනු ඉලක්කයකි. ඉලක්ක පිහිටුවීම මඟින් ඔබට දේශීයව, ජාතිකව හා ජාත්‍යන්තරව ඔබගේ පරමාර්ථය ඉටු කර ගැනීම පහසු වනු ඇත. (මේ ක්ෂේත්‍රය ගැන තවදුරටත් උපදෙස් ලබා ගැනීමට, හාවස්ටයිම් ජාත්‍යන්තර ආයතනයේ "*අරමුණු මඟින් කළමණාකරණය*" නමැති පාඨමාලාව ලබා ගන්න).

අලුත් අරමුණු මේවා සඳහා පිහිටුවන්න.

- **ප්‍රතිපත්ති -**
  ඔබගේ සභාව ඉවැන්ජලිස්ත හා මිෂන් සේවය සඳහා ලිඛිත ප්‍රතිපත්තියක් තිබේ නම්, එය ප්‍රමාණවත්දැයි සොයා බලන්න. ඔබගේ සභාවට එවැන්නක් නොමැති නම් එකක් ලියන්න. මිෂන් සේවා ප්‍රතිපත්තියක ඔබගේ ඉවැන්ජලිස්ත හා මිෂන් සේවයේ අරමුණු හා පරමාර්ථ සඳහන් විය යුතුය. "*අරමුණු මඟින් කළමණාකරණය*" නමැති හාවස්ටයිම් ජාත්‍යන්තර ආයතනයේ පාඨමාලාව ඔබට මේ සඳහා උපකාරී වනු ඇත.

- **යාච්ඥාව -**
  මිෂන් සේවාව සඳහා කමිටුවක් ලෙස එක්ව යාච්ඥා කිරීම අරඹන්න. ඉවැන්ජලිස්ත හා මිෂන් සේවාවන් පිළිබඳ යාච්ඥා ඉල්ලීම් ඉදිරිපත් කරන්න.

- **සම්මේලන -**
  මිෂන් සම්මේලනයක් සැලසුම් කරන්න. විවිධ ජාති හා මිෂන් සේවා ආයතන පිළිබඳ තොරතුරු මධ්‍යස්ථානයක් දේවස්ථානයේ පිහිටුවන්න. සම්මේලනයට ඉවැන්ජලිස්ත හා මිෂන් සේවය, සභාව සභාය දෙන මිෂනාරිවරුන්, අදාළ චිත්‍රපට, කාව්‍ය හා ශ්‍රව්‍යපට ආදී විෂයයන් සඳහා කථිකයන් ඇතුළත් කළ හැකිය.

  මෙම සම්මේලනය පුවත්පත්, ගුවන් විදුලිය, රූපවාහිනිය ආදිය මඟින් හැකිනම් අරමුදල් ඇති ප්‍රමාණය අනුව, ප්‍රචාර කරන්න. බැනර්, පෝස්ටර් හා කොඩි යොදා ගන්න. දේව මෙහෙයේදී මේ ගැන දැනුම් දෙන්න. දැන්වීම් පුවරුවක් ඇත්නම් එහිද මේ ගැන පලකරන්න.

- **පුහුණුව -**
  බයිබලීය ලෝක දැක්ම වැඩි වර්ධනය කිරීම සඳහා පංති හෝ බයිබල් අධ්‍යයනයන් හෝ පවත්වන්න. මේ සැසිවලදී ඉවැන්ජලිස්ත සේවයට ඇති අවශ්‍යතාව හා ලොව

මුළුල්ලේ ශුභාරංචිය පැතිරවීමේ වර්තමාන තත්ත්වය ගැන අවධානය යොමු කරන්න. මෙම පාඨමාලාව අධ්‍යයන මාර්ගෝපදේශයක් ලෙස යොදා ගන්න.

ඉවැන්ජලිස්ත හා මිෂන් සේවය සඳහා වර්ෂය පුරාම අවධාරණය කෙරෙන සැලැස්මක් සකස් කරන්න. ඔබට ඇතැම්විට වෙනත් මිෂනාරිවරයෙකු, ජාතියක් හෝ මිෂන් සංවිධානයක් වෙත සෑම මාසයකම ඔබගේ අවධානය යොමු කළ හැකිය.

ඉවැන්ජලිස්ත හා මිෂන් සේවය ගැන ඔබ සභා සාමාජිකයන් දැනුවත් කිරීම පිණිස පොත්, සඟරා හා ශ්‍රව්‍ය-දෘෂ්‍ය ද්‍රව්‍ය සහිත පුස්තකාලයක් අරඹන්න.

**සහභාගිත්වය** :

ශුභාරංචිය පැතිරවීම සඳහා ඔබේ සභාව අතීතයේත්, වර්තමානයේත් සහභාගි වූ ආකාරය පිළිබඳව ඔබ උගත් දේ නැවත මතක් කරන්න. දේශීයව, ජාතිකව හා ජාත්‍යන්තරව ඔබ අනාගතයේදී කරන දේ සැලසුම් කර ඒ ගැන යාච්ඤා කරන්න.

අතීතයේදී සාර්ථක වූයේ කුමන වැඩසටහන්ද? ඒවා නැවත කිරීමට ඔබට සිතෙන්නට පුළුවන. වර්තමානයේ සාර්ථකව ඇත්තේ කුමන වැඩසටහන්ද? ඉවැන්ජලිස්ත හා මිෂන් සේවය ගැන ඔබට අලුතින් ආරම්භ කළ හැක්කේ මොනවාද? අතීතයේ ඔබ මුහුණ දුන් අසාර්ථක දේ මොනවාද? ඒවා මඟහරවා ගත හැක්කේ කෙසේද?

ඉවැන්ජලිස්ත හා මිෂන් සේවා සඳහා සෑම වයස් කාණ්ඩයක්ම හා සෑම දෙපාර්තමේන්තුවක්ම සහභාගි කරගන්න. මෙය කළ හැකි එක් ක්‍රමයක් වන්නේ සෑම දෙපාර්තමේන්තුවෙන්ම නියෝජිතයෙක් ඉවැන්ජලිස්ත කමිටුවට පත් කරගැනීම වේ. එවිට මේ නියෝජිතයාට, දර්ශනය හා සැලැස්ම, නව දෙපාර්තමේන්තුවට ආපසු දැනුම් දිය හැකිය.

පහත දැක්වෙන ක්‍රම මඟින් සෑම පවුලකම සහභාගි වීම වැඩි කර ගැනීමට පුළුවන.

- සෑම පවුලක්ම තම නිවසේ සිතියමක් තබාගෙන තමා සහාය දෙන හා යාච්ඤා කරන මිෂනාරිවරුන් සිටින ස්ථාන එහි ලකුණු කරනු ඇත.
- මිෂනාරිවරුන්, ජාත්‍යන්තර ශිෂ්‍යයන් හා විදේශීය අමුත්තන් තම නිවෙස්වල තබා ගැනීමට පවුල්වලට ඉඩ දෙන්න.
- නිවාඩුව ගතකරන මිෂනාරිවරුන්ට හෝ තාවකාලික රැකබලා ගැනීමක් අවශ්‍ය මිෂනාරිවරුන්ගේ දරුවන්ට හෝ නවාතැන් පහසුකම් හෝ ගමනාගමන පහසුකම් සපයන්න.
- මිෂනාරි සේවය ප්‍රචාරය කෙරෙන පෝස්ටර්, එලක හා සංඥා නිවෙස්වල ප්‍රදර්ශනය කරන්න.
- මිෂනාරි සේවය පිළිබඳ පොත් හා සඟරා අඩංගු පුස්තකාලයක් අරඹන්න.
- පවුලේ සාමාජිකයන්ට දිනපතාම මිෂනාරි සේවයට ආධාර සැපයීමට හැකිවන පරිදි විශේෂ කැටයක් හෝ ටින් එකක් නිවසේ තබන්න.
- සෑම පවුලකට ඔබගේ සභාව ආධාර සපයන මිෂනාරිවරුන්ගේ ලිපිනයන් දෙන්න. ඔවුන් සමඟ ලිපි හුවමාරු කරගැනීමට දිරි ගන්වන්න.
- වගකිවයුතු මිෂනාරි ආයතනයක් මඟින්, නිවාඩු කාලයේදී, මිෂනාරි සේවා ස්ථානයකට පවුලම සහභාගි වන පිණිස සංවිධානය කළ හැකිය.
- තම පෙදෙසේ ඉවැන්ජලිස්ත හා මිෂන් සේවා කටයුතුවල නියැලෙන ලෙස තම දරුවන් දිරි ගැන්වීමට දෙමව්පියන්ට පුළුවන.
- පවුලේ නමස්කාරයේදී ඉවැන්ජලිස්ත හා මිෂන් සේවය ගැන අවධාරණය කළ හැකිය.

**සහාය -**

ඔබ සභාවෙන් සහාය දෙන්නාවූ මිෂනාරිවරුන්ගේ සංඛ්‍යාව හා /හෝ සහාය දෙන ප්‍රමාණය වැඩි කරන්න. ඔබගේ සභාවෙන් විවිධ සංස්කෘතිවලට කෙටිකාලීනව මිෂනාරිවරුන් යැවීම ගැන සලකා බලන්න.

**අයවැය ලේඛනය** - ඉවැන්ජලිස්ත හා මිෂන් සේවා සඳහා අය-වැය ලේඛණයෙන් වෙන් කර ඇති මුදල් ප්‍රතිශතය වැඩි කිරීමට සැලසුම් කරන්න. නිදසුනක් ලෙස පහත දැක්වෙන චාට් සටහන සභාවේ සාමාජිකයින් අභියෝග කිරීමට යොදා ගන්න.

> සෑම සාමාජිකයෙක්ම දිනකට රුපියල්................මිෂන් සේවයට දෙන්නේ නම් අපි අවුරුද්දකට (සාමාජිකත්වය ..............× දින 365 අනුව දිනපතා දෙන මුදල) රුපියල්............. මුදලක් දෙන්නෙමු.

නිදසුනක් ලෙස ඇමෙරිකා එක්සත් ජනපදයේ 200 දෙනෙක් සිටින සභාවක, සෑම සාමාජිකයෙක්ම දිනකට ශත 10ක් දුන්නොත් අවුරුද්දකට සභාවට $7300 ඉවැන්ජලිස්ත සේවාවන් සඳහා වැඩිපුර ලැබේ.

ඔබගේ වර්තමාන අය-වැය ලේඛණය පරීක්ෂා කර බලන්න. ඉවැන්ජලිස්ත හා මිෂන් සේවයට වැඩිපුර දීම සඳහා කුමන වියදම් කපා හැරිය හැකිද? දේශීය, ජාතික හා අන්තර්ජාතික මිෂන් සේවය සඳහා ලැබෙන අරමුදල් ප්‍රතිශතය නිර්ණය කරන්න.

**සම්පත් -**

ඉවැන්ජලිස්ත හා මිෂන් සේවයට අවධාරණය කිරීම සඳහා ඔබ සභාවේ සම්පත් නැවත සංවිධානය කරන්න. සෙනඟ, මුදල්, බඩුබාහිරාදිය හා පහසුකම් සම්පත්වලට අයත් වේ. ඉවැන්ජලිස්ත සේවය සඳහා වන ඔබ සැලැස්ම සාක්ෂාත් කර ගැනීමට ඔබගේ සම්පත් වඩාත් ඵලදායිව භාවිත කළ හැක්කේ කෙසේදැයි බලන්න.

## ඉවැන්ජලිස්ත කමිටු රැස්වීම් ක්‍රමවත්ව පවත්වන්න.

ඉවැන්ජලිස්ත කමිටුවේ ක්‍රමානුකූල රැස්වීම් පැවැත්වීම සඳහා න්‍යාය පත්‍රයක් පහත දැක්වේ.

1. ආරම්භක යාච්ඤාව හා ශුද්ධ ලියවිලි කියවීම
2. පළමු රැස්වීමේ වාර්තාව කියවීම (ලේකම් විසින්)
3. මුදල් වාර්තාව
4. ප්‍රාදේශීය වාර්තා ඉදිරිපත් කිරීම
   - දේශීය ඉවැන්ජලිස්ත සේවා සභාපතිගේ වාර්තාව
   - ජාතික ඉවැන්ජලිස්ත සේවා සභාපතිගේ වාර්තාව
   - විදේශ ඉවැන්ජලිස්ත සේවා සභාපතිගේ වාර්තාව
5. විශේෂ වාර්තා
   - අරමුදල් රැස් කිරීම
   - වාර්ෂික මිෂන් සම්මේලනය
   - පුහුණු කිරීම
   - ඉවැන්ජලිස්ත හා මිෂන් සේවය පිළිබඳ විවිධ සභා දෙපාර්තමේන්තුවල වාර්තාවන්
6. විවිධ කරුණු
   - ඉහත කාණ්ඩවලට අයත් නොවූ වෙනත් කරුණු
7. සභාපාලකතුමාගේ අදහස්
8. යාච්ඤා සභාපති මෙහෙයවන ඉවැන්ජලිස්ත හා මිෂන් සේවය සඳහා මැදහත් යාච්ඤා සඳහා කාලය

## සභාවට හා ප්‍රජාවට සන්නිවේදනය කරන්න.

දර්ශනය, ඉලක්ක, සැලසුම් හා ක්‍රියාකාරකම් සභාවට හා ප්‍රජාවට පහත දැක්වෙන ක්‍රම මඟින් සන්නිවේදනය කරන්න.

- මාධ්‍යය මඟින් : ගුවන් විදුලිය, රූපවාහිනී හා පුවත්පත් දැන්වීම්
- පෝස්ටර් හා දැන්වීම් : දේවස්ථානය ඇතුලේ හා පිටත ප්‍රජාව මුළුල්ලේම
- විවිධ ජාතීන්ගේ කොඩි හා බැනර්
- සභා පුස්තකාලයේ පොත් හා ශ්‍රව්‍ය - දෘශ්‍ය ද්‍රව්‍ය

- අත් පත්‍රිකා, කුඩා පොත්, පෝස්ටර් වැනි දේ
- ඉවැන්ජලිස්ත හා මිෂන් සේවය පිළිබඳ පුවත් ඇතුළත් සතිපතා පළවන දැන්වීම්
- සභා සාමාජිකයන්ට යවන පුවත් ලිපි හා විශේෂ ලිපි
- සභාව ආධාර සපයන ඉවැන්ජලිස්ත හා මිෂන් සේවාවල ක්‍රියාකාරකම් පිළිබඳ පින්තූර, ලිපි, රැස්වීම් පිළිබඳ දැන්වීම්, ධර්මදූත සේවයේ උදේ‍යාග පාඨ හා අරමුණු ඇතුළත් දැන්වීම් පුවරු
- සාමාන්‍ය දේව මෙහෙයන්වල කෙරෙන දැන්වීම්
- මිෂනාරි පවුල්වල නම්, ලිපින හා ඡායාරූප, පවුලේ සාමාජිකයන්ගේ නම්, වයස හා උපන් දිනයන්, සේවය කරන තැන පිළිබඳ තොරතුරු හා ඔවුන් කරන සේවය පිළිබඳ කෙටි විස්තරයක් ඇතුලත් පොත් පිංචක්
- සභාව ඉවැන්ජලිස්ත හා මිෂන් සේවයට සහාය දෙන විවිධ රටවල හා ලෝකයේ සිතියම්

## ලෝක කිතුනු බයිබල් අධ්‍යයනයක්

"ලෝක කිතුනු" බයිබල් අධ්‍යයනයන් ඔබට, බයිබලීය ලෝක දැක්ම ඔබගේ ජීවිතයේ හා සේවයේ කේන්ද්‍රස්ථානය කර ගැනීමට උපකාරී කෙරේ. එමෙන්ම ඒවා මේ දර්ශනය අන් අය සමඟ බෙදා ගැනීමටද උපකාර කරනු ඇත. එවැනි අධ්‍යයනයක් නිර්මාණය කර ගැනීමට යෝජනා කීපයක් පහත දැක්වේ.

## බයිබල් පද අධ්‍යයනය

මෙම පාඨමාලාවේ 4,5,හා 6 පරිච්ඡේද, බයිබලීය ලෝක දැක්මට හා දේව වචනය තුළ ලෝකය යන විෂයට විශේෂ යොමු කිරීම් ලබාගැනීමට යොදා ගන්න. ඔබගේ පෞද්ගලික දේව වචනය අධ්‍යයනයේදී දෙවියන්වහන්සේගේ ලෝක පරමාර්ථයන් පෙන්වන පදවල මෙම ප්‍රධාන වචන ඇත්දැයි බලන්න.

ජාතීන් - විදේශීන් - මිථ්‍යා දෘෂ්ටීන් - සෙනඟ - ලෝකය - රට -

ඔබ බයිබල් කොටස් අධ්‍යයනය කරන විට මෙම ප්‍රශ්න අසන්න:

- ලෝකයේ ජාතීන් පිළිබඳ දෙවියන්වහන්සේගේ හැඟීම ගැන එම කොටස එළිදරව් කරන්නේ කුමක්ද?
- ලෝකය පිළිබඳව එම කොටස එළිදරව් කරන්නේ කුමක්ද?
- සියලු ජාතීන්ගේ මිනිසුන් සමඟ දෙවියන්වහන්සේගේ අන්තර් ක්‍රියා පිළිබඳව එම කොටස එළිදරව් කරන්නේ කුමක්ද?
- මෙම කොටසින් එළිදරව් වන පරිදි ලෝකයට දෙන දෙවියන්වහන්සේගේ පණිවුඩය කුමක්ද?
- ලෝකයට, ඉශ්‍රායෙලයට, සභාවට හා ඇදහිලිවන්තයාට ඇති දෙවියන්වහන්සේගේ පරමාර්ථය පිළිබඳව මෙම කොටසින් එළිදරව් වන්නේ කුමක්ද?
- මෙම කොටසේ සඳහන් කිනම් ප්‍රධාන වචන ලෝකය කෙරෙහි අවධානය යොමු කරන්නේද? නිදසුනක් ලෙස ජොහන් 3:16 හි සඳහන් "ලෝකයා" යන වචනය එවැනි ප්‍රධාන වචනයකට නිදසුනකි. දෙවියන්වහන්සේගේ ප්‍රේමය සුවිශේෂීව අවධාරණය වන්නේ "ලෝකයා" වෙතය. සියලු මනුෂ්‍යයාගේ පාපය වෙනුවෙන් මිය යෑමට උන්වහන්සේ ජේසුස්වහන්සේ එවන ලද්දේ ඒ නිසාය.
- ශුභාරංචිය ලෝකයා වෙත ගෙන යෑම හා සම්බන්ධව ඇදහිලිවතුන්ගෙන් විශේෂ ප්‍රතිචාරයක් මෙම කොටසින් බලාපොරොත්තු වේද? අපි කුමන ක්‍රියාවක් කළ යුතු වෙමුද?

## චරිත අධ්‍යයනයන්

ලෝකයා කෙරෙහි ඇති දෙවියන්වහන්සේගේ සැලැස්මෙහි ඔවුන්ගේ භූමිකාව පදනම් කරගෙන ප්‍රධාන බයිබලීය චරිත අධ්‍යයනය කරන්න. ඔබ බයිබලයේ පුද්ගලයෙකු ගැන අධ්‍යයනය කරන විට මෙම ප්‍රශ්න අසන්න.

- දෙවියන්වහන්සේ ඔහු පත් කළේ කුමන සුවිශේෂී කාර්යය සඳහාද?

- ලෝකයා සඳහා දෙවියන්වහන්සේගේ පරමාර්ථ සාක්ෂාත් කර ගැනීමට මෙම කාර්යය උපකාරී වන්නේ කෙසේද?
- දෙවියන්වහන්සේගේ පණිවුඩකරුවෙකු ලෙස ඔවුන්ගේ භූමිකාව සාක්ෂාත් කර ගැනීමට දායක වූ හෝ වැළැක්වූ හෝ ඔහුගේ පෞද්ගලික ගති ලක්ෂණ මොනවාද? (අටවන පරිච්ඡේදයේ "තවදුරටත් අධ්‍යයනය" සඳහා කොටසෙහි ආබ්‍රහම් පිළිබඳ අධ්‍යයනයේදී පෞද්ගලික ගති ලක්ෂණ අධ්‍යයනය කිරීමට නිදසුනක් සපයයි.)
- මෙම පුද්ගලයා දෙවියන්වහන්සේ ඔහු පත් කළ කාර්යය සාර්ථක කර ගත්තේ කෙසේද?
- ඔවුන් සාර්ථක වීමට හේතුව කුමක්ද?
- ඔවුන් අසාර්ථක වූයේ කෙසේද? අසාර්ථක වීමට හේතුව කුමක්ද? මේ අසාර්ථක වීම් වළක්වා ගැනීමට කුමක් කළ යුතු වීද?
- දෙවියන්වහන්සේගේ සැලැස්මේ ඔබගේ භූමිකාව සම්පූර්ණ කිරීමට ඔබට උපකාරී වන ඔවුන්ගේ අත්දැකීම්වලින් ඔබට උගත හැක්කේ කුමක්ද?

## පොත් අධ්‍යයනය

බයිබලීය ලෝක දැක්ම සිත්හි තබාගෙන බයිබලයේ සම්පූර්ණ පොතක් අධ්‍යයනය කරන්න. මෙම පාඩමාලාවෙන් ඔබ දුටු පරිදි බයිබලයේ සෑම පොතකින්ම ලෝකයේ ජාතීන් වෙනුවෙන් ඇති දෙවියන්වහන්සේගේ සැලැස්ම පිළිබඳ සත්‍යයන් ප්‍රකාශ කෙරේ. ඔබ සුවිශේෂී පොතක් අධ්‍යයනය කරනවිට මෙම ප්‍රශ්න ඔබගෙන්ම අසන්න.

- දෙවියන්වහන්සේගේ ලෝකය සදහා පරමාර්ථය පදනම් කරගත් විට මෙම පොතේ පරමාර්ථය කුමක්ද? මෙම පොතේ සඳහන් සිද්ධීන් උන්වහන්සේගේ සැලැස්මට හා පරමාර්ථයට සම්බන්ධ වන්නේ කෙසේද?
- මෙම පොතේ ප්‍රධාන චරිත මොනවාද? දෙවියන්වහන්සේගේ සැලැස්මේ ඔවුන්ගේ කොටස හා සම්බන්ධ චරිත අධ්‍යයනය කරන්න (චරිත අධ්‍යයනය සඳහා කලින් දී ඇති උපදෙස් පිළි පදින්න)
- ලෝකයත් දෙවියන්වහන්සේගේ සැලැස්මත් පරමාර්ථයත් ගැන කතා කරන විට මෙම පොතේ සඳහන් සුවිශේෂී පද මොනවාද?
- දෙවියන්වහන්සේගේ ලෝකය සදහා පරමාර්ථය මත මෙම පොත ඔබට පෞද්ගලිකව දෙන අභියෝග මොනවාද? ඔබ මෙම පොතෙන් ඉගෙන ගත් දේට ප්‍රතිචාර දක්වන්නේ කෙසේද?

# එකොළොස්වන පරිච්ඡේදය

## එවිට අවසානය එනු ඇත.

**අරමුණ**

මෙම පරිච්ඡේදය අධ්‍යයනයෙන් ඔබට

- ❖ ප්‍රධාන පදය මතකයෙන් ලිවීමට
- ❖ ලෝකාන්තිමය හා දෙවියන්වහන්සේගේ සැලැස්මේ උච්චතම අවස්ථාවට පෙර ප්‍රධාන සිදුවීම් පැහැදිලි කිරීමට
- ❖ ලෝකාන්තිමය විස්තර කෙරෙන ශුද්ධ ලියවිලි යොමුවන් සැපයීමට
- ❖ ලෝකාන්තිමය හා ජාතීන් වෙනුවෙන් ඇති දෙවියන්වහන්සේගේ සැලැස්මේ උච්චතම අවස්ථාව පැමිණීමට තුඩු දෙන සිද්ධීන් සාරාංශ කිරීමට

හැකිවනු ඇත.

### ප්‍රධාන පදය

**රාජ්‍යයේ මේ ශුභාරංචිය සියලු ජාතීන්ට සාක්ෂියක් පිණිස ලොව මුළුල්ලේ ප්‍රකාශ කරනු ලබන්නේය. එවිට අන්තිමය පැමිණෙන්නේය. (මතෙව් 24:14)**

### හැඳින්වීම

මෙම පාඩමාලාවේ පළමුවන පරිච්ඡේදයෙන් ලෝකයේ පටන්ගැන්ම විස්තර කෙරිණි. එතැන් සිට, ඉතිහාසය මුළුල්ලේම පැරණි හා නව ගිවිසුම් යුගයේ සිට සභා යුගය තුළින් හා මේ යුගය දක්වා දෙවියන්වහන්සේගේ සැලැස්ම වර්ධනය වූ අයුරු, ඔබ අධ්‍යයනය කළෙහිය.

එහෙත් ලෝකයේ අනාගතය ගැන බයිබලය උගන්වන්නේ කුමක්ද? ජේසුස්වහන්සේ ලෝකාන්තිමය ගැන කතා කළ සේක. ඉන් අදහස් වන්නේ කුමක්ද? මෙම ප්‍රශ්නවලට පිළිතුරු එනම් ලෝකාන්තිමය හා සියලු මනුෂ්‍ය වර්ගයා වෙනුවෙන් ඇති දෙවියන්වහන්සේගේ සැලැස්ම ගැන මෙම පරිච්ඡේදයෙන් සාකච්ඡා කරන විට ඔබට ලැබෙනු ඇත.

### ප්‍රධාන සිද්ධියක්

ජේසුස්වහන්සේ තම අනුගාමිකයන්ට මෙසේ පොරොන්දු වූ සේක:

**මම ගොස් නුඹලාට ස්ථානයක් පිළියෙළකරමි නම්, මා සිටින තැන නුඹලාත් සිටින පිණිස මම නැවත ඇවිත් නුඹලා මා ළඟට ගන්නෙමි. (යොහන් 14:3)**

නැවත උත්පාදනය ලැබූ එනම් ඇදහිලිවතුන් වෙනුවෙන් හා ඔවුන්ට උන්වහන්සේ සූදානම් කළ විශේෂ තැනකට කැඳවාගෙන යෑමට නැවත ලෝකයට එන බව ජේසුස්වහන්සේ වදාළ සේක. මෙය කවදා සිදුවේද? දෙවියන්වහන්සේ හැර නියමිත වේලාව වෙන කිසිවෙක් නොදනී.

**නුමුත් ඒ දවස හා පැය මාගේ පියාණන්වහන්සේ මිස දන්නා කෙනෙක් නැත. ස්වර්ගයෙහි දේවදූතයන්වත් පුත්‍රයාවත් දන්නේ නැත. (මතෙව් 24:36)**

හරියටම වේලාව අපි නොදනිමු. එහෙත් ඒ වේලාව ආසන්න බව උන්වහන්සේගේ අනුගාමිකයන්ට දැනගත හැකිවීම පිණිස සිදුවන ප්‍රධාන සිද්ධියක් උන්වහන්සේ පැවසූ සේක.

**රාජ්‍යයේ මේ ශුභාරංචිය සියලු ජාතීන්ට සාක්ෂියක් පිණිස ලොව මුළුල්ලේ ප්‍රකාශ කරනු ලබන්නේය. එවිට අන්තිමය පැමිණෙන්නේය. (මතෙව් 24:14)**

ලෝකාන්තිමය හා දෙවියන්වහන්සේගේ සැලැස්මෙහි උච්ච ස්ථානය වෙත ළඟාවීමට පෙර සිදුවන ප්‍රධාන සිද්ධිය වන්නේ දේව රාජ්‍යය පිළිබඳ ශුභාරංචිය සියලු සෙනඟට ප්‍රකාශ කිරීම වේ. දෙවියන්වහන්සේගේ සැලැස්ම සාක්ෂාත් කිරීම සඳහා අපට ඇති වගකීම කෙතරම් මහත්ද?

මෙම අභියෝගය සාක්ෂාත් කිරීම වෙනුවෙන් ඔබට ඇති පෞද්ගලික වගකීමත්, සභාවේ කාර්යයත් ගැන ඔබ මෙම පාඩමාලාවෙන් උගත්තෙහිය. එමෙන්ම ඔබ ප්‍රකාශ කළ යුතු පණිවුඩය, එනම් "දේව රාජ්‍යය පිළිබඳ ශුභාරංචිය" ගැනද ඔබ උගත්තෙහිය. එහෙත් ජේසුස්වහන්සේ කතා කළ "අවසානය" කුමක්ද? අප දැන් දන්නා පරිදි අවසානය යනු ලෝකයේ හා කාලයේ උච්චතම අවස්ථාව වේ. එය ජාතීන් වෙනුවෙන් ඇති දෙවියන්වහන්සේගේ සැලැස්මේ අවසාන කොටසය.

## අනාගතය හෙළි කරන වාර්තාව

ලෝකය අවසාන වන ආකාරය පිළිබඳව සියලු විස්තර දෙවියන්වහන්සේ එළිදරව් කළේ නැත. එහෙත් අනාවැකි මඟින් ප්‍රධාන සිදුවීම් ගැන සංක්ෂිප්තයක් උන්වහන්සේ දුන් සේක. "අනාවැකි" යන්නෙහි තේරුම "ඉදිරිය ගැන කතා කිරීම" වැන්නකි. බයිබලයේ ඇති අනාවැකිවල "ඉදිරිය ගැන කතා කිරීම්" තෙආකාර වේ.

1. දෙවියන්වහන්සේගෙන්ම පොලඹවන ලද පණිවිඩයක්
2. දෙවියන්වහන්සේගේ සදාතනික සැලැස්මේ අනාගත සිදුවීම් පිළිබඳ අනාවැකි
3. දෙවියන්වහන්සේගේ ක්‍රියාවන් පිළිබඳ මිනිසාට දෙනු ලබන අර්ථ නිරූපණයන්

ලෝකයේ අනාගතය පිළිබඳ ප්‍රධාන අනාවැකි දානියෙල් හා එළිදරව්ව පොත්වල ඇත. මතෙව් 24 හා 1 තෙසලෝනික 4:13-18 වැනි පාඨවලින් අතිරේක තොරතුරු සපයේ. මෙම පාඨ අධ්‍යයනය කිරීමෙන් ලෝකාන්තිමය ගැන දෙවියන්වහන්සේ එළිදරව් කර ඇති දේ අපට දැනගත හැකිය.

## එළිදරව් කර ඇති දේ

ලෝකාන්තිමය ගැන දෙවියන්වහන්සේ ස්වකීය වචනයෙන් එළිදරව් කර ඇති දේ පිළිබඳව කෙටි සාරාංශයක් පහත දැක්වේ.

### දේව රාජ්‍යය පිළිබඳ ශුභාරංචිය දේශනා කිරීම

අවසානය පැමිණීමට පෙර මෙය ඉටු කළ යුතුය. (මතෙව් 24:14)

### ඔසවා ගැනීම:

සියලු දෙනාටම දේවරාජ්‍යය පිළිබඳ ශුභාරංචිය දේශනා කළ පසු, ජේසුස්වහන්සේ ඇදහිලිවතුන් වෙනුවෙන් නැවත පැමිණෙනු ඇත. "ඔසවා ගැනීම" ලෙස හැඳින්වෙන මෙම නැවත පැමිණීම පිළිබඳ පැහැදිලි විස්තරයක් 1 තෙසලෝනික 4:13-18න් දී ඇත. මෙම කොටසින් අප උගත් දේ මෙසේ වේ:

- ජේසුස්වහන්සේම නැවත පැමිණෙනු ඇත. (16 පදය)
- මිය යනවිට ඇදහිලිවතුන් ලෙස සිටි අය උත්ථානය කෙරෙනු ඇත. (16 පදය)
- ඔසවා ගැනීමක් සිදුවනු ඇත. ඉන් අදහස් වන්නේ "යම් කෙනෙකු එක් තැනක සිට තවත් තැනකට ගෙන යෑම" වේ.
- ජීවතුන් අතර සිටින ඇදහිලිවතුන් පොළොවේ සිට, ජේසුස්වහන්සේ හමු වීමට අහසට ගෙන යනු ඇත. (17 පදය)
- කලින් මියගිය ඇදහිලිවතුන්ද, ස්වාමීන්වහන්සේගේ ආගමනයේ දී ජීවත්ව සිටින ඇදහිලිවතුන් ද ස්වාමිවූ ජේසුස් ක්‍රිස්තුස්වහන්සේ ද අතර නැවත එක්වීමක් සිදුවනු ඇත.

ඇතැමුන් විශ්වාස කරන්නේ ඔසවා ගැනීම සිදුවන්නේ පීඩා සමයට පෙර බව හා ඇදහිලිවතුන්ට මෙම අසීරු කාලය ගත කිරීමට සිදු නොවන බවය. අනෙක් අය විශ්වාස කරන්නේ ඔසවාගැනීම අතරමැද සිදුවන බවය. තවත් අය සිතන්නේ ඔසවා ගැනීම සිදුවන්නේ පීඩා සමය අවසානයේ බවය. පොදු මතය වන්නේ ඇදහිලිවතුන්ගේ ඔසවා ගැනීම පීඩා සමය ආරම්භ වීමට පෙර සිදුවන බව වේ. ඔසවා ගන්නා අවස්ථාව ගැන විවිධ මත තිබීමට හේතුව ශුද්ධ ලියවිල්ල පිළිබඳ විවිධ අර්ථ නිරූපණ තිබීම වේ. මෙය සිදුවන නිශ්චිත වේලාව පියවූ දෙවියන්වහන්සේ හැර වෙන කිසිවෙකු නොදනී (මතෙව් 24:36). අප දැනගත යුතු වැදගත්ම දෙය වන්නේ ඔබ සැබෑ ඇදහිලිවන්තයෙකු බව හා ඔසවා ගැනීම සිදුවන අවස්ථාවේ ජේසුස්වහන්සේ සමඟ ඔසවා ගනු ලැබීමට සූදානම්ව සිටීම වේ.

**පීඩා සමය**

ජේසුස්වහන්සේගේ ආගමනය දැකීමට ඇතැම් අය අකමැති වනු ඇත.

> **බලන්න, උන්වහන්සේ වළාකුල්වලින් එන සේක, සියලු ඇස්ද උන්වහන්සේට ඇන්න අයද උන්වහන්සේ දකින්නෝය. පොළොවේ සියලු ගෝත්‍රද උන්වහන්සේ නිසා වැලපෙන්නෝය. එසේය, ආමෙන්. (එළිදරව් 1:7)**

ඔවුන්ගේ කනගාටුවට හේතුව ඔවුන් ජේසුස්වහන්සේ පිළි නොගැනීම වේ. ඔවුහු උන්වහන්සේ ප්‍රතික්ෂේප කර තම පාපී ජීවිතයම ගත කළහ. දැන් ඔවුහු පොළොවේ මහත් දුක් විඳීමේ කාලයක් ගත කරති. "පීඩා සමය" ලෙස හැඳින්වෙන මෙම අසීරු අවස්ථාව ගැන බයිබලයේ සඳහන් වේ. එය සිදුවන්නේ ඇදහිලිවතුන් ජේසුස්වහන්සේ සමඟ සිටීම සඳහා ඔසවා ගනු ලැබීමෙන් පසුව වේ.

- පීඩා සමය මාස 42ක් හෙවත් දින 1260ක් පවතිනු ඇත. (දානියෙල් 9:24-27)
- මෙය ඉතා අසීරු කාලයක් වනු ඇත. ලෝකයේ අසීරු අවස්ථා බොහොමයක් තිබී ඇත. එහෙත් පීඩා සමය අනෙකුත් සියලු අසීරු අවස්ථාවන්ට වඩා කරුණු තුනකින් වෙනස් වේ.

පළමුව : එය මුළු ලොව පුරාම පැවතෙන අතර ප්‍රදේශයකට පමණක් සීමා නොවේ. (එළිදරව් 3:10)
දෙවනුව: ලෝකාන්තිමය ආසන්න බව සෙනඟ දැනගනු ඇත. (එළිදරව් 6:16)
තෙවනුව: කරදරවල තීව්‍රතාවය මීට පෙර අත්දැක ඇති සියල්ලට වඩා වැඩිවේ. (මතෙව් 24:4-14)

පීඩා සමයේදී පොළොවේ දෙවියන්වහන්සේගේ විනිශ්චයන් මාලාවක් පවතිනු ඇත. මේවා එළිදරව් පොතේ පරිච්ඡේද 6, 8, 9 හා 16ත්, මතෙව් 24:4-14ත් විස්තර කර තිබේ. ජේසුස් ක්‍රිස්තුස්වහන්සේ ප්‍රතික්ෂේප කළ සියලු දෙනා වෙත විනිශ්චය පැමිණෙනු ඇත.

**සහස්‍රය**
පීඩා සමයෙන් පසු අවුරුදු 1000ක් ජේසුස්වහන්සේ ධර්මිෂ්ඨකමින් ලොව පාලනය කරන යුගයක් පිළිබඳව බයිබලයේ සඳහන් වේ (සෙකරියා 14:9, දානියෙල් 7:14). රජයේ කේන්ද්‍රස්ථානය වන්නේ ජෙරුසලම් නගරය වේ (යෙසායා 2:3). සාතන් දෙවියන්වහන්සේට විරුද්ධව අවසාන කැරැල්ල දියත් කිරීමෙන් මෙම යුගය අවසන් වේ (එළිදරව් 20:7-9). දෙවියන්වහන්සේ ස්වර්ගයෙන් ගින්දර එවා සියලු විරුද්ධවාදීන් නිම කරනු ඇත. සාතන්, සදාතනිකවම ගිනි විලට හෙළනු ලබන්නේය. (එළිදරව් 20:10)

**විනිශ්චය**
නොඇදහිලිවතුන් ලෙස මියගිය අය විනිශ්චයට මුහුණ දීම සඳහා මරණයෙන් නැගිටවනු ලබන්නේය. ඔවුන් පාපය වෙනුවෙන් පසුතැවිලි වී ගැළවුම්කරු ලෙස ජේසුස්වහන්සේ පිළිනොගත් නිසා සදාතනික නිරයට හෙළනු ලබනු ඇත (එළිදරව් 20:12-15). පාපය වෙනුවෙන් පසුතැවිලි වී ගැලවුම්කරු ලෙස ජේසුස්වහන්සේ පිළිගත් සැබෑ ඇදහිලිවන්තයන් සදාතනය, දෙවියන්වහන්සේගේ අභිමුවෙහි ගත කරනු ඇත (එළිදරව් 21).

**ලෝකයා විනාශ වේ.**
ලෝකය බලවත් රස්නයකින් විනාශ වන බව බයිබලයේ සඳහන් වේ.

**“එහෙත් සොරෙකුමෙන් ස්වාමින්වහන්සේගේ දවස පැමිණෙන්නේය. ඒ දවසේදී අහස මහත් ඝෝෂාවකින් පහව යන්නේය. මහා භූතයෝද තද උෂ්ණයෙන් නාස්ති වී යන්නෝය. පොළොව ද එහි තිබෙන කර්මාන්ත ද දාලා යන්නෝය. (2 පේතෘස් 3:10)**

කාලය දැන් අප මනින ආකාරයට තව දුරටත් ගන්නේ නැත. ආරම්භයක් හෝ අවසානයක් හෝ නොමැති සදාතනයට අප ඇතුළු වනු ඇත.

**මුහුද පිටත් ගොඩබිමෙහිත් සිටිනවා මා විසින් දුටුවාවූ දේවදූතයා ස්වර්ගය දෙසට තමාගේ දකුණත ඔසවා සදාකාලේටම ජීවත් වන්නාවූ, ස්වර්ගයත් එහි තිබෙන දේත්, පොළොවත් එහි තිබෙන දේත් මුහුදත් එහි තිබෙන දේත් මැවුවාවූ තැනැන්වහන්සේ ගැන දිවුරනුයේ, තවත් කල් නැත කියාද.... (එළිදරව් 10:5-6)**

## දෙවියන්වහන්සේගේ පරමාර්ථය සාක්ෂාත් වේ.

ඔබ පෙර අධ්‍යයනය කළ දෙවියන්වහන්සේගේ පරමාර්ථය අධ්‍යයනය කර ගන්න.

**එසේ කලේ කාලවල සම්පූර්ණකමේ නියමය ලෙස ස්වර්ගයෙහි දේවල්ද පොළොවෙහි දේවල්ද යන සියල්ල ක්‍රිස්තුස්වහන්සේ තුළ එක්රාශි කරන්ට තමන්වහන්සේ තුළ අදහස් කළ තමන්ගේ ප්‍රසන්නකමේ හැටියට තමන්ගේ කැමැත්තේ රහස අපට දන්වා දීමෙන්ය. (එපීස 1:9-10)**

අන්තිමේදී දෙවියන්වහන්සේගේ විශේෂ සැලැස්ම සම්පූර්ණ කෙරේ.

**සත්වෙනි දේවදූතයාද පිම්බේය: එවිට: ලෝකයේ අධිපතිකම අපගේ ස්වාමින්වහන්සේටද තමන් ක්‍රිස්තුස්වහන්සේටද වූයේය. උන්වහන්සේ සදාකාලේටම රජකම් කරන සේක යයි කියන මහත් ශබ්ද ස්වර්ගයෙහි විය. (එළිදරව් 11:15)**

**තවද ස්වර්ගයෙහිත් පොළොවෙහිත් පොළොවෙන් යට සහ මුහුද පිටත් ඇත්තාවූ සියලු මැවිලි වන එහි ඇති සියල්ලෝ: සිංහාසනයෙහි වැඩ ඉන්න තැනැන්වහන්සේටත් බැටළුපැටවාණන්ටත් ප්‍රශංසාවද ගෞරවයද මහිමයද පරාක්‍රමයද සදාකාලේටම වේවයි කියනවා ඇසීමි. (එළිදරව් 5:13)**

**සිංහාසනය ඉදිරිපිට**
දෙවියන්වහන්සේ අලුත් අහසක් හා අලුත් පොළොවක් මවන සේක. මේ පිළිබඳ විස්තර එළිදරව් 21 හා 22 පරිච්ඡේදවලින් දී ඇත. එකම සැබෑ දෙවියන්වහන්සේ සමඟ සියලු ජාතීන්ගේ ඇදහිලිවතුන් එක්රැස් වනු ඇත.

**ඉන්පසු සියලු ජාතීන්ගෙනුත් ගෝත්‍රවලිනුත් සෙනඟගෙනුත් භාෂාවන්ගෙනුත් කිසිවෙකුට ගණන් කළ නොහැකි මහත් සමූහයක් සුදු සළු පැළඳ, තමුන්ගේ අත්වල තාලපත්‍ර ඇතුව, සිංහාසනය ඉදිරියෙත් බැටළුපැටවාණන් ඉදිරියෙහිත් සිටිනවා දුටිමි: ඔවුහු සිංහාසනයෙහි වැඩ හිඳින අපේ දෙවියන්වහන්සේටත් බැටළුපැටවාණන්ටත් ගැළවීම අයිතිය කියා මහත් ශබ්දයකින් හඬ ගැසුවෝය. සියලු දේවදූතයෝ සිංහාසනයද වැඩිමහල්ලන්ද ජීවමාන සත්ත්වයන් සතර දෙනාද වටකර සිට, සිංහාසනය ඉදිරියෙහි මුහුණින් වැටී, දෙවියන්වහන්සේට නමස්කාර කරමින්: ආමෙන්, ප්‍රශංසාවද තේජසද ප්‍රඥාවද ස්තුතියද ගෞරවයද බලයද පරාක්‍රමයද සදාකාලේටම අපේ දෙවියන්වහන්සේට වේවා. ආමෙන් යයි කීවෝය. (එළිදරව් 7:9-12)**

සියලු ජාතීන්ගේ .... සියලු ගෝත්‍රවල හා භාෂා කතා කරන .... සියලු සෙනඟ කණ්ඩායම්වල පිරිමි හා ගැහැනු සිංහාසනය ඉදිරියේ රැස්වන්නාහ. එහෙත් ස්වර්ගයෙහි මේ මහත් ප්‍රීතිවීමේ පූර්ව දර්ශනය නිසා:
**“ස්වාමින්වහන්සේගේ නාමයට යාච්ඤා කරන කවුරු නමුත් ගළවනු ලබන්නේය.” (රෝම 10:13)** යන අභියෝගය අමතක නොකරමු.

එහෙත්

**එසේ නම් ඔවුන් තමුන් විසින් අදහා නොගත්තාවූ කෙනෙකුට යාච්ඤා කරන්නේ කොහොමද? තමුන් නොඇසුවාවූ කෙනෙකු කෙරෙහි අදහන්නේ කොහොමද? දේශනාකරන්නෙක් නැතුව ඔවුන් අසන්නේ කොහොමද? (සමහරු) යවනු ලැබුවොත් මිස දේශනා කරන්නේ කොහොමද? මේ සම්බන්ධව යහපත් දේ ගැන ශුභාරංචි ගෙනෙන්නාවූ තැනැත්තන්ගේ පාද කොපමණ අලංකාරද කියා ලියා තිබේ. (රෝම 10:14-15)**

ඔබ බයිබලීය ලෝක දැක්ම අධ්‍යයනය කළෙහිය. ඔබ දෙවියන්වහන්සේගේ ඇස් තුළින් ලෝකය දෙස බැලුවෙහිය.

දැන් .... මේ මහා අභියෝගයට ඔබගේ **පෞද්ගලික** ප්‍රතිචාරය කුමක්ද?

## ස්වයං පරීක්ෂණය

1. ප්‍රධාන පදය මතකයෙන් ලියන්න.

2. ලෝකාන්තිමයට පෙර සිදුවිය යුතු ප්‍රධාන සිදුවීම කුමක්ද?

3. ලෝකාන්තිමය ගැන හා ජාතීන් සඳහා දෙවියන්වහන්සේගේ සැලැස්මෙහි උච්චතම ස්ථානය පිළිබඳව තොරතුරු වැඩියෙන්ම සපයන බයිබලයේ පොත් දෙක කුමක්ද?

සහ

4. "ඔසවා ගැනීම" පිළිබඳව විස්තරාත්මක තොරතුරු සපයා ඇත්තේ කොහේද?

5. අලුත් අහස හා අලුත් පොළොව ගැන වඩාත් තොරතුරු සපයා ඇත්තේ කොහේද?

6. අහස හා පොළොව විනාශ කෙරෙන ආකාරය විස්තර කරන පදය කුමක්ද?

7. ලෝකාන්තිමය හා ජාතීන් වෙනුවෙන් ඇති දෙවියන්වහන්සේගේ සැලැස්ම උච්චස්ථානය වෙත ගෙන එන සිද්ධීන් සාරාංශ කරන්න.

(මෙම ප්‍රශ්නවලට පිළිතුරු මෙම අත්පොතේ අවසාන පරිච්ඡේදය අවසානයේ ඇත.)

## තවදුරටත් අධ්‍යයනය සඳහා

1. ලෝකාන්තිමය ගැන දෙවියන්වහන්සේ එළිදරව් කර ඇති දෙය තව තවත් අධ්‍යයනය කරන්න.
    - දානියෙල් හා එළිදරව්ව පොත් අධ්‍යයනය කරන්න.
    - මතෙව් 24 අධ්‍යයනය කරන්න.
    - 1 තෙසලෝනික 4:13-18 හා 2 පේතෘස් 3:10 අධ්‍යයනය කරන්න.

2. එළිදරව් පොතේ සඳහන් වන්නේ ලෝකාන්තිමය ගැන හා ජාතීන් වෙනුවෙන් දෙවියන්වහන්සේගේ සැලැස්මේ උච්චතම අවස්ථාව ගැනය. පෙර පාඩම්වලින් ඔබ උගත්තේ, එළිදරව්ව පොත හැර අනෙකුත් බයිබලයේ පොත් සියල්ලෙන්ම "දේව වචනය තුළ ලෝකය" පිළිබඳවය.

    මේ විෂය පිළිබඳ අවසාන සඳහන ඇත්තේ එළිදරව්ව පොතේ වේ. පහත දැක්වෙන පද, ලෝකයේ ජාතීන් වෙත බයිබලයේ සඳහන් අවසන් විශේෂ යොමු කිරීම් වේ.

    1. පොළොවේ රජවරුන්ගේ කුමාරයා ජේසුස්වහන්සේ වේ. 1:5
    2. මෙලොවට ජේසුස්වහන්සේගේ පැමිණීම: 1:7
    3. සියලු ජාතීන්ගේ ඇදහිලිවතුන්ට දී ඇති පොරොන්දු 2:26, 3:10
    4. අන්තිම දේශනාවන් හා පොළොවේ අස්වැන්න කපා ගැනීම :14:6-7,15-19
    5. ලෝකයේ අවසානය : 10:5-6, 11:15, 13:8, 17:8
    6. අලුත් අහස හා පොළොව ද හා එහි සිදුවන සිදුවීම් විස්තර කිරීම. 5:9-10,13, 7:9-11, 15:4, 21 හා 22 පරිච්ඡේද (විශේෂයෙන් ජාතීන් ගැන යොමුවන් 21:24,26: 22:2)

# ස්වයං පරීක්ෂණ සඳහා පිළිතුරු

## පළමු පරිච්ඡේදය

1. ආරම්භයේදී දෙවියන්වහන්සේ අහසත් පොළොවත් මැවූ සේක. (උත්පත්ති 1:1)

2. ශුද්ධ බයිබලයෙන් එළිදරව් කර ඇති එකම සැබෑ දෙවියන්වහන්සේ.

3. මැවීම පිළිබඳව වෙනස් කතා සඳහා හේතු දෙකක් වන්නේ මැවිල්ල පිළිබඳ සැබෑ කරුණු දැන ගැනීමට මිනිසුන්ට අවස්ථාවක් නොතිබීම හා මැවිල්ල පිළිබඳ සත්‍ය කථාව දැනගත් විට එය විශ්වාස කිරීමට තීරණය නොකිරීම.

4. ඇතැම් අය මැවිල්ල පිළිබඳ සත්‍ය කරුණු පිළිනොගන්නේ, එසේ කළහොත් ඔවුන් දෙවියන්වහන්සේ සිටින බව පිළිගත යුතු නිසාය. දෙවි කෙනෙක් සිටින බව ඔවුන් පිළිගතහොත්, එවිට උන්වහන්සේගේ සර්වබලධාරී පාලනය පිළිගත යුතුය. එමෙන්ම උන්වහන්සේගේ වචනය ද පිළිගත යුතු අතර ඔවුන්ගේ දුෂ්ට ජීවිත ශෛලය පිළිබඳව යමක් කළ යුතුය. තම ජීවිත ශෛලය වෙනස් කිරීමට මිනිසුන් අකමැති නිසා ඔවුහු මැවීම පිළිබඳ බයිබලීය විස්තරය හා දෙවියන්වහන්සේගේ පැවැත්ම ප්‍රතික්ෂේප කරති.

5. බයිබලීය ලෝක දෘෂ්ටියක් සැකසීම පිළිබඳව අප කතා කරන විට ඉන් අදහස් වන්නේ අප ලෝකය පිළිබඳව අපගේ අවබෝධය පදනම් කරගන්නේ දෙවියන්වහන්සේ තම ලිඛිත වචනයෙන්, එනම් බයිබලයෙන්, එළිදරව් කළ දේ මතය.

6. දෙවියන්වහන්සේගේ මැවීමේ ක්‍රියාවන් පිළිබඳ සාරාංශයක් සඳහා පළමු පරිච්ඡේදයේ සපයා ඇති ලැයිස්තුව බලන්න.

7. දෙවියන්වහන්සේ විසින් මවන ලද අන් සියලු සත්ත්වයන්ට වඩා මිනිසා වෙනස් වන්නේ ඔහු දෙවියන්වහන්සේගේ ස්වරූපයෙන් මවා ඇති නිසා හා සදාතනික ප්‍රාණයක් හා ආත්මයක් ඇති නිසාය. ඔහුට දෙවියන්වහන්සේ සමඟ සන්නිවේදනය කිරීමට හා සබඳතාවක් ඇති කර ගැනීමට හැකියාවක් ද ඇත.

8. පළමු පරිච්ඡේදයේ සපයා ඇති "මිනිසාගේ වැටීම" පිළිබඳ සාරාංශය බලන්න.

9. පළමු පරිච්ඡේදයේ සපයා ඇති "මිනිසාගේ වැටීමේ" ප්‍රතිඵල බලන්න.

10. උත්පත්ති 3:15

11. ස්වාභාවික ලෝකය හා ආත්මික ලෝකය

## දෙවන පරිච්ඡේදය

1. ස්වාමීන්වහන්සේද: බලව ඔව්හු එක සෙනඟක්ය, ඔවුන් සියල්ලන්ට ඇත්තේ එක භාෂාවක්ය, ඔවුන් කරන්ට පටන් ගන්නා දේ මේය. ඉඳින් ඔවුන් කරන්ට අදහස් කරන කිසිවක් ඔවුන්ට කරන්ට දුෂ්කර නොවන්නේය. යමු, අපි බැස ඔවුන්ට එකිනෙකාගේ කතාව නොතේරෙන ලෙස එහි ඔවුන්ගේ භාෂාව අවුල් කරමුයයි කී සේක. (උත්පත්ති 11:6-7)

2. බාබෙල් කොත අසලදී ලෝකයා විවිධ භාෂා කණ්ඩායම්වලට බෙදන ලදී.

3. මිනිස්සු තමාට කතා කළ හැකි අය සමඟ එකට එක්වූහ. එකම භාෂාව කතා කරන අයගේ කණ්ඩායම් හෝ ගෝත්‍ර ඔවුන් පිහිටුවා ගත්හ. මෙහි ප්‍රතිඵලය වූයේ විවිධ සෙනඟ කණ්ඩායම් බිහි වීම වේ.

4. සෙනඟ කණ්ඩායම් වැඩි වර්ධනය වූ විට ඔවුහු ලෝකයේ විවිධ ස්ථානවලට ගියහ. කාලයක් ගතවීමේදී මෙම කණ්ඩායම්, ජාතීන් ලෙස සංවිධානය වූ විශාල සෙනඟ කණ්ඩායම් බවට

පත්විය. ඔවුහු භූගෝලීය දේශ සීමා පිහිටුවා ගත් අතර තම සෙනඟ පාලනය කිරීමට දේශපාලනික හා නීතිමය පද්ධති ද ස්ථාපිත කළහ.

## තෙවන පරිච්ඡේදය

1. "එවිට උන්වහන්සේ ඔවුන්ට ලියවිලි වැටහෙන පිණිස ඔවුන්ගේ සිත් පහදවා ඔවුන්ට කියන සේක්: මෙසේ ක්‍රිස්තුස්වහන්සේ වධ විඳින්ටත් තුන්වෙනිදා මළවුන්ගෙන් නැගිටින්ටත් යෙරුසලමේ පටන් සියලු ජාතීන්ට පසුතැවිල්ල සහ පව් කමාව ද උන්වහන්සේගේ නාමයෙන් ප්‍රකාශ කරනු ලබන්ටත් යුතුයයි ලියා තිබේ." ලූක් 24: 45-47

2. බයිබලයේ "ප්‍රධාන යතුර" වන්නේ ලූක් 24: 45-47 වේ.

3. බයිබලයේ "ප්‍රධාන යතුරෙන්" ඉදිරිපත් කර ඇති මූලික කරුණු දෙකක් වන්නේ:
   පළමුවැන්න : "ක්‍රිස්තුස්වහන්සේ වද විඳින්ටත්.... මළවුන්ගෙන් නැගිටින්ටත් .... යුතුමය."
   දෙවැන්න : "පසුතැවී සිත් හරවා ගැනීම ද පව් කමාව ද උන්වහන්සේගේ නාමයෙන් ප්‍රකාශ කළ යුතුමය."

4. ලෝකයා සඳහා වන දෙවියන්වහන්සේගේ පරමාර්ථය පැහැදිලි කරන ශුද්ධ ලියවිලි යොමුව වන්නේ එපීස 1:9-10 හා 3:11 වේ.

5. දෙවියන්වහන්සේගේ සදාතනික පරමාර්ථය වන්නේ ජේසුස් ක්‍රිස්තුස්වහන්සේ තුළින් සියලු පාපී මිනිසුන් තමන්වහන්සේ වෙතට ගෙන ඒම වේ.

6. අස්වැන්න කෙත

## සතරවන පරිච්ඡේදය

1. මක්නිසාද ඉර උදාවන තැන් පටන් බස්නා තැන් දක්වා මාගේ නාමය ජාතීන් අතරේ උතුම්ය: සියලුම ස්ථානවල සුවඳ දුම්ද පිරිසිදු පූජාවක්ද මාගේ නාමයට ඔප්පු කරනු ලබන්නේය. එසේය, මාගේ නාමය ජාතීන් අතරේ උතුම්යයි සේනාවල ස්වාමීන්වහන්සේ කියන සේක. මලාකි 1:11

2. ප්‍රධාන පණිවුඩය වන්නේ පාපී මිනිසාගේ ගැළවීම උදෙසා දෙවියන්වහන්සේගේ සැලකීම හා සැලැස්ම වේ.

3. ඔබගේ සාරාංශය සතරවන පරිච්ඡේදයේ දී ඇති සාරාංශය හා සසඳන්න.

4. ඔබගේ සාරාංශය සතරවන පරිච්ඡේදයේ දී ඇති සාරාංශය හා සසඳන්න.

5. ඔබගේ සාරාංශය සතරවන පරිච්ඡේදයේ දී ඇති සාරාංශය හා සසඳන්න.

6. ඔබගේ සාරාංශය සතරවන පරිච්ඡේදයේ දී ඇති සාරාංශය හා සසඳන්න.

## පස්වන පරිච්ඡේදය

1. ඔබ මට කරන්ට දුන් වැඩ මම නිමවා කර පොළොවේදී ඔබ ගෞරවයට පැමිණවීමි. යොහන් 17:4

2. දේවදූතයන්ගේ, මරියතුමීගේ, සිමියොන්ගේ හා අනෙක් අයගේ ප්‍රකාශයන් තුළින් ලෝකයා සඳහා වන දෙවියන්වහන්සේගේ සැලැස්ම එළිදරව් කෙරිණි. මේ සෑම ප්‍රකාශයකම, උන්වහන්සේගේ පරමාර්ථය වන සියලු සෙනඟ දෙවියන්වහන්සේ හා සමගි කිරීම ගැන සඳහනක් තිබිණි.

3. ඔබගේ සාරාංශය පස්වන පරිච්ඡේදයේ ඇති සාකච්ඡාව හා සසඳන්න.

4. ඔබගේ සාරාංශය පස්වන පරිච්ඡේදයේ ඇති සාකච්ඡාව හා සසඳන්න.

5. ධර්මිෂ්ඨ දෙවි කෙනෙකු සමඟ පාපී මිනිසා සමගි කළ හැක්කේ, කුරුසිය මත ජේසුස්වහන්සේගේ මරණයෙන් වේ.

6. යේසුස්වහන්සේ එවන ලද පරමාර්ථය, එනම් ධර්මිෂ්ඨ දෙවි කෙනෙකු සමඟ පාපී මිනිසා සමගි කිරීම, උන්වහන්සේ ඉටු කළ සේක. ගැළවීම සඳහා වන දෙවියන්වහන්සේගේ සැලැස්ම සම්පූර්ණ විය.

**හයවන පරිච්ඡේදය**

1. නුමුත් ශුද්ධාත්මයාණන්වහන්සේ නුඹලා කෙරෙහි පැමිණි කල නුඹලා බලය ලබන්නහුය. එවිට නුඹලා යෙරුසලමෙහිද මුළු යුදයෙහිද සමාරියෙහිද පොළොවේ සීමාව දක්වාද මාගේ සාක්ෂිකාරයෝ වන්නහුයයි කී සේක. ක්‍රියා 1:8

2. ශ්‍රේෂ්ඨ පැවරුම යනු, ශුභාරංචිය ලෝකයේ ජාතීන් වෙත පතුරුවන ලෙස ජේසුස්වහන්සේ ඇදහිලිවතුන්ට දුන් ආඥාව වේ.

3. මෙම යොමුවීම්වලින් ඕනෑම තුනක් භාවිත කළ හැකිය : යොහන් 20:21-23, ක්‍රියා 1:8, යොහන් 15:16, ලූක් 24:45-49, මාර්ක් 16:14-16, මතෙව් 28:16-20.

4. සභාව මට්ටම් දෙකක නිර්වචනය කර ඇත.

ලොව මුළුල්ලේ : ජේසුස් ක්‍රිස්තුස්වහන්සේ අදහන සියලු දෙනාගෙන් සභාව සමන්විත වේ. එය නැවත උත්පාදනය ලැබූ හා දෙවියන්වහන්සේට කීකරුව ජීවත්වන ඇදහිලිවතුන්ගේ සහභාගිකත්වයකි. සභාව යන වචනයේ තේරුම “ ”කැඳවනු ලැබූ” හෝ ”කැඳවා ඇති අය” හෝ වේ. සභාව සමන්විත වන්නේ සාතන්ගේ රාජ්‍යයෙන් දෙවියන්වහන්සේගේ රාජ්‍යයට කැදවූ අයගෙන් වන අතර එය සෑම ජාතියකම, ගෝත්‍රයකම, සංස්කෘතියකම හා භාෂාවකම සෙනඟගෙන් සමන්විතය. ඔවුහු ජේසුස් ක්‍රිස්තුස්වහන්සේ තම ගැළවුම්කරු ලෙස පිළිගත් අය වෙති.

දේශීය : මිෂන් සේවය, සංවිධානය කිරීම හා සහභාගිකත්වය සඳහා ඇදහිලිවතුන් කණ්ඩායම්, දේශීයව සංවිධානාත්මක සහභාගිකත්වයකට එක් වී ඇත.

5. සභාව ආරම්භ වූයේ ක්‍රියා 2 සඳහන් ලෙස පෙන්තකොස්ත දිනයේ වේ. එය දෙවියන්වහන්සේ විසින් මහත් බලයක් පෙන්වමින් ඉපදවූ සේක.

6. ශුද්ධාත්මයාණන්වහන්සේගේ බලය

7. ඇදහිලිවතුන්, එක් පවුලක සහෝදර සහෝදරියන් ලෙස එකට සම්බන්ධ විය යුතුය. ඔවුන් ක්‍රිස්තුස්වහන්සේ හිස ලෙස වූ ශරීරයක් ක්‍රියා කරන ආකාරයට සේවය කළ යුතු වේ. දෙවියන්වහන්සේ විශේෂ නායකයන් පත් කරන අතර සභාවේ මිෂන් සේවය කිරීමේ හැකියාව ඔවුන්ට දෙන සේක.

8. සභාවට විවිධ කාර්යයන් තිබේ. ඒවා අතර නමස්කාරය, සහභාගිකත්වය හා මනුෂ්‍ය අවශ්‍යතාවන් සඳහා සේවය කිරීම වේ. එහෙත් එහි පැවැත්මේ මූලික පරමාර්ථය වන්නේ ශුභාරංචිය පැතිරීමය. සරලව එය මෙසේ වේ: සභාවේ පරමාර්ථය වන්නේ ජේසුස්වහන්සේ විසින් දෙන ලද ශ්‍රේෂ්ඨ පැවරීම සාක්ෂාත් කිරීමය.

9. ශුභාරංචියේ මූලික ගුණාංග 1 කොරින්ති 15:1-11හි සාරාංශ කර ඇත. එහි මූලික පණිවුඩය වන්නේ ජේසුස්වහන්සේ, උන්වහන්සේගේ සේවය, පාපයේ මරණය, උත්ථානය වීම හා පෙනී සිටීම වේ. ඉතා පටුවෙන් ශුභාරංචිය යනුවෙන් අදහස් වන්නේ, යොහන් 3:16, යොහන් 14:1,

මතෙව් 11:28, හා රෝම 10:9ය. එහි පුළුල් අදහසෙහි දේව රාජ්‍යය පිළිබඳව ජේසුස්වහන්සේ ඉගැන්වූ සියල්ල අන්තර්ගත වේ.

### හත්වන පරිච්ඡේදය

1. "අස්වැන්න බහුලය, ගොවිහු විරලය". මතෙව් 9:37

2. ඔබගේ සාරාංශය සත්වන පරිච්ඡේදයේ දී ඇති සාරාංශය හා සසඳන්න.

3. සෙනඟ කණ්ඩායමක් යනු එකිනෙකාට පොදු බැඳීමක් ඇති තරමක් විශාල කණ්ඩායමකි. එවැනි බැඳීමක භාෂාව, සංස්කෘතිය, සිරිත් විරිත් හා භූගෝලීය පිහිටීම අන්තර්ගත විය හැකිය.

4. ශුභාරංචිය නොගිය සෙනඟ කණ්ඩායමක් යනු, පිටතින් ආධාරයක් නොමැතිව තම සෙනඟට ශුභාරංචිය දීමට තරම් දේශීය ඇදහිලිවතුන් සමූහයක් හා සම්පත් නොමැති සෙනඟ සමූහයකි.

5. ශුභාරංචිය ලද සෙනඟ කණ්ඩායමක් යනු, පිටතින් ආධාරයක් නොමැතිව තම සෙනඟ ශුභාරංචිය දීම සඳහා ප්‍රමාණවත් ඇදහිලිවතුන් සංඛ්‍යාවක් හා සම්පත් ඇති සෙනඟ සමූහයකි.

6. ශුභාරංචිය නොලද ප්‍රධාන කණ්ඩායම් පහ වන්නේ : ගෝත්‍රික, මුස්ලිම්, හින්දු, චීන හා බෞද්ධ අය වේ.

7. සංවෘත රටක් යනු අනෙක් රටවලින් මිෂනාරිවරුන් පිළිනොගන්නා රටකි. බොහෝ අවස්ථාවල ඔවුන්ගේ සෙනඟගේ ආගම පාලනය කිරීමේ නීති පනවා ඇත. ඇතැම් රටවල සෙනඟ කිතුනු ආගමට හැරවීම නීතියෙන් තහනම් වේ.

8. මේ ප්‍රකාශය සත්‍යය.

### අටවන පරිච්ඡේදය

1. "නුඹලා මා තෝරා ගත්තා නොව මම නුඹලා තෝරා ගෙන පත් කළෙමි. එසේ කළේ නුඹලා ගොස් ඵල දරන පිණිසත් නුඹලාගේ ඵල පවතින පිණිසත් මාගේ නාමයෙන් පියාණන්වහන්සේගෙන් නුඹලා ඉල්ලන කොයි දෙයක් නුමුත් උන්වහන්සේ නුඹලාට දෙන පිණිසත්ය." යොහන් 15: 16

2. ලෝක කිතුනුවන් යනු විවිධ ජාතීන්, සංස්කෘතීන්, භාෂාවන් හා ආගමික නිකායයන්ගෙන් සමන්විත කණ්ඩායමකි. ඔවුන් සියලු දෙනාටම පොදු වන්නේ ලෝක කිතනුවකු වීමට ඇති පෞද්ගලික කැපවීම වේ.

3. මුල් සභාව ලෝකයා වෙතට ශුභාරංචිය ගෙන ගියේ 2 තිමෝති 2:2හි විස්තර කර ඇති ගුණ කිරීමේ ක්‍රියාවලියෙනි. සෑම ඇදහිලිවන්තයෙක්ම තවත් ඇදහිලිවතුන් බිහි කළ අතර සෑම නිවසක්ම ශුභාරංචිය දීමට කේන්ද්‍රස්ථානයක් විය.

4. මෙම ප්‍රශ්නයට ඔබගේ කැපවීමේ අත්සන අවශ්‍ය වේ.

### නවවන පරිච්ඡේදය

1. "මාගේ ශුද්ධ කන්දට පමුණුවා මාගේ යාච්ඤා ගෘහයෙහි ඔවුන් ප්‍රීතිවන්නට සලස්වන්නෙමි. ඔවුන්ගේ දවන පූජා සහ යාග මාගේ පූජාසනය පිට පිළිගනු ලබන්නේය. මක්නිසාද මාගේ ගෘහය සියලු ජාතීන්ට යාච්ඤා ගෘහයක්යයි කියනු ලබන්නේය." යෙසායා 56: 7

2. මැදිහත්කරුවෙකු යනු තවත් කෙනෙකු වෙනුවෙන් පෙනී සිටින්නෙකි. අපි යාච්ඤා කිරීම මගින් ජාතීන් වෙනුවෙන් මැදිහත්කම් කරන්නෙමු. ජාත්‍යන්තර මැදිහත්වීම යන්න මින් පැහැදිලි වේ. අප මැදිහත් වන විට අපි අන් අය වෙනුවෙන් දෙවියන්වහන්සේ සොයන්නෙමු. ලෝකයේ ජාතීන් වෙනුවෙන් අපි උන්වහන්සේට ඉල්ලීම් ඉදිරිපත් කරන්නෙමු.

3. ජාත්‍යන්තර මැදිහත්කරුවන් ලෙස අන් අය පුහුණු කිරීමේ පියවර:
පළමුවැන්න : බයිබලීය ලෝක දැක්ම සන්නිවේදනය කරන්න.
දෙවැන්න : යාච්ඤා සැලැස්ම වෙනුවෙන් ඇති යාච්ඤා නිර්දේශ අනුගමනය කරමින් හා යාච්ඤා අත්පොතක් පිළියෙල කිරීමෙන් මෙම පරිච්ඡේදය එකට එක්ව අධ්‍යයනය කරන්න.
තෙවැන්න : ජාත්‍යන්තර මැදිහත්වීම් සඳහා යාච්ඤා කණ්ඩායමක් සංවිධානය කරන්න. මේ වැදගත් දේව සේවයට නිරන්තර කැපවීම මෙමඟින් සහතික කෙරෙනු ඇත.

4. ඔබගේ පිළිතුර ඔව් නම්, ඔබ මෙම පරිච්ඡේදයේ අරමුණ සාක්ෂාත් කර ගෙන ඇත.

5. ඔබගේ පිළිතුර ඔව් නම්, ඔබ මෙම පරිච්ඡේදයේ අරමුණ සාක්ෂාත් කර ගෙන ඇත.

6. - මැදිහත්වීම ශුද්ධ ලියවිල්ලට අනුකූලය.
- යාච්ඤාව යනු අනෙක් සියලුම දේ රඳා පවතින ක්‍රියාකාරකමකි.
- ජාත්‍යන්තර මැදිහත්වීමට සීමා නොමැත.

7. යාච්ඤා සැලැස්මෙහි මේවා අන්තර්ගත වේ.
- දෙවියන්වහන්සේට ප්‍රශංසා කිරීම (මිනිත්තු 10)
- ලෝකයා වෙනුවෙන් පොදුවේ මැදිහත්වීම (මිනිත්තු 10)
- ලෝකයේ එක් පෙදෙසක් වෙනුවෙන් මැදිහත් වීම (මිනිත්තු 10)
- සුවිශේෂී මිෂනාරිවරයෙකු හෝ මිෂන් ආයතනයක් හෝ වෙනුවෙන් මැදිහත් වීම (මිනිත්තු 10)
- ශුභාරංචිය නොලද එක් සෙනඟ කණ්ඩායමක් වෙනුවෙන් යාච්ඤා කිරීම (මිනිත්තු 10)
- සුවිශේෂී පුද්ගලික යාච්ඤා අවශ්‍යතාවන් (මිනිත්තු 10)

**දහවන පරිච්ඡේදය**

1. බොහෝ සාක්ෂිකාරයන් ඉදිරියෙහි නුඹ මාගෙන් ඇසූ දේම වෙන අයටත් උගන්වන්ට සමර්ථවූ විශ්වාසවූ මනුෂ්‍යයන්ට භාරදෙන්න. 2 තිමෝති 2:2

2. විශ්වාසවන්ත පිරිමි හා ගැහැනු

3. - දර්ශනයේ ආකෘතියක් වන්න.
- දර්ශනය අන් අයට සන්නිවේදනය කරන්න.
- දර්ශනය ජීවිතයේ කේන්ද්‍රස්ථානය ලෙස තබාගන්න.
- දර්ශනයට කීකරු වන්න.

4. මෙම ප්‍රශ්නයට පිළිතුරු දිය හැක්කේ ඔබට පමණි. දර්ශනයට කීකරු වීම සඳහා ඔබ සුවිශේෂී ප්‍රතිචාරයක් ගැන තීරණය කර නොමැති නම් ඔබ එසේ කරන තුරු දෙවියන්වහන්සේ සොයන්න. මෙම පරිච්ඡේදයේත් මෙම මුළු පාඨමාලාවේත් සැබෑ පරීක්ෂණය මෙය වේ. ලෝකයේ ජාතීන් වෙනුවෙන් ඇති දෙවියන්වහන්සේගේ සැලැස්මේ ක්‍රියාකාරී වීමට ඔබ පෙලඹී තිබේද?

**එකොළොස්වන පරිච්ඡේදය**

1. රාජ්‍යයේ මේ ශුභාරංචිය සියලු ජාතීන්ට සාක්ෂියක් පිණිස ලොව මුළුල්ලේ ප්‍රකාශ කරනු ලබන්නේය. එවිට අන්තිමය පැමිණෙන්නේය. මතෙව් 24:14

2. දේව රාජ්‍යය පිළිබඳ ශුභාරංචිය ලෝකයේ සියලු සෙනඟට දේශනා කිරීම

3. දානියෙල් හා එළිදරව්ව පොත්

4. 1 තෙසලෝනික 4:13-18

5. එළිදරව්ව පරිච්ඡේද 21 හා 22

6. 2 පේතෘස් 3:10

7. ඔබගේ සාරාංශය එකොළොස්වන පරිච්ඡේදයේ සඳහන් සාකච්ඡාව හා සසඳන්න.